

# පයිත

සමාජ
සංස්කෘතික
සමීක්ෂා

දෙවන වෙළුම - 2004
ISSN 1391-9148

## පඨිත සංස්කාරක මණ්ඩලය

සසංක පෙරේරා, ප්‍රධාන සංස්කාරක (කොළඹ විශ්වවිද්‍යාලය)

ආනන්ද තිස්ස කුමාර, භාෂා සංස්කාරක (කොළඹ විශ්වවිද්‍යාලය)

ටී. සනාතනන්, ප්‍රධාන සංස්කාරක, *පණුවල්* (යාපනය විශ්වවිද්‍යාලය)

රමණී ජයතිලක (කොළඹ විශ්වවිද්‍යාලය)

ඉන්දිකා බුලන්කුලම (නීතිය හා සමාජීය භාරය)

අශෝක ද සොයිසා (කැලණිය විශ්වවිද්‍යාලය)

යූවී තන්ගරාජා (නැගෙනහිර විශ්වවිද්‍යාලය)

නලින් ස්වාරිස් (ස්වාධීන ලේඛක)

රංජිත් පෙරේරා (සමාජ විද්‍යාඥයන්ගේ සංගමය)

හරින්ද්‍ර දසනායක (ස්වාධීන පරිවර්තක)

ජගත් වීරසිංහ (කැලණිය විශ්වවිද්‍යාලය)

## සංස්කරණ සහාය

ජගත් බණ්ඩාර පතිරගේ

ක්‍රිශාන්ත ෆෙඩ්රික්ස්

පඨිත සමාජ සංස්කෘතික ගවේෂණය සඳහා වූ එකතුව විසින් වාර්ෂිකව පළකරනු ලැබේ. එය තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුවේ ප්‍රකාශන වැඩසටහනේ කොටසකි.

**මූල්‍ය අනුග්‍රහය හීවෝස් ආයතනය මගිනි**

# පඨිත [redacted]

සමාජ
සංස්කෘතික
සමීක්ෂා

දෙවන වෙළුම - 2004

සමාජ සංස්කෘතික ගවේෂණය සඳහා වූ එකතුව,
කොළඹ.

© ලිපි එකතුවක් වශයෙන් සියලුම හිමිකම්

සමාජ සංස්කෘතික ගවේෂණය සඳහා වූ එකතුව සතුවේ, 2004.

© සියලුම මුල් ලිපිවල හිමිකම් මුල් කතුවරුන් සතුවේ, 2004.

© සියලුම පරිවර්තනවල හිමිකම් පරිවර්තකයන් සතුවේ, 2004.

ප්‍රකාශන හිමිකම් පිළිබඳ නෛතික තත්ත්ව තුළින් අදහස් ගලනයට හා සම්භාෂණයට සම්බාධක ඇතිවිය හැකි නිසා, ප්‍රකාශන අයිතිය පිළිබඳ මනවාදීමය විශ්වාසයක් සමාජ සංස්කෘතික ගවේෂණය සඳහා වූ එකතුව තුළ නොමැත. එබැවින් මෙහි අන්තර්ගත ඕනෑම ලිපියක් සංවාද කටයුතු සඳහා ඕනෑම ආකාරයකින් යොදා ගැනීමට අවසර තිබේ.

# පටුන

**පඨිත ප්‍රවිෂ්ටය**

හැඳින්වීම: නාගරික අවකාශ සහ ආශ්චර්යාත්මක
යථාර්ථවාදය
- *පඨිත සංස්කාරකවරු* 1

**පඨිත නාගරික අවකාශ ගවේෂණය**

අතුරුදහන්වීම මත ගොඩනැංවීම:
හොංකොංහි වාස්තු විද්‍යාව හා යටත්විජිත අවකාශය
- *අක්බාර් අබ්බාස්* 13

යටත්විජිත නගරය දේශීය කිරීම:
19 වන සියවස අග භාගයේ කොළඹ සහ
එහි භූමි දර්ශනය
- *නිහාල් පෙරේරා* 77

**පඨිත නිර්මාණ සාහිත්‍ය කතිකාව**

ආශ්චර්යාත්මක යථාර්ථවාදය
පශ්චාත් යථාර්ථවාදයක් ලෙස
- *ලියනගේ අමරකීර්ති* 129

**පඨිත ග්‍රන්ථ විමර්ශන**

*Remaking a World: Violence, Social Suffering and Recovery*
[ලොවක් නැවත ගොඩනැගීම: ප්‍රචණ්ඩත්වය,
සමාජයානුගත දුක සහ ප්‍රතිප්‍රාප්තිය]
(සංස්කාරකවරු: වීනා දාස්, ආතර් ක්ලයින්මන්,
මාගරට් ලොක් සහ මම්ෆෙලේ රම්ෆෙලේ)
*- ටොඩ් මෙයර්ස්* 169

*වර්තමාන සමාජ අර්බුදය* (එස්. ටී. හෙට්ටිගේ)
*- අජිත් සේරසුන්දර* 177

*இலங்கையின் பொருளாதார வரலாறு வடக்கு - கிழக்குப் பரிமாணம்*
[ශ්‍රීලංකාවේ ආර්ථික ඉතිහාසය:
උතුරු නැගෙනහිර පැතිකඩ]
(වී. නිත්‍යානන්දන්)
*- එන්. ෂේරින්ඩනාදන්* 191

**පඨිත පාරිභාෂික අඩවිය**

පඨිත පාරිභාෂික පද මාලව 199

**ලේඛකයන් පිළිබඳ තොරතුරු** 207

**පඨිත අරමුණු** 211

# හැඳින්වීම:

## නාගරික අවකාශ සහ ආශ්චර්යාත්මක යථාර්ථවාදය

පඨිත සංස්කාරවරු

පඨිත පළමු වෙළුම (2003) සඳහා ලියූ පෙරවදනින් අපි පඨිත ශාස්ත්‍රීය විමර්ශිත ලිපි සංග්‍රහයෙන් බලාපොරොත්තු වන බුද්ධිමය හා දේශපාලනික කාර්යභාරය මෙන්ම එහි දිශානතිය කුමක්දැයි පැහැදිලි කෙළෙමු. එකී බුද්ධිමය හා දේශපාලනික සන්දර්භය තුළ ස්ථානගත වෙමින්, පඨිත දෙවන වෙළුමින් (2004) අප බලාපොරොත්තු වන්නේ අපට දියත් කිරීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය සංස්කෘතික කතිකාව මූලික වශයෙන් තවත් කේන්ද්‍රීය කතිකාමය අඩවියක් කරා යොමු කිරීමටය. එනම් නගරය, නැතහොත් නාගරික අවකාශය ගවේෂණය කිරීම යන අතිශයින් ගතික, බහු අර්ථ ජනනීය හා අන්තර් සම්බන්ධිත ඥාන විභාගාත්මක අඩවිය වෙත යම් මූලික පිවිසීමක් කිරීමය.

ශ්‍රී ලංකාවේ දැනට ස්ථාපනය වී ඇති බුද්ධිමය වශයෙන් බෙහෙවින් දරිද්‍ර සමාජ විද්‍යාත්මක සහ සමාජ මානව විද්‍යාත්මක කතිකාව තුළ නාගරික භූමි දර්ශනය (urban landscape) හෝ නාගරික අවකාශය (urban space) වැනි සංකල්පීය සූත්‍රගත කිරීම් සහ ඒ හා සම්බන්ධ න්‍යායත්මක ප්‍රවේශ ඔස්සේ ගැඹුරු ශාස්ත්‍රීය මට්ටමකින් නගරය පාඨනය කිරීමට තවමත් බුද්ධිමය අවකාශයක් විවර වී නොමැත. කෙටින්ම කියතොත්, එකී ශාස්ත්‍රාලයීය කතිකාව තුළ නාගරික අවකාශය පිළිබඳ සමාජ විද්‍යාව හෝ නාගරික

අවකාශය පිළිබඳ සමාජ මානව විද්‍යාව (sociology and social anthropology of urban space) වැනි මූලික ඥාන ගවේෂණ ප්‍රවේශ හෝ දැනට මතු වී නොමැත. බුද්ධිමය වශයෙන් ශ්‍රී ලාංකේය සමාජ හා සමාජ මානව විද්‍යාව තවමත් බොහෝදුරට කාලය ගත කරනුයේ 'ගම' නැමැති අතිශය වේගයෙන් වෙනස්වෙන සමාජ යථාර්ථය හා ඒකකය අති සරල ආකාරයකින් විස්තර කිරීමටය. මෙය සුපැහැදිලි වන්නේ මේ ඥාන සම්පාදන අඩවි මගින්ම ජනිත කර ඇති විධික්‍රමික වශයෙන් දුර්වල, දාර්ශනික හා න්‍යායාත්මක ප්‍රවේශ අතින් පසුගාමී ජනප්‍රියවාදී ප්‍රවණතා තුළය. මීට විකල්පීය වශයෙන් සහ මීට අමතරව, මෙකී සමස්ත බුද්ධි සම්පාදන ක්ෂේත්‍ර තුළ නගරය සම්බන්ධයෙන් සිදුවන්නේ සංවර්ධන ආයතන හා ක්‍රියාවලීන්ට අවශ්‍ය පරිදි නගරය පිළිබඳ සංඛ්‍යානමය දත්ත හෝ තාක්ෂණික තොරතුරු සම්පාදනය කිරීම හා එතුළින් බෙහෙවින් සීමිත හා බුද්ධිමය වශයෙන් ඌනිත නිගමනවලට එළැඹීමය. දෙමටගොඩ ඉදිකර ඇති සහස්‍රපුර නම් අඩු ආදයම්ලාභී මහල් නිවස්නය මේ සියළු නිශේධක ඥාන සම්පාදන අඩවිවල බුද්ධිමය සීමා සහ න්‍යායික පසුගාමීත්වයන් කැටිකොටගත් භෞතික යථාර්ථයකි.

අනෙක් අතට, දැනට සම්පාදිත දැනුම පිළිබඳව සලකා බලන විට පෙනී යන තවත් කරුණක් නම්, ශ්‍රී ලංකේය පුරා විද්‍යාව නම් ඥාන සම්පාදන ක්ෂේත්‍රයට ද යුරෝපීය යටත් විජිත යුගයේ ආරම්භයේ සිට වර්තමානය දක්වා කාලය තුළ දේශීය නාගරික අවකාශය තුළ ඇති වී තිබෙන ව්‍යුහාත්මක, සංස්කෘතික, දේශපාලනමය හා අවකාශීය විපර්යාස ගවේෂණය කිරීමට බුද්ධිමය උනන්දුවක් ආයතනික හෝ පෞද්ගලික මට්ටමින් ඇති වී නොමැති බවයි. මීට එක් පැහැදිලි හේතුවක් නම්, ශ්‍රී ලාංකේය පුරා විද්‍යාව තුළ දැකගත හැකි තත්කාලීන සමාජ න්‍යාය හා සංස්කෘතික විශ්ලේෂණයට දක්වන අඩු අවධානයත් තම ඥාන සම්පාදනය ප්‍රාග් හා පුරාණ ඓතිහාසික යුග තුළ අඩස්සි කර තිබීමත්ය.





නගරය සංස්කෘතික, දේශපාලනික, පරිකල්පනික සහ සිහින අවකාශයක් ලෙසඃ
කොළඹ නගරය ප්‍රතිසංවර්ධනය සඳහා සැකසුනු
අනේක වාස්තු විද්‍යාත්මක සැලසුම්වලින් ස්වරූප දෙකක්.
මූලාශ්‍රයඃ ආකිටෙක්ට්, 1996.

මේ අතිශය පසුගාමී දැනුම පිළිබඳ රික්තයේ තවත් යථාර්ථයක් නම් වාස්තු විද්‍යාව, නාගරික සැලසුම්කරණය, ඉදිකළ පරිසරය (built environment) වැනි විධිමත් ශාස්ත්‍රාලයීය ඥාන සම්පාදන අඩවි හුදෙක් තාක්ෂණික දැනුම ප්‍රගුණ කිරීම හා සැලැසුම්කරණය යන අන්තයන්ට ලඝු වී තිබීමය. මෙය සුපැහැදිලිව පෙනෙන්නේ මේ ක්ෂේත්‍ර හා සම්බන්ධ දැනුම් සම්පාදන ආයතන තුළ සංස්ථාගත වී ඇති විෂය රාමු තුලින් සමාජ සංස්කෘතික ගවේෂණය මඟින් සහ තත්කාලීන සමාජ න්‍යායෙන් ලබාගත හැකි ආලෝකය ඉතා පැහැදිලි ලෙස අවතක්සේරු කර ආන්තික කර තිබීම තුළින්ය. එනම්, මේ තත්ත්වය තුළ ලබාදෙන පුහුණුව හා සම්පාදිත දැනුම හුදෙක් තාක්‍ෂණික කතිකාවකට ලඝු වී තිබීම හා ඊට අනිවාර්යයෙන් ලැබිය යුතු දාර්ශනික හා න්‍යායික පන්නරය හා දිශානතිය නොලැබී තිබීමය.

මේ තත්ත්වය තුළ පෙනී යන කරුණක් නම්, සමස්තයක් වශයෙන් නගරය සමාජීය, සංස්කෘතික හා දේශපාලනික අවකාශයක් වශයෙන් පාඨනය කිරීමට උත්සාහ දැරීමේ දී අප සතු වියයුතු පූර්ව දැනුම, ඥාන ගවේෂණය පළිබඳ විධික්‍රමික පුහුණුව, දාර්ශනික පසුබිම හෝ ආයතනික මග පෙන්වීම අප සතුව නොමැති බවය. නගරය පිළිබඳව දැනට ලියැවී ඇති අතළොස්සක් වූ ඓතිහාසික හා තත්කාලීන කෘති ද තිබෙනුයේ බෙහෙවින් විසිරී ගිය ආකාරයකටය. මේ අනුව, පඨිත දෙවන වෙළුම මගින් නාගරික අවකාශය ගවේෂණය කිරීම සහ ඒ ක්‍රියාවලියේ දී සංස්කෘතික හා ඓතිහාසික පාඨනයක සහ අර්ථකථනයක ඇති කේන්ද්‍රීය වැදගත්කම හා කාලීන බුද්ධිමය අවශ්‍යතාව අවධාරණය කරනුයේ මේ දැනුම් රික්තය පිළිබඳ බරපතල ගැටලුව විධිමත් ශාස්ත්‍රීය කතිකාවක මතුපිටට ගෙන ඒමේ අරමුණෙනි. එයින් උත්සාහ කරනුයේ මෙවන් දැනුම් රික්තයක්, පඨිත වැනි එක් ලිපි සංග්‍රහයක වෙළුමකින් විසඳීම නොවේ. එවන් මනස්සෘෂ්ටියක් ප්‍රායෝගික ද නොවේ. නමුත් අපගේ උනන්දුව වන්නේ එකී ගැටලුව

පිළිබඳ වාද විෂයන් මෙලෙස සංක්ෂිප්තව ආමන්ත්‍රණය කොට, ඒවා සමග බුද්ධිමය හා ශාස්ත්‍රීය මට්ටමකින් ගනුදෙනු කිරීමට ඒ සඳහා උනන්දුව ඇති දැනුම් සම්පාදකයන්ට යම් අවකාශයක් නිර්මාණය කිරීම සහ ඒ කර්තව්‍යය සඳහා ආරාධනා කිරීමය. එමෙන්ම, පයිත දෙවන වෙළුමේ පළ කර ඇති ප්‍රථම ලිපි දෙක පෙළගස්වා ඇත්තේ එකී දීර්ඝ කාලීන ශාස්ත්‍රීය ගනුදෙනුවට යම් ප්‍රාරම්භයක් වශයෙනි.

අක්බාර් අබ්බාස් විසින් රචනා කරන ලද *අතුරුදහන්වීම මත ගොඩනැංවීම: හොංකොංහි වාස්තු විද්‍යාව සහ යටත් විජිත අවකාශය* යන ලිපිය තරමක් සංකල්පීය හා න්‍යායික වශයෙන් සංකීර්ණ සහ පරිවර්තනයේ දී භාෂාමය අභියෝග ගණනාවකට මුහුණ පාන්නට සිදු වූ ලිපියකි. එය මූලික වශයෙන් සංකල්පීය, දාර්ශනික, න්‍යායාත්මක හා වාස්තු විද්‍යාත්මක තොරතුරු යන සියලුම ඥාන සම්පාදන මට්ටම් තුළින් තර්ක කිරීමට උත්සාහ කරනුයේ නාගරික අවකාශය තුළ 'අතුරුදහන් වීම' හෝ 'නොපෙනී යෑම' යන යථාර්ථය හොංකොං සම්බන්ධයෙන් වාස්තු විද්‍යාත්මක ගොඩ නැංවීමට හා අවකාශීය සැකසීම සඳහා පූර්ව කොන්දේසි වී තිබෙන්නේය යන කාරණයත්, ඒ ක්‍රියාවලිය තුළ දී අතුරුදහන් වන්නේ හුදෙක් පැරණි ගොඩනැගිලි පමණක් නොව, එමගින් ඉතිහාසය හා නාගරික අනන්‍යතාව ද අතුරුදහන් වන බවත්ය. නාගරික අවකාශ අධ්‍යයනයේ දී විවර කර ගත හැකි බොහෝ ප්‍රවේශ මැනැවින් පෙන්නුම් කරන මේ ලිපියෙන් නගරය (එය කොළඹ හෝ අන් ස්ථානයක් වේවා) සමාජීය හා සංස්කෘතික වශයෙන් ගවේෂණය කරන්නට බුද්ධිමය උනන්දුවක් දක්වන්නන්ට ප්‍රාරම්භක ප්‍රයෝජනයක් ලබා දෙනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු.

පයිත දෙවන වෙළුමේ අන්තර්ගත මීළඟ ලිපිය නිහාල් පෙරේරා විසින් රචිත *යටත් විජිත නගරය දේශීය කිරීම: 19 වන සියවස අගභාගයේ කොළඹ සහ එහි භූමි දර්ශනය* යන කොළඹ නගරයේ අවකාශීය හා

සංස්කෘතික පරිණාමය පිළිබඳ ඓතිහාසික විමර්ශනයයි. පෙරේරා මූලික වශයෙන් උත්සාහ කරනුයේ දේශීය ජනතාවගේ සමාජ-සංස්කෘතික අවශ්‍යතා නොසලකා, ඔවුන් මත ආරෝපණය කළ යටත්විජිත නගරයක් වූ කොළඹ, යටත්විජිත යුගයේ සිටම ඓතිහාසික ක්‍රියාවලියක කොටසක් වශයෙන් දේශීයකරණයට ලක් වූයේ කෙසේද යන්න විස්තර කිරීමටය. යටත්විජිත ජීවන ශෛලීන්ට අනුගත වීම, යටත්විජිත වාස්තු විද්‍යාත්මක අකෘති අනුකරණය කිරීම, බෞද්ධ පුනරුදයත් සමග බෞද්ධ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත විහාර වැනි ගොඩනැගිලි තුළින් නාගරික අවකාශයට බලපෑම් කිරීම යන මේ සියලුම ක්‍රියාවලි තුළින් නාගරික අවකාශය දේශීයකරණය කිරීම යන ප්‍රතිඵලය පෙරේරා දකිනුයේ සමස්ත යටත්විජිත ව්‍යාපෘතියේම අනිවාර්ය විස්තීරණයක් වශයෙනි. එමෙන්ම, මේ දේශීයකරණ ක්‍රියාවලිය යටත්විජිත බලධාරීන් සමග දේශීය ප්‍රභූන් හා සාමාන්‍ය ජනයා නිරතුරුවම නිරත වූ ප්‍රකට හා අප්‍රකට බල අරගලයක ප්‍රතිඵලය ද විය.

කෙසේ වුවද, කොළඹ නගරයේ සංස්කෘතික, අවකාශීය හා බල දේශපාලනික විකාශනය පිළිබඳව මීට වඩා බෙහෙවින් ගැඹුරින් සහ තත්කාලීන සමාජ න්‍යායේ ආලෝකය මීට වඩා වැඩියෙන් ලබා ගනිමින් පුළුල් අධ්‍යයන ගණනාවකට, නැතහොත් පුළුල් අර්ථ විවරණාත්මක පාඨන ගණනාවක් වෙත යා හැකි බව අපගේ විශ්වාසයයි. එසේම, ඒ සඳහා අවශ්‍ය බුද්ධිමය දිශානතීන් කිහිපයකින් එකක් මේ ලිපිය මගින් යම් දුරකට සපයන්නේ යැයි අපි විශ්වාස කරන්නෙමු.

මේ වෙළුම තුළ අපගේ කේන්ද්‍රීය අවධානය යොමුවී තිබෙනුයේ නාගරික අවකාශය පාඨනය කිරීම සඳහා වුවද, මෙවර අපගේද්විතීය අවධානය යොමු වන්නේ තත්කාලීන නිර්මාණ සාහිත්‍යයේ එක් විසම්මුතික ඥාන සම්පාදන අඩවියක් වන ආශ්චර්යාත්මක යථාර්ථවාදය (magic realism) යන අදහස සහ ආශ්චාර්යාත්මක යථාර්ථවාදී රචනාකරණය පිළිබඳ

අර්ථවිවරණාත්මක සම්භාෂණයක නිරතවීම සඳහාය. ඒ ලියනගේ අමරකීර්ති විසින් රචනා කළ *ආශ්චර්යාත්මක යථාර්ථවාදය පශ්චාත් යථාර්ථවාදයක් ලෙස* යන ලිපිය තුළිනි. මේ ලිපියෙන් අමරකීර්ති ගවේෂණය කිරීමට උත්සාහ දරන ප්‍රධාන ස්ථාවරයක් වන්නේ දැනට සිංහල භාෂාවෙන් 'ඉන්ද්‍රජාලික' හෝ 'මායා' යථාර්ථවාදය වශයෙන් හඳුන්වාදෙන 'magic realism' යන පදයේ ඇති ඥාන විභාගාත්මක හා ආනුභවික ගෝචර බවයි. එනම්, ආශ්චර්යාත්මක යථාර්ථවාදී කෘති සම්පාදනය වූ සමාජ හා සංස්කෘතික අවකාශයනට සාපේක්ෂව ඒ පදයේ ඇති සුදුසුකමයි. ගේබ්‍රියෙල් ගාර්සියා මාකේස් වැනි රචකයන්ගේ කෘතිවලින් ගත් උදාහරණ සහ මේ සාහිත්‍යික ප්‍රවේශය පිළිබඳව දැනට පවතින සම්භාෂණයේ අදහස් ද ආශ්‍රයෙන් අමරකීර්ති උත්සාහ දරනුයේ ඉන්ද්‍රජාලික, මායාකාරී සහ ගුඪ යන පදවලින් විස්තර වන ආශ්චර්යාත්මක යථාර්ථවාදී පඨිත තුළ දැකිය හැකි බොහෝ ආඛ්‍යාන හා කථාංග ඒවා ජනිත වූ සමාජවල යථාර්ථ සමග ඇති සබඳතා ගවේෂණය කිරීමටය. මේ ඇතැම් අංග, ආඛ්‍යාන හෝ විස්තර ඉන්ද්‍රජාලික හෝ මායාකාරී තත්ත්වයනට වඩා ආශ්චර්යාත්මක ලක්ෂණ බවත්, එනිසා ඒ තත්ත්ව හැඳින්වීමට 'ආශ්චර්යාත්මක යථාර්ථවාදය' යන අදහස හා පදය වඩා සුදුසු බවත් ඔහු යෝජනා කරයි. එසේ නොමැතිනම්, එකී තත්ත්ව පශ්චාත් යථාර්ථවාදයක් සනිටුහන් කරන බවට ඔහු තර්ක කරයි.

මෙවර පඨිත වෙළුමේ කේන්ද්‍රීය බුද්ධි ගවේෂණය ඉහත සංක්ෂිප්තව විස්තර කළ ලිපි තුනට පමණක් සීමා වන අතර, ඊට අමතරව ග්‍රන්ථ විමර්ශන තුනක් ද ඇතුළත් කොට ඇත. පඨිත හා සමාන ජාත්‍යන්තර ශාස්ත්‍රීය ලිපි සංග්‍රහ හා සසඳන විට, ග්‍රන්ථ විමර්ශන සඳහා සාපේක්ෂ වශයෙන් වැඩි අවකාශයක් පඨිත තුළ ලැබෙන බව යමෙකුට පෙනී යනු ඇත. මේ තීරණය ගෙන ඇත්තේ ප්‍රධාන වශයෙන් කාරණා දෙකක් මත පදනම් වෙමිනි. ඉන් පළමු කරුණ වන්නේ ශ්‍රී ලංකාවේ බුද්ධිමය අවකාශය

තුළ විවේචනාත්මක හා ඵලදායක මට්ටමේ ග්‍රන්ථ විමර්ශන සම්ප්‍රදායක් නොමැති වීම සහ එවැනි සම්ප්‍රදායක ප්‍රභවය සඳහා අවකාශ සැපයීමට අප තුළ ඇති උනන්දුවය. දෙවන කරුණ නම් ජාතික, කලාපීය හා අන්තර්ජාතික වශයෙන් සම්පාදනයවන අන්තර් සම්බන්ධිත හා විධිමත් දැනුම් සම්භාර අවම වශයෙන් ඒවා ප්‍රකාශයට පත්වන පයිත විමර්ශනය කිරීම තුළින් හෝ ශ්‍රී ලාංකේය පාඨකයන් වෙත සන්නිවේදනය කිරීම කාලීන සමාජීය සහ බුද්ධිමය අවශ්‍යතාවක්ය යන්න අප විශ්වාස කරන නිසාය. ඒ අනුව, මේ වෙළුම තුළ වීනා දාස්, ආතර් ක්ලයින්මන්, මාගරට් ලොක් සහ මම්ෆෙලේ රම්ෆෙලේ විසින් සංස්කරණය කළ *Remaking a World: Violence, Social Suffering and Recovery* (ලොවක් නැවත ගොඩනැගීම: ප්‍රචණ්ඩත්වය, සමාජයානුගත දුක සහ ප්‍රතිප්‍රාප්තිය) යන කෘතිය ටොඩ් මෙයර්ස් විසින් විමර්ශනය කර ඇත. එමෙන්ම, එස්. ටී. හෙට්ටිගේ විසින් රචිත *වර්තමාන සමාජ අර්බුදය* යන කෘතිය අජිත් සේරසුන්දර විසින් විමර්ශනය කර ඇත. අවසන් වශයෙන්, වී. නිත්‍යානන්දන් විසින් දෙමළ බසින් ලියන ලද *இலங்கையின் பொருளாதார வரலாறு வடக்கு - கிழக்குப் பரிமாணம்* (ඉලංගෛයින් පෙරුලාදාර වරලාරු - වඩක්කුක් කිලක්කුප් පරිමාණම් - ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය: උතුරු නැගෙනහිර පැතිකඩ) යන කෘතිය එන්. ජේරින්බනාදන් විසින් විමර්ශනයට ලක්කර ඇත.

පයිත පාරිභාෂික අඩවිය යන මෙවර වෙළුමේ අවසන් කොටස තුළින් අප මෙතෙක් පයිත පළමු හා දෙවන වෙළුම් තුලින් සාකච්ඡාවට භාජනය වූ විෂයන් සම්බන්ධයෙන් භාවිතයට ගැණුනු පද හා එම විෂයන් සම්බන්ධ ඇතැම් අමතර පද ද කැටිකොට ගත්, සාපේක්ෂ වශයෙන් අසම්පූර්ණ පාරිභාෂික පද මාලාවක් ඉදිරිපත්කොට ඇත. මෙම කොටස ද මෙවන් අන් ලිපි සංග්‍රහ තුළ සාමාන්‍යයෙන් දැකගත නොහැකි අංගයකි. පයිත සැලසුම් කළ අවධියේදී මෙවන් අංගයක් ඇතුළු කිරීමට අප තුළ

බලාපොරොත්තුවක් තිබුණේ ද නැත. එසේ වුවද, මේ මැදිහත්වීම කිරීමට අප තීරණය කළේ පඨිත පළමු වෙළුම කියැවූ ශාස්ත්‍රඥයන් හා සාමාන්‍ය පාඨකයන් බොහෝ දෙනෙකු ද අපගෙන් කළ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙනි. මේ ඇතැම් පද අප ඒවා යොදා ඇති සන්දර්භයානුකූලවම එම අර්ථ ස්වරූපවලින්ම වෙනත් බුද්ධි සම්පාදන අවකාශ තුළ දැනටමත් භාවිතයට ගෙන ඇත. එනිසා ඒවා පිළිබඳව යම් ප්‍රමිතියක් සහ එකඟතාවක් තිබේ. අන් පද අප යොද ඇත්තේ ඒවා සාමාන්‍යයෙන් යෙදෙන සන්දර්භයෙන් වෙන්කොට වෙනත් සන්දර්භයක වන අතර, ඒ ක්‍රියාවලිය තුළින් එකී නව සන්දර්භ තුළ ඒවායේ අරුත් ද වෙනස් වී ඇත. මීට අමතරව, අප යොදා ඇති අන් පද දැනට නොයෙක් සන්දර්භ තුළ භාවිතයේ පවතින පද එකතු කිරීමෙන් හෝ අන් භාෂාමය උපක්‍රම මගින් අප සම්පාදනය කළ ඒවාය. එමෙන්ම ඇතැම් පද යොදා ඇත්තේ එකිනෙකට වෙනස් අර්ථ කිහිපයක් සඳහා එක් පදයක් වශයෙනි. මේ අවසනට සඳහන් කල තත්ත්වය බුද්ධිමය ව්‍යාකූලත්වයනට තුඩු දිය හැකි බැවින් අනාගතයේදී එකී තත්ත්වය විසඳා ගැනීමට වෙර දැරිය යුතුය.

සිංහල භාෂාවෙන් විධිමත් ශාස්ත්‍රීය රචනාකරණයේ යෙදෙන විට අප මුහුණපාන ප්‍රධානතම ගැටලුවක් නම් සංකීර්ණ අදහස් හෝ සංකල්ප විස්තර කිරීමට හෝ සන්දර්භගත කිරීමට අත්‍යවශ්‍ය ව්‍යුක්ත තාක්‍ෂණික පද මාලාවක අඩුවය. මේ තත්ත්වයට එක් ප්‍රධාන හේතුවක් නම් අපගේ දැනුම් සම්පාදන අඩවි තුළ, විශේෂයෙන්ම සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර ලෙස සැලකෙන ශාස්ත්‍රාලයීය ක්‍ෂේත්‍ර තුළ ඇති බුද්ධිමය මන්දගාමී භාවයයි; නිරන්තර හා ගැඹුරු අර්ථ විවරණයේ හා රචනාකරණයේ ඇති අඩුවයි; න්‍යාය සම්පාදනයට හා භාවිතයට ඇති ආයතනික හා පෞද්ගලික අකමැත්තයි. මේ තත්ත්වය තුළ දැනට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් කිහිප දෙනෙකු විසින් ප්‍රකාශයට පත් කර ඇති පාරිභාෂික

ශබ්ද මාලා හා ශබ්ද කෝෂ කොතරම් ප්‍රයෝජනවත් වුවද, ඒවා යම් සීමාවන්ගෙන් ඔබ්බට යන්නේ නැත. මේ අඩුව නැතිනම් භාෂාමය දරිද්‍රතාව වඩාත් පැහැදිලි වන්නේ මෑතකාලීන දැනුම් සම්පාදන ක්ෂේත්‍ර හා අවශ්‍යතා සම්බන්ධයෙනි. උදාහරණයක් වශයෙන්, ව්‍යුහවාදී, පශ්චාත් ව්‍යුහවාදී හා පශ්චාත් නූතනවාදී අදහස් හා සංකල්ප වැනි දෑ පිළිබඳව කථා කිරීමේ දී මේ ගැටලුව වඩාත් බරපතළ ලෙස මතුවේ. නමුත් භාෂාවේ ඇති අවවර්ධනය නිසා පුළුල් වශයෙන් විධිමත් බුද්ධිමය සම්භාෂණයේ යෙදීමෙන් හා සුවිශේෂ වශයෙන් රචනාකරණයෙන් ඈත් වීම කළ යුතු හෝ කළ හැකි දෙයක් නොවේ. පඨිත පාරිභාෂික පද වැල අප ඉදිරිපත් කරනුයේ මෙවැනි සන්දර්භයක් තුළය.

එය පළ කිරීමෙන් අප බලාපොරොත්තු වන්නේ හුදෙක් පඨිත වෙළුම් තුළ දැනට පළවී ඇති ලිපි කියවීම වඩාත් පහසු කිරීම හෝ අපගේ බුද්ධිමය අණසක සියලු දෙනා මත පැටවීම හෝ නොවේ. එය ඉදිරිපත් කරනුයේ කතිකාමය ප්‍රවේශයක් වශයෙනි. නැතහොත්, බුද්ධිමය සම්භාෂණයකට මුලපිරීමක් වශයෙනි. මේ පද ඒවායේ සුදුසුකම, ප්‍රයෝජනය, ඥාන විභාගාත්මක ගෝචරබව ආදී කරුණු මත යම් ආකාරයක බුද්ධි කලම්බනයකට භාජනය කිරීමෙන් යම් ආකාරයක ප්‍රමිතියකට ඒවා කාලාවකාශානුකූලව පත් කළ හැකිය. එතුළින්, අවශ්‍ය නම් හා ප්‍රයෝජනවත් නම්, වෙනත් ලේඛකයන්ට ද මේ පද යොදාගත හැකිය. නොඑසේ නම්, ඒවා යම් ආකාරයෙන් වෙනස් කොට, වඩාත් සුදුසු ස්වභාවයන් හෝ යෙදුම් ප්‍රගුණ කර ගත හැකිය. එසේත් නැතිනම්, ඒවා මුළුමනින්ම ඉවත දමා, ඒ වෙනුවට වෙනත් පද යෝජනා කළ හැකිය. නමුත් මෙය මූලික වශයෙන් චිත්තවේගීය අගතීන්ගේ ග්‍රහණයට හෝ භාෂා පාරිශුද්ධවාදීන්ගේ සහ භාෂා සංහාරකයින්ගේ න්‍යාය පත්‍රවලට ලඝු නොවූ විධිමත් ශාස්ත්‍රීය හා බුද්ධිමය ව්‍යාපෘතියක් විය යුතුය. අපගේ බලාපොරොත්තුව මේ

කර්තව්‍යයට කෙටිකාලීන හා මූලික අවකාශයක් හා ප්‍රවේශයක් සැපයීමය. මේ සම්බන්ධව වඩාත් දීර්ඝ කාලීන, පරිපූර්ණ හා තිරසාර මැදිහත්වීම් ඉදිරි පඨිත වෙළුම් තුළින් හා සමාජ සංස්කෘතික ගවේෂණය සඳහා වූ එකතුවේ අනාගත ක්‍රියාකාරකම් තුළින් ඉදිරියට ගෙන යාමට අපි බලාපොරොත්තු වන්නෙමු.

අවසන් වශයෙන්, පඨිත ශාස්ත්‍රීය විමර්ශිත ලිපි සංග්‍රහය සඳහා අප පළමු වෙළුමේ පෙරවදනින් විස්තර කළ බුද්ධිමය හා දේශපාලනික භූමිකාව මේ දෙවන වෙළුම තුළින් ද ඉදිරියට ගෙනයන බව අපගේ විශ්වාසයයි. ඒ හැකියාව ඉදිරියේ ද පවත්වාගත හැකි වනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු.

## ආශ්‍රිත පඨිත


Architrave

1996. *An Urbanity for the New Millennium: Building the Distinctive Sri Lankan City* (Urban Design / Planning Proposals for the Re-Development of Colmbo Fort, Sri Lanka). Colombo: Architrave Chartered Architects.

# අතුරුදහන් වීම මත ගොඩනැංවීම:

## හොංකොංහි වාස්තු විද්‍යාව හා යටත්විජිත අවකාශය

අක්බාර් අබ්බාස් [1]

පරිවර්තනය: හරින්ද්‍ර දසනායක

### ප්‍රවේශය



අතුරුදහන්වීම මත ගොඩනැංවෙන නිරතුරුවම වෙනස්වෙන හොංකොංහි ගුවන් ඉම.
ඡායාරූප මූලාශ්‍රය: පුඩ්පික්, 1986.

හොංකොං සෑම වසර කිහිපයකට වරක්ම යළි නිපදවෙනවාය (reinvent) යන කියමන විශ්වාස කටයුතු එකක් බවට පත්වන්නේ, අප එහි මධ්‍යම දිස්ත්‍රික්කයෙහි දිනෙන් දින වෙනස්වන ගුවන් ඉම (skyline) දෙස බලන කල්හිය. එය තවමත් නිව්යෝර්ක් හෝ චිකාගෝ නුවර ගුවන් ඉමට

අභියෝග එල්ල කරන්නක් නොවුණත්, ඊටම අවේණික චිත්තාකර්ෂණීය බවක් දරන්නේ, එහි දිනෙන් දින වැඩිවන නෝමන් ෆොස්ටර්, අයි. එම්. පෙයි සහ පවුල් රුඩොල්ෆ් වැනි අන්තර්ජාතික වාස්තු විද්‍යාඥයන්ගේ අනන්‍යතාව විද්‍යමාන කරන ගොඩනැගිලි ද (signature buildings) සමගිනි. වාස්තු විද්‍යාඥයාගේ අනන්‍යතාව වෙළෙඳ නාමයක් ලෙස ක්‍රියාත්මක වන මෙවැනි නාගරික ගුවන් ඉමක් මගින් අවධාරණය කරනු ලබන්නේ වෙළෙඳපොළෙහි අධිපතිභාවය පමණක්ම නොව, වෙළෙඳපොළ නිසා ස්ථානය වියැකී යන්නේය (market erodes place) යන ශැරන් සුකින්ගේ තර්කය ද අන්තයකට රැගෙන යන බවයි (සුකින් 1992). දිනෙන් දින ඉහළ යන ඉඩම් මිල ගණන් ද, දේපොළ සමපේක්ෂණය[2] ද (property speculation), ප්‍රධාන අවකාශයන්හි හිමිකාරත්වය සඳහා තරග කරන දැවැන්ත ව්‍යාපාරයන්හි පැවැත්ම ද, යන සාධකවල සංයෝජනයෙහි ප්‍රතිඵලයක් ලෙස නිරන්තරයෙන් යළි ඉදි කෙරෙන නගරය, සියුම් ලෙස හඳුනාගත නොහැකි තත්ත්වයකට පත්වෙමින් තිබේ.

මෙ සම්බන්ධයෙන් වඩාත්ම කැපී පෙනෙන උදාහරණය වනු හැකිව තිබුණේ, මධ්‍යම දිස්ත්‍රික්කය තුළ මධ්‍යගතව පිහිටා ඇති රිට්ස් කාල්ටන් හෝටලයයි. එහි වැඩ නිමවීමට ආසන්නව තිබූ 1993 වසර මුල් භාගයේදී, හෝටලයේ පළමු අයිතිකරුවන් විසින් එය බහුජාතික වෙළෙඳ ව්‍යාපාර හවුලකට විකුණා දමන ලදුව, ඔවුන් විසින් මෙම අභිනව සුඛෝපභෝගී හෝටලයේ එකදු සංචාරකයෙකුවත් ලැගුම් ගැනීමට පෙර එය බිමට සමතලා කොට ඒ වෙනුවට වඩා වැඩි ආදායම් ජනනය කිරීමේ හැකියාව සලකා එම ස්ථානයෙහි කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීමේ යෝජනාවක් ඉතා ගැඹුරින් සලකා බැලූ බව වාර්තා විය. හොංකොංහි ගොඩනැගිලි වෙනත් ඕනෑම පරිභෝජන භාණ්ඩයකට අත්වන ඉරණමට මුහුණදිය යුතුය. එනම්, මීට අඩ සියවසකට පෙර වෝල්ටර් බෙන්ජමින් විසින් ලඟාවුණු, අද වන විට අප දැස්

පනාපිට යථාර්ථයක් බවට පත්වෙමින් තිබෙන, අන්තර් දෘෂ්ටියකට (insight) අනුව, "පරිභෝජන ආර්ථිකයේ කැලඹිලිකාරිත්වය තුළ, අප ධනේශ්වරයේ ස්මාරක, ඒවා කැඩී බිඳී යාමටත් පෙර නටඹුන් ලෙස දකින" බවයි (බෙන්ජමින් 1978: 162). දේපොළ සමපේක්ෂණය මගින් ඇති කරනු ලැබ ඇති තත්ත්වය නම් හොංකොංහි ඕනෑම ගොඩනැගිල්ලක්, කොතරම් අලුත් හෝ ස්මාරකීය (monumental) වශයෙන් වැදගත් වුවත්, නුදුරු අනාගතයේදීම, එනම් අද තිබී හෙට වන විට, නටඹුන් බවට පත්වීමට ඇති අවදානමයි. මේ අවදානම කාලය සංකෝචනය කරනු ලබන, දිරාපත්වී යාමේදී ලැබෙන අනුකම්පාවද නිෂ්ප්‍රභ කෙරෙන තත්ත්වයකි. මෙම තත්ත්වය තුළ, 'සෞභාග්‍ය සහ ස්ථාවරත්වය' (prosperity & stability) සහ 'වෙනසකින් තොරව අඩ සියවසක්' (fifty years without change) වැනි වර්තමාන දේශපාලන සටන් පාඨ අප ඇස් ඉදිරියේම වෙනස්වන නාගරික භූ දර්ශනය (urban landscape) හමුවේ මුසාවක් බවට පත්වන්නේ අවකාශීය අනන්‍යතාව (spatial identity) පිළිබඳ ගැටලුව තව තවත් සංකීර්ණ බවට පත්කරමිනි.

## හොංකොං වාස්තු විද්‍යාව සහ යටත් විජිත අවකාශය

වාස්තු විද්‍යාව මගින් සෑමවිටම *කොතැනක හෝ පිහිටා තිබීම* (to be somewhere) උපකල්පනය කෙරෙන නිසා, එය නගරයක විද්‍යමාන අනන්‍යතාවෙහි (putative identity) ප්‍රථම දෘශ්‍ය සාක්ෂ්‍ය වෙයි. මෙනයින් පෙනී යන්නේ, මධ්‍යම දිස්ත්‍රික්යෙහි සංකේතීය භූ දර්ශනය (symbolic landscape) බොහෝ දෙනා වශී කිරීමට සමත්ව තිබෙන බවයි. ඒ අතර සිනමාකරුවන් හා ඡායාරූප ශිල්පීන් පමණක් නොව, ඉරිදා දිනයේදී රථ වාහන ඇතුළුවීම තහනම් කළ පසු එම ප්‍රදේශය සියතට ගන්නා පිලිපීනයෙන් පැමිණි ගෘහ සේවකයෝ ද සිටිති. එහෙත් මධ්‍යම දිස්ත්‍රික්කයේ හෝ පොදුවේ හොංකොංහි

වාස්තු විද්‍යාවට, හොංකොං නගරය නියෝජනය කළ හැකිද? ඩයනා ඇග්රෙස්ට් පෙන්වාදී ඇති ආකාරයට, වාස්තු විද්‍යාවේ දෘෂ්ටි කෝණයෙන් නගරය දෙස බැලීම එකකි, නගරයේ දෘෂ්ටි කෝණයෙන් වාස්තු විද්‍යාව දෙස බැලීම ඉඳුරාම අනෙකකි (ඇග්රෙස්ට් 1993). නගරය දෙස වාස්තු විද්‍යාවේ දෘෂ්ටි කෝණයෙන් බැලීම බොහෝ දුරට සම්භාව්‍ය සම්ප්‍රදාය (classical tradition) ආශ්‍රිත චිත්‍ර ශිල්පීය දෘෂ්ටියක් (painterly mode of looking) මත පදනම් විය හැකි අතර, නගරයේ දෘෂ්ටි කෝණයෙන් වාස්තු විද්‍යාව දෙස බැලීම පදනම් විය හැක්කේ, නූතන නගරයට සමගාමීව වර්ධනය වූ දෘශ්‍ය කලාව වන සිනමාව මත පමණි. එනම්, ෂෝන් ලුක් ගොදාර් කියූ පරිදි "සත්‍යය තත්පරයට විසිහතර වතාවක්" (truth twenty four times a second) (අබ්බාස් 1997) අප ඉදිරියේ දක්වන දිසිරුව (visual) ස්ථාවරය යන්න ගැටලුකාරී බවට පත්කරනු ලබන (problematize) කලාවයි.

හොංකොං සම්බන්ධයෙන් සලකා බලන කල, ගොඩනැගිලිවල තේජාන්විත දර්ශන සිනමා පටය මත සටහන් කරගන්නවාට වඩා වැඩි සම්බන්ධයක් ඇත්ත වශයෙන්ම සිනමාව හා වාස්තු විද්‍යාව අතර දැකගත හැකිය. මෙම මාධ්‍ය දෙක හොංකොංහි වඩාත්ම සංවර්ධිත සංස්කෘතික ස්වරූප දෙක වනවා පමණක් නොව, වඩාත්ම දෘශ්‍යමය වන්නේ හා වෙළෙඳපොළ මත වැඩිපුරම යැපෙන්නේ ද, මේවායි. හොංකොංහි සිනමාව, විශේෂයෙන්ම එහි වඩාත් කැපී පෙනෙන සිනමාකරුවන්ගේ කෘති තුළ, දිසිරුව භාවිතය හරහා දිසිරුබවම (visuality) ප්‍රශ්න කරමින් යටත් විජිත අවකාශය පිළිබඳ විචාරාත්මක කතිකාවකට පිවිසුම් සපයයි. එහෙත් වර්තමානය වනතෙක් පැවති හොංකොංහි වාස්තු විද්‍යාව එහි සිනමාව හා සසඳන විට දක්වන්නේ වඩාත් අඩු බලාපොරොත්තු සහගත බවකි (less sanguine). එමගින් ගොඩනගනු ලබන දෘශ්‍ය අවකාශය (visual space) විවේචනාත්මකව බිඳ හෙළීමට එරෙහි වෙයි (resists critical dismantling).

සිනමාවේදී වස්තු විෂය (subject) චලන රූපවලින් (moving images) වටවී තිබීම නිසාම එහි වඩාත් සරල ස්වරූපයන්හිදී පවා රූප සම්බන්ධය විශ්ලේෂණය පිළිබඳව එක්තරා ප්‍රමාණයක විචාරශීලී අවධානයක් යොමු කළ යුතු වෙයි. මෙහා සැසඳීමේදී, වාස්තු විද්‍යාවේදී වස්තු විෂය ස්ථාවර යැයි සැලකෙන ප්‍රතිරූප වටා චලනය වෙයි (අවකාශය සිනමාකරණය නැතහොත් cinematization of space මගින් වාස්තු විද්‍යාව අස්ථායීකරණය [destabilization] කළ යුතු බවට ඇග්රෙස්ට් නගන තර්කය මේ හා සැසඳෙයි). මේ නිසා වාස්තු විද්‍යාව සතුව, අප සියලු දෙනාවම, එනම් ස්වදේශිකයන් මෙන්ම ආගන්තුකයන් ද, ස්ථාවර සහ ස්මාරකීය රූප නරඹන සංචාරකයන් බවට පත් කිරීමේ භයානක විභවය පවතී.

නිල වශයෙන් භාවිත කිරීම මගහරිනු ලැබුව ද, හොංකොංහි තවදුරටත් ඇත්තේ යටත්විජිත අවකාශයක්ය යන්න දක්වීමට ඇති ප්‍රධානතම භෞතික සාධකය නම්, ප්‍රත්‍යාවලෝකනයෙන් තොර (unreflexsive) දෘශ්‍ය පරිභෝජනය දිරිගන්වන හොංකොං වාස්තු විද්‍යාවයි. යටත්විජිත අවකාශය යටත්විජිත වස්තු විෂයන් වෙනුවෙන් මතුව පෙනී සිටින හා යළි අතුරුදහන්වන (appears & disappears) සංකේතීය පිළිවෙළක් (symbolic order) සිතියම්ගත කර දෙනු ලබන යටත්විජිත පරිකල්පනයක (colonial imagination) ප්‍රක්ෂේපණයක් ලෙස දැකිය හැකිය. මෙමගින් කියැවෙන දෙයක් නම්, යටත්විජිතවාදය විශ්ලේෂණය කරනු වස්, අවකාශය පිළිබඳ ගැටලු විශ්වයන් (spatial problematics) සකසා ගැනීම වඩ වඩාත් අවශ්‍ය වන්නේ ඇත්ත වශයෙන්ම හොංකොංහි යටත්විජිත අවකාශය විශේෂයෙන්ම අතුරුදහන්වීම මත ගොඩනැගුණු අවකාශයක් වීම නිසාය. එවැනි විශ්ලේෂණයකදී වාස්තු විද්‍යාවට හිමි කාර්යය වැදගත් විය හැකි නමුත්, වඩා උදාසීන එකකි. මින් අවධාරණය කරනු ලබන්නේ, හොංකොංහි වාස්තු විද්‍යාව සහ නාගරික අවකාශය පිළිබඳව, නව

හොංකොං සිනමාව මෙන් දිසිරු බටෙහි ආධිපත්‍යය ප්‍රශ්න කිරීමට ලක් කරනු ලබන ආකාරයේ විවේචනාත්මක කතිකාවක් වහා සම්පාදනය කිරීමට ඇති අවශ්‍යතාවයි.

බැලූ බැල්මටම පශ්චාත් යටත්විජිතවාදී (post-colonial) සංවේදීතාවන්ගෙන් ආරම්භ වූවා සේ පෙනෙන නාගරික ප්‍රපංචය ආශ්‍රයෙන් මා විසින් දුන් මෙම අතුරුදහන්වීම පිළිබඳ අදහස සහ යටත්විජිතවාදී බැල්ම (colonial gaze) යන්න විස්තර කෙරෙයි. මා මෙහිදී ඉදිරිපත් කරනු ලබන අතුරුදහන් වීම පිළිබඳ අදහස මගින් කිසිදු සලකුණක් ඉතිරි නොකොට සැඟවී යාමක් ඇඟවෙන්නේ නැත. ඇත්ත වශයෙන්ම, ඊට ඉතා හොඳින් වර්තමානය පිළිබඳ සැළකිලිමත් බවින් හා සංරක්ෂණ ව්‍යාපෘති සමග සංයෝගීව පැවතිය හැකිය. පසුගිය වසරවලදී, විශේෂයෙන්ම 1980 ගණන්වල මුලදී, ස්වයං සවිඥානකත්වයකින් (self conscious) යුක්තව හැඳින් වූ හොංකොං සංස්කෘතිය කෙරෙහි දක්වූ උනන්දුව වර්ධනය වෙමින් පැවති අතර, බොහෝ දෙනෙකු මේ තත්ත්වය කියැවූයේ හොංකොං සිය අනන්‍යතාව සම්බන්ධයෙන් හැඟීමක් වර්ධනය කර ගැනීමක් ලෙසය. උදාහරණ වශයෙන්, පැරණි හොංකොං පිළිබඳව කෙරුණු ඡායාරූප ප්‍රදර්ශන රැල්ලක් පැවතිනි. එමෙන්ම, පැරණි හොංකොං චිත්‍රපට සඳහා සංරක්ෂණාගාරයක් ස්ථාපනය කෙරෙමින් පවතී. හොංකොංහි ආචාර විධි (customs), සම්ප්‍රදායන් සහ ජනශ්‍රැති අධ්‍යයනයට ලැබෙන ශාස්ත්‍රීය පිළිගැනීම දිනෙන් දින ඉහළ යමින් පවතී. තවද, පරිප්‍රාකාරිත කොවුලූන් නගරය කඩා ඉවත් කිරීමට එරෙහිව දක්වුණු විශාල ප්‍රතිචාරය ද තේරුම් ගත යුත්තේ, මෙම සංස්කෘතික සහ නාගරික ආකෘති (cultural & urban forms) සංරක්ෂණය තුළින් සංස්කෘතික අනන්‍යතාව සංරක්ෂණය කිරීමේ සන්දර්භය තුළය. ඓතිහාසික විෂමතා නිසා කොවුලූන් කිසිවෙකුටත් අයිති නැති බිමක් (no man's land) ලෙසින් බ්‍රිතාන්‍ය පාලන ප්‍රදේශයෙන් පිටත මෙන්ම චීන පරිපාලනයට ළඟාවීමට

නොහැකි තරම් දුරින් ද පිහිටා තිබුණි. එහි ප්‍රතිඵලය වූයේ මේ නගරය, සාමාන්‍ය පුරවැසියන් ප්‍රමාණයකට ද සිය 'නිවහන' (home) වුවද සියලුම ආකාරයේ නීති විරෝධී සහ රහස්‍ය (clandestine) වැඩකටයුතු සඳහා තෝතැන්නක් බවට පත්වීමයි. චීන බලධාරීන්ගේ ද අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව, මෑතදී ඒ නගරය බිමට සමතලා කර දැමීමෙන් පසුව ටික කලක් ගතවෙන තුරු ඒ ගැන හාහෝවක් පැවති අතර, ඉන් පසු නගරයේ කැළැල් සහිත විභූතිය (seedy glory) සමරමින් දිලිසෙන කඩදාසියේ මුද්‍රිත ලිපි සහ ඡායාරූපවලින් පිරි මිලාධික පොතක් නිකුත් විය. මේ උදාහරණය ආශ්‍රයෙන් අපට තේරුම්ගත හැක්කේ කුමක්ද? යටත්විජිත වාදය ගමන් කරන්නේ දේශීය සංස්කෘතිය හා අනන්‍යතාව හෙළාදැකීම හා සමගාමීව නම්, මේ වර්ධනය වෙමින් පවතින නව උනන්දුව පශ්චාත් යටත්විජිත දැනුවත් බවක මතුවීමෙහි පෙර නිමිත්තක් බවයි. කෙසේ නමුදු, තත්ත්වය මීට වඩා, උභයාර්ථිත (ambivalent) බව පෙනී යන්නේ ෆ්‍රාන්ට්ස් ෆැනොන් මීට බොහෝ කලකට පෙර පෙන්වා දුන් පරිදි "ජාතික ශෛලියේ ආරක්ෂකයා බවට පත්වන්නේ අධිරාජ්‍යවාදියාය" (ෆැනොන් 1967: 195) යන ප්‍රකාශය සළකා බැලීමේදිය. දේශීය සංස්කෘතිය සහ ශෛලීන් විශේෂ ප්‍රවර්ගයක් (special category) යැයි උද්ධෘත කොට වෙන් කරනු ලැබූ විට, ඒවා සාර්ථකව මෙල්ල වී යන අතර, මතකය කැලඹීමට ඒවාට තිබෙන්නට ඇති කිසියම් විභවයක් වේ නම්, එය අහෝසි වී යයි. සංරක්ෂණය යනු මතකය නොවන බව සැළකිය යුතුය. සංරක්ෂණය තෝරා බේරාගෙන කරනු ලබන්නක් වන අතර, එමගින් කුණු, දූවිලි සහ වේදනාව (dirt & pain) බහිෂ්කරණය කෙරෙයි. වර්තමානයේදී හොංකොංහි පශ්චාත් යටත්විජිත බවට අදාළව සිදුවෙමින් පවතින බොහෝ දේ සම්බන්ධයෙන් සත්‍ය වන පරිදි, සංස්කෘතිය සංරක්ෂණය ලෙස සැළකීම පැවතිය හැක්කේ එක් සරුවපිත්තල (kitsch) ස්වරූපයක් ලෙස පමණි.

පැරණි ගොඩනැගිලි සංරක්ෂණය තුළින්, ඉතිහාසයට ස්ථානයක් ලබාදීම මෙන්ම එය අපගේ දෘෂ්ටිය (sight) තුළ තබාගැනීම ද සිදු කෙරෙයි. එනිසා සංරක්ෂණය ගැන කෙරෙන සාකච්ඡාවක්, දෘශ්‍යමය මතවාදය (visual ideology) පිළිබඳව කෙරෙන සාකච්ඡාවක් ද විය යුතුය. මේ සාකච්ඡාව ඉදිරියට ගෙන යාමට මා බලාපොරොත්තු වන්නේ, යටත්විජිතවාදය බැල්ම (gaze) පිළිබඳ දේශපාලනයක් ලෙස සළකාගෙනය. මෙහිදී වාස්තු විද්‍යාත්මක සංරක්ෂණ තුනක් ඇසුරින් ප්‍රධාන වශයෙන් තර්ක කෙරෙනුයේ, ඊටම ආවේණික සාධනීය ප්‍රයෝජන ඇති 'සංරක්ෂණයට' එරෙහිව නොව, එහෙත් සංරක්ෂණය ඉතිහාසය ලෙස භාවිත කිරීම මගින්, ඉතිහාසය අතුරුදහන් කරවීමට එරෙහිවය.

ඉන් පළමු උදාහරණය නම්, හොංකොං-කැන්ටොන් දුම්රිය පර්යන්තය පිහිටා තිබුණු භූමියේ ඉදිකෙරුණු සංස්කෘතික මධ්‍යස්ථානයයි. ප්‍රජාවක් පරිකල්පනය (imagine a community) කිරීමට මෙම සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමේ සැලැස්ම මගින් අවස්ථාව ලබාදුන්නද, ක්‍රියාවට නැංවීමේදී මේ අවස්ථාව බොහෝ දුරට මගහැරී ගොස් ඇත. ශ්‍රවණාගාර පිහිටා ඇති ප්‍රධාන ගොඩනැගිලි ආකෘතිය, යෝධ හිම ක්‍රීඩා බෑවුමකට (ski slope) වඩා වැඩි යමක් යැයි නොපෙනෙන, ඕනෑම තැනකින් ආභාසය ලැබුවා විය හැකි, නූතනවාදී අස්ථානීය ආකෘතීන්ගෙන් එකකි (one of those modernist placeless structures). මේ ස්වදේශීයත්වය නොසළකා හැරීම හානිපූරණය කිරීමට මෙන් ඊට එක් කැපී පෙනෙන අලංකරණ උපාංගයක් (design detail) හඳුන්වාදී තිබේ. කඩා ඉවත් කරන ලද දුම්රියපොළෙහි රතු ගඩොලින් ඉදිකර තිබුණු හෝරා ස්තම්භය නොකඩා ඉතිරි කොට සමස්ත සැලැස්මට අන්තර්ග්‍රහණය කෙරී ඇත. එක් තලයකදී, මෙසේ හොංකොං වාස්තු විද්‍යා ඉතිහාසයෙන් 'උපුටා ගැනීම' මෙම සංස්කෘතික මධ්‍යස්ථානයට දේශීය ඉතිහාසයෙන් හුදු පැල්ලමක් ආදේශ කරමින් ඓතිහාසික මොහොතක්

පිළිබඳ හැඟීමට ප්‍රකාශනයක් ලබාදීමකි. එහෙත් තවත් තලයකදී, මෙම ඓතිහාසික පැල්ලම දෘශ්‍ය පරිභෝජනය අරමුණු කරගත්, අලංකරණය ඉක්ම නොයන, ඉතිහාසයට අයත් රූපයකි (an image of history). මෙය සංස්කෘතික මධ්‍යස්ථානයේ සමස්ත සැලැස්මට දක්වන සම්බන්ධය සලකා බැලීමේදී, මේ හෝරා ස්තම්භය ෂක් ලකාන් විසින් සිය බැල්ම පිළිබඳ සාකච්ඡාවේදී විශ්ලේෂණය කළ ප්‍රසිද්ධ චිත්‍රයක් වන හන්ස් හෝල්බයින්ගේ *The Ambasdors* (තානාපතිවරු) චිත්‍රයේ[3] දක්නට ඇති, එහි පාමුල සිට ඉපිලෙමින් තිබෙන අමුතු පෙනුමැති, ආකෘතිය හඳුනාගැනීමට අපහසු, අරූපී (strange looking, hard to construe, anamorphic) වස්තුව සමග සන්සන්දනය කළ හැකිය (ලකාන් 1977). කෙසේ වෙතත්, මේ දෙක අතර වෙනස හොඳින් කැපී පෙනෙන අතර, එමගින් යටත් විජිත අවකාශය තුළ 'ආශාව' (desire) පාලනය කෙරෙන ආකාරය ගැන යමක් අපට කියාදෙයි. *The Ambasdors* චිත්‍රයට මුහුණ දී එය නරඹන්නා (viewing subject) බැල්මෙහි, එනම් චිත්‍රයේ බොහෝ කොටස් පාලනය කරනු ලබන පර්යාලෝකීය අවකාශයෙහි (perspectival space) පැටලෙන අතර, චිත්‍රයේ දක්වෙන අරූපී වස්තුව හිස් කබලක් නියෝජනය කරන බව හඳුනා ගැනීමට පොහොසත් වෙයි. එනම්, බැල්ම යනු ආශාව හැසිරවීම හා සමාජානුයෝජනය කිරීමකි. එමෙන්ම අරූපී වස්තුව භ්‍රාන්තියක් බවට පෙරළෙන්නේ හා හඳුනාගත හැකි, ඒකීය හා පර්යාවලෝකීය අවකාශයක් බවට පෙරළෙන්නේද එවැනි සමාජානුයෝජිත ආශාවක් මගිනි. හොංකොං සම්බන්ධ උදාහරණයේදී, අපට දකිය හැක්කේ ඊට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි. එවිට මේ හෝරා ස්තම්භය, හිස් කබල මෙන් නොව, *ඕනෑවටත් වඩා පහසුවෙන්* දකිය හැකි වන අතර, අධික වේගයකින් අවකාශීය සමස්තයට සමාග්‍රහණය කෙරී ඇත (හොංකොං ඉතිහාසයේ එක් අවස්ථාවක් ලෙස). යටත්විජිත බැල්ම තුළ අවකාශය සමාජාතිකරණය වී ඇති අතර 'පැරණි' හා 'නව' දේ, එකම සන්තතියක්

හා අඛණ්ඩතාවක් (congruity and continuity) ඇති කරමින් එක ළඟ තබා ඇත. එහිදී ආගාව, අවකාශීය වශයෙන් හැඩගැස්වීමකට (spatial programing) සහ සමාජානුයෝජනයකට ලක් කෙරෙන නමුත්, ඊට අපව කිසිදු පුදුමවීමකින් හෝ විරෝධතාවකින් තොරව, වඩාත් නිර්ලජ්ජාශීලී (blatant) ඛණ්ඩනයන් හා අඛණ්ඩතාවන් (discontinuities and continuities), පිළිගන්නන් බවට පත් කිරීමද ඇතුළත් ය. සංරක්ෂණය කරන ලද ඕනෑම අතීත ප්‍රතිරූපයක් ප්‍රජා ඉතිහාසයේ සලකුණක් ලෙස භාවිත වීමට ඉඩ ඇත. එවැනි අවකාශීය භාවිතයන් අතීත ප්‍රතිරූප සපයාදීම සම්බන්ධයෙන් විශේෂීකරණය වී ඇති ඩිස්නි තේමා උද්‍යානවල කෙරෙන භාවිතයන්ගෙන් වැඩි වෙනසක් නැත. එම තේමා උද්‍යානයන්ට සමාන ඒවා දූන් දූන් හොංකොංහි ආරම්භ වෙමින් පවතී. කොවුලුන්හි සුන්ග් විලේජ් සහ වඩාත් මෑතකදී විවෘත කරන ලද චීන වාස්තු විද්‍යා ස්මාරකයන්ගේ කුඩා පරිමාණයේ අනුරූ (miniatures) ප්‍රතිනිර්මාණය කෙරුණු ඕෂන් පාක් සංකීර්ණයෙහි කොටසක් වන මිඩ්ල් කින්ග්ඩම් ද එවැනි ඒවාය. මේ උදාහරණවලදී ද, සංස්කෘතික මධ්‍යස්ථානයෙහි හෝරා ස්ථම්භය සම්බන්ධයෙන් සිදුවූවාක් මෙන් මනඃකල්පිත ප්‍රජාවක් (imaginary community) විසින් පරිකල්පිත ප්‍රජාවක (imagined community) තැන හිමිකර ගනී. සංස්කෘතිය, සංරක්ෂණයක් ලෙස සැලකීම මගින් මං පාදා දෙනු ලබන්නේ, මං පාදන්නේ, ප්‍රජාව පිළිබඳ විචාරාත්මක දෘෂ්ටියක වර්ධනයට නොව, අනන්‍යතා ප්‍රතිරූප නැරඹීමෙන් සපිරි, යටත්විජිත විෂයට හිමි තැන තහවුරු කරදීමටයි.

සංරක්ෂණය පිළිබඳ දෙවන උදාහරණය නම් 1840 ගණන්වලදී අධිරාජ්‍යවාදී ශෛලියට අනුව ඉදිකළ, ෆ්ලැග්ස්ටාෆ් හවුස් නම් රමණීය ගොඩනැගිල්ලයි. ආරම්භයේදී ජාඩින්, මැත්සන් සහ සමාගමේ ප්‍රධාන කාර්යාලය ලෙසත්, ඉන් පසුව බ්‍රිතාන්‍ය හමුදා මූලස්ථානය ලෙසත් පාවිච්චි කෙරුණු මේ ගොඩනැගිල්ල පසුව බ්‍රිතාන්‍ය හමුදා ප්‍රධානියාගේ නිල නිවස

බවට පරිවර්තනය කෙරිණි. එධාත් මෑතදී, බ්‍රිතාන්‍ය හමුදා හොංකොං හැරගිය පසු, මේ ගොඩනැගිල්ලට කුමක් කළ යුතුදැයි ඇතැම් වාද විවාද පැවතිණි. අවසානයේදී ආණ්ඩුවේ වාස්තු විද්‍යා දෙපාර්තමේන්තුව තීරණය කළේ එය කෞතුකාගාරයක් බවට හරවා එහි ඉතා අනර්ඝ චීනයේ තේ පානය හා සම්බන්ධ භාණ්ඩ (tea ware) එකතුවක් තැන්පත් කිරීමටයි. එය 1984 දී සිදු කෙරුණු අතර, 1989 දී මේ ගොඩනැගිල්ල ස්මාරකයක් ලෙස නම් කෙරිණි. මේ අයුරින්, මෙම ඓතිහාසික වශයෙන් වැදගත් ගොඩනැගිල්ල බුල්ඩෝසර්වලින් බේරාගන්නා ලද අතර පොදු ජනයා ඉන් චීන සංස්කෘතිය ගැන අධ්‍යාපනයක නියැළෙයි. කොයි අතින් බැලුවත් පෙනී යනු ඇත්තේ මේ ක්‍රියාදාමය මගින් සෑම පාර්ශ්වයකටම වාසි ලැබී ඇති බව වන අතර, එහි එක්තරා සත්‍යයක් ද ඇත. කෙසේ වෙතත්, මෙහි සිතාමතා සිදු නොකළා යැයි අනුමාන කළ හැකි උපහාසයක් ගැබ්ව ඇත්තේ අදාළ දින වකවානු වන 1984 (හොංකොංහි අනාගතය පිළිබඳව චීනය හා එංගලන්තය අතර අත්සන් කෙරුණ *ඒකාබද්ධ ප්‍රකාශනයෙහි* වසර) සහ 1989 (චීනයේ ටයිනැමන් චතුරශ්‍රයේ සමූල ඝාතනය සිදුවූ වසර) වසරවල පමණක් නොවේ. තේ සහ අබිං යුද්ධය අතරත්, අවසානයේ බ්‍රිතාන්‍යයට හොංකොංහි හිමිකාරීත්වය තහවුරු කරදුන් බ්‍රිතාන්‍ය යුද බෝට්ටු මූලික රාජ්‍ය තාන්ත්‍රික සබඳතා (gun boat diplomacy) අතරත් ඇති ඓතිහාසික සම්බන්ධයත් මීට අදාළය. මෙසේ බ්‍රිතාන්‍ය මිලිටරි ආයතනයක් චීන තේ භාණ්ඩ කෞතුකාගාරයක ස්වරූපයෙන් යළි ඉපදීම (reincarnation) දහ නව වැනි සියවසේ ස්මාරකීය චනචාරීත්වයන්ට, ඒවාහි තථ්‍ය පැවැත්මට ඔබ්බෙහි වූ සෞන්දර්යාත්මක බවක් ලබාදීම (aesthetizing) මගින් ඒවා සුමට බවට පත් කිරීමකි. එනිසා ෆ්ලැග්ස්ටාෆ් හවුස් ගොඩනැගිල්ල ඉතිහාසය අතුරුදහන් වීම පිළිබඳ උදාහරණයක් ලෙස කියැවිය හැකිය. ඒ ඉතිහාසය අවසානයකට පැමිණ තිබෙනවාය යන අර්ථයෙන් නොව, එහෙත් එය එක්තරා පරමාදර්ශී

මෙහෙයුම් නිර්ණායක පද්ධතියකට අනුකූලව පවතිනවාය (persistence along certain ideological guidelines) යන අර්ථයෙනි. මෙහිදී අනුරූදහන් වීම යන්නෙන් අදහස් වන්නේ එකක් වෙනුවට අනෙකක් ආදේශ වීමයි. එනම් වරෙක හොංකොංහි අර්බුදකාරී යටත්විජිත ඉතිහාසය කෙරෙහි තිබුණු අවධානය අස්ථානගත වී, ඒ වෙනුවට චීන සංස්කෘතියට යටත්විජිත වාස්තු විද්‍යාව තුළ සුසංගතව ආදේශ වීමට ඉඩ සැලසීමය.

තුන්වැනි උදාහරණය නම් රිපල්ස් බේ හෝටලයයි. මෙම උදාහරණය පෞද්ගලික අංශයෙන් සැපයෙන නිසා, කලින් උදාහරණ දෙකට වඩා මඳක් වෙනස් බව පෙනී යා හැකි නමුත්, මෙයින් ගම්‍ය කෙරෙන දෙයද බොහෝ දුරට සංසන්දනය කිරීමේ හැකියාව පවතී. උත්තුංග අධිරාජ්‍යවාදී වාස්තු විද්‍යා ශෛලියට (grand colonial style) අනුව මුලින්ම 1920 දී ඉදි කෙරුණු මෙම හෝටලය හොංකොං හඳුනාගැනීමට ඇති ප්‍රධාන සලකුණක් නැතහොත් ප්‍රමුඛස්ථානයක් (land mark) බවට පත් විය. වෙරළ තීරය දිස්වන සේ තනන ලද ඉතා පුළුල් ආලින්දයකින් යුතු මේ හෝටලය, ඉරිදා හවස් වරුවේදී කෙරෙන මෝස්තරකාරී තේ පානය සඳහා හමුවන ස්ථානයක් විය. ඉඩම් සමපේක්ෂණය ඉතාමත් දැඩි ලෙස ඉහළ ගොස් තිබුණු 1982 වසර මුලදී මේ හෝටලය කඩා ඉවත් කරන ලද්දේ එහි සුඛෝපභෝගී කුළී නිවාස සංකීර්ණයක් ඉදිකිරීමටය. මේ කටයුත්ත සඳහා තෝරාගෙන තිබූ කාලය නොගැළපෙන එකක් නොවුණේ, එම වසර අගදී යෙදී තිබුණු මාග්‍රට් තැචර්ගේ චීන සංචාරය නිසාය. මෙහි ක්ෂණික ප්‍රතිඵලයක් ලෙස දේපොළ වෙළඳපොළේ දරුණු අවපාතයක් ඇති වූ අතර, නව නිවාස සංකීර්ණය ඉදිකිරීම ප්‍රමාද විය. සිය චිත්‍රපටයට පසුබිම් දර්ශන කිහිපයක් ලබාගැනීමට වුවමනා කළ ඈන් හුයි නම් සිනමා අධ්‍යක්ෂවරිය මෙතැනට පැමිණියේ මේ අවස්ථාවේදීය. හෝටලය තිබුණු ස්ථානයේම එහි අනුරුවක් ඉතා ඉක්මනින් ඉදි කෙරුණි. මෙය කිසිවෙකු හෝ තුළ ජනිත කරන්නට ඇති අදහස නම් හෝටලයේ පූර්ණ

අනුරුවක් ඉදිකිරීම සාර්ථක වෙළෙඳ අවස්ථාවක් බවයි. හොංකොංහි වෙළෙඳපොළ විශ්වාසය නැවතත් 1985 දී පමණ ගොඩනැගුණු විට (මුහුණ දුන් විපත්ති කුමක් වුවත් හොංකොං ආර්ථිකය මේ වන තෙක් සැමවිටම එසේ යළි ගොඩනැගී ඇත) රිපල්ස් බේ නිවාස සංකීර්ණය ඉදිකිරීමේ වැඩ නැවත ආරම්භ කෙරුණු අතර පැරණි හෝටලයේ අනුරුවක් ඉදිකිරීම ද එම සැලැස්මෙම කොටසක් ලෙස සිදු කෙරිණි. මෙම ව්‍යාපෘතිය 1989 දී සම්පූර්ණ කෙරුණු අතර, ඊට හොංකොංහි ඉහළම වාස්තු විද්‍යා සම්මානය වන, හොංකොං වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ රිදී පදක්කම ප්‍රදානය කෙරිණි. ඊට එක් හේතුවක් වූයේ, 'පැරණි' සහ 'අලුත්' දේ සාර්ථකව සමෝධානය (integration) කර තිබීමයි. කෙසේ නමුත් පැරණි හා අලුත් දේ අතර ඇති සම්බන්ධය සංස්කෘතික මධ්‍යස්ථානය සම්බන්ධයෙන් දුටු සබඳතා පරිදිම විය. ඒවා අතර ඇති වෙනස නම්, රිපල්ස් බේ නිවාස සංකීර්ණයේදී, පැරණි දේ ඉතාම පැහැදිලිවම චිත්‍රපට පසුතල ආශ්‍රයෙන් යළි සාදන (remake) ලද්දකි. නිශ්චිත අර්ථයෙන් සලකා බලන්නේ නම්, මෙම අනුරුව සංරක්ෂණය සම්බන්ධ නිවැරදි උදාහරණයක් වන්නේද නැති අතර, මේ නිදසුනේදී වඩාත් ඍජුව (explicit) ප්‍රකාශ වන්නේ කලින් සළකා බැලූ නිදසුන්වලදී වඩාත් ගම්‍යමාන ලෙස සැළකූ දේයි. එනම්, සංරක්ෂණය, ඓතිහාසික ස්ථානය (historical site) අතුරුදහන්වීම මත උපග්‍රහණය (posit) කෙරෙන ආකාරයයි.

සංරක්ෂණය පිළිබඳ මෙම උදාහරණ අර්ථවත් ඒවා වන නමුත් සංරක්ෂණය හොංකොංහි ඉදිකළ අවකාශ (built space) සම්බන්ධයන් වැදගත් සාධකයක් වීමට එතරම් ඉඩක් නැත්තේ මේ නිදසුන් මගින් අවකාශය වඩ වඩාත් වියුක්ත (abstract) සහ තේරුම්ගත නොහැකි (ungraspable) වන තරමට, එහි ප්‍රතිරූපයෙහි වැදගත්කම ඉහළ යනවාය යන තර්කය තහවුරු කරන නිසාය. ඊට අනුකූලව, අතුරුදහන්වීම පාදක වූ අවකාශයක, පූර්වාදර්ශ නොමැති (unprecedented) ඓතිහාසික සන්දර්භයක යටත්විජිතවාදීත්ව

(colonialities) දෙකක් (බ්‍රිතාන්‍ය සහ චීන) අතර සිරවෙමින් සිටින හොංකොං, අනන්‍යතා ප්‍රතිරූප ග්‍රහණය කර ගැනීමට දැඩි උත්සාහයක යෙදී සිටින්නේ එම ප්‍රතිරූප කෙතරම් ආගන්තුක (alien) හෝ ප්‍රතිමාන මූලික (cliched) දැයි නොසළකමිනි. වඩ වඩාත් බලහත්කාරයෙන් (insistently) ගෝලීයකරණය වන අවකාශයක් තුළ මැකීයාමේ තර්ජනයට මුහුණ දෙමින් සිටින ස්ථානීය හැඟීම (sense of place: එය ආරම්භ වන්නේ එතරම් ප්‍රබල හැඟීමක් වශයෙන් නොවේ) නිර්වචනය කිරීම අවශ්‍ය වේ.

සත්‍ය වශයෙන්ම, මෙහි ඇති සංකීර්ණතාව නම්, ස්ථානය (place) සහ අවකාශය, කිසිම සරල ආකාරයකින් එකිනෙකට ප්‍රතිවිරුද්ධ ලෙස සැළකිය නොහැකිවා මෙන්ම, ඒවා වෙන වෙනම සළකා බැලීම ද කළ නොහැකි වීමයි. අවකාශයෙහි වෙනස්වන ස්වභාවය (උදාහරණයක් ලෙස තොරතුරු තාක්ෂණය නිසා), අනිවාර්යයෙන්ම ස්ථානය සම්බන්ධ සංකල්පය ද වෙනස් කරන නිසා, ස්ථානය යන්න හුදු පැහැදිලිව හඳුනාගත හැකි භෞතික ලක්ෂණ සහ පිහිටා තිබීම (situatedness) ආධාරයෙන් විස්තර කිරීමට නොහැකි බව පැහැදිලිය. පෝල් විරිලෝ පෙන්වා දෙන පරිදි, නගරයේ කෙළවර හෝ සීමාව යන්නත්, ප්‍රශ්න කිරීමකට භාජනය වී ඇත (විරිලෝ 1991). ඒ නව තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මගින් හඳුන්වාදෙන ලද අවකාශය පිළිබඳ නව අදහස නිසාය. එනම්, අවකාශය එක්තරා වැදගත් තේරුමකින්, අභෞතික (non-physical) සහ නිර්විනිර්මුක්ත (dematerialized) බවට පත්ව තිබේ. ඔහු මේ කරුණු ගෙනහැරපාන්නේ දූන් කෙනෙකු වර්තමාන නගරයකට ප්‍රවිෂ්ට වන්නේ කෙසේද යන ප්‍රශ්නය අසමින් සහ සිය ප්‍රශ්නයට, වාහල්කඩකින් නොව ඒ වෙනුවට ඉලෙක්ට්‍රොනික සහභාගීවීමේ ක්‍රමයක් (electronic audinece system) මගින් යැයි පිළිතුරු දීමෙනි. වාහල්කඩෙහි ශබ්දය, දත්ත බැංකුවල ශබ්දයට (clatter of data banks) ඉඩදෙමින් පලා ගොස් ඇති අතර, නගරයේ පවුර බොහෝ කල් සිට අනන්ත විවරවීම

(infinite openings) සහ පිපිරුම් මගින් සිදුරු කරනු ලැබ ඇත (විරිලෝ 1991:13). සියලු අද්‍යතන ප්‍රධාන නගර 'අධි අනාවරණයකට' (over exposed) ලක්ව ඇති අතර, *සීමාව* යන සංකල්පය වෙනුවට ක්‍රම ක්‍රමයෙන් අතුරු මුහුණත (interface) යන්න ආදේශ වෙමින් පවතී.

හොංකොං සම්බන්ධයෙන් සලකා බැලීමේදී, එය 1841 දී බ්‍රිතාන්‍ය යටත්විජිතයක් සහ නිදහස් වරායක් බවට පත්වීම හේතුවෙන්, ප්‍රවිෂ්ට වීමේ හැකියාව (accessibility) ගැන දක් වූ දැඩි ප්‍රමුඛතාව නිසා, නගරය මුල සිටම අධි අනාවරණය සඳහා සූදානම් කෙරුණු බව පෙනී යනු ඇත. මෙසේ දැඩි ප්‍රමුඛතාවක් දැක්වීම, ඊටම ආවේණික සීමා සංශයන් (aporias) නිර්මාණය කරයි.[4] නගරයේ සිටින අති විශාල නීති විරෝධී සංක්‍රමණිකයන් සංඛ්‍යාව පෙන්වා දෙන්නේ හොංකොං සහ චීනය අතර දේශසීමාව කොතරම් පහසුවෙන් ගොඩබිම සහ මුහුදු මාර්ග ඔස්සේ විනිවිද යා හැකි ද යන්නයි. දේශසීමාව හරහා හොර බඩු ප්‍රවාහනය (smuggling) පාලනය කිරීමට ඇති දුෂ්කරතාව (උදාහරණයක් ලෙස, මෑතකදී චීනයට ගෙන ගොස් තිබූ සොරාගත් සුඛෝපභෝගී මෝටර් රථ පිළිබඳ සිද්ධිය) මගින් පෙන්වා දෙන්නේ, භෞතික වශයෙන් නගරයෙන් පිටවීම ද, එතුළට ඒම තරමම පහසු බවයි. අවසන් වශයෙන් ප්‍රකාශ කළ හැක්කේ නගරය නිශ්චිතවම ගෝලීය ප්‍රාග්ධන හා තොරතුරු ජාලවලට ඇතුළත්වීම, අවකාශය සහ ස්ථානය පිළිබඳ භෞතික හැඟීම අවප්‍රමාණය වීමෙහි (devaluation) නවතම අදියර ලෙස සරලව දැකිය හැකි බවයි.

අනෙක් අතට මෙසේ ස්ථානීය වශයෙන් සැලකීමේ වලංගුභාවය ද නව ගෝලීය අවකාශය මගින් ප්‍රශ්න කෙරෙමින් පැවතුණද, එම ගෝලීය අවකාශය පූර්ණ වශයෙන් සාර්ථක වූ තත්ත්වයක ද නොපවතී. මේ සම්බන්ධයෙන් මැනුවෙල් කැස්ටෙල්ස් විසින් ඉතා වැදගත් කරුණක් ගෙන හැර දක්වයි. එනම්, "නව තොරතුරු තාක්ෂණ මගින් සමාජ මත සහ

එනයින් නගර සහ ප්‍රදේශ මත ප්‍රධාන බලපෑම් (fundamental impacts) එල්ල කරනු ලබන නමුත් ඒවා මගින් ඇති කරනු ලබන ඵලය තීරණය වන්නේ, ඒවා කොතරම් දුරකට නිෂ්පාදනය හැඩගස්වනු ලබන ආර්ථික, සමාජීය, දේශපාලන සහ සංස්කෘතික ක්‍රියාවලීන් සමග අන්තර් සම්බන්ධතා පවත්වන්නේද යන්නත්, නව තාක්ෂණික මාධ්‍ය කොතරම් දුරට භාවිතයට ගැනෙන්නේද යන්නත් මත" බවය (කැස්ටෙල්ස්: 1989: 2). වෙනත් වචනවලින් කියනවා නම්, අතුරුදහන් වීම මත ගොඩනැංවීම පිළිබඳ ප්‍රශ්නයකදී වුවත්, සලකා බැලිය යුතු විශාල පරාසයක පැතිර පවත්නා අවකාශීය සහ ඓතිහාසික සම්මුතිගතවීම් (mediations) සමූහයක් ඇති අතර, එමගින් ඉදිකළ අවකාශයෙහි දේශපාලනය පිළිබඳ සාකච්ඡාවකට ද ඉඩ සලසයි. මෙමගින් ප්‍රකාශ වන්නේ වාස්තු විද්‍යාව එය නිෂ්පාදනය වූ අවකාශීය හෝ මතවාදී සන්දර්භයෙන් (spatial or ideological context) වෙන් කළ නොහැකි බවයි.

මීළඟට මා සැරසෙන්නේ හොංකොංහි නාගරික අවකාශය සම්බන්ධයෙන් මාගේ ස්වචාරී අදහස් (ideosyncratic) කිහිපයක් ගෙනහැර පෑමටයි. සුවිශේෂ ගණයේ යටත් විජිත අවකාශයක් වන මෙය මා නම් කරන්නේ අවකාශීය දේශපාලනය ගැන කෙරෙන කතිකාවකට අවශ්‍ය ප්‍රාරම්භයක් වන අතුරුදහන් වීමේ අවකාශයක් ලෙසයි.

## අවකාශීය ඉතිහාස

පෝල් විරිලියෝගේ රචනාවල අතුරුදහන්වීම සම්බන්ධ න්‍යායාත්මක අනුමිතීන් (theoretical implications) වඩාත් ගැඹුරින් අධ්‍යයන කෙරී ඇති අතර, ඒවාහිදී අතුරුදහන් වීම යනු වේගය සහ ඩිජිටල්කරණය (speed & digitalization) සම්බන්ධ ක්‍රියාදාමයන්ගේ ආනුෂංගික ඵලයන් (consequences) ලෙස, ආකෘතීන්ට සහ රූපයන්ට (forms & figures) ඒවා චිත්‍ර, මූර්ති, ඒක

ශෛල (monolith) හෝ වාස්තු විද්‍යාත්මක ගොඩනැංවීම වුවත්, සිය භෞතික මානයන් (physical dimensions) අහිමි කර දැමීමේ ක්‍රියාවලියකි. "පෙර පැවති, සාදෘශ්‍ය (analogy) සහ ස්ථිතික (static) ස්වභාවය බල පැවැත්වූ ස්ථාවර ප්‍රතිරූප පාදක (stable images of static nature) දිස්වීම පිළිබඳ සෞන්දර්ය (aesthetic of appearance) වෙනුවට අද අපට ඇත්තේ, සංඛ්‍යාත්මක (numerical), ඉපිලෙන ස්වභාවය බලපවත්වන අස්ථාවර ප්‍රතිරූප (unstable images of fleeting nature) පාදක, අතුරුදහන්වීම පිළිබඳ සෞන්දර්යයක් (aesthetic of dissappearance) වන අතර, ඊට ඇත්තේ සම්පූර්ණයෙන්ම විතංස (retinal) පැවැත්මකි" (විරිලියෝ 1991: 36). කෙසේ වෙතත්, හොංකොං ගැන සලකා බැලීමේදී නම්, අතුරුදහන් වීමේ අවකාශය, සුවිශේෂී ස්වදේශීය සහ ඓතිහාසික සබඳතා මත පදනම් වන බවත්, එනිසාම ඒ ගැන වෙනත් ආකාර කිහිපයකින් ද සංකල්පනය කළ හැකි බවත් පෙනී යයි.

ප්‍රථමයෙන්ම, අතුරුදහන්වීම, මෑතදී හටගත් එක්තරා සංස්කෘතික සහ දේශපාලන මනෝභාවයන් ආශ්‍රයෙන් සලකා බැලිය හැකිය. අතුරුදහන්වීම හා සම්බන්ධ එක්තරා ඉහළ උභයාර්ථීත බවක් ඇත. හොංකොං නැවත චීනයට භාර දුන් පසු හොංකොං ජීවන රටාව නැති වී යනු ඇතැයි පවතින කාංසාව වැනි පටු අදහසක් මින් ගම්‍ය නොකෙරෙයි. මෙහි අර්ථය නම්, කොටින්ම කියතොත්, මහා ඓතිහාසික ව්‍යසනයක් ඇතිවනවා යන්න නොව, ඊට වඩා දෙපැත්ත කැපෙන ලෙස (double edged), සත්‍ය හෝ මනඃකල්පිත ව්‍යසනයක් ඇති වීමේ උවදුරට මුහුණ පා සිටින මොහොතක, දේශීය සංස්කෘතිය සහ දේශපාලනය කෙරෙහි පූර්වාදර්ශයන්ගෙන් මුක්ත සහ බොහෝ විට අලුතින් ඇති කරගන්නා ලද කැමැත්තක් (new found interest) දක්වන අකාරයයි. එක් වැදගත් කරුණක් යළිත් කියන්නේ නම්, 'හොංකොංහි අවසානය' (end of Hong Kong) යන්න මගින්, එහි ඓතිහාසික සහ සංස්කෘතික සුවිශේෂතාව කෙරෙහි දැඩි

උනන්දුවක් ඇති කෙරේ. මෙම තත්ත්වය හොංකොංහි පූර්ණ වශයෙන්ම පාහේ සාර්ථක ආර්ථික ජයග්‍රහණයට වගීවීම කෙරෙන් මදක් වෙනස්වීමකි. මෙය නියමාකාරයෙන්ම අතුරුදහන්වීම මත පදනම් වූ සංස්කෘතියක් වන්නේ එහි දිස්වීම (appearance) සිදුවන්නේ නුදුරේදීම විය හැකි අතුරුදහන්වීම සමග අත්වැල් බැඳගෙන එන්නක් ලෙසින් වීම සහ එහි උත්පාදක හේතුවම (cause of emergence) එහි අභාවයට ද හේතු කාරක විය හැකි නිසාය. මෙය නියමාකාරයෙන්ම අතුරුදහන්වීම මත පදනම් වූ සංස්කෘතියක් වන්නේ හොංකොං චීනයට භාර දීමත් සමගම (1997 දී) මෙම අනන්‍යතා ප්‍රතිරූප වැළඳ ගැනීමට බලපෑ හේතුවම එම සංස්කෘතියේ අභාවයට ද හේතු කාරක විය හැකි නිසාය. අතුරුදහන්වීම සම්බන්ධ මෙම කනගාටුදායක තත්ත්වය, දුම්වැටි සමාගමක් මගින් හිතාමතාම නිර්මාණය කළ එක්තරා ප්‍රචාරක දැන්වීමක් සමග සන්සන්දනය කළ හැකිය. ඔවුන් විසින් කරන ලද්දේ ප්‍රසිද්ධ ස්ථානයක "No Smoking; Not Even Viceroy"[5] යන දැන්වීම ප්‍රදර්ශනය කිරීමයි. මේ අවස්ථා දෙකේදීම, නිෂේධනීය හෝ අවම වශයෙන් එසේ තේරුම්ගනු ලබන තත්ත්වයක් මගින් උසිගන්වනු ලබන්නේ දුම්බීම සඳහා හෝ අනන්‍යතාව සම්බන්ධයෙන් ක්ෂණික ආශාවකි. 'හොංකොං සංස්කෘතිය' සම්බන්ධයෙන් එවැනි හැඟීමක් ඇතිවීම මගින් එහි වාස්තු විද්‍යාව සහ පැරණි ගොඩනැගිලි සංරක්ෂණය ගැන උද්යෝගයක් අවශ්‍යයෙන්ම වර්ධනය වනු ඇති නමුත්, එවැනි උද්යෝගයක් ස්ථානගත කිරීමට සිදුවනු ඇත්තේ අතුරුදහන්වීම පිළිබඳ අවකාශයක් තුළයි.

අතුරුදහන්වීම පිළිබඳ දෙවැනි තේරුමකින් සලකා බැලෙන්නේ *නියෝජනය* (representation) පිළිබඳවය. අතුරුදහන්වීමේදී, නගරය සහ එහි නියෝජන අතර පරතරයක් (gap) හෝ පමාවක් (hysteresis) පවතී. එනම්, නගරයක අසංතුලිත ඓතිහාසික ඉරණම (city's erratic historical futures) සහ සිය ගමන් මග නවීකරණය, පරායත්තතාව (dependency) හෝ සංවර්ධනය

වැනි, එවක පවතින ආදර්ශ (models) ආශ්‍රයෙන් විස්තර කිරීමට යාමෙන් ඇතිවන පරතරයයි. නගරය දිස්වීමට සලස්වා ඇති බොහෝ නිරූපණ මඟින් ඇත්තටම සිදුවන්නේ ඒවා නොපෙනී යාමයි. නිරූපණය සහ අතුරුදහන්වීම අතර ඇති මෙම ප්‍රතිවිරුද්ධ සම්බන්ධතාව පැහැදිලි කිරීම සඳහා මම උදාහරණ දෙකක් ඉදිරිපත් කරමි. ඉන් එකක් සාධනීය (positive) වන අතර, අනෙක නිෂේධනීය (negative) එකකි.

හොංකොං පෙරදිග හා අපරදිග (east-west) එක් කරන නගරයක් ලෙස එනම්, සම්ප්‍රදායන් සහ නූතනත්වය, මතකය සහ ආශාව මෙන් එකිනෙක හා මුහුවන තැනක නිරූපණයක් ලෙස සලකා බලමු. නූතනවාදී ලෙස නිමවූ උස ගොඩනැගිලි පසුබිම් කොටගෙන, හොංකොංහි වික්ටෝරියා වරායේ නැංගුරම් ලා ඇති චීන රුවල් නැව් සහිත දර්ශනයේ, අපට මෙම හොංකොං සම්බන්ධයෙන් පවතින ඉතාමත් ස්ථාවර අදහස සුරක්ෂිතව තහවුරු වී ඇති ආකාරය දැකගත හැකිය. මෙම රූපය සරුව පිත්තල (kitsch) හා ඒකාකෘතික (stereotypical) බව ඉක්මවා ගොස් ඇති අතර, නාගරික මූලාකෘතික (urban arche type) තත්ත්වයට ඉහළ ගොස් සහ ඉහළ දමනු ලැබ ඇත. අප මේ පින්තූරය නොගිණිය හැකි තරම් තැපැල් පත් මත දකිනවා පමණක් නොව, ශෛලීකෘත (stylized) චීන රුවල් බෝට්ටුවක්, හොංකොං සංචාරක සංගමයේ නිල ලාංඡනය ලෙස ද තෝරාගෙන ඇත. මෙහිදී අදාළවන ප්‍රශ්නය නම්, එම ප්‍රතිරූපය මඟින් හොංකොං 'වැරදි ලෙස අර්ථකථනය කරනවාද' (හොංකොං ඇත්තෙන්ම ලොව විශාලතම චීන නගරය (China Town) පමණක් නොවන්නේද?) යන්න නොවේ. මෙහිදී සාකච්ඡාවට ගත යුතු කරුණ නම්, බ්‍රිතාන්‍ය පරිපාලනය සහ චීන ව්‍යවසායකත්වය සුමටව ආරෝපණය කිරීමට උදව් දෙන ආඛ්‍යානයක් (narrative) වර්ධනය කිරීම සඳහා හොංකොං වාස්තු විද්‍යාව සහ නාගරික අවකාශය පිළිබඳ ප්‍රතිරූපයක් යොදාගන්නේ කෙසේද යන්නයි. එවැනි ආඛ්‍යානයක් මඟින්, සන්නිරීක්ෂණයට

(scrutiny) මුහුණදීමට තරම් ප්‍රබල නොවන, ජනවාර්ගික සහ මානසික (psychologistic) පදනමකින් යුත් උපකල්පන ද ඇති කරනු ලබයි: හොංකොං වැසියෝ ස්වභාවයෙන්ම මහන්සි වී වැඩ කරන්නෝය (hard working) යන ආධානිය (dogma), ඔවුන් සිය ජානමය ආකෘතිය (genetic design) මගින්ම තදබදය යටතේ ජීවත්වීම ඉවසීමට හැකිවන සේ හැඩගැසී ඇති බව, ඔවුන් මුදල් සඳහා ඕනෑම දෙයක් කරනු ඇති බව එවැනි ඒවාය.

මේ ආඛ්‍යානයන්ගෙන් පිටතට එබී බලන විට පෙනී යන්නේ, ස්වකීය ප්‍රතිබිම්බයන්ම පමණක් දකින, එහි හුදු පදගතාර්ථයට අනුව, සෑම තැනම මූලිකත්වය ගන්නේ ආර්ථිකයයි යන්න තහවුරු කරන ප්‍රධාන කතිකාවක් (master discourse) දැකගත හැකි බවයි. මෙය මවිසින් අනෙකුත් සෑම තැනකදීම පරිභානීය එකකැයි හඳුන්වනු ලැබූ කතිකාවකි. මෙම කතිකාව මගින් සංකීර්ණ අවකාශයක් පටු ද්වංගිකත්වයක් (facile binarism) මත පදනම් වූ ඒකමානීය (single dimensional) ප්‍රතිරූපයක් බවට සංකෝචනය කර දැමීමට හැකියාව ලැබෙයි. එවැනි ද්වයංගිකත්වයක් මගින් වෙනස්කම් හිලෑකොට වෙනස්වීම ප්‍රතිස්ථායිකරණය (restablized change) කිරීමට පෙලඹෙනවා පමණක් නොව, අවකාශීය වස්තු විෂයන් (spatial issues) මගහරිමින් මෛථුන්‍යයේ යෙදෙන ප්‍රතිමාන (copulation of cliches) පමණක් ලබාදෙයි (ව්ලද්මීර් නොබොකොෆ් ලිංගික රචනා (pornography) ගැන ඉදිරිපත් කර ඇති විශිෂ්ට නිර්වචනයෙන් කියැවෙන්නේ ද මෙයමය).

දැන් හොංකොං නිෂේධනාත්මකව නිරූපණය වූ අවස්ථාවක්, එනම් ඉතා පැහැදිලි තත්ත්වයක් වන, හොංකොං නගරය යටත්විජිතයක් සහ බ්‍රිතාන්‍ය මත යැපෙන ප්‍රදේශයක් වීම, පිළිබඳ තත්ත්වය සළකා බලමු. බ්‍රිතාන්‍ය සිය වාසස්ථානය කරගැනීමට අයිතිය ලැබෙන පරිදි, බ්‍රිතාන්‍ය ගමන් බලපත්‍රය නිකුත් කිරීම, හොංකොං ප්‍රභවයකින් යුත් බ්‍රිතාන්‍ය පුරවැසි වරම සාපේක්ෂව අඩු පිරිසකට සීමා කිරීමට බ්‍රිතාන්‍ය මෑතකදී ගත් තීරණය හරහා යටත් විජිත

මානසිකත්වය සිහින්ව ක්‍රියාවේ යෙදෙන ආකාරය පෙනෙනවාය යන්න සත්‍යයක් වන නමුත්, සමස්තයක් ලෙස ගත් කල, හොංකොං, බ්‍රිතාන්‍ය යටත්විජිතයක් බවට පත්වීම සාපේක්ෂ වශයෙන් වාසිදායක වූ බව මතුපිටින් බැලීමේදී පෙනී යනු ඇත. කෙසේ වෙතත්, මෙසේ කීම මගින් අදහස් කෙරෙන්නේ, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ඉතිහාසයට සුදු හුණු ගෑමට හෝ අබිං යුද්ධ අමතක කිරීම නොවේ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට, හොංකොං සූරා නොකෑ බවට සාධාරණ වාර්තා පෙන්විය හැකිනම්, ඒ බොහෝ දුරට එහි සූරා කෑ හැකි යමක්, එනම් භෞතික සම්පත් හෝ 1949න් පසු හොංකොං චීන සරණාගතයන්ගෙන් පිරී ඉතිරී යන තෙක්, මානව සම්පත් හෝ නොතිබුණු නිසාය. මේ සාධක හේතුවෙන් හොංකොංහි තත්ත්වය බ්‍රිතාන්‍යයන් යටතේ ඉන්දියාවේ පැවති තත්ත්වයට වඩා බෙහෙවින් වෙනස් බව පෙනී යන අතර එය යැපීම් න්‍යාය (dependency theory) ආශ්‍රයෙන් වඩා පහසුවෙන් විස්තර කළ හැකි තත්ත්වයකි. හොංකොං සම්බන්ධයෙන් සළකා බැලීමේදී පෙනීයන්නේ, ඒ සතුව ප්‍රමාණවත් තරම් සම්පත් හෝ සිය ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට මාර්ගයක් නොතිබීම, කුතුහලය දනවන ආකාරයට, ඊට වාසි සහගත සාධකයක් වූ බවයි. ඉන් අදහස් කෙරුණේ හොංකොං වරාය නගරයක් ලෙස සංවර්ධන කිරීම මගින්, එනම් යටිතල පහසුකම්, අධ්‍යාපනය, අන්තර්ජාතික සබඳතා ආදිය වර්ධනය තුළින්, සියලු පාර්ශ්වයන්ට වාසි අත්කරගත හැකි වන බවයි. මෙය ආක්‍රමණිකයා සහ යටත් වැසියා යන දෙපාර්ශ්වයටම එකඟතාවකට පැමිණීමට හැකි වූ තත්ත්වයක් වන අතර, එය හුරුබුහුටි සමරූප්‍යතාවක් හෝ රහස් එකඟතාවක් (collusion) වුවත්, මෑතක් වන තුරුම දේශපාලන අයිතීන් සහ 'ප්‍රජාතන්ත්‍රවාදය' ඉල්ලා සිටීම සාපේක්ෂ වශයෙන් අඩුවීමට බලපෑවේය. හොංකොං සම්බන්ධයෙන් අප නැවත නැවතත් දකින්නේ සම්පත් මඳ බව සහ පරාධීනත්වය වාසිදායක ලෙස ක්‍රියා කරන ලද ආකාරයයි. නිදසුනක් දක්වතොත්, හොංකොං විජිතය රෙදි

නිෂ්පාදන කර්මාන්තයට පිවිසි විට, ඊට තායිවානයට සහ කොරියාවට වඩා විශාල අන්තර්ජාතික වෙළෙඳපොළක් වර්ධනය කර ගැනීමට හැකි වූයේ වඩා විශාල ජනගහනයක් සහිත ඒ රටවල්වලට මෙන් නොව හොංකොං හි කැපී පෙනෙන දේශීය වෙළෙඳපොළක අඩුව නිසාවෙනි. නගරයේ ඉදිරි ගමන සිදුවූයේ ස්වාධීනත්වය දිශාවට නොව, සැමවිටම අධිපරාධීනත්වය (hyperdependency) දිශාවටය. හොංකොං යටත් විජිතයක්යැයි කීම බොහෝ දුරට වැරදි අර්ථකථනයක් නොවුණත්, එමගින් පරාධීනත්වය ලලිත කලාවක් (a fine art) බවට හරවනු ලැබ ඇති ආකාරය නොසලකා හරිනු ලබයි.

මේ උදාහරණ හරහා හොංකොං කුමන අවස්ථාවේදී එහි සංස්කෘතික නිරූපිතයන් (cultural representations) අභිභවා ගියේද යන්න ප්‍රකාශ වන්නේ නැති නමුදු, අඩු තරමින් එය සිටියේ යැයි නිරූපිත තැන මෙන්ම වෙනත් තැනකද එක්තරා කාලයක් ගත කරනු ලබනු ඇති බව අපට කියා දෙයි. ලොස් ඇන්ජලීස් හෝ ටෝකියෝ වැනි අනෙකුත් නගර ඉදිකර ඇත්තේ භූමි කම්පා ඇතිවන ප්‍රදේශ තුළ (seismic fault lines) හෝ ගිනි කඳු පුපුරා ගොස් සෑදුණු පස් තට්ටු මතය. හොංකොං ඉදිකරනු ලැබ ඇතැයි පෙනෙන්නේ එහි පාලනයෙන් ඔබ්බෙහි වූ ඒ ඒ යුග සහ බලපාන තත්ත්වයන් සහ සිද්ධීන්ට උපයෝගතානුරූපීව අනුගත වීම (pragmatic accomodantion to events) මගින් හැඩගස්වනු ලැබූ භූගෝලීය හා සහ ඓතිහාසික අහම්බයන්ගෙන් සෑදුම් ලත් අවිනිශ්චිතතාව මතය. අප නගරය වර්ගීකරණය කිරීමට වඩ වඩාත් උත්සාහ කරන තරමට, එය පවතින ප්‍රවර්ගයන්ට සමච්චල් කරමින්, එහි දැවැන්ත පෙනී සිටීම ද (overwhelming presence) නොතකා සුවිශේෂී ගණයේ අදෘශ්‍යමාන (invisible) නගරයක්ව පවතී. එය පෙනී සිටින්නේ අතුරුදහන් වන මොහොතේදීය (පළමු අර්ථය). නැතහොත්, පෙනී සිටීමට හෝ නිරූපණය වීමට සැලැස්වීමේදී එය අතුරුදහන් වෙයි (දෙවන අර්ථය).

තවද, දිස්වීම සහ අතුරුදහන්වීම පිළිබඳ උභයාර්ථ විනිවිද ගිය විට හැමවිටම ඇත්තේ සුවිශේෂ ඓතිහාසික අවස්ථාවකි (එය එසේ නොවිය හැක්කේ කෙසේද?). එමගින් අතුරුදහන්වීමේ අවකාශයක් සංකල්පීයකරණය (conceptualization) සඳහා තුන්වැනි ආකාරයක් ද යෝජනා කෙරෙයි. එනම් ඓතිහාසිකව නිෂ්පාදිත අවකාශයක් ලෙසයි. කෙසේ වෙතත් මෙසේ ප්‍රකාශ කිරීම මගින්, කොතරම් විකෘති කිරීම්වලට සහ වෙනස් කිරීම්වලට (twists & turns) ලක් කරනු ලැබුවද, නිශ්චිත අර්ථයක් දිය හැකි (definitive) ඓතිහාසික ආඛ්‍යානයක් පවතිය යන්න ගම්‍ය කිරීමට අදහස් නොකෙරේ. අතුරුදහන්වීම පිළිබඳ ඉතිහාසයක් සාකච්ඡාවට භාජනය කළ හැක්කේ අතුරුදහන්වීම සම්බන්ධ ගැටලු විශ්වයක් (problematic) හරහාම පමණක් වන්නේ, අතුරුදහන්වීමේ අවකාශයකට හුරු පුරුදු නිරූපණ මගහැර යා හැකිනම්, ඊට ඓතිහාසික විස්තර කිරීම් ද (historical descriptions), මගහැර යා හැකි හෙයිනි. එනයින්, හොංකොංහි ඉතිහාසය සහ අවකාශය අතර ඇති සංකීර්ණ සම්බන්ධතාව ගැන යමක් ප්‍රකාශ කිරීමට ඇති අවශ්‍යතාව නිසා, එනම්, අවකාශීය ඉතිහාස (spatial histories) ගැන කතා කිරීම නිසා, එවැනි ඉතිහාස මගින් යටත් විජිතවාදය හෝ පශ්චාත් යටත් විජිතවාදය ගනු ලබනවා ඇති ආකෘති ගැන තිබෙන ඇතැම් පොදු උපකල්පන (common assumptions) වෙනස් කිරීමට පොලඹවනු ලබනු ඇතැයි කොහෙත්ම සිතිය නොහැකිය. මා පෙන්වාදීමට උත්සාහ කර ඇති පරිදි නව හොංකොං සිනමාව සතු වරප්‍රසාද ලත් තත්ත්වයට හේතුව, ඉතිහාසය, අවකාශය සහ සංවේදනාත්මකතාව (affectivity) එකිනෙක සම්බන්ධ කිරීමට ඊට ඇති හැකියාවයි.

අතුරුදහන්වීමේ අවකාශයක්, එය ඓතිහාසිකව නිරූපණය (historically represent) කිරීම සුවිශේෂී ආකාරයකින් අභියෝගයට ලක් කරන්නේ, එවැනි අවකාශයකට ඕනෑම ආකාරයේ විස්තරයකට ඉතා පහසුවෙන් හැඩගැසෙමින් එම අවකාශය විස්තර කිරීමට ඉතා අපහසු බවට පත්වීමට

ඇති හැකියාව හේතුවෙනි. එවැනි අවකාශයක් ඉතා වේගයෙන් ප්‍රතිරූප ජනනය කරන නිසාවෙන් එය න-විස්තරයක් (nondescript) බවට පත්වෙයි. නිදසුනක් ලෙස, ඇලැන් රොබ් ග්‍රියේගේ උපහාසාත්මකව හොංකොංහි ස්ථානගත කරන ලද, ඉතා සැලසුම්සහගතව යථාර්ථ විරෝධී (antirealistic) සහ න-ඓතිහාසික (nonhistorical) සිනමා පඨිතයක් වන *La Maison de rendez vous* හි පවා නගරයෙහි ඓතිහාසික ගුණය ගැන යමක් දැකිය හැකිය (රොබ්-ග්‍රියේ 1966). එය සමස්තය මගින් මනස්සාෂ්ටිය තියුණු කරනු ලබන අතර, සව්‍ය සංවාස (promiscuous) ප්‍රතිරූප ජනනය කරයි. අපට එවැනි න-විස්තර අවකාශයක් මෙවැනි ගුඪ එකෙකැයි සිතිය හැකියඃ එනම් එය පාලන නීතිරීති සහ සීමා ඉවත් කරනු ලැබූ (deregulated) කිසියම් හෝ ආකාරයකින් සිය සාමාන්‍ය ක්‍රම සහ අන්තර්සම්බන්ධිතතාව (usual systems and interconnectedness) අභිමිව ගිය සාමාන්‍ය, එදිනෙදා අවකාශයකි. එවැනි අවකාශයක් හමුවේ සියලු විස්තර කිරීම් පරාජය වී යන්නේ, එම අවකාශය අපැහැදිලි නිසා කිසිදු ප්‍රවර්ගයක් ඒ හා නොසැසඳෙන නිසා නොව, එය අධි-පැහැදිලි (hyper legible) සහ සියලුම ප්‍රවර්ග, ඒවා සමාජීය විද්‍යාවන්ට, සංස්කෘතික විචාරයට හෝ ප්‍රබන්ධකරණයට අයත් ඒවාද යන්න ද නොතකා, එම අවකාශය හා සැසඳෙන නිසාවෙනි. එනිසා නගරයේ ලක්ෂණ ග්‍රහණය කර ගැනීමට උත්සාහ කරන ඕනෑම විස්තරයකට, අඩු තරමේ එක්තරා දුරකටවත් ඇතැම් විට ජෝර්ජ් ලුවිස් බෝර්ජෙස්ගේ *Emma Zuns* කෙටිකතාවේ මෙන්, කරුණු සහ ප්‍රබන්ධ අතර (between fact & fiction), විසිරී යන්නට සිදු වේ. පවතින්නේ මෙවැනි තත්ත්වයක් නම්, නගරයට ක්‍රමික කියවීමක් ලබාදීමෙන් අවසන් වන ආකාරයේ ඒක මනෝමය (single-minded) සංඥාර්ථ ගවේෂණයක් තිබිය නොහැකි අතර, ඒ වෙනුවට අවශ්‍ය වන්නේ, නගරයෙහි ලිහිල් බව සැලකිල්ලට ගන්නා සහ එහි විෂමජාතීත්වයට (heterogeneity) ආමන්ත්‍රණය කරනු ලබන, අතුරුදහන්වීම පිළිබඳ දර්ශකවල (න-විස්තරය වැනි) එකතුවකි.

අතුරුදහන්වීම පිළිබඳ අවකාශීය ඉතිහාසයක් මගින් ප්‍රයත්න දරෙනු ඇත්තේ, ඊට නගරය නියෝජනය කළහැකි යැයි කියා සිටිනවා වෙනුවට, නගරය සැබැවටම කුමක් වැනි ද යන්න ගැන නිශ්චිත වාර්තාවක් ලබාදෙනවාය යන තේරුමෙන් නගරය උද්දීපනය (evoke) කිරීමටයි.

හොංකොං පිළිබඳව ලියැවී ඇති ඉතිහාස මගින්, සංඛ්‍යානමය දත්ත ආශ්‍රයෙන් පැවසෙන්නේ, හොංකොං විජිතය භෞතික අංශයෙන් අත්පත් කරගෙන ඇති ක්‍රමික සංවර්ධනය පිළිබඳ කතා පුවතයි. මෙහිදී සාකච්ඡාවට බඳුන් විය යුතු කරුණක් නම්, වඩාත් දේශපාලනික වශයෙන් සවිඥානිකව මෑතදී ලියැවුණු ඉතිහාස අවධාරණය කරන්නේ හොංකොං විජිතයෙහි ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ඇත්තේ සාපේක්ෂ වශයෙන් අඩුවෙන් බවත්, ඒ සතුව ස්වයං නිර්ණ අයිතිය නැති බවත්ය. එවන් ප්‍රකාශ එක් මට්ටමකදී වලංගු වුවත්, ඒවා තවදුරටත් යෝග්‍යකරණයට (qualify) භාජනය කළ යුතු වන්නේ, විජිතයෙහි අනාගත ගමන්මග විසින් අනුගමනය කෙරෙන්නේ හුදු සංවර්ධනය පිළිබඳ තර්කයක් හෝ පීඩනය (oppression) පිළිබඳ තර්කයක් පමණක් නොව, එහෙත් හිඟ බව (lack) සහ පරාධීනත්වය (dependency) ත් කිසියම් හෝ ආකාරයකින් වාසිදායක විය හැකි වන ආකාරයේ වඩාත් උභතෝකෝටික අවකාශීය තර්කයක් (more paradoxical spatial logic) ද වන හෙයිනි.

උදාහරණයක් දක්වතොත්, අවසන් වරට කෙරුණු සංගණනයේ දත්තයන්ට අනුව, හොංකොං ලොව අටවැනි විශාලතම වෙළෙඳ ජාතියයි (trading nation). දැන් එය පාමස්ටන් විසින් කරන ලද 'ඒ මත එකදු නිවසක් හෝ නැති තරමවන මුඩු දූපතකි' යන ප්‍රසිද්ධ විස්තරය කරන ලද යුගයේ සිට බොහෝ දුරක් ඉදිරියට පැමිණි අන්තර්ජාතික නගරයකි (අබ්බාස් 1997). එහෙත් මෙම භූමිකාව මගින් ගම්‍ය කෙරෙන සියලු අසන්තතාවයන් ද සමගින්, තවදුරටත් වචනයේ අර්ථයෙන්ම වරායක් ලෙස පැවතීමට හොංකොං නගරය සමත් වී ඇත. එනම්, දොරටුවක්, එළිපත්තක්, භාණ්ඩ,

මුදල් සහ තොරතුරු ගලායන නාලිකාවක් ලෙසිනි. එය එක්තරා ආකාරයක නිශ්පන්ද ලක්ෂයක් (nodal point) ලෙස අතරමැද අවස්ථාවක පවතින හෙයින් හොංකොං *අන්තර්ජාතික* (international) නගරයකට වඩා *අන්තර්-ජාතික* (inter-national) නරගයකි. වර්තමානය වන විට මෙම වරායෙහි හෝ පිවිසුම් මගෙහි (gateway) ස්වභාවය වෙනස් වී ඇති බව නම් සත්‍යයක් වන අතර ඉන් ඇඟවෙන්නේ හොඳ වරායක් පමණක් නොව කාර්යක්ෂම සන්නිවේදන ක්‍රමයක් ද එහි පවතින බවය. වරායෙහි ස්වභාවය වෙනස් වී තිබිය හැකි නමුත්, වරායක් ලෙස හොංකොං නගරය වෙනස් වී නැත. අන්තර්ජාතික නගර වන නිව්යෝක්, ලන්ඩන් හෝ ටෝකියෝ හා හොංකොං අතර ඇති අසමානතාව නම්, ඒවා එම ප්‍රදේශයෙහි කේන්ද්‍ර වන අතර, භාණ්ඩ හා සංස්කෘතික නිෂ්පාදනයෙහි මධ්‍යස්ථාන ද වන මුත් හොංකොං මූලික වශයෙන්ම සුසාධ්‍යකරණය (facilitation) සඳහා වන අවකාශයකි. එය බිම් කඩකට (site) වඩා පාර-බිම් කඩකි (para-site). එනම්, සිය ප්‍රදේශය තුළ බලවත් වීමට හොංකොං නගරයට බලපාන ප්‍රධානතම හේතුව, එය බාහිර ලෝකයට ප්‍රවිෂ්ට වීමේ පහසුකම් ද සහිතව, චීනයට භූගෝලීය වශයෙන් ආසන්නව පිහිටා තිබීමයි. එවන් සුවිශේෂී (unique) භූගෝලීය පිහිටීමක් හේතුවෙන් පැනනගින ආර්ථිකමය ඉඩ ප්‍රස්තා පහසුවෙන්ම දැකගත හැකිය. එහෙයින් පාර-බිම් කඩක් යන්නෙන් එක්තරා අපූර්ව ආකාරයකින් අඟවනු ලබන්නේ, ස්වාධීනත්වය (autonomy) එකිනෙක පරස්පර ආකාරයකට පරාධීනත්වයෙහිම කෘත්‍යයක් වන, ස්වාධීන මෙන්ම පරාධීන ද වන තත්ත්වයකි.

අන්තර්-ජාතික නගරයක සහ පාර-බිම්කඩ නගරයක, කාලය සහ කලානුක්‍රමය (chronology) පිළිබඳ හැඟීමට කිසියම් වෙනසක් සිදුවෙයි. හොංකොංහි අවකාශය ගොඩනැගී ඇති ආකාරය යළිත් වරක් සලකා බලමු. හුදෙක් වේගයෙන් වෙනස්වීමට භාජනය වීමේ පමණක් නොව, සිය අපිකේන්ද්‍රයන් (epecenters) වෙනත් තැනෙක ස්ථානගත වූ ඓතිහාසික

සිදුවීම නිසා ඇති කෙරුණු වේගවත් කරන ලද වෙනස්වීම ද (accelerated rate of change) හේතුවෙන්, හොංකොං මේ වන විට වෙනස්වීමට සහ 'ප්‍රගමණයට' (progress) හුරු වී තිබේ. මෙය ජියානෝ වතිමෝ විසින් ඉතිහාසයෙහි අවසානය' (end of history) අත්දැකීම ලෙස විස්තර කරන තත්ත්වයට මනා උදාහරණයක් ලෙස දැක්විය හැකිය. මේ තත්ත්වයේදී සිදුවන්නේ, 'ප්‍රගතිය අකාරිකයක් (routine) බවට පත්වීම' වන අතර ඉන් 'ප්‍රගතිය' සමාජයට උරානොගන්නේය යන්න නොව ප්‍රගතිය අත්කරගන්නා බව අවබෝධ නොවන්නේය යන්න ගම්‍ය කෙරෙයි (වතිමෝ 1988:7). කෙසේ වෙතත්, මෙවැනි අකාරිකයනයක (routinization) එක් ඉතා වැදගත් ප්‍රතිඵලයක් නම්, කාලානුක්‍රමය සහ ඓතිහාසික අනුක්‍රමිකතාව (historical sequentiality) පිළිබඳ හැඟීම දුර්වල වීමයි. එවිට 'පැරණි' සහ 'අලුත්' දේ ඉතා පහසුවෙන් තත්කාලීන දේ බවට පත්වන අතර, සන්තතීන් (continuations) සහ අසන්තතීන් (discontinuations), *එකක් විසින් අනෙක අන්තර්ග්‍රහණය කරගැනීමකින් තොරව, එකිනෙක සමීපයෙහි එකට පවතියි.* ඇතැම් විට, මෙය වඩාත්ම ප්‍රබලව සංකේතකරණය (symbolization) වී ඇත්තේ සිනමාවේය. විශේෂයෙන්ම, ස්ටැන්ලි ක්වාන්ගේ *රූෂ්* (Rouge) චිත්‍රපටයේ එන, සෑම වසර පනහකටම වරක් සිය පෙම්වතා සොයා, ගල්ගැසී සිටින රූප රාමුවෙන් එළියට එන ස්ත්‍රී හොල්මන, මේ සම්බන්ධයෙන් දිය හැකි කදිම උදාහරණයයි. එනමුත් ඒ ගැන වෙනත් නිදසුන් ද සැපයිය හැකිය. නෝමන් ෆොස්ටර් විසින් සැලසුම් කළ අභ්‍යවකාශ යුගයේ අමුද්‍රව්‍ය යොදා ඉදිකරන ලද හොංකොං ෂැන්හයි බැංකු ගොඩනැගිල්ල ද ඇතුළුව, ඕනෑම දැවැන්ත ඉදිකිරීමක් සාම්ප්‍රදායික චීන උණ බම්බු පලංචිවලින් වටකර තිබෙනු දැකීම විෂමෙ දසුනක් නොවේ. එය එක්තරා ආකාරයකින් මැකී ගිය අවකාශය මත යළි සටහන් කිරීමක් වැනිය (palimpest). මෙසේ මැකීයාම මත යළි සටහන් කිරීම සම්බන්ධයෙන් දිය හැකි වෙනත් ආකාරයක උදාහරණයක් නම්, එක් ඉඩම

සංවර්ධනය කරන්නෙකු (property developer) විසින්, 'වාසනාවන්ත' වාහන ලියාපදිංචි අංකය ලෙස සැලකෙන අංක 2 ලබාගැනීමට ගෙවන ලද හොංකොං ඩොලර් මිලියන 9.5 ක් වූ ඇදහිය නොහැකි මුදලයි. අංක '2' වාසනාවන්ත වන්නේ, එය චීන බසින් 'පහසු' යන්නට සමාන අරුත් ඇති පදයක් නිසාත් අංක '2' කුකුළෙකු මෙන් හැඩය ඇති නිසාත් (අප අපගේ පරිකල්පනය මඳක් පුළුල් කිරීමට ඉඩදීමට කැමති වන්නේ නම්), සහ එම රථය චීන දින දර්ශනයට අනුව කුකුළාට වෙන් කරන ලද වසරේදී මිලට ගත් නිසාත්ය. එක් තලයකදී අපට මෙය සාම්ප්‍රදායික මිථ්‍යා විශ්වාසයක්, 'අංක ශාස්ත්‍රය' (numeracy) සම්බන්ධ කටයුත්තක් සහ විශාල මුදල් නාස්තියක් ලෙස පෙනී යා හැකිය. තවත් තලයකදී අපට එහි දැකිය හැක්කේ සමාගම් වෙළෙඳ නාමයක් මිලට ගැනීම තරම්ම වටිනා ප්‍රේක්ෂා සමාජය (society of the spectacle) තුළ කරන ලද ඉතා තීක්ෂණ ආයෝජනයක් ලෙසිනි. 'ප්‍රාග් නූතනත්වය' සහ 'පශ්චාත් නූතනත්වය' එකිනෙක පිළිගැනීමට ලක්විමෙන් තොරවම අතිනත වෙළාගෙන සිටී. අපට, ඉදිකළ අවකාශය තුළින් ද මේ හා සම්බන්ධ උදාහරණ සොයාගත හැකිය. විශාල වශයෙන් මුදල් ආයෝජනය කෙරුණු ගොඩනැගිලි, කඩා ඉවත් කිරීමේ තර්ජනයට මුහුණ පා ඇති අයුරු සහ ඉතා ස්ථිර (permanent) ලෙස පෙනෙන දේ ඇත්ත වශයෙන්ම ඉතා තාවකාලික (temporary) වන අයුරු අපි දුටිමු. එහෙත් එම තර්කයටම අනුව තාවකාලික දේට සාපේක්ෂ ස්ථිරත්වයක් ඇත යන්න ද සත්‍ය වේ. මේ ගැන දැක්විය හැකි බොහෝ නිදසුන් අතරින් එකක් ඉදිරිපත් කරන්නේ නම්, බටහිර දිස්ත්‍රික්කයේ දක්නට ලැබෙන ස්මිත්ෆීල්ඩ් පාරේ ඇති 'තාවකාලික වෙළෙඳපොළ' යන පුවරුවක් එම ප්‍රදේශයට ඇතුළුවන තැන ප්‍රදර්ශනය කර තිබීමයි. එහෙත් මේ වෙළෙඳපොළ ඕනෑම කෙනෙකුට මතක ඇති කාලයේ පටන් එහි තිබී ඇති අතර ඉන් අපේක්ෂිත කටයුතු සහ ලැබෙන ප්‍රයෝජන අතින් එය වටපිටාවේ ඇති ඕනෑම ස්ථාවර ඉදිකිරීමක්

හා සමානය. ඉන් පෙනී යන්නේ ඉතිරිව පවතින්නේ තවමත් විකිණිය නොහැකි (unmarketable) ස්ථාන පමණක් බවයි. මේ උදාහරණ මගින් යෝජනා කෙරෙන්නේ හොංකොං එක්තරා සුවිශේෂ අර්ථයකින් අසමාන සංවර්ධනයට (uneven development) භාජනය වූ අවකාශයක් ලෙසයි. එම අවකාශය හරහා විවිධ යුග සහ වේගයන් හමා ගොස් ඇත. එහි සිදුවන වෙනසට පැහැදිලි දිශාවක් ද නැතිමුත් එය ස්ථානයක් තහවුරු කර ගැනීම සඳහා එකිනෙකා තෙරපෙන පූර්වාපේක්ෂණයක් (anticipations) සහ අවශේෂ (residues) පෙළක් ලෙස අත්දකිනු ලැබේ. මේවා කාල ව්‍යතික්‍රම (anachro-nisms) සඳහා උදාහරණ නොවෙතත් (කාල ව්‍යතික්‍රමය සංජානනය කරනු ලබන්නේ කාලානුක්‍රමය උල්ලංඝනය කිරීමක් ලෙස වන නිසා), ඒවා අතීතය සහ වර්තමානය එකිනෙක තුළ අතුරුදහන්ව යන නිර්කාල ක්‍රමයක් (achronicity) ලෙස හැඳින්විය හැකි වනු ඇත.

මෙතෙක් කෙරුණු සාකච්ඡාවෙන් ගම්‍ය කෙරෙන ප්‍රධානතම කරුණක් නම්, අතුරුදහන්වීම විවිධ දිශාවන්ට ඇදී යන බවයි. එය විෂම ජාතිය සහ පරස්පර විරෝධී (contradictory) වන අතර මූට්ටු නැති දැලක් (seamless web) නොවේ. එක් අතකින්, හොංකොං, අතුරුදහන්වීමේ අවකාශයක් ලෙස ගත් විට පෙනී යන්නේ පරාධීනත්වය සමග ගනුදෙනු කිරීම සඳහා අකාලික බවක් (නිර්කාල ක්‍රමයක්) සහ අස්ථානීය බවක් (අන්තර්-ජාතික සහ පාර-බිම්කඩ වශයෙන්) වෙත නැඹුරුවක් වර්ධනය කරගැනීම මෙන්ම ස්ථාවර අනන්‍යතා ගොඩනගා ගැනීමට අවශ්‍ය නොවන පරිදි තමන්ටම ආවේණික 'පාවෙන ලෝකයක්' (floating world) තනාගැනීට දක් වූ නැඹුරුවයි. අනෙක් අතට, අතුරුදහන්වීම මගින් හොංකොං යළි චීන ආධිපත්‍යයට නතුවීමට පෙර, කිසියම් හෝ සංස්කෘතික අනන්‍යතාවක් ඉතා ඉක්මනින් වර්ධනය කර ගැනීමට ඇති අවශ්‍යතාව ද සලකුණු කරන නව සංස්කෘතික මනෝභාවය ද පිළිබිඹු කරයි. මෙසේ අතුරුදහන් වීමේ

අවකාශය තුළ, ඉතිහාසය සමග ගැටීම, අප හොංකොංහි නාගරික අවකාශය දෙස බලන ආකාරය සහ හොංකොං වාස්තු විද්‍යාව හරහා කුමක් තේරුම් ගන්නේද යන්න මත බලපෑමක් ඇති කරයි.

## නගරය දකින ආකාර

අවස්ථා න්‍යායවාදීන් (situationists)[6] 1950 ගණන්වලදීම දුටුවේ 'නගරයක දෘශ්‍යමාන අංශය (visual aspect) වැදගත් වන්නේ, ඊට ඇති කළ හැකි මානසික ඵලයන්ට (psychological effects) සාපේක්ෂව පමණක් බවයි. මෙවැනි අදහසක් පළවිය හැක්කේ අද්‍යයතන නගරය ගැන අත්දැකීම් ඇත්තෙකු හරහා පමණි. මෙම දිසිරු බවින් ඈත්ව යාමේ ගුණාංගය මගින් පෙන්වා දෙන්නේ නගරය පිළිබඳ දෘශ්‍ය අත්දැකීම (visual experience) කොතරම් ගැටලුකාරී බවට පත්ව ඇත් ද යන්නයි. නගර, අපව වික්ෂිප්ත බවට (confuse) පත්කරන අතර අපගේ අවධානය බිඳින චලනයෙහි විවිධ අවස්ථා රැගත් සලකුණුවලින් අපව නහවාලයි. මේවා රථවාහන ගමනාගමනය (traffic), වෙළෙඳ දැන්වීම්වල සිට රූපවාහිනී මාධ්‍යය දක්වා විහිදී යන අතර, ඒ සියල්ලම තමා වෙත අවධානය ලබාගැනීම සඳහා ගොඩනැගිලි සමග තරග වැද සිටී.

ලොව විශාලතම 'මැල්බොරෝ' මිනිසා සහිත දැන්වීම (Malboro Man Sign)[7] ඇත්තේ හොංකොංහි යැයි කියවේ. එය විශාල තට්ටු ගොඩනැගිල්ලක් තරම් විශාලය. නියෝන් ලාම්පු මගින් ආලෝකමත් කළ (neon lights) දැන්වීම් පුවරු නගරයෙහි සෑම තැනෙම පාහේ තිබෙනවා මෙන්ම, උපරිම ලෙස දිස්වනු පිණිස ඉතා දක්ෂ ලෙස නිමවා ඇති එම දැන්වීම් පුවරු සම්බන්ධයෙන් වෙනම වාස්තු විද්‍යාත්මක නිබන්ධයක් ලිවීම වටී. මේ සියලු අස්ථාපනයන්ගේ ප්‍රතිඵලය නම් දිසිරුව නිවී යාමයි. ප්‍රධාන නගරවල (metropolitan centers) වැසියන් එකිනෙකා දෙස කෙළින් බැලීම

මගහරින්නට (avoid eye contact) නැඹුරුවන ආකාරයෙන්ම, දූන් ඔවුහු නගරය දෙස කෙළින් බැලීම ද මග හරින්නට නැඹුරුවක් දක්වති. සංකීර්ණත්වය වැඩිවීම, අර්බුදකාරී බව ඉහළයාම වඩාත් නුහුරුවීම, දකින්නා හසුරුවන්නට තැත් කිරීම ඉහළයාම වැනි හේතු සාධක නිසා දිසිරුව වඩා ගැටලුකාරී බවට පත්වන විට නගරය දෙස බැලීමේ වෙනත් ක්‍රම, එනම් විවිධ දෘශ්‍ය තන්ත්‍ර (scopic regimes) හඳුන්වා දිය යුතු වේ.

නගරය දකින විවිධ ආකාර, අපට අරාටා ඉසොසාකි සහ අකිරා අසාදා විසින් මෑතදී ඉදිරිපත් කරන ලද නාගරික අවකාශය පිළිබඳ දර්ශවේදය (typology of urban space) සමග සම්බන්ධ කළ හැකිය (ඉසොසාකි සහ අසාදා 1992:16-17). ඔවුන් ඉදිරිපත් කළ දර්ශවේදයට අනුව, තුන් ආකාරයක නාගරික අවකාශ හඳුනා ගැනෙන අතර, ඒවා නිර්වචනය කෙරෙනුයේ ස්වකීය ඓතිහාසික සන්දර්භය සමග දක්වන, වේගයෙන් හීනවීයන. සම්බන්ධතාවට අනුවය. ඒ අනුව තථ්‍ය (real) නගර නම්, සිය ඓතිහාසික සන්දර්භ සංරක්ෂණය කරන ලද ඒවාය. අධි-තාත්වික (surreal) නගර නෑ: වෝකියෝ වැනි, නාගරික මූලිකාංග (urban elements) මිශ්‍ර (mixed up) සහ සම්මිශ්‍රිත (hybrid) වූ ඓතිහාසික සන්දර්භය ගැන තැකීමක් නැති නගර වන අතර, අධි තථ්‍ය/ ව්‍යාපිදේශිත (hyper real/ simulated) නගර යනු කිසිදු ඓතිහාසික සන්දර්භයක් නැති, ප්‍රබන්ධ සහ ප්‍රයෝග (fiction and artifice) මත පදනම් වූ වෝල්ට් ඩිස්නි වැනි තේමා උද්‍යානයන්ය. දූන් අපට ඉසොසාකි සහ අසාදා විසින් ඉදිරිපත් කරන ලද දර්ශවේදයන්ට දළ වශයෙන් අනුරූපී වන ආකාරයේ, දෘශ්‍ය තන්ත්‍ර පිළිබඳ දර්ශවේදයක් ගොඩනගාගත හැකිවනු ඇත. ඒ අනුව පිළිවෙළින්, 'තථ්‍ය' නගර මගින් දෘශ්‍යමානය (visible) හෝ 'දුටු බව' (seen) පිළිබඳ දෘශ්‍ය තන්ත්‍ර ද, 'අධිතාත්වික' නගර මගින් උපද්වාරික සහ ඇදහිය නොහැකි (ගුඪ බව - subliminal & uncanny) හෝ 'අර්ධ -දුටු' බව (අර්ධ වශයෙන් පෙනෙන හෝ half seen) පිළිබඳ දෘශ්‍ය තන්ත්‍ර ද, 'අධිතථ්‍ය'

නගරවලින් දුර දෘශ්‍ය (tele-visual) හෝ 'සැණෙකින් දුටු බව' පිළිබඳ දෘශ්‍ය තන්ත්‍ර ද ජනනය වීම දිරිගන්වනු ලබයි. දර්ශවේදයන් සහ ඒවා අතර ඇති සම්බන්ධතා යන කාරණා දෙකම මගින් ලබාදෙන්නේ 'පරමාදර්ශී දර්ශයන්' (ideal types) පිළිබඳ උදාහරණ පමණක් බව සිහියේ තබාගන්නේ නම්, අපට මේ කාරණා ද්විත්වය ප්‍රයෝජනවත් ලෙස භාවිත කළ හැකි වනු ඇත. ටෝකියෝ හෝ හොංකොං වැනි, එක්තරා විශාලත්වයකින් සහ සංකීර්ණත්වයකින් යුතු සැබෑ නගර, ඉසොසාකි සහ අසාදාගේ දර්ශවේදයෙහි සඳහන්වන ආකාර තුනෙහිම නාගරික අවකාශයන්ගේ සම්මිශ්‍රණයක් වීමේ ප්‍රවණතාවක් පවතී. එනම්, ඒවා එකම විට තථ්‍ය, අධිතාත්වික සහ අධිතථ්‍ය වන අතර විවිධාකාරයෙන් පෙනී යා හැකිය (can be seen in different ways). මහා නගර සතු මෙම සම්මිශ්‍රිත ස්වභාවය වැදගත් වන්නේ, ඉන් එහි, *කිහිපයක් අතරින් එකක් තෝරා ගත හැකි දෘශ්‍ය තන්ත්‍ර කිහිපයක් සැමවිටම පවතින* බව කියැවෙන නිසා වන අතර, එහිදී ඇත්තෙන්ම කෙරෙන තෝරාගැනීම ඓතිහාසිකව කැපී පෙනේ. දැන් අපට මෙම ප්‍රකාශ හොංකොං සම්බන්ධයෙන් කෙසේ අදාළ වන්නේදැයි සලකා බැලිය හැකිය.

හොඳට හෝ නරකට, හොංකොං නාගරික අවකාශයෙහි දෘශ්‍යමාන දේ පමණක් හරහා එම අවකාශය සම්බන්ධයෙන් කිසිවක් සිතාගත නොහැකි තරම්ය. අතැම් විට, තවමත් නගරය 'දකින්නේ' සංචාරකයන් පමණක් විය හැකිය. එහෙත් ඔවුන්ට දෘශ්‍යමාන වන්නේ, සංචාරක මාර්ගෝපදේශ පොත්වල දැක්වෙන ප්‍රමුඛස්ථාන (landmarks) සහ ස්මාරක පමණක් වන අතර, දේශීය ඉතිහාසය යන්නෙන් අර්ථවත් වන්නේ 'විචිත්‍ර' (exotic) බව පමණි. නගරයක් වඩාත් 'ඓතිහාසික' වන තරමට එය සංචාරකයාගේ බැල්මෙහි ගොදුරක් බවට පත්වීම ද වැඩි වෙයි. හෙන්රි ලෆේව්ර අපට සිහිපත් කර දෙන ආකාරයට, හුදෙක් දෘශ්‍යමය අවකාශයකට 'සමාජ පැවැත්මක් නැති අතර හුදෙක් 'දුටු' (සහ හුදෙක් දෘශ්‍යමාන) අවකාශය දැකීම බොහෝ දුෂ්කර වන

නමුත්, ඒ ගැන වඩ වඩාත් ව්‍යක්ත ලෙස කතා කෙරෙන්නේද, බහුල ලෙස ලියැවෙන්නේ ද වෙයි (ලංෆෙවීරඃ 1991ඃ 286).[8] මේ සම්බන්ධයෙන් සලකා බැලීමට වටින තවත් කාරණයක් නම්, මෑතදී බිහි වූ හොංකොංහි ඓතිහාසික තත්ත්වය (present historical situation) ගැන උනන්දුවක් දැක් වූ සිනමා පට කිහිපයක්, නගරයෙහි වඩාත්ම දෘශ්‍යමාන දෙය වන එහි වාස්තු විද්‍යාව රූගත කරමින්, නගරය දෘශ්‍යමාන බවට හරවමින් එය හඳුනාගැනීමට උත්සාහ කරනු ලබන ආකාරයයි. මෙම චිත්‍රපට එවන්ස් චැන්ගේ ඉතා ගාම්භීර *To Liv(e)* (ජීවත්වීමට) සිට උපහාසාත්මක චිත්‍රපටයක් වන මිසුයි හාක්ගේ *Wicked City* (දුෂ්ට නගරය) දක්වා විශාල පරාසයක විහිදී යයි. එහෙත් ඒවාහිදී වාස්තු විද්‍යාව සලකනු ලැබ ඇත්තේ ඉතා ඡායාකාන්ත (photogenic) වස්තු සමූහයක් ලෙස පමණක් නිසා, අපට එම චිත්‍රපටවල හමුවන්නේ, කඳු මුදුනත සිට පහළ ඇති වරාය දෙස බැලීම, වරායේ සිට ඉහළට ඇති කඳු මුදුනත බැලීම වැනි, එකම කෝණයකින් ගන්නා ලද ප්‍රසිද්ධ ගොඩනැගිලිවල හුරු පුරුදු රූප රාමුය. මෙය, නගරය සැබෑවක් බව යළි තහවුරු කිරීම සඳහා හුරුපුරුදු දේ වෙනම යොමු වීමට අවශ්‍ය වූවාක් මෙනි. කෙසේ වෙතත්, මෙතුළින් කිසිම අනන්‍යතාවක් මතුවන්නේ නම් නැත. කීකරු ළමයෙකු මෙන් නගරය පෙනෙන නමුත්, ඉන් කිසිවක් ඇසෙන්නේ නැත (the city is seen but not heard).

වෙනස්වන නගර මගින් බොහෝ නුහුරු දර්ශන නිෂ්පාදනය කෙරෙයි. එහෙත් හොංකොං වැනි ඉතා වේගයෙන් වෙනස්වන, අතිධාවනීය නගර මගින් ඊට වඩා වැඩි යමක් ද නිෂ්පාදනය කෙරෙයිඃ *එය හුරු දෙය තුළ නුහුරු දෙයකි* (unfamiliar in the familiar). එනම්, හුරුපුරුදු දේ සම්බන්ධ දුටු බවට/ දර්ශනයට (seen/scence of the familiar) පිටුපස ඇති, 'අර්ධ-දුටු බව' හෝ උපද්වාරික 'දුටු' බව සම්බන්ධ නුහුරු දේයි (the unfamiliar that is half - seen or seen subliminally). මෙය නම්, 'මම මෙහි සිටිමි' (I am here) යැයි කියන විට

එන 'හුරුපුරුදුය' සහ 'ගෙදර වගේ' (familiar and homely) යන හැඟීම, 'මම කලින් මෙහි ඉඳ ඇත්තෙමි' යැයි කියන විට එන 'පිට තැනක්' (unheimlich)[9] වැනි නුහුරු බව පිළිබඳ හැඟීමට කෙමෙන් පරිවර්තනය වීමකි. මේ පිටතැනක් වැනි හැඟීම යනු දූන් දකින දෙය, පෙර දුක ඇති දේ ගැන ඇති වේදනය (feeling) සමග මිශ්‍ර වීමෙන් ඇති වන 'දුටු විරූ මායාව' (déjà vu) පිළිබඳ හැඟීමයි. වේගයෙන් වෙනස්වන නගරයෙහි ගුඪ සහ උපද්වාරික ස්වභාවය, එහි ගුප්ත මිනිසුන්ගෙන් ජනාකීර්ණ වූ නොසන්සුන් කරවන වටපිටාව (disquieting atmosphere of places...peopled with unrecognized sphinxes) ද සමගින්, වඩාත්ම හොඳින් ග්‍රහණය කර ගත්තේ ලූවි අරගොං නම් අධිතාත්විකවාදී කවියායි. නූතන නගර සැලසුම්කරණය නිසා, වේගයෙන් අතුරුදහන් වෙමින් තිබුණු පැරිසියෙහි ආරුක්කු පාරවල් (arcade) ගැන ඔහු මෙසේ ලිවේය: "ඒවා වහා නැසෙන දේ අභිවන්දනය කරන පූජාස්ථාන (sanctuaries of a cult of the ephemeral) බවට පත්ව ඇත්තේ, කුන්තානියෙහි (pick axe) තර්ජනයට මුහුණ දී සිටින අද දවසේදීයි. ඒයේ තේරුම් ගත නොහැකි වූ මේ ස්ථාන හෙට දවසේදී කිසිවකු නොදන්නේ වනු ඇත" (අරගොං 1980). අරගොං විසින් උද්දීපනය කරනු ලබන උපද්වාරිකය මගින් දිසිරුව ප්‍රශ්න කිරීමකට භාජනය කෙරෙන නමුත්, ඊට බාධා කෙරෙන්නේ නැත. සංඥාව සහ අර්ථය එකිනෙක සමපාත (coincide) වීම අවහිර කරනු ලබන කාලාවකාශමය (spatio-temporal) ප්‍රමාදයක් වශයෙන් සලකා බැලීමේදී, උපද්වාරය, කොටසක් දෘශ්‍යමය වශයෙන්ද, එමෙන්ම තවත් කොටසක් රූපක (allegorically) වශයෙන් අත්දකිනුයේ එම නිසාය. රූපකවලදී සංඥාවන්ට ලිහිල්ව හැසිරීම සඳහා ඉඩ ලැබෙන අතර ඒවා වඩාත් කුපිත කරවන සුළුවෙයි. නොසන්සුන් කරවන සහ ස්ෆින්ක්ස් වැනි (sphinx-like)[10] මේ සංඥා මගින්, අනන්‍යතාව පිළිබඳ ආඛ්‍යාන ද ඇතුළුව පොදුවේ ආඛ්‍යාන බිහි කිරීම කුපිත කරවයි (provoke the making of narratives).

මෙසේ සලකා බලන විට, රූපකය, හොංකොං නාගරික අවකාශය සම්බන්ධ සුවිශේෂී යථාර්ථ අත්දැකීමට මේවා අතික්‍රමණය කරනු ලබන එක් අවස්ථාවකදී හැර, වඩාත් යෝග්‍ය ක්‍රමයක් බව පෙනී යනු ඇත. නගරය, නිෂ්පාදනය පාදක අර්ථ ක්‍රමයක සිට සේවා සම්පාදනය සහ මූල්‍ය කෙරෙහි වැඩි අවධානය සහිත ක්‍රමයක් වෙත ගමන් කරන විට දූර දෘශ්‍ය තන්ත්‍රය (regime of the televisual) වඩ වඩාත් බලවත් වෙමින්, අවකාශය පිළිබඳ නව අත්දැකීමක් හඳුන්වා දෙනු ලබන අතර එය පාවුලෝ විරිලියෝ විසින් හඳුන්වන්නේ 'පෙනුමෙහි දූර-ජයග්‍රහණය' (tele-conquest of appear-ance) ලෙසයි (විරිලියෝ 1991: 31). මෙම දූර දෘශ්‍ය අවකාශයෙහි ප්‍රධාන ලක්ෂණ වන්නේ, දැරිය නොහැකි තරම් දෘශ්‍යමය තොරතුරු (visual over-load), වේගවත් සහ මන්දගාමී දේ අතර සම්පර්කය සහ සංකුලතාව (fusion & confusion of the fast and the slow), විශාල සහ කුඩා දේ අතර ඇති සංක්‍රමණික අවස්ථාවක් ද නැතිවීම, ඩිජිටල් තත්ත්වය වෙනුවෙන් සාදෘශ්‍ය (analogy) බිඳහෙළීම, යන ඒවායි. එහි ප්‍රතිඵලය නම් 'නරඹන්නා' නරඹන ලද යථාර්ථ සමග කිසිදු සමීප සම්බන්ධතාවක් නොදක්වන දූර-නැරඹීමකි (tele - observation). දූර දෘශ්‍යයෙහි ඵලය නම්, දැනටමත් නිර්වචනය කරන ලදැයි සලකා රූපක විනාශ කර දැමීමයි. විද්‍යුත් මාධ්‍ය මගින් කාලය හා අවකාශය පිළිබඳ ප්‍රමාදයන් අහෝසි කර දමන්නේ ද එම ක්‍රියාවලියම හරහාය. එහෙත් මෙම ක්ෂණික හා ඉක්මන් දෘශ්‍යමාන බව පිළිබඳ තන්ත්‍රයේදී, නුහුරු දේ (the unfamiliar) තවදුරටත් හුරු පුරුදු දෙයෙහිම පොලඹවන සුළු මානයක් නොවේ (no longer a provocative dimension of the familiar). නුහුරු නුපුරුදු දේ ක්ෂණික නැවත ප්‍රචාර (instant replays) සහ සජීව විකාශ (real time) හරහා ඉතා හුරු පුරුදු දේ බවට පත් කෙරෙන අතර, දූර දෘශ්‍යමය තන්ත්‍රය මගින් නගරය දෙස බැලීමට ඇති අනෙකුත් සියලුම ආකාර බල රහිත කිරීමට තර්ජනය කෙරෙන විට (දැනටමත් දක

ඇති බව), දුටු විරූ මායාව හා සම්බන්ධ ගුප්ත උමතු බව (strange madness) 'දූනටම අතුරුදහන්ව ඇති බව' හා සම්බන්ධ සාමාන්‍ය උමතු බව (ordinary madness of the déjà dispavu) බවට පෙරළේ.

ප්‍රශ්නය නම් නගරය දැකිය යුත්තේ කෙසේද යන්නය. අපි කුමන දෘශ්‍ය තන්ත්‍රයක් නම් තෝරා ගනිමුද? නගරය දැකීමට ඇති කිසිදු ආකාරයක් හොංකොංහි වර්තමාන තත්ත්වය දැකීමට නොගැළපෙන බව පෙනී යන සන්දර්භයක් තුළ මෙම තේරීම අපහසු එකක් වුවත්, කළ නොහැක්කක් නම් නොවේ. සංචාරකයාගේ බැල්ම (gaze) මගින් අපට ලබාදෙන නගරය පිළිබඳ කලින් නිමවූ ප්‍රතිරූප (ready-made images of the city) සතුව කිසිදු සමාජමය හරයක් නැතිනම් සහ දූර දෘශ්‍යමය බව මගින් රූපකමය බැල්ම විනාශ කර දැමෙන විට අපට ඉතිරි වන්නේ අස්ථානීය බව (placelessness) ගැන හැඟීමක් වර්ධනය කිරීමට පමණක් රුකුල් දෙන තත්ත්වයකි. 1997 දී ඇති වූ සිත් තැවුල්වලට සහ ටයිනැමන් චතුරශ්‍රයෙහි සංහාරයට පෙර එක් කලකදී මෙසේ ශක්තිමත් දේශීය අනන්‍යතාවක් නැතිවීම හා අත්වැල් බැඳගත් අස්ථානීය බව පිළිබඳ හැඟීමක් පැවතීම, හොංකොං සතු එක් වත්කමක් බවට පත්ව තිබුණේ එමගින් හොංකොං නගරයට අතරමැදි අවකාශයක් (space in between) වශයෙන් පැවතීම මගින් වාසි අත්කරගැනීමට ඉඩ සලසා දුන් නිසාය. එහෙත් වර්තමානයේදී චීනය මගින් හොංකොං මත විදේශීය අනන්‍යතාවක් පටවනු ලැබීමේ අවදානමට මුහුණ දී සිටින විට ක්ෂණිකව අනන්‍යතාවක් වර්ධනය කර ගැනීමට විශාල පීඩනයක් පවතී. ටෙක්සාස් ජනපදයේ ඇති පැරිස් නගරය ප්‍රංශයේ පැරිස් නගරයෙන් වෙනස්වන තරමටම, බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වන හොංකොං සියැං ගැං චීනයෙන් වෙනස්වනු ඇත. මවිසින් මීට ඉහත ද දක්වා ඇති පරිදි, මේ තත්ත්වයෙහි ඇති භයානකකම නම්, අතුරුදහන්වීම නිරූපණය කිරීමේදී අනුකාරක ප්‍රතිරූප (ersatz images) වුවද

හාර ගැනීමට ඇති ඉඩයි. එනම්, හොංකොංහි වාස්තු විද්‍යාව යනු කුමක්ද යන ප්‍රශ්නය වඩාත් උචිත වන්නේ මේ සුවිශේෂ සන්දිස්ථානයේදීය.

## හොංකොංහි වාස්තු විද්‍යාව යනු කුමක්ද?

හොංකොංහි වාස්තු විද්‍යාව, අප එහි මතුපිට පමණක් සලකා බලන්නේ නම්, එය හුදෙක් වර්ධනය වන හොංකොංහි සෞභාග්‍යයේ එක් සංකේතයක් ලෙස පෙනී යනු ඇත. අප හොංකොංහි වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට අවධාරණය කළ යුතු කාරණයක් නම්, එහි ඉදිකළ අවකාශය මත ඇත්තේ එක් ලියවීමක් පමණක් නොව, එහි පිටාර යන තරම් ලියවීම් (over inscribed) ගණනාවක් කෙරී ඇති බවය. එහි කිසියම් පණිවුඩයක් ගැබ්ව ඇත්නම් එය එක් අර්ථයකට ලුහු කොට දක්විය නොහැකි ආකාරයේ පටලැවිලි සහිත එකකි. නගරයෙහි ඉදිකළ අවකාශය මගින් හුවා දක්වන්නේ, මූල්‍යමය ප්‍රගතිය සහ බලය අත්පත් කරගැනීම පමණක් නොව, එතුළ සංස්කෘතික අවශේෂ ද, අනාගත සිහින ද, විරෝධතා පළ කිරීම ද අපි දකිමු. එහෙයින් අප ඉදිකළ අවකාශය තේරුම්ගත යුත්තේ අවකාශීය ආකෘති ලෙස නොව, එහෙත් සංස්කෘතික භාවිත නිෂ්පාදනය කරන්නක් සහ ඒවාහි නිර්මිත ලෙසිනි. හොංකොංහි වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් සලකා බැලීමේදී නම් මේ සංස්කෘතික භාවිතයන්, අතුරුදහන් වීමේ සංස්කෘතියක් හා සම්බන්ධ ඒවා වනු ඇත. එහි ලක්ෂණ තුනක් හඳුනාගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම හරහා මේ සාකච්ඡාව ඇරඹේ.

මෙහිදී අවධානය යොමු කෙරෙන පළමු කරුණ නම් නව වාස්තු විද්‍යාත්මක ශෛලීන් කෙරෙහි හොංකොං නගරය දක්වන ග්‍රාහකතාවයි (receptivity). වාස්තු විද්‍යාව, ගොඩනැගිලි සමූහයක් ලෙස සැලකූ විට එය

සැමවිටම කිසියම් හෝ තැනෙක ස්ථානගත වී තිබීම අදහස් කෙරෙන නමුත් එය මතවාදයක් ලෙස ගත් විට විශිෂ්ට ලෙස අතිස්ථාපනය (transpose) කළ හැක්කක්ය යන්න හැඟෙයි. අනෙක් බොහෝ අංශ සම්බන්ධයෙන් මෙන්ම වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් ද හොංකොං ස්වදේශීය ශෛලීන්ගේ සිට යටත් විජිත වාස්තු විද්‍යා ශෛලීන් දක්වා ද නූතනවාදී ශෛලීන්ගේ සිට පශ්චාත් නූතනවාදී ශෛලීන් දක්වාද, විහිදෙන සියලුම වාස්තු විද්‍යාත්මක ශෛලීන්ගෙන් ආභාසය ලැබූ 'විවෘත නගරයක්' (open city) බව කිව යුතුය. මෙම අති ග්‍රාහකත්වය සාමාන්‍ය තත්ත්වයක් නොවන අතර, එය නගරයෙහි 'පාවෙන' අනන්‍යතාවට මෙන්ම එහි වර්ධනය වන සමෘද්ධිමත්භාවයට හා වේගය වැඩි කරන ලද (ත්වරණිත) සංවර්ධනයට එකසේ සම්බන්ධ කළ හැකිය. වෙනත් වචනවලින් කියනවා නම්, අවකාශය සම්බන්ධයෙන් පුද්ගල බද්ධ බව (subjectivity) මෙන්ම ආර්ථිකය එකසේ වැදගත් වෙයි. හොංකොං ගැන ලියැවී ඇති බොහෝ වාර්තා මගින් දක්වෙනුයේ, ඉතා දුර්වර්ණ සහ ප්‍රභාවත් ගොඩනැගිලිවල මිශ්‍රණයක් වන හොංකොං, ආසියාවේ අනෙකුත් නගරවලින් විශාල වශයෙන් වෙනස් නොවන බවයි. කෙසේ වුවත්, හොංකොංහි ඇති වෙනස දැන ගැනීමට අප කළ යුත්තේ, ඒ තරමම සෞභාග්‍යවත් නගරයක් වන තායිවානයේ තායිපේ සමග එය සන්සන්දය කිරීම පමණි. තායිපේ නගරයත් වාස්තු විද්‍යාත්මක ශෛලීන්ගේ මිශ්‍රණයක් ප්‍රදර්ශනය කළද, ඉන් ලබාදෙන සමස්ත අදහස වෙනස් එකකි. සිය දේශපාලන බලය සාධාරණීකරණය සඳහා තායිවානය ඉදිරිපත් කරන ප්‍රධානම තර්කය නම්, එය 'චීන සංස්කෘතියේ' සත්‍ය ආරක්ෂකයා බවයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, චීන අනන්‍යතා ප්‍රතිරූපයට වක්‍රව බාධා කරනු ලබන මතවාද හරහා උපදින අද්‍යතන වාස්තු විද්‍යාත්මක ආකෘතීන් භාවිතයට ගැනීම සම්බන්ධයෙන් තායිවානය මැලිකමක් දක්වයි. හොංකොං සතුව ස්ථිර අනන්‍යතාවක් හෝ ඉන් ඇතිවන වාරණයක් ද නොමැත. ඒ සඳහා

එක් උදාහරණයක් ලෙස, මේ දෙනුවර සංස්කෘතික මධ්‍යස්ථාන අතර ඇති තියුණු පරස්පර සලකා බැලිය හැකිය. තායිවානයේ චියැං කයි ෂෙක් සංස්කෘතික මධ්‍යස්ථානය, චීන වාස්තු විද්‍යාත්මක ශෛලීන්ගේ අනුසාරයෙන් කළ අනුකාරක නිර්මාණයක් (pastiche of Chinese architectural styles) වන අතර, හොංකොංහි සංස්කෘතික මධ්‍යස්ථානය සමකාලීනත්වයට කැප කෙරී ඇත.

හොංකොං, වාස්තු විද්‍යාත්මක ශෛලීන්ට දක්වන ග්‍රාහකත්වයට අමතරව, දෙවැනි ලක්ෂණයක් ලෙස දැක්විය හැක්කේ, කෙනෙකුට නොදක සිටීමට අපහසු නිරන්තර ඉදිකිරීම් හා යළි ඉදිකිරීම් සමූහයයි. ඇතැම් විට මෙය යටත් විජිතය ගැන ඇති පැරණි විහිළුවක් වන "එය ලස්සන නගරයකි; ඒ කෙදිනක හෝ එහි වැඩ නිමවූ පසුවය" (a nice city - once it is finished) යන්න සිහි කැඳවයි. මෙම ඉදිකිරීම් හා යළි ඉදිකිරීම් හරහා යෝජනා කෙරෙන්නේ, අවකාශය යනු එහි ඇති දේ මකා යළි පාවිච්චියට ගත හැකි චුම්භක පටයක් (magnetic tape) ලෙසටයි. මෙහිදී පෙනී යන්නේ ආර්ථික සාධක, පුද්ගලාබද්ධ ප්‍රතිචාර (subjective response) සමග මනාව පෑහෙන ආකාරයයි. මකා දැමෙන දේ සංස්කෘතික මතකයන්ය. ඒ මත යළි ඉදිකෙරෙන්නේ වඩා ලාභදායී ගොඩනැගිලිය. මේ ප්‍රකාශය හොංකොං නගරය සම්බන්ධයෙන් පොදුවේ සත්‍ය වුවත්, විශේෂයෙන්ම, වර්තමාන හොංකොංහි වෙළඳ දිස්ත්‍රික්කය මෙන්ම ඓතිහාසික වශයෙන් පළමුවෙන්ම සංවර්ධනය කෙරුණු ප්‍රදේශය වන මධ්‍යම දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් ඉඳුරාම සත්‍ය වේ. දැනට ඉතිරිව ඇති වර්තමාන ව්‍යවස්ථාදායක කවුන්සිලයේ රැස්වීම් සඳහා පාවිච්චි කෙරෙන යටත් විජිත ශෛලිය විදහාපාන පැරණි ශ්‍රේෂ්ඨාධිකරණ ගොඩනැගිල්ල හැරුණු විට, මධ්‍යම දිස්ත්‍රික්කයෙහි මෙම ඉතිහාසය ගැන කිසිම හෝඩුවාවක් ශේෂවී නැත. ඇත්ත වශයෙන්ම යටත් විජිත අවකාශය අතුරුදහන්වීමේ අවකාශයක් ලෙස සලකා බැලීමේදී, හමුවන වඩාත්ම පරස්පර විරෝධී ලක්ෂණයක් නම්, මා කලින් ද සඳහන්

කර ඇති අකාරයට, 'සංරක්ෂණයම' සංස්කෘතික මතකයන් මකා දැමීමේ ක්‍රියාවලියේ හවුල්කරුවෙකු විය හැකි ආකාරයයි.

එහෙත් හොංකොං නගරයෙහි වඩාත්ම හොඳින් කැපී පෙනෙන ලක්ෂණය නම්, සංඛ්‍යාලේඛන මගින් දක්වා ඇති පරිදි වර්ග සැතපුමකට හතලිස්දහසකටත් වඩා වැඩි, එහි අති-ජනඝනත්වයයි (hyper density). ඉහත සඳහන් කළ සංඛ්‍යාවද, නගරයටම පොදු ලෙස ගත හැකි සාමාන්‍ය අගයකි. එනම්, ඊට වඩා බොහෝ ඉහළ ජනඝනත්වයක් සහිත මොන්කොක් සහ ෂුම්ෂුයිපෝ වැනි ප්‍රදේශ ද ඇති අතර මෑතකදී කඩා ඉවත් කරන ලද පරිප්‍රාකාරිත නගරයෙහි ඊට අයත් වූ වර්ග සැතපුමකින් සියයෙන් පංගුවක් පමණ වන බිම්කඩ තුළ තිස්තුන් දහසක ජනගහනයක් වාසය කරන ලදින් එහි ජනඝනත්වය වර්ග සැතපුමකට මිලියන තුනද ඉක්මවයි. එය පහසුවෙන්ම ලොව විශාලම ජනඝනත්ව අගයයි. ඉදිකිරීම දෙදිශාවකින් පුළුල් වී ඇත: එනම් තැනිතලා භූමිය දිගට මුහුදින් උදුරා ගනු ලැබූ කොටස් ද සමගින් වෙරළ තීරය දිගට තිරස් ආකාරයට සහ ඉතා උස් වූ ගොඩනැගිලි නිසා නැවතත් පරිප්‍රාකාරිත නගරය මෙන් දිස්වන සේ සිරස් වශයෙනි.

අවසාන වශයෙන් කිව හැක්කේ, අති ජනඝනත්ව අවකාශ බොහෝ උපයෝගීතාවලට භාවිත කෙරෙන නිසා සහ ආකෘතිය විසින් අවශ්‍යයෙන්ම කෘත්‍යය අනුගමනය කෙරෙන්නේ නැති නිසා (form does not necessarily follow function) හොංකොංහි බොහෝ ප්‍රදේශවල අවකාශ වාණිජමය හා වාසස්ථානමය වශයෙන් භාවිත කිරීම අතර නිරවුල් වෙන් කිරීමක් නැති බවයි. මවිසින් නැවත වරක් අතිජනඝනත්වය සම්බන්ධ මෙම ගැටලුව ගැන සාකච්ඡා කරනු ඇත.

ඉහත දැක් වූ ලක්ෂණ, එනම් අනෙකුත් ශෛලීන්ගෙන් ආභාසය ලැබීම සම්බන්ධ ග්‍රාහකතාව ඉහළ මට්ටමක පැවතීම, නිරන්තර යළි ඉදිකිරීම, සහ අතිජනඝනත්වය, ආදිය මගින් පමණක් අපට හොංකොංහි

වාස්තු විද්‍යාව පිළිබඳ නිර්වචනයක් ලබාදෙන්නේ නැත. ඒ කෙසේ වුවද, බලපෑම්වලට නතුවීම පිළිබඳ සාකච්ඡාමය මාතෘකාගතයන් (thematics of susceptibility to influence) සහ සංස්කෘතික මතකය මකා දැමීම මගින් ඉඟිකරනු ලබන්නේ, හොංකොංහි වාස්තු විද්‍යාව පිළිබඳ ප්‍රශ්නය, අතුරුදහන් වීමේ අවකාශයක පමණක් ගැටලුකාරී බවට පත්විය හැකි, හොංකොං තමාටම සපයාගන්නා ස්වයං නිර්වචනය අතර ඉතා කිට්ටු බැඳීමක් ඇති බවයි. ඒ නිසා මා යෝජනා කරන්නේ, නගරයේ ඇති විවිධාකාර ඉදිකළ අවකාශ සහ ඒවා හරහා මතු කරනු ලබන විවිධ නාගරික වාද විෂයන් (urban issues), එනම් සංරක්ෂණය සහ මතකය, දේශපාලනික රූපක සහ පුද්ගල බද්ධභාවය ගැන ඇතිවන ප්‍රශ්න, සලකා බැලීම තුළින් හොංකොං වාස්තු විද්‍යාව අධ්‍යයනය සඳහා වක්‍ර එළැඹුමක් වර්ධනය කර ගැනීම සුදුසු බවයි.

හොංකොංහි වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් සම්පූර්ණ අධ්‍යයනයක් කිරීමට නම්, බොහෝ වාස්තු විද්‍යාත්මක ප්‍රවර්ග සහ විවිධ වාස්තු විද්‍යාත්මක උදාහරණ සම්බන්ධ සාකච්ඡා භාවිතයට ගත යුතු වනු ඇත. එහෙත් වර්තමාන අධ්‍යයනය සඳහා අපට හොංකොංහි ඉදිකළ අවකාශය ප්‍රධාන කොටස් තුනකට බෙදාගත හැකිය. මේ සෑම කොටසක් මගින්ම හොංකොං වාස්තු විද්‍යාවෙහි එක් අංශයක් නිරූපණය කරන්නේය යන අර්ථයෙන් එම කොටස් තුන 'දේශීය' ඒවා ලෙස සැලකිය හැකි වුවත් එමගින් පෙනී යන්නේ දේශීයත්වය හඳුනාගැනීම කොතරම් අපහසුවේ ද යන්නයි. එක් අතකින් බැලූ විට, මවිසින් *හුදෙක් දේශීය* (merely local) යැයි නම් කෙරෙන, ප්‍රධාන වශයෙන්ම නගරයේ ආර්ථික කේන්ද්‍රයට දුරින් එහි සීමාව ආශ්‍රයෙන් පිහිටා තිබෙන, බොහෝදුරට වෙනත් ඓතිහාසික යුගයකට අයත් ගොඩනැගිලි සමස්තයම අන්තර්ගත ප්‍රවර්ගයක් වෙයි. මීට අයත්වන්නේ ක්වීන් රාජ යුගය හා නෑකම් කියන ස්වදේශීය වාස්තු විද්‍යාව ෂැන්හයි සහ ග්වාන්සු නගරවල ද දැකිය හැකි දේශීය නාගරික ශෛලීන්ගෙන් යුත්

ගොඩනැගිලි, සහ හොංකොං විශ්වවිද්‍යාලය කදිම නිදසුනක් ලෙස සැලකිය හැකි. ඉන්දියාවේ හා මැලේසියාවේද දැකිය හැකි යටත් විජිත ශෛලියටම අයත් ඉදිකිරීමය. අනෙක් අතින් බැලූ විට අපට හමුවන්නේ කිසිම දේශීය මනකයකට නෑකම් නොකියන, සියලුම දර්ශනීය බහු ජාතික හෝටල් සහ කාර්යාල ගොඩනැගිලිවලින් සමන්විත, අස්ථානීය වාස්තු විද්‍යාවයි. මෙම ගොඩනැගිලි ප්‍රධාන වශයෙන් මධ්‍යම දිස්ත්‍රික්කය තුළ සංකේන්ද්‍රය වී තිබුණ ද අද වන විට ඒවා වරාය අසල වන්චායි ප්‍රදේශයේ ග්ලව්සෙස්ටර් පාරට උතුරින් පිහිටි බිම් කඩක් ද ඈඳා ගනිමින් නැගෙනහිර දෙසට ව්‍යාප්ත වෙමින් තිබේ. මේ ගොඩනැගිලි ලෝකයේ වෙනත් ඕනෑම තැනක වුවද දැකිය හැකි ඝනයේ ඒවා වන අතර, ඒවා කිසියම් හෝ නොදන්නා තැනෙක සිට විත් ඒවා දැනට පිහිටි බිම මත පතිත වූවා සේ පෙනේ. *හුදෙක් දේශීය හා අස්ථානීය* වාස්තු විද්‍යාව අතර, ඇතැම් විට වෙන් කිරීමේ තිරුවක් (buffer zone) ලෙස ක්‍රියා කරන, අඥාත (anonymous) වාස්තු විද්‍යාවක් පවතින අතර ඊට අයත්වන්නේ නිරන්තරයෙන් සිය අනුරූ (replicas) ගොඩනගමින් සිටින න-විස්තරමය වාණිජ සහ වාසික ගොඩනැගිලි සමස්තයයි. මේ ඉදිකිරීම් දෙස දෙවරක් බැලීමට තරම් ආකර්ෂණීය නොවුණද, හොංකොංහි ඉදි කළ අවකාශයෙන් වැඩි ප්‍රමාණයකට හිමිකම් කියන්නේ මේවාය.

*හුදෙක් දේශීය* වාස්තු විද්‍යාවට හොංකොංහි ඉතිහාසය සහ භූ ලක්ෂණ (topography) සමග කිට්ටු සම්බන්ධතාවක් පවතී. මේ වාස්තු විද්‍යාවට හොංකොංහි පන්සල් සහ සිද්ධස්ථාන හැරුණු විට, හොංකොං අතීතයේදී ධීවර ගම්මානයක්ව පැවති බව සිහිගන්වන ජලය මත ඉදිකළ වාසස්ථාන ද ඇතුළත්ය. මේ සම්බන්ධව දැක්විය හැකි උදාහරණයක් නම් ඇබර්ඩීන්හි සහ කෝස්වේ බොක්කෙහි සජීව සේවා අවකාශ බවට පරිවර්තනය කර ගන්නා ලද සම්පන් වර්ගයේ බෝට්ටුය (sampan boats). ඒ කෙසේ වෙතත්,

එහි ඇති සම්පන් වර්ගයේ බෝට්ටු සංඛ්‍යාව මේ වන විට පහත වැටෙමින් තිබෙන අතර, එහි විසූ පාවෙන ජනගහනය (වාච්‍යාර්ථයෙන්) වඩාත් සම්මත ආකාරයේ රැකිරක්ෂා සහ වාසික අවකාශ සොයාගනු සඳහා යළි වියළි ගොඩබිම වෙත 'දේශප්‍රත්‍යාවර්තනය' කෙරී ඇත. තවත් එවැනි උදාහරණයක් ලෙස ලින්තවු දිවයිනෙහි බටහිර ප්‍රදේශයෙහි පිහිටි, තායි ඕ නම් ධීවර ගම්මානයෙහි තවමත් දැකිය හැකි මුහුද ආසන්නයේ සිටවන ලද ආධාරක කණු මත ඉදිකෙරී ඇති නිවෙස් දැක්විය හැකිය. කලකට ඉහතදී සමෘද්ධිමත්ව පැවති දූන් දිනෙන් දින වැහැරී යන මේ ධීවර ගම්මානය, අද වන විට අවහරණය කරන ලද (smuggled) භාණ්ඩ භාරගන්නා මධ්‍යස්ථානයක් බවට පත්ව ඇති අතර, එහි ප්‍රධානතම නිෂ්පාදනය වන එක්තරා කරවලයෙක් උපහාසය දනවන ලෙසින් එම ගම්මානයෙහි ලාංඡනය ලෙස යොදා ගැනේ. නව ප්‍රදේශවල වෙනත් ආකාරයක ගම්මාන කිහිපයක් ද දැකිය හැකිය. එනම් චීන ස්වදේශීය ශෛලියට අනුව ඉදිකෙරුණු, තාප්පවලින් වටකරන ලද ගම්මානයන්ය. ඊට එක් නිදසුනක් ලෙස, ආණ්ඩුවේ පොදු නිවාස සංකීර්ණය ආසන්නයේම පවතින, ඒ හා සහජීවනයෙන් පැවතෙන, තවමත් ජනතාවට වාසස්ථාන සපයන ශතිං හි පිහිටා ඇති ට්සං තයි උක් ගම්මාන දැකිය හැකිය. බටහිර ප්‍රදේශයේ දැකිය හැකි විසිරී ගිය උදාහරණ කිහිපයක් හැරුණු විට, ස්වදේශීය නාගරික ශෛලිය සඳහා ඇති අනෙකුත් සියලුම උදාහරණ පාහේ මැකී ගොස් තිබුණ ද, යටත් විජිත ශෛලිය විදහාපාන ව්‍යුහ කිහිපයක් තවමත් ඉතිරිව තිබේ. අප කලින්. සාකච්ඡාවට ලක් කරන ලද ෆ්ලැග්ස්ටාෆ් හවුස් සහ බොහෝ සෙයින් ගෞරවාරෝපිත (much gentrified) කොවෙන්ට් ගාර්ඩන් (Covent Garden) පන්නයට නිමවා ඇති චීන අවන්හල් සහ වෙළඳ සැල් කිහිපයකට සෙවණ දෙන එක්තරා ආකාරයක කෞතුකාගාරයක් හෝ මෝල් එකක් බවට පරිවර්තිත ගොඩනැගිලි මීට උදාහරණ වේ.

හුදෙක් දේශීය වශයෙන් සැලකිය හැකි ව්‍යූහ කාලයක් සහ ස්ථානයක් (a time and place) යන්නෙහි මුල්බැසගෙන තිබුණා විය හැකි නමුත්, මේ වන විට වියැකී ගොස් ඇත්තේද කාලය හා ස්ථානයයි. මේ ව්‍යූහ සතුව ආකර්ෂණීය කතාන්දර තිබෙනවා විය හැකි නමුත්, වෙනත් දිශාවකට ගමන් ගන්නා ලද නගරයේ වර්තමාන ජීවිතය තුළ ඒවාට සැබෑ හඬක් ලැබෙන්නේ නැත. ඒ කෙසේ වෙතත්, ඒවා මගින් සංස්කෘතික මතකය සහ සංරක්ෂණය සම්බන්ධයෙන්, විශේෂයෙන්ම ඒ දෙක අතර ඇති සම්බන්ධය ගැන ඉතා වැදගත් මෙන්ම දුෂ්කර ගැටලුවක් මතු කෙරේ. පැරණි ගොඩනැගිලි සංරක්ෂණය පාදක කරගන්නා තර්කිතය (rationale), නගරයෙහි අති අස්ථානීය බව සහ එහි දිස්වන අඥාත බව ප්‍රතිතුලනය කිරීමක් (counter weight) ලෙස වටහා ගැනීම පහසු වුවද, වර්තමාන හොංකොං නගරය සම්බන්ධයෙන් සලකා බැලිය යුතු තවත් සාධකයක් ද වෙයි. එනම්, මා කලින් ද දක්වූ පරිදි සංරක්ෂණය සඳහා වන ගාමක බලයෙන් (impetus) කොටසක් උත්පාදනය වන්නේ අතුරුදහන් වීමේ සංස්කෘතියක් උභයාර්ථීතයන් හරහා වීමයි. ඈන්තනි කිං විසින් විශ්ලේෂිත ආකාරයේ වඩාත් ඍජු යටත් විජිත තත්ත්වයන්හිදී පවා සංරක්ෂණය, සංදිග්ධතා ලක්ෂණ පෙන්නුම් කරන ලදී. නිදසුනක් ලෙස, ඔහු විසින් 'සංරක්ෂණ සහලක්ෂණය' (the preservation syndrome) ලෙස නම් කෙරෙන තත්ත්වය විස්තර කර ඇත්තේ මෙසේය: "යටත් විජිත සන්දර්භය තුළ මෙය (සංරක්ෂණය) ද්විත්ව උත්ප්‍රාසයකි (double irony). සැලසුම්කරණ ප්‍රයත්න මගින් යටත් වැසි සංස්කෘතිය, අධිරාජ්‍යවාදී වටිනාකම්වලට හුරු කිරීමට තැත්කෙරනවා පමණක් නොව, අධිරාජ්‍යවාදී බලවතුන්ගේ මිනුම් දඬු ආශ්‍රයෙන් 'වාස්තු විද්‍යාත්මක සහ ඓතිහාසික වශයෙන් වැදගත් ගොඩනැගිලි' නිර්වචනය කිරීම සහ 'සංරක්ෂණය' කිරීම මගින්, ස්වදේශීය සංස්කෘතියේ අවශේෂාංග අතුරුදහන්වී යාමට ඉඩ සලස්වයි" (කිං 1990: 50). යම් තැනෙක තිබුණේ කුමක්ද යන්න සංරක්ෂණය කිරීමේදී

එතරම්මටම වැදගත් වන එහි නොතිබුණේ ද කුමක් ද යන්න පිළිබඳ මතකය බොඳ වී යාමේ තර්ජනයක් පවතී. සංරක්ෂණය යනු වරණීය ක්‍රියාවක් නිසා (selective) එය මතකය අතුරුදහන්වීමකි. එනම්, මෙම අතුරුදහන්වීම ද අප කලින් සාකච්ඡාවට බඳුන් කළ විවිධාකාර නාගරික අවකාශ නිරූපණ මෙන්, හොංකොං නුවර ඉතිහාසය වර්තමානයේදී පසුකරමින් සිටින සුවිශේෂී සංධිස්ථානයේදී දේශපාලනික වශයෙන් බොහෝ වැදගත් විය හැකිය. සංරක්ෂණය ගැන ලැබී ඇති බොහෝ උදාහරණ මගින් ඉතිහාසය, අලංකරණය (decoration) අතීත රංජනයක් (nostalgia) ලෙස ව්‍යංග්‍යයෙන් ඇඟවීම හුදු අහම්බයක් නම් නොවේ. අතීත රංජනය යනු ගුප්තවින් තොර දුටු විරූ මායාවයි.

*හුදෙක් දේශීය වාස්තු විද්‍යාවට තියුණු ලෙස පටහැණි වෙමින් අස්ථානීය* අන්තර්ජාතික ගොඩනැගිලිවලට වැඩිම ආකර්ෂණය ලැබේ. *ඒවා කියවීමට භාජනය කිරීම සඳහා* (meant to be read) ඉදිකෙරුණු ගොඩනැගිලි වන අතර, හෙන්රි ලෆෙව්ර පෙන්වා දෙන පරිදි එසේ කියවීම සඳහාම නිර්මිත අවකාශ පහත සඳහන් ලෙස විස්තර කළ හැකිය:

> "වඩාත්ම මුලාකරන සුළු සහ ප්‍රයෝගකාරී පරිකල්පනයන් (the most deceptive and tricked up imaginable) ස්මාරකීයත්වය, නිදසුනක් ලෙස සැම විටම පැහැදිලි හා අවබෝධ කටයුතු පණිවුඩයක් අන්තර්ගතවන සහ එවන් පණිවුඩයක් පනවාගත් ගොඩනැගිලි ... ස්මාරකීය ගොඩනැගිලි, ඒවා නිරූපණය කරන්නේ යයි ඉඟිකරනු ලබන සාමූහික අභිලාෂයන් සමඟ සාමූහික චින්තනය සංකේතවත් කරන සංඥා සහ පෘෂ්ඨයන් (signs & surfaces) පිටුපස බලය සඳහා ඇති අභිලාෂය සහ බලයෙහි අභිමතානුකූලත්වය (arbi-

trariness of power) සඟවාගෙන සිටී. මේ ක්‍රියාවලියේදී සංඥා සහ පෘෂ්ඨයන් මගින් විය හැකියාව (possibility) සහ කාලය මායාවක් බවට පත් කෙරෙයි" (ලෆෙව්ර 1991: 143).

දිනෙන් දිනම වර්ධනය වන තත්ත්වයට අනුව, ස්මාරකීය ගොඩනැගිලි හමුවන්නේ තවදුරටත් මධ්‍යම දිස්ත්‍රික්කයේ පමණක් නොවේ. මේවා අතරින් නවතම ගොඩනැගිල්ල වන, නොදුමුණු ලෙස තමාවම සෙන්ට්‍රල් (මධ්‍යම) ප්ලාසා ලෙස හඳුන්වා ගන්නා ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ වන්චායිහි වන අතර (මධ්‍යම දිස්ත්‍රික්කයේ නොවේ) වර්තමානයේදී



නෝමන් ෆොස්ටර් විසින් සැලසුම් කරන ලද, අභ්‍යවකාශ යුගයේ අමුද්‍රව්‍ය යොදා නිර්මාණය කරන ලද හොංකොංහි 'හොංකොං හා ෂැංහයි' බැංකු මූලස්ථාන ගොඩනැගිල්ල කැමරා කෝණ දෙකකින්.
ඡායාරූප මූලාශ්‍ර: දින සඳහන් කර නොමැති 'හොංකොං හා ෂැංහයි' බැංකු ප්‍රචාරණ පත්‍රිකාවකින් (වම් පස) හා සුඩ්ජික් 1986 (දකුණු පස).



අයි. එම්. පෙයි විසින් සැළසුම් කරන ලද, හොංකොංහි 'හොංකොං බැංකු කුළුණ' කැමරා කෝණ දෙකකින්.
ඡායාරූප මූලාශ්‍ර: http://en.wikipedia.org.

(1997) එය ආසියාවේ උසම ගොඩනැගිල්ලයි (එහෙත් ඒ වැඩි කලකට නොවේ). අස්ථානීය වාස්තු විද්‍යාව දේශීය බවක් නොපෙන්වුවද, ඊට ශක්තිමත් හඬක් ඇත (highly vocal). ඒවා කතාවක් කියනවාට වඩා එක්තරා කරුණක් ඔප්පු කර පෙන්වයි; එම කරුණ බොහෝ විට අතිශයෝක්තියෙන් (rhetorical) සහ ශෛශ්නරූප කේන්ද්‍රීය (phallocentric) එකකි: එනම් 'මම මෙහිදී උසම, ආකර්ෂණීයම, අලුත්ම හෝ මිලාධිකම ගොඩනැගිල්ල වෙමි'යි යන්නය. හොංකොං කොටස් වෙළඳපොළට සහ ප්‍රධාන ජාත්‍යන්තර බැංකු කාර්යාලවලට සෙවණ දෙන එක්ස්චේන්ජ් ස්ක්වෙයා නම් ගොඩනැගිල්ල එහි තිබූ වඩාත්ම ආකර්ෂණීයම ඉදිකිරීම වුවද, අද වන විට මධ්‍යම දිස්ත්‍රික්කයේ ඉදි වී ඇති සිටි බැන්ක් ප්ලාසා හමුවේ ප්‍රබල තරගයකට මුහුණ දී සිටී. චීන බැංකුව එය ඉදිකෙරුණු කාලයේදී, හොංකොංහි පිහිටි උසම ගොඩනැගිල්ල වුවද, වර්තමාන හොංකොංහි උසම ගොඩනැගිල්ල සෙන්ට්‍රල් ප්ලාසා වන

නමුත් චීන බැංකුවට තවමත් සිය ශෝභනත්වය (elegence) ගැන ආඩම්බර විය හැකිය. මෑතදී වැඩ නිමවන ලද රැජිණ පාරේ අංක 09 දරන ස්ථානයේ හොංකොංහි ප්‍රථම 'පශ්චාත් නූතනවාදී' (postmodernist) ගොඩනැගිල්ල ලෙස ආඩම්බර විය හැකි ගොඩනැගිල්ල බිහි වූ අතර, එනිසාම එය වඩාත්ම සමකාලීන ඉදිකිරීම බවට ද පත්වන්නේ එය ඉදිකිරීමේදී තත්කාලීන වාස්තු විද්‍යාත්මක ශෛලීන් මනාව භාවිත කරනු ලැබ ඇති නිසාය. වඩාත්ම මිලාධික සහ තාක්ෂණික වශයෙන් ඉදිරියෙන් සිටින්නට තවමත් සමත්ව ඇත්තේ හොංකොං බැංකුවයි. මේ සියලු වාස්තු විද්‍යාත්මක අතිශයෝක්තීන් ව්‍යූහ විභාගනය සඳහා පරිණත බවට පත්ව තිබේ. හොංකොංහි පීක් ප්‍රදේශයෙහි සුඛෝපභෝගී සමාජ ශාලාවක් ඉදි කිරීම සඳහා සැලසුම් නිර්මාණය කිරීමේ අන්තර්ජාතික තරඟයට සාහා හඩිඩ් ඉදිරිපත් කළ සැලැස්ම අතිශයෝක්ති විරෝධී එකක් විය. එම සැලැස්මෙහි එක් ප්‍රධාන ලක්ෂණයක් නම්, කඳුකර දෙසට තිරස්ව විහිදී යන විශාල බාල්ක හතරකි. එමගින් සිරස් බව (verticality) සහ ශෛශ්න රූප කේන්ද්‍රීයත්වය පිළිබඳ පොදු අතිශයෝක්තිය ව්‍යූහ විභාගනය කරමින් තිරස් අතට අහස සූරන ගොඩනැගිලි (horizontally embedded sky scrapers) පිළිබඳ ප්‍රතිරූපයක් හඳුන්වා දෙයි.

තවමත් හොංකොංහි වඩාත්ම මනස්කාන්ත ගොඩනැගිලි දෙක නම්, නෝමන් ෆොස්ටර් නම් බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාඥයා විසින් නිම කරන ලද හොංකොං හා ෂැන්හයි බැංකු ගොඩනැගිල්ල සහ අයි. එම්. පෙයි නම් විදේශගත චීන වාස්තු විද්‍යාඥයා විසින් නිර්මිත චීන බැංකු කුළුනයි (China Bank Tower). මධ්‍යම දිස්ත්‍රික්කයෙහි, සිය ස්මාරකීයත්වය ද විදහාපාමින් එකිනෙක ආසන්නයේ නැගී සිටින මේ ගොඩනැගිලි දෙක දෙස බලන විට, ඉන් මතුව එන දේශපාලන රූපකය පෙනීයාමට පටන් ගනී. අප මීළඟට දකින්නට යන ආකාරයට මේ ගොඩනැගිලි දෙක, අතුරුදහන් වීම සම්බන්ධ රූපක වුවත්, අවකාශීය සහ දේශපාලන එදිරිවාදීකම පිළිබඳ සම්බන්ධතාවකට

ද කොටු වී තිබෙනු දැකිය හැකි වනු ඇත. ෆොස්ටර්ගේ නිර්මාණය ලොව වඩාත්ම මිලාධික දේපොළ (world's most expensive piece of real - estate) ලෙස ප්‍රසිද්ධියක් ලබා තිබේ. අභ්‍යවකාශ යුගයේ අමුද්‍රව්‍ය යොදාගෙන බහු ජාතික සමාගම් කණ්ඩායමක් විසින් ඉදිකෙරුණු මෙම ගොඩනැගිල්ල, උසස් තාක්ෂණයට කෙරෙන දඩබ්බර උපහාරයකි. ඊට පරස්පරව පෙයි විසින් නිර්මාණය කරන ලද වඩාත් ශෝභන ගොඩනැගිල්ල, සිරස් බවට සහ දිසිරූ බවට (verticality and visuality) කෙරී ඇති එක් වාස්තු විද්‍යාත්මක ගුණ ගායනාවක් (architectural ode) වැනිය. ජ්‍යාමිතික වශයෙන් එය ප්‍රිස්මයක හැඩය ගනී. ප්‍රිස්ම හතරකින් සමන්විත වඩා ශක්තිමත් පාදක කොටසින් ඉහළට නැගෙන මෙම ගොඩනැගිල්ල, ඊළඟ අදියරේදී වඩාත්ම සැහැල්ලු වෙමින්, ප්‍රිස්ම තුනකින් යුතුව සහ ඉන් අනතුරුව ප්‍රිස්ම දෙකක් සහ අවසානයේ ගොඩනැගිල්ලේ ඉහළම මාල එක් ප්‍රිස්මයක් තුළට ගොනු කරමින් නැනී ඇති අතර, මේ සමස්ත ව්‍යුහයම අභිභවමින් රිටි දෙකක් ඉහළට නගිමින් එය තවදුරටත් ඉහළට යොමු කරයි. මට සිතෙන ආකාරයට නම්, මේ ගොඩනැගිල්ල ඒ හා සමානම හැඩයෙන් යුත් සුප්‍රකට ස්විට්සර්ලන්ත චොක්ලට් වර්ගයක වෙළෙඳ නාමය ආශ්‍රයෙන් ටොබ්ලරොන් ගොඩනැගිල්ල ලෙස හැඳින්විය හැකිය. මේ සම්බන්ධයෙන් අපට ඇසිය හැකි ප්‍රශ්නය නම් මේ ගොඩනැගිලි දෙක හරහා හොංකොං නගරය තුළ කොතරම් දුරකට චීනය සහ බ්‍රිතාන්‍යය අඟවනු ලබන්නේද යන්න සහ ඒ මත පදනම්ව, කොතරම් දුරකට එහි පුරවැසියන්ගේ පක්ෂපාතීත්වය ඉල්ලා සිටින්නේ ද යනුයි. මෙහිදී සිත් ඇදගන්නා සුළු තවත් කරුණක් නම්, මේ ගොඩනැගිලි අතර කෙතරම් වාස්තු විද්‍යාත්මක අතිශයෝක්තිමය වෙනස්කම් තිබුණ ද, ඒ දෙකම සමකාලීන වාස්තු විද්‍යාවට නිදසුන් ලෙස දැක්විය හැකිවාක් මෙන්ම, එකම ක්‍රමයක් තුළ ඇති විචලනයන් වන බවයි. ඇතැම් විට, මේ ගොඩනැගිලි දේශීයකරණයට (localization) උත්සාහ කිරීමේදී ඒවා

සිය ව්‍යුහය මගින් ජනිත කරනු ලබන ආකෘතික තර්කය හා නොසැසඳෙන සැලසුම් මූලිකාංග (design elements) අන්තර්ග්‍රහණය කරගෙන ඇතුවා සේ පෙනෙන්නේ මේ හේතුවෙන් නිසා විය හැකිය. නිදසුනක් දක්වතොත්, හොංකොං හා ෂැංහයි බැංකු ගොඩනැගිල්ල නිර්මාණයේදී, පැරණි බැංකුවේ පිවිසුම් දෙපස සිටි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී යුගයට අයත් දරුණු පෙනුමැති පිත්තල සිංහ රූප දෙක එක්තරා ආකාරයක ඓතිහාසික පූජා වස්තුවක් මෙන් නව ගොඩනැගිල්ල තුළ ද ආරක්ෂා කරනු ලැබ ඇත. එහෙත් දූන් ඇති ප්‍රශ්නය නම්, නව ගොඩනැගිල්ලට විධිමත් පිවිසුම් දොරටුවක් නැති අතර, බිම් මහල දෙපසින්ම මහාමාර්ගය හා සම්බන්ධ වීමෙන් ඉහත කී සිංහයන් දෙදෙනා සිය බිම් ප්‍රදේශවලින් පලවා හරිනු ලදුව දැන් අහිංසක පූස් පැටවුන් දෙදෙනකු මෙන් දිස් වීමය. දේශීයකරණය සඳහා ගන්නා ලද තවත් උත්සාහයකදී, පෙයි විසින් නිර්මිත සැරසිලි කිසිවකින් තොර විදුරු සහ වානේ ආශ්‍රයෙන් කළ ගොඩනැගිල්ලේ පහළ කොටසෙහි, එම ගොඩනැගිල්ලේ එකම අලංකරණය ලෙස ඊට ඊනියා චීන ලක්ෂණ සහිත (quasi-Chinese) ආවරණයක් (effect) ලබාදීම සඳහා කළු සහ සුදු කිරි ගරුඬ යොදාගෙන අලංකරණය කෙරී ඇති අතර, එහි විදුරු ව්‍යුහය එක්තරා උපක්‍රමශීලී බවකින් ද යුතුව උණ බම්බු හා සන්සන්දනය කෙරේ. කෙසේ වෙතත්, වෙනස සඳහා දරන ලද මේ ප්‍රයත්න මගින්, මේ ගොඩනැගිලි දෙකම සම්බන්ධ අවකාශීය තර්කනය (spatial logic) අයත් වන්නේ එකම ජාත්‍යන්තරවාදී වාස්තු විද්‍යාත්මක ක්‍රමයකටය යන කාරණය සඟවාලන්නේ දුර්වල වශයෙනි. මෙමගින් අපට නැවත සලකා බැලීමට බල කෙරෙන්නේ, 1997 න් පසු හොංකොං අනුගමනය කරන දේශපාලන ආදර්ශය වන 'එක් රටක්, ක්‍රම දෙකක්' (one country, two systems) යන අපට නිතර ඇසෙන, හොංකොං නගරය සමාජවාදී දේශයක් තුළ සුවිශේෂී ධනවාදී ප්‍රජාවක් ලෙස පැවතීම පිළිබඳ සූත්‍රයයි. නගරයෙහි ඉදිකළ ආකෘති (built forms) අපට

කියන දෙය නම්, ඊට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ දෙය වන 'එක් ක්‍රමයක්' (ජාත්‍යන්තර ප්‍රාග්ධනයෙහි) එහි සංවර්ධනයෙහි විවිධ අවස්ථා පසුකරමින් සිටින බවයි. අපට මෙහිදී හමුවන්නේ අතුරුදහන්වීමේ පද්ධති දෙකකි. ඉන් පළමුවැන්න, 'එක් රටක්' යන උද්ධෘතයෙන් ඇඟවෙන සුවපහසු බව ගෝලීය ආර්ථික ක්‍රමය තුළ අතුරුදහන් වීම වන අතර, දෙවැන්න නම් එම උද්ධෘතය තුළම පරමාදර්ශී වශයෙන් එකිනෙකට වෙනස් සමාජ-ආර්ථික ක්‍රම දෙකක් පිළිබඳ හැඟීම අතුරුදහන්වී යාමයි.

මෙම වාස්තු විද්‍යාත්මක ප්‍රදර්ශන භාණ්ඩවලට එරෙහිව හොංකොංහි ඇති බහුතර වාණිජ සහ වාසික ගොඩනැගිලි කිසිම ආකාරයකින් කැපී පෙනෙන ඒවා නොවේ. එකම ආකාරයේ සම්මත ආකෘති, හිස් බිම් කඩක් ඇති ඕනෑම තැනක යළි ඉදිවනවා අපි දකිමු. හොංකොංහි ඇති සුවිසල් වාසික ප්‍රදේශ (residential estates) ඒවා රජයෙන් ඉදිකළ නිවාස සංකීර්ණ හෝ පෞද්ගලික අංශය මගින් ඉදිකළ ඒවා වුවත්, සිරස්ව නැගී සිටින පරිප්‍රාකාරික ගම්මාන ලෙස පෙනී යයි. එහි ප්‍රතිඵලය ලෙස, දේශීය නාගරිකත්වයේ (urban vernacular) වර්තමාන ස්වරූපය මගින් - අපට ඉදිරිපත් කෙරෙන්නේ නගරයේ බොහෝ ප්‍රදේශවල විහිදී යන ආකාරයේ දෘශ්‍යමය ආඥාත බවක් (visual anonymity) වන අතර, ඊට කිසිදු වාස්තු විද්‍යාත්මක අනන්‍යතා ලක්ෂණයක් හිමි කරගැනීමට අවකාශ ලබාදෙන්නේ ද නැත. එහෙත් හේතු ගණනාවක බලපෑම නිසා නගරයෙහි අන් සියල්ලටම වඩා කැපී පෙනෙන්නේ මෙම අඥාත බවයි.

මේ සාකච්ඡාව ආරම්භ කිරීමට, වාස්තු විද්‍යාත්මක අඥාත බව සහ අධි ජනඝනත්වය පිළිබඳ ප්‍රශ්නය අතර සම්බන්ධතාවක් පවතින්නේ යැයි කිව හැකිය. අධිජනඝනත්වයට දිය හැකිව තිබූ එකම විසඳුම අති විශාල තට්ටු නිවාස පද්ධති ක්ෂණිකව ඉදි කිරීම යයි කෙනෙකුට තර්ක කළ හැකිය. නිදසුනක් ලෙස, විනාශකාරී ගින්නකින් සරණාගතයන් බවට පත් වූ

බහුතරය චීන ජාතිකයන් වූ තිස්තුන් දහසක් ජනතාවට වාසස්ථාන සැපයීම සඳහා 1953 දී ශෙක් කිප් මෙයිහිදී ඉදිකෙරුණු හොංකොංහි ප්‍රථම නිවාස සංකීර්ණය පිළිබඳ කතන්දරය නිතර අසන්නට ලැබේ. මාක් 1 ආකෘතිය: මෙම මාක් 1 ආදර්ශ නිවාස සංකීර්ණයේ ඉදිකරන ලද නිවෙස් ඉතාමත් මූලික ආකෘතියක් දරුවද ෂෙක් කිප් මෙයිහි මුඩුක්කු නගරයක තත්ත්ව යටතේ මෙන් ජීවත් වූ ජනයාට නම් එය වර්ධනීය පියවරක් විය. වර්තමානයේදී මුළු ජනගහනයෙන් සියයට 50 ක් පමණ වන මිලියන 2.8 ක ජනතාවක් වාසය කරන්නේ ආණ්ඩුවේ ආධාර යටතේ තැනුණු වාසස්ථානවල වන අතර, ආණ්ඩුව මගින් වැඩිවන ඉල්ලුම සපුරාලනු වස් මහල් නිවාස (flats) හතලිස් දාහක් ඉදිකෙරෙනු ලැබේ. සමාජ කුරිරු බව (social ruthlessness) ගැන ප්‍රසිද්ධයක් උසුලන හොංකොං වැනි නගරයක දැකිය හැකි මේ තත්ත්වය පුදුම එළවන සුළු මෙන්ම අගය කළ යුතු එකක් වන අතර එය බොහෝ දෙදෙනෙකුට ඇතැම් විට ප්‍රහේලිකාවක් ද වූයේ ඇතැම් විචාරකයන් විසින් ආණ්ඩුවේ මෙම යළි පදිංචි කරවීමේ වැඩසටහන ආරම්භ වී ඇත්තේ හුදු සමාජ සුභසාධන පරමාර්ථයෙන් පමණක් නොවන බව පෙන්වා දෙන තුරු පමණි. යළි පදිංචි කරවීමේ ක්‍රියාවලිය හරහා සංවර්ධනය සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කරගත හැකිය; ලාභදායි නිවාස සැපයීම මගින් පඩි වැඩි කිරීම මත ඇති කෙරෙන පීඩනය අඩුවීම හරහා ලාභ ශ්‍රමය නිෂ්පාදනය වන අතර, එය පැරණි ගොඩනැගිලි කඩා ඉවත්කර ගැනීමට එරෙහිව නැගෙන හණමිටි කරුවන්ගේ විරෝධතා, ඒවා ඇති වීමටත් පෙරම නිශ්ප්‍රභ කරයි.

මෙම කතාවට (ඊටම සම්බන්ධ වුවත්) තවත් පැතිකඩක් ද තිබේ. අධිජනඝනත්වය යනු සීමාසහිත අවකාශය තවදුරටත් සීමාසහිත වීමේ ප්‍රතිඵලයක් මෙන්ම, එම සීමාසහිත අවකාශ ආර්ථික වාසි ලබාගැනීම සඳහා භාවිත කළ යුත්තේ කෙසේද යන්නේ ද ප්‍රතිඵලයකි. යටත් විජිත ආණ්ඩුව මෙම අධිජනඝනත්වය පිළිබඳ ප්‍රශ්නය පාලනය කරන්නේ ලාභදායි

නිවාස සංකීර්ණ ඉදිකිරීම හරහාය. අනෙක් අතට, යටත් විජිත ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ලෙස දනට ක්‍රියාවේ යෙදවෙන ඒ සතු කිරීටීය ඉඩම (crown land) උපාය මාර්ගිකව වැදගත් අවස්ථාවලදී, ටිකින් ටික මුදාහැරීම සහ ඒ සතු කිරීටීය වරප්‍රසාදයක් වන ඉඩම් ග්‍රාමීය හෝ නාගරික (ඒවාහි ගොඩනැගිලි ඉදිකිරීමට සම්බන්ධ නීති සඳහා) ලෙස නම් කිරීමේ බලය හේතුවෙන් ගොඩනැගිලි අවකාශය දුලබ වනවා පමණක් නොව, දේපළ මිල ගණන් ද ඉහළ මට්ටමකම පැවතීම තවදුරටත් තහවුරු වේ.

මේ තත්ත්වයටම උදව් දෙන තවත් කරුණක් නම්, බැංකුවල ප්‍රතිපත්තියක් වන වසර දහයකට මෙපිට ඉදිකළ ගොඩනැගිලි මිලට ගැනීම සඳහා සිය ගනුදෙනුකරුවන්ට සහනදායී ණය ක්‍රමයක් පත්වාගෙන යාමත්, වසර තිහකට මෙපිට ඉදිකළ ගොඩනැගිලි මිලට ගැනීම සඳහා ණය ලබා නොදීමත් නිසා, ඉඩම් සංවර්ධනය කරන්නන් සැමවිටම නව ගොඩනැගිලි ඉදිකිරීමට ධෛර්යවත් වීමත්, එනිසාම ඉඩම් සඳහා ඇති ඉල්ලුම තවත් ඉහළ යාමත්ය. මේ අනුව බැලූ විට පෙනී යන්නේ සහ යා යුත්තේ, ආණ්ඩුවේ සහ පෞද්ගලික අංශයේ අඥාත මහල් ගොඩනැගිලි, අධි ජනඝනත්වය පිළිබඳ ප්‍රශ්නයට ලබාදෙන එක් විසඳුමක් පමණක් නොවන නමුත්, එම ප්‍රශ්නය ගොඩනැගිලි හිමිකරුවාට වාසිදායක වන ආකාරයට පරිවර්තනය කරනු ලබන සහ ප්‍රශ්නය පිළිබඳව දර්ශකයක් ලෙස පෙනී සිටින සාධකයක් ලෙසය. මෙම තත්ත්වය මෙසේ පවතින තාක් කල්, හොංකොංහි දේශීය නාගරිකයට එහි ඒක මානීය (one-dimentional) ලක්ෂණයෙන් මිදෙනු නොහැකිය.

බලය පිළිබඳ අස්ථානීය භූමි දර්ශන සහ අඥාත දේශීය නාගරික භූ දර්ශනයක් හමුවේ සිටින අප අසනු ලබන ප්‍රශ්නය නම්, සුබයෙහි සහ තරගයෙහි ශෘංගාරාත්මක අවකාශ එකිනෙක හා තරග වැද සිටින බහු ප්‍රස්තුත අවකාශ (heterotopic spaces of contestation) සහ පරිවර්තනයෙහි හා

වෙනස්වීමෙහි උපාන්තික අවකාශ (limial spaces of transition and change) කොහි තිබේද යන්නයි. මේවා ගැන දිය හැකි උදාහරණ බොහෝ ගණනක් සිතට නගින්නේ නැතිවාක් මෙන්ම, එසේ සිතට නැගෙන උදාහරණ ද ඇතැම් විට සංදිග්ධ ඒවා වේ. ඉරිදා දිනයන්හි පිළිරූ චතුරස්‍රය (Statue Square) අවට ප්‍රදේශය සලකා බලමු. මෙම (මධ්‍යම දිස්ත්‍රික්කයෙහි පිහිටි) කොන්ක්‍රීට්වලින් නිමවා ඇති චතුරස්‍රය විශේෂයෙන් ආකර්ෂණීය එකක් නොවන අතර එය හොංකොං බැංකුවට ඉදිරියෙන් සහ අන්තර්ජාතික මට්ටමේ හෝටලයක් වන මැන්ඩරින් හෝටලයට යාබදව පිහිටා තිබේ. ඉතා ඇඩි වශයෙන් ඉදිකිරීම්වලින් ගහන ප්‍රදේශයක් වන මෙහි ඇති එකම විවෘත අවකාශය මෙම චතුරස්‍රයයි. සතියේ දිනවලදී හොංකොංහි ප්‍රබල වාණිජ ප්‍රදේශය වන මධ්‍යම දිස්ත්‍රික්කය ඉරිදා දිනයේදී බහුතරයක් වන පිලිපින ගෘහසේවිකාවන්ගේ ග්‍රහණයට නතුවන අතර, චතුරස්‍රය වටා රොක්වන මේ සංක්‍රමණික සේවිකාවෝ ඊට සැණකෙළි අවකාශයක ස්වරූපය ලබාදෙති. ඔවුහු එහිදී එකිනෙකා හා කතාබහ කරති, තොරතුරු හා ප්‍රවෘත්ති හුවමාරු කර ගනිති, ආහාර වේලක් හෝ සිය රටින් ගෙනා පුවත්පතක් බෙදාහදා ගනිති. මෙහි කුඩා පරිමාණයේ ව්‍යවසායකත්ව කටයුතු ද සිදුකෙරේ. එනම්, අර්ධකාලීන රූපලාවණ්‍ය ශිල්පීන් සහ අත් සහ නිය අලංකරණ ශිල්පීන් ද වැගලොග් බසින් වන සඟරා වෙළඳුන් ආදීන් ද එහි දී දකගත හැකිය. එක් කලකදී මේ හමුවීම් අධෛර්ය කිරීමට නිලධාරීන් විසින් ඒ සඳහා පූර්ණ කැපවීමකින් තොරව පියවර ගැනුණු නමුත්, මේ වන විට ඔවුන් එම ගෘහ සේවිකාවන්ගේ ග්‍රහණයට නතුවන මධ්‍යම දිස්ත්‍රික්කය සති අන්ත දිනයන්හිදී වාහන ගමනාගමනය අත්හිටවූ ප්‍රදේශයක් බවට හරවා ඇත. එසේ නම්, ඉරිදා දිනයන්හිදී පිළිරූ චතුරස්‍රය, බලය පිළිබඳ හා ප්‍රීතිය පිළිබඳ අවකාශයක් බවට හැරවීමේ හෝ පරිවර්තනය කර ගැනීමක් සඳහා නිදසුනක් සපයයි ද? එහෙත් සැබෑවටම නම්, තත්ත්වය මෙය නොවන්නේ ඉරිදා දින හමුවීම

සතිපතා කෙරෙනුයේ බලධාරීන්ගෙන් අවසර ලබාගැනීමෙන් අනතුරුව නිසා, සහ නැවත සඳුදා උදා වන විට සියල්ල නැවත 'සාමාන්‍ය' තත්ත්වයට පත්වන නිසාවෙනි. එහි බලය පිළිබඳ තරග කිරීමක් කෙරී නැත. ඇතැම් විට මේ ඉරිදා දිනයේදී මධ්‍යම දිස්ත්‍රික්කයේ බලය තහවුරු කර ගැනීම, බලය පිළිබඳ සංකේතීය අවකාශ එම බලය මගින් ඉවත් කරන ලද්දවුන් තුළ ඇතිකරන මෝහනීය බවට ඉතා කදිම උදාහරණයකි. බලය නැතියවුන්ට මධ්‍යම දිස්ත්‍රික්කය නැරඹීමට අවසර ඇත. ඒ වෙළෙඳසැල්වල වීදුරු කවුළු තුළින් එතුළ ඇති බොහෝ දේ නරඹනවා වැනිය. ඒවා ස්පර්ශ කිරීමට අවසර නැත.

මීට මදක් වෙනස් උදාහරණයක් නම්, මධ්‍යම දිස්ත්‍රික්කයේ තිබූ පැරණි මාවතක නාමයට අනුරූපව නම් කෙරුණු ලන් ක්වෙයි ෆොං ප්‍රදේශයයි. මධ්‍යම දිස්ත්‍රික්කයෙහි වඩා කඳුකර සහ ළඟාවීමට අපහසු ප්‍රදේශයක පිහිටා තිබෙන මෙම ප්‍රදේශය වාණිජ අවකාශයක් වශයෙන් යෝග්‍ය නොවූ අතර, එතරම් ප්‍රසිද්ධ තැනක් ද නොවීය. මෑතක් වන තුරුම ලං ක්වෙයි ෆොං, එතරම් කැපී නොපෙනෙන සහ විලාසිතා අවශෝෂණය කර නොගන්නා, වෙළඳ මධ්‍යස්ථානයට දුරින් පිහිටා තිබුණු, පටු මාවත්, දෙවැනි පෙළ කන්තෝරුවලින් සහ කුඩා කඩ සාප්පුවලින් ගහන, දේශීය ආපනශාලා, මල් වෙළෙඳ සැල්වලින් සහ සපත්තු මහන්නන්ගෙන් ගහන ප්‍රදේශයක්ව පැවතිණි. එනම්, එය හොංකොංහි දේශීය නාගරිකයේ කොටසක් විය. එහෙත් මෙම විස්තරයෙන් ද පෙනී යන පරිදි, මෙම ප්‍රදේශය සතුව ද ආකර්ෂණීය ලක්ෂණ පවතින බවත්, ඒවාට තවදුරටත් ගෞරවාරෝපණය කළ හැකි බවත්, සමහර වෙළඳාමේ දක්ෂයෝ දුටුවහ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, එහි මනහර අවන් හල් පෙළක් ඉතා ඉක්මනින් මතුවිණි. ඉන්පසු යුරෝපීය පන්නයේ බියර් ශාලා (එහි විශේෂ විධි අනුව පැසවූ මධ්‍යසාර අලෙවි කෙරිණි), කෝපි ශාලා, හොංකොංහි

එකම ජෑස් සමාජ ශාලාව, කලාගාර ආදියෙන් පිරුණු, පොදුවේ ගතහොත් මෝස්තරකාරී හමුවීමේ ස්ථානවලින් (stylish meeting places) ගහන ප්‍රදේශයක් බවට හැරවිණි. නව සාප්පුවල අධි-තාක්ෂණික ක්‍රෝමියම් සහ ප්ලෙක්සිග්ලාස් (plexiglass) යොදා තනන ලද ජනෙල් ආසන්නයේම මල් වෙළෙන්දෝ සහ සපත්තු මහන්නෝ පෙර සේම සිටිති. එහි මාවත්වලට එක්තරා පැරණි පෙනුමක් (ye olde look) ලබාදීම සඳහා ඒවා නැවත ගල් කැට අතුරා ප්‍රතිසංස්කරණය කෙරුණි. මෙහි වටාපිටාව එකම විට ඇමෙරිකානු (විශේෂයෙන්ම කැලිෆෝර්නියානු), යුරෝපීය සහ ස්වදේශික වෙයි.

දඟකාර ලෙස මිශ්‍ර වී ඇති මේ අවකාශය, තමා ජේත්තුකාර සහ ශෝභනකාමී (hip & arty) යැයි සිතීමට කැමති අයගේ සිත් බැඳගනී. විශේෂයෙන්ම තරුණ සහ ධනවත්, මෙම කඳුකර ස්ථානයට යාමට තරම් සිත්දෙන, එමෙන්ම එහි ඉතා ඉහළ වියදම් දැරීමට සිදුවීම නොතකන, ඉහළ චලතාවයට රුචි අයගේ සිත් ඇදගැනීමට මේ ස්ථානය සමත්ය. ඒ කෙසේ වුවත්, එහි මුඛ්‍යාර්ථය වන ප්‍රීතිවීමේ සහ එකිනෙකා හමුවීමේ අවකාශයක් ලෙස, ලං ක්වෙයි ෆොං සතු ප්‍රධාන දුර්වලතාවක් වෙයි. එනම්, එහි ඇතුළුවීමට ගෙවිය යුතු විශාල මුදලයි. නව යොවුන් වියෙහි සිටින්නන්ට නම් එහි නොමිලේ ඔබමොබ සැරි සැරීමට අවසර ඇත. ලං ක්වෙයි ෆොං, උපාන්තික අවකාශයක ඇතැම් ලක්ෂණ පෙන්විය හැකි නමුදු, එය ද වඩාත් බලවත් ප්‍රාග්ධනය යන තේමාවේම තවත් එක් විචල්‍යක් පමණි. ෂැරන් සුකින්ගේ වචනවලින් ප්‍රකාශ කරන්නේ නම්, පැහැදිලි 'දේශීයත්වය', ප්‍රාග්ධනය මගින් බලයෙන් අත්පත් කරගෙන (appropriated) එය කමනීය භූ දර්ශනයක් (desirable landscape) බවට පරිවර්තනය කරයි (සුකින් 1992). එහෙත් මෙම පරිවර්තන ක්‍රියාවලිය පූර්ණ වශයෙන්ම තීරණය වන්නේ වාණිජවාදය හරහා වන අතර මෙම උදාහරණය අනුව කිසිම පරිවර්තනයකට භාජනය නොවීම හරහා පෙනී යන පරිදි අවසන් වශයෙන් ගත් කළ දේශීය නාගරිකය

ගැන කිසි තැකීමක් නොකරයි. මේ සම්බන්ධයෙන් සලකා බලන කල, ලං ක්වෙයි ෆොංහි අවකාශය වඩාත් මැතකදී ඉදිකළ මෝල් සහ විනෝදාස්වාද සංකීර්ණයක් වන ටයිම්ස් චතුරස්‍රය හා සන්සන්දනය කර බැලිය හැකිවන්නේ මේ අවකාශ දෙක බොහෝ සෙයින් එකිනෙකට වෙනස්වන බව ද නොසලකමිනි. කෝස්වේ බොක්කෙහි (Causeway Bay) සහ හැපී වැලි (Happy Valley) අතර පිහිටි, කලකට ඉහතදී දේශීය වෙළෙඳපොළ වීථියක්ව තිබූ රසල් වීදියෙහි පිහිටා ඇති, ටයිම්ස් චතුරස්‍ර සංකීර්ණය, සැලසුම් කරනු ලැබ ඇත්තේ සිය වටාපිටාව ගැන තැකීමකින් තොරව (ෆෙඩ්රික් ජැමිසන් විස්තර කර ඇති පශ්චාත් නූතන අවකාශ මෙන්) අභ්‍යන්තරය වෙත යොමු වූ ඇල්මකින් යුත්, ස්වාධීන (autonomous) අවකාශයක් ලෙසිනි. ඒ නිසා මේ මෝල් සංකීර්ණයට පැමිණෙන අමුත්තන්ට එහි වීදුරුවලින් ආවරණය කරන ලද සෝපානයන්හි නැගී ඔබ මොබ සැරිය හැකිවා මෙන්ම, මෝල් සංකීර්ණයෙන්ම ආරක්ෂාව ලබා, රසල් වීථිය අනෙක් පැත්තේ මීටර කිහිපයක් දුරින් පිහිටා තිබෙන ගරා වැටුණු නිවෙස්වල අභ්‍යන්තරය සහ ඒවායේ වහළවල් දෙස එක්තරා ප්‍රීතියකින් යුතුව සෘජුවම බැලිය හැකිය. ලං ක්වෙයි ෆොං ද සන්සන්දනය සඳහා භාවිත කළ හැකි තරම් අවකාශීය උදාසීනත්වයක් (spatial indifference) ප්‍රදර්ශනය කරයි. එය බොහෝ දුරට බලයෙන් අත්පත් කරගත් දේශීය අවකාශයක් වන හෙයින්ම ඊට සිය දේශීය බව අමතකව ගොස් තිබේ.

## සමාප්තියක් වෙනුවට

තුන්වන නිදසුන මගින් අපව නැවතත් අධිජනඝනත්වය කෙරෙහි යොමු වූ දේශීය ප්‍රතිචාරය වෙත ගෙන යයි. තම අධ්‍යයනය හොංකොංහි මෙම අධිජනඝනත්වය මත නාභිගත වෙමින් මෑතකදී හොංකොං නාගරික

අවකාශය අධ්‍යයනය කළ ජපන් ජාතික වාස්තු විද්‍යාඥයෝ කණ්ඩායමක් පුදුම එළවන සුළු නිගමන කිහිපයක් ගම්‍ය කළහ. ඔවුන් සිය කටයුතු ආරම්භ කෙළේ ඒ හා ගනුදෙනු කළ හැකි දෙවිධියක් ප්‍රභේදනය කරමිනි. ඉන් එක් ක්‍රමයකින් යෝජනා කෙරුණේ සුප්‍රසිද්ධ ප්‍රංශ වාස්තු විද්‍යාඥ ල' කුර්බිසියේගේ 'මිලියන තුනක ජනතාවක් සඳහා වන සමකාලීන නගරය' පිළිබඳ දැක්ම මගින් පෝෂිත නගර සැලසුම්කරණය පිළිබඳ නූතනවාදී අදහස්වලට අනුව වූ අතර, එහිදී කෘත්‍යයන් වෙන් කිරීම (seperation of functions) සහ වාණිජ අවකාශ සහ වාසික අවකාශ එකිනෙකින් වෙන් කර තැබීම ද අවධාරණය කිරීමය. එහෙත් මෙම බෙදා වෙන්කිරීම එම අවකාශයේ අන්‍යෝන්‍ය අභිවර්ධනයට (mutual enhancement) රුකුලක් දෙනු ඇත්ද, නැතහොත් නිරස සමජාතීත්වයක් නිර්මාණය කරනු ඇත්ද? අනෙක් ක්‍රමය නම්, හොංකොංහි පවතින ක්‍රමය වන ආක්‍රමණශීලී ලෙස කෘත්‍යයන් මිශ්‍ර කරන රාජ්‍ය සහ පෞද්ගලික අංශ හෝ වාණිජ සහ වාසික අවකාශ එකිනෙක බෙදා වෙන්කරන්නේ නැති 'විකල්ප අගනගරය' (alternative metropolis) තුළ ඇති ක්‍රමයයි. එහි ප්‍රතිඵලය නම්, විෂමජාතීත්වය, සක්‍රියත්වය (vitality) සහ සංකීර්ණත්වය බවට තර්ක කෙරේ. නිදසුනක් දක්වතොත්, හොංකොං යනු, ජනතාව පිජාමා ඇඳුම ඇඳ මෝල් තුළ භාණ්ඩ මිලට ගනු දැකිය හැකි ලෝකයේ විරල නගරවලින් එකකි. නූතනවාදී නගර සැලසුම්කරණයෙන් ගන්නා ලද අදහස් ද, ඒවා ක්‍රියාවේ යෙදවීමේ දී වෙනස් වී යයි. පදිකයන්ගෙන් වාහන වෙන්කර තැබීම සිය අරමුණ කරගත් පදික මංතීරුව පිළිබඳ අදහස සලකා බලමු. අප මධ්‍යම දිස්ත්‍රික්කයෙහි සහ අනෙකුත් නව නගරවල පදික මං තීරු දකින නමුත් ඒවාහි කෘත්‍යය වෙනස් වී තිබේ. උදාහරණ වශයෙන්, මධ්‍යම දිස්ත්‍රික්කයෙහි, පදික මං තීරු මගින් මහජනයා මෝටර් රථවලින් වෙන් කෙරෙන්නේ නැත. ඒ වෙනුවට අමතර විකල්ප මං තීරුවක් (additional alternative path)

ලබාදී ඇති අතර නව නගරවල අප දකින්නේ වෙළඳ සැල් සහ සාප්පු මගින් සීමා කරන ලද පදික මං තීරුය. එනමි මෙහි ඇති නැඹුරුව, විශේෂීකරණයට සහ වෙන් කිරීමට (specialization and separation) නොව ඒ වෙනුවට, ගුණනය කිරීම (multiplication) සහ එකම අවකාශය තුළ කෘත්‍යයන් කිහිපයක් සංකේන්ද්‍රණය කිරීම සඳහාය. එහෙත් ඇතැම් විට අධි-ජනඝනත්වයට මුහුණදීමේ වඩාත්ම නෛසර්ගික විධිය නම්, සඳලුතල, ගෘහස්ථ උද්‍යාන, අමතර ගබඩා පහසුකම් ආදී නීති විරෝධී සහ අර්ධ-නීත්‍යානුකූල ඉදිකිරීම් හරහා අඥාත මහල් නිවාසවල මුහුණත් පරිවර්තනය කිරීම විය හැකිය. එය ඇතැම් විට මෙම අඥාත ගොඩනැගිලිවල පැතලි පෘෂ්ඨයන් රැළි සහ නැමීම්වලින් වසා දමා, ඒවා සිය ප්‍රමාණය සහ දක්වන උනන්දුව අතින් ගුණනය කිරීම සහ ඒවාට ඇතුළත සහ පිටත (inside and outside) අතර මධ්‍යස්ථ කලාපයක් (zone of mediation) ලබාදීමක් වැනිය.

මෙම ජපන් ජාතික වාස්තු විද්‍යාඥයින්ගේ තර්කයට අනුව, අධි-ජනඝනත්වය ධනාත්මක දෙයක් බවට පත්වන අතර, අඥාත බව, අපට බරොක් (baroque) අවකාශයක දැනෙන සෞන්දර්යාත්මක ප්‍රීතිය ලබාදෙන්නක් බවට පත්වෙයි. එය බරොක් කලාව බවට පත්වන්නේ සැලැස්ම (design) අනුව නොව අවශ්‍යතාව (necessity) අනුවය. විවිධත්වය ද (diversity) යළි මතුවන්නේ වාස්තු විද්‍යාත්මක ශෛලීන් බොහොමයක් ලෙස නොව ප්‍රමිතිගත (standaradized) ආකෘති අභ්‍යන්තර වෙනස් කිරීම්වලට (modifications) භාජනය කිරීමෙන් වීම ඇතැම් විට සන්සන්දනය කළ හැක්කේ හොංකොං සිනමාවේ භාවිතයන් සමග පමණි. මෙවැනි තර්කයක් තුළ, එය කොතරම් ආකර්ෂණීය සහ බලාපොරොත්තු සහගත බවක් දැරුවත්, එහි එක් ප්‍රබල දෝෂයක් (serious flaw) අඩංගු වේ. මෙම තර්කය මගින් මීට ඉහත සාකච්ඡා කෙරුණු අධි-ජනඝනත්වය පිළිබඳ දේශපාලන සහ ආර්ථික විද්‍යාව නොසලකා හරිනු ලබන අතර සෑම තැනම අඥාත බහු මහල් ගොඩනැගිලි පද්ධති

තැනීම එකම විසඳුම ලෙස පිළිගනී. එවිට ඉබේම ඇතිවන ප්‍රශ්නය නම් අඥාත බවට මුහුණ දෙන්නේ කෙසේද යන්නයි. ඒ පැනයට ඔවුන් දෙනු ලබන ඉතා ශෝභන පිළිතුර නම්: දේශීය දේ බරොක් ශෛලීය බවට පත් කරන්න (make the vernacular baroque) යනුයි. එහෙත්, හොංකොංහි නාගරික අවකාශය ගැන කෙරෙන විශ්ලේෂණයක ඇති හුදු ආකර්ෂණීය බව මගින් සැලසෙන එකම සේවය නම් දේශීය දේ තවදුරටත් රැඩිකල් පරිවර්තනයන්ට භාජනය වීම අවශ්‍ය නොවන බව තහවුරු වීමයි.

## පසු සටහන්

[1] මේ ලිපිය මුලින්ම පළ වූයේ අක්බාර් අබ්බාස්ගේ *Hongkong: Culture & politics of Dissapearance* (1997, University of Minnerstone Press, Minneapolis) යන කෘතියේය. වර්තමාන පරිවර්තනය සඳහා යොදාගත් පිටපත උපුටා ගන්නා ලද්දේ සයිමන් ඩියුරින් විසින් සංස්කරණය කෙරුණු *Colonial Studies Reader* (1999, Routledge, London) යන කෘතියෙනි. මේ ලිපිය උපුටාගත් කෘතිය මුලින්ම පළ වූ කාලයේ හොංකොං නිල වශයෙන් චීන පාලනයට මාරු වී නොතිබුණි. අද වන විට ඒ පරිවර්තනය සිදු වී තිබුණ ද, මේ සිංහල ලිපියේ භාෂාව තුළින් ඒ දේශපාලන පරිවර්තනය සනිටුහන් කිරීමට පයීන සංස්කාරක මණ්ඩලය උත්සාහ කර නොමැත. ඊට හේතුව එතුළින් සිංහල ලිපිය තුළ අර්ථ සම්පාදන ව්‍යාකූලතා මතුවීම වලක්වා ගැනීම සඳහාය.

[2] මින් අදහස් කරනුයේ විශාල ලාභ ලැබීමේ අරමුණින් දේපොළ පිළිබඳ මිල සහ ඒවායේ වටිනාකම කෘත්‍රිම වශයෙන් අනුමාන කිරීමය. මේ හරහා දේපොළ වෙළඳපොළෙහි මිල ගණන් ඉතා ඉහළ යා හැකි අතර ඒවා හදිසියේ බිඳවැටීමේ අවදානම ද පවතී.

[3] මෙම චිත්‍රය ලන්ඩන්හි ජාතික කලාගාරයේ තැන්පත් කර ඇත.

[4] Aporia යන ග්‍රීක මූලයක් සහිත වචනය මේ සන්දර්භය තුළ යෙදෙන විට යමක් කෙසේ කළ යුතුද හෝ කෙසේ කිව යුතුද යන්න පිළිබඳ සැකයේ ප්‍රතිඵලය සංකේතවත් කරයි.

[5] මේ වෙළඳ දැන්වීම තුළින් ප්‍රකාශ වූයේ 'දුම්බීම තහනම්, වයිස්රෝයි පානයත් තහනම්' යන්නයි. මෙහිදී මතක තබාගත යුත්තේ 'වයිස්රෝයි' යනු දුම්වැටි වර්ගයක් වන අතර හොංකොංහි එංගලන්තයේ ආණ්ඩුකාරයාට භාවිත වූ නිල නාමය ද වන බවයි.

[6] එන එන තත්ත්වයන්ගේ සහ අදහස්වල වාසි සහගත බව පිළිබඳව පමණක් සිතා, ඒවාට හැඩගැසීම ප්‍රචලිත කරන අර්ධ දාර්ශනික ව්‍යාපාරයකි. මෙය බොහෝ දුරට බලපැවැත්වූයේ විසිවන සියවස මුල් කාලයේ සහ 1950 ගණන්වල යුරෝපයේය.

[7] 'මැල්බොරෝ' යනු ලෝක ප්‍රසිද්ධ ඇමෙරිකානු දුම්වැටි වර්ගයකි. 'මැල්බොරෝ මිනිසා' මේ දුම්වැටි සමාගමේ වඩාත්ම ප්‍රසිද්ධ වෙළෙඳ සංකේතයයි.

[8] "Has no social existence...... that which is nearly seen (and merely visible) is hard to see. but is spoken of more and more eloquently and written of more and more copiously."

[9] ජර්මන් භාෂාවෙන් 'heim' යන වචනයෙන් ගෙදර හෝ තමා වාසය කරන ස්ථානය යන අර්ථය ගෙන දෙයි. Unheimlich යනු ගුප්ත, නොදන්නා, නුපුරුදු වැනි අරුත් ගෙනදේ.

10. ස්ෆින්ක්ස් යනු පැරණි ග්‍රීක, ඊජිප්තු සහ අන් මැද පෙරදිග සමාජවල විශ්වාස පද්ධති තුළ ප්‍රචලිතව තිබූ මිත්‍යා සත්වයෙකි. එම සත්වයාගේ ඊජිප්තු ස්වරූපය සිංහයෙකුගේ සිරුරින් හා මානව හිසකින් යුක්ත වූ අතර, එය ෆේරෝ රජවරුන්ගේ රාජකීය සංකේතයක් වශයෙන් ද භාවිත විය.

# ආශ්‍රිත පඨිත


Abbas, Ackbar

1997. *Hong Kong: Culture and Politics of Disappearance.* Minneapolis: University of Minnesota Press.

Agrest, Diana

1993. Architecture from Without. Cambridge: MIT Press.

Aragon, Louis.

1980. *Paris Peasant.* London: Picador.

Benjamin, Walter

1978. *Reflections.* New York: Harcourt Brace Javanovich.

Castels, M.

1989. *The Informational City.* Oxford: Blackwell.

Fannon, F.

1967. *The Wretched of the Earth.* Harmondsworth: Penguin.

Isozaki, A and A. Asada

1992. 'Anywhere – Problems of Space.' In, A. Isozaki and A Asada Eds., *Anywhere.* New York: Rizzoli.

King, Anthony.

1990. *Urbanism, Colonialism and the World Economy.* London: Routledge.

Lacan, Jacque.

1977a. *The Four Fundamental Concepts of Psychoanalysis.* New York: Norton. 1977b. *Ecrits.* London: Tavistock.

Lefebvre, Henri

1991. *The Production of Space.* Oxford: Blackwell.

Robbe-Grillet, Alain

1966. *La Maison de rendez vous.* New York: Grove Press.

Sudjic, Deyan

1986. *New Directions in British Architecture: Norman Foster, Richard Rogers, James Stirling.* London: Thames and Hudson

Vattimo, G.

*1988. The End of Modernity.* Cambridge: Polity Press.

Virilio, Paul

1991a. *The Lost Dimension.* New York: Semiotext[e].

1991b. *The Aesthetics of Disappearance.* New York: Semiotext[e].

Zukin, Sharon

1992. 'Postmodern Urban Landscapes: Mapping Culture and Power' In, S. Lash and J. Friedman Eds., *Modernity and Identity.* Oxford: Blackwell.

# යටත්විජිත නගරය දේශීය කිරීම:
## 19 වන සියවස අග භාගයේ කොළඹ සහ එහි භූමි දර්ශනය[1]

නිහාල් පෙරේරා
පරිවර්තනය: හරීන්ද්‍ර දසනායක

### ප්‍රවේශය

ආර්. එල්. බ්‍රෝහියර් පෙන්වා දෙන පරිදි "කොළඹ නගරය ශ්‍රී ලාංකිකයන්ගේ කැමැත්තෙන් තොරව ඔවුන් මත පැටවූ නගරයකි. එය කිසිවිටෙකත් ඔවුන් විසින් සාදා ගනු ලැබූවක් හෝ ඔවුන්ගේ කැමැත්තට අනුව නිර්මාණය වූවක් නොවේ" (2000: 2). 16 වන සියවස මුලදී පෘතුගීසීන් විසින් බලය තහවුරු කරගත් කොළඹ, යටත්විජිත නගරයක් ලෙස පෘතුගීසි (1518-1656), ලන්දේසි (1656-1796) හා බ්‍රිතාන්‍ය ජාතිකයන් (1796-1948) විසින් පාලනය කරණු ලැබීය. වෙනත් අවස්ථාවලදී ද සාකච්ඡා කෙරී ඇති පරිදි, නූතන කොළඹ නගරය, එය ගොඩනැගීමට හේතු වූ කේන්ද්‍රීය පසුබිමක් හෝ ලංකාවට සම්බන්ධ 'ඓන්ද්‍රීය වර්ධනයකට' රුකුල් දෙන ඉතිහාසයක් හෝ නැති විදේශීය ආරෝපණයක් විය (පෙරේරා 1998). එනිසා පැවැත්ම හා අර්ථය සම්බන්ධයෙන්, කොළඹ නගරය ඉතා කිට්ටු ලෙස යුරෝපීය විශාල නගර මත යැපිණි. එහෙත් 1948න් පසු නිදහස් ශ්‍රී ලංකාවේ අගනුවර වූයේ ද කොළඹයි. මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් ම අවධානය යොමු කරනු ලබන්නේ යටත්විජිත පාලකයන්ගේ පූර්ණ ග්‍රහණයට යටත්ව තිබූ කොළඹ නගරය, දේශීය

සමාජ-සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා අවකාශ සපයන ලාංකේය වටපිටාවක් බවට පරිවර්තනය වූ ආකාරය සම්බන්ධවයි. මෙම ක්‍රියාදාමය මෙහිදී 'දේශීයකරණය' ලෙස නාමකරණය කර ඇත.[2]

යටත්විජිත යුගයේ දී කොළඹ නගරයෙහි ඊට පෙර විසූවන්ව කොන් කෙරිණි. ඉන්දියන් සාගර වෙළඳ ජාලයෙහි වැදගත් 'මුහුදු සන්ධිස්ථානයක්' වූ කොළඹ නගරය තමන්ට හිතකර ආකාරයට සකසා ගැනීම සඳහා පෘතුගීසීහු නගරය ජනවාර්ගික පදනමක් මත බෙදා වෙන් කළහ. එහිදී කොළඹ විසූ මුස්ලිම් ජාතික වෙළෙඳුන් හා ස්වදේශිකයන් කොන් කරමින්, පෘතුගීසීහු පුරුෂ මූලික ක්‍රිස්තියානි නගරයක් බවට කොළඹ නගරය පත් කළහ.[3] ප්‍රමාණයේ හා හැඩයේ වෙනස්කම් ඇති වූවද, සියවස් තුනහමාරක්, එනම් 1860 දශකය වන තුරුම කොළඹ කොටුව ප්‍රදේශය දේශපාලන බලය පිළිබඳ මර්මස්ථානය ලෙස පැවැතුණු අතර ඒ හා සැසඳිය හැකි සමාජ සංස්කෘතික ආයතන ඉන් පරිබාහිරව නොපැවතුණි. මේ කාලය පුරාම යටත්විජිත පාලකයෝ ශ්‍රී ලාංකිකයන්ව නගරයෙන් පලවා හැරීමට නිරන්තරයෙන් වගබලා ගත්හ. ජනවාර්ගික පදනම මත නගරය බෙදා වෙන්කළ බ්‍රිතාන්‍යයෝ, කොටුව ස්වකීය අයිතිය යටතේ තබාගත් අතර පෘතුගීසීන්ගෙන් හා ලන්දේසීන්ගෙන් පැවත එන්නන් ද ඈත් කළහ. මෙසේ කොටුවෙන් ඉවත් කරන ලද පෘතුගීසි හා ලන්දේසි සම්භවයක් සහිත නගර වැසියෝ, 19 වන සියවස මුලදී යාබද පිටකොටුවේ පවුල් 500කින් පමණ සමන්විත සමූහයක් ලෙස සංකේන්ද්‍රණය වූහ (බ්‍රෝහියර් 2000). මෙමඟින් 'ස්වදේශික නගරය' තවත් ඈතට තල්ලුවී ගියේය. එහි ලිපිනය වන පිටත පිටකොටුව (Outer Pettah) යන්න මගින් පැහැදිලිවම පෙනීයන්නේ, නගරයේ 'ස්වදේශික' අවකාශය යටත් විජිත අවකාශයෙන් සැළකිය යුතු තරම් ඈතින් පිහිටා තිබුණු බවයි (මෙම පරිච්ඡේදයේ සඳහන් ස්ථාන නාම සඳහා රූප සටහන් අංක 1 බලන්න).




රූප සටහන් අංක 01: කොළඹ: පයිනය තුළ සඳහන්කර ඇති ස්ථාන.
මූලාශ්‍රය: ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, රොබර්ට්ස් සහ අන් අය, 1989.

යටත්විජිතකරණයේ මුල් යුගයේ දී බොහෝ ලාංකිකයන් තමන්ට නුහුරුවූ නව යටත්විජිත සමාජ ආකෘතීන්ට විරුද්ධ වූයේ නැවතත් පැරණි ජීවන රටාව ළඟාකර ගැනීමේ බලාපොරොත්තු ඇතිවය. මෙහිදී 'ලාංකික' හා 'ලාංකිකයන්' යන පද භාවිත කෙරෙන්නේ (සිලෝන් [Ceylon] සහ සිලනීස් [Ceylonese] යන පද වෙනුවට) අපගේ සාකච්ඡාවට බඳුන් වන දිවයින හැඳින්වීමටත්, යුරෝපීය ග්‍රහණයට නතුවීමට පෙර එහි විසූ ස්වදේශීය සමාජ හැඳින්වීමට සහ 'පූර්ණ වශයෙන්' 'විජිතකරණයට' (colonized) නතු නොවූ යටත්වැසියන්ට (subjects) නියෝජනයක් ලබාදීමටත්ය. ෆ්‍රාන්ස් ෆැනොන් (1968) පෙන්වා දෙන පරිදි, යටත් විජිතකරණයට නිරාවරණය වන ස්වදේශිකත්වය පළමුව අවුල් වී යන නමුත් පසුව අධිරාජ්‍යවාදී ක්‍රමය ස්වදේශිකයාගේ ඊර්ෂ්‍යාවට පාත්‍ර වෙයි. 'එරෙහිවීමේ' සිට ඊර්ෂ්‍යාව දක්වා වන මේ පරිවර්තනය මගින් ගම්‍ය වන්නේ අධිරාජ්‍යවාදී සංස්කෘතිය තම ආධිපත්‍යය තහවුරු කරගෙන ඇති බවයි. එහෙත් ඒ සමඟම අධිපතිවාදී යටත්විජිත නගර දේශීයකරණය කිරීමේ ක්‍රියාවලියකට ද අධිරාජ්‍යවාදී සංස්කෘතිය මගින් පදනම දමනු ලබයි.

විජිතකරණයට මෙන් ම දේශීයකරණයට ද 'සමාජ අවකාශය' කේන්ද්‍රීය වේ. අධිරාජ්‍යවාදීන්ට තම පාලන කටයුතු කරගෙන යාමට යටත් වැසියන්ගෙන් කොටසක් පරිපාලන ව්‍යූහ අන්තර්ග්‍රහණය කර ගැනීම අත්‍යවශ්‍ය වූ අතර, එහිදී සමාජ අවකාශයට ඉතා වැදගත් තැනක් හිමිවිය (යෙඕ 1996). ඩේවිඩ් හාවි දක්වන්නේ, "යම්කිසි සමාජ-අවකාශීය ආකෘතියක් තුළ නිශ්චිත ස්ථානයක් පවරා දීම මගින් සමාජ පර්යාය (social order) තුළ නිශ්චිත කාර්ය කොටසක් ක්‍රියාත්මක වීමේ අයිතියක් හා සමස්ත බල අධිකාරියට ප්‍රවේශයක් විද්‍යාමාන වේ" (1990: 419) යන කාරණයයි.

එවැනි ආකාරයක අවකාශ පවරාදීමක් හා පාලනය කිරීමක් විජිතකරණයට ලක්වූ සමාජ පද්ධතියෙහි ජනවාර්ගිකත්වය, පන්තිය හා සමාජ ලිංගිකත්වය වැනි සමාජීය නිර්මිතයන් හැඩ ගැස්වීමෙහිලා බලපානු

දැකිය හැකිය. මෙම තත්ත්වය විජිතකරණයට ලක්වූ සමාජ පද්ධතිය මගින් තමන්ට නතු අවකාශ මත කරන බලපෑම හා එම පද්ධතිය හා අවකාශය අතර පවතින සම්බන්ධතාව මගින් සමාජ පර්යාය පහසු කිරීම හරහා ද දැකගත හැකිය. මිෂෙල් ෆුකෝගේ මත ගෙනහැර දක්වමින් හාවි පෙන්වා දෙන්නේ, "අවකාශය ප්‍රතිසංවිධානය කිරීම මගින් සැමවිටම සමාජ බලය ප්‍රකාශයට පත්වන ආකෘතිය ප්‍රතිසංවිධානය කරනු ලබන බවයි" (1990: 8).

මෙවැනි අවකාශ විග්‍රහ කිරීමේදී සමාජ බලය නම් විචල්‍යය ඉතා වැදගත් තැනක් ගනී. එනම් යම් ක්‍රියාවලීන් පරිවර්තනය කිරීමට හෝ වෙනස් කිරීම සඳහා නිශ්චිත අවස්ථාවකදී මැදිහත් වීමට යටත් වැසියන්ට ඇති හැකියාව හා ප්‍රචණ්ඩත්වය සෘජුව භාවිත කිරීම හෝ එසේ කරන බවට තර්ජනය කිරීම මගින් තම අරමුණු වෙත යටත්වැසියන් නතු කර ගැනීමට අධිරාජ්‍යවාදීන්ට ඇති හැකියාවයි. එහෙත් සමාජ බලය සම්බන්ධයෙන් සැමවිටම තරගයක් පවතී. දේශීයකරණ ක්‍රියාවලිය එක් අතකින් සමාග්‍රහණය වීමක් ද (assimilation) අනෙක් අතට විරෝධතාවක් ද (resistance) ද වෙයි. එනම් නව සම්මිශ්‍රිත (hybrid) සංස්කෘතික භාවිතයන් (cultural practices) හා අවකාශ නිර්මාණය කිරීම හරහා ගොඩනැගෙන නව විජිත පුරවැසි භාවයකි. මෙම ක්‍රියාවලියේ දී භූමි දර්ශනය ඉතා වැදගත් තැනක් උසුලයි.

ජේම්ස් ඩන්කන්ට අනුව, භූමි දර්ශනය යනු පරිසරය කෙසේ දිස්විය යුතුද යන්න සම්බන්ධයෙන් මිනිසා විසින් ගොඩනගන සංස්කෘතික ආකෘතියයි (1989). නැතහොත් මිනිසා තම පරිසරය වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස භූමි දර්ශනය භෞතික හෝ සංකේතමය වශයෙන් පරිවර්තනය කිරීම මගින් නැවත භූමි දර්ශනය අර්ථකථනයට ලක් වීමයි. මේ අධ්‍යයනයේදී සොයා බලන්නේ ඉහත අදහස් කොළඹ නගරය දේශීයකරණය කිරීමේ ක්‍රියාවලියේ භූමි දර්ශනය අධ්‍යයනය කිරීමට කොතෙක් දුරට අදාළ වේදැයි යන්නය.

කොළඹ නගරයෙහි, යටත්විජිත, සමාජ හා අවකාශීය ආකෘති දේශීයකරණයට ලක්වූයේ අධිරාජ්‍යවාදීන්ගේ පැවතුම් හා චාරිත්‍ර සමාරෝපණය කරගත්, ස්වදේශිකයන් හරහාය. එහෙත් ඔවුන්ට එසේ සමාග්‍රහණය වීමට හැකිවූයේ අධිරාජ්‍යවාදීන්ගේ දෛනික හා බාහිර පැවතුම්වලට පමණක් නිසා, මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් මනඃකල්පිතයන් ඉතා වැදගත් වෙයි. යටත්විජිත ක්‍රමය ස්වදේශිකයන්ට පළමුව ඉතා අමුතු දෙයක් වූ හෙයින් ඊට ගොඩවීම සඳහා ඔවුන් පළමුව යම් යම් අධිරාජ්‍යවාදී විෂයන් හා අවකාශ දැන හඳුනා ගත යුතුයි. එසේ ඔවුන් පළමුවෙන් ම දැන හඳුනාගන්නේ, එවැනි භුදු භාවිතය මගින්ම ස්වකීය ව්‍යුහයන් ප්‍රති අර්ථකථනයන්ට ඉඩ සලසන සංජානනීය ආකෘති (perceptual frameworks) හා භාෂාය. තවදුරටත් මේ ආකෘති හා භාෂා ඉතා සංකීර්ණ හා අන්‍යෝන්‍ය ක්‍රියාවලියක් වන 'දේශීයකරණයේදී' වෙනස් කිරීම්වලට භාජනය වෙයි.

එසේ අධිරාජ්‍යවාදී ආකෘති දේශීයකරණයට ලක්වීම නිසා සමස්ත අධිරාජ්‍යවාදී ක්‍රමයම අවශ්‍යයෙන් ම අලුත් වන්නේ නැති නමුදු, ප්‍රතිඅර්ථ ගැන්වෙන අධිරාජ්‍යවාදී සමාජීය හා අවකාශීය ව්‍යුහයක් හරහා ස්වදේශිකයන්ට එම ව්‍යුහ යළි හැඩගස්වා ගැනීමට හා ප්‍රතිනිර්මාණයට ඉඩ සලසයි. වෙනත් වචන වලින් කිවහොත්, සමස්ත යටත්විජිත ව්‍යුහයේ කොටසක් ලෙස යටත්විජිත පුරවැසිභාවය මගින් සමස්ත ව්‍යුහයම, එතුළ සිටින්නෙකුගේ දෘෂ්ටි කෝණයෙන් අර්ථකථනයට අවකාශ සලසයි.[4]

ඒ අර්ථයෙන් ගත්කල දේශීයකරණ ක්‍රියාවලිය තුළ අධිරාජ්‍යවාදී ආයතනික හා අවකාශීය ව්‍යුහයද පරිවර්තනය වීම අඩංගුය. එයිනුදු විශේෂයෙන් ම ඒවාට ලබාදෙන අර්ථ හා නියෝජන ද අධිරාජ්‍යවාදියා හා යටත් වැසියා ලෙස පවතින බල ආකෘතික සම්බන්ධතා ද පරිවර්තනයට භාජනය කෙරේ. එහෙයින් දේශීයකරණය, යටත්විජිතකරණයට එල්ල වන විරෝධතාවක් ලෙස සැළකිය හැකිය. සමාජය හා එහි පුරවැසිභාවය

සකස් කිරීමේදී හා පරිවර්තනය කිරීමේදී, සමාජ අවකාශය මගින් ඉටුකරනු ලබන්නේ ස්ථාපක කාර්යභාරයක් (constitutive role) වූවද, සමාජය හා අවකාශය වෙනස් වන්නේ සරල රේඛීය ආකාරයෙන් හෝ එකක් පසුපස අනෙක ලෙසින් නොව, එකම විට හා එකම වේගයෙනි. සමාජය හා අවකාශය ක්‍රියාත්මක වන්නේ, එකිනෙක මගින් අනෙක වෙනස් කිරීමට බලපාමින් නමුත්, එකක් මගින් අනෙක තීරණය වන්නේ නැත.[5]

දේශීයකරණය හා යටත්විජිතකරණය හැමවිටම අන්‍යොන්‍ය මෙන්ම එකිනෙකින් විරුද්ධ, පූර්ණ වශයෙන් එකිනෙකින් වෙන් නොවූ මෙන්ම පූර්ණ විසංවාදයක් ද නොවන ක්‍රියාවලි දෙකකි. එනම් දේශීයකරණය ඇරඹෙන්නේ විජිතකරණය අවසාන වූ විට නොවේ. අධිරාජ්‍යවාදී සමාජ හා අවකාශ ව්‍යුහයන්ට අනුගත වීම, විජිතකරණයට ලාංකේය ස්වදේශිකයන් දැක්වූ මූලික ප්‍රතිචාරයකි. 16 වන සියවස මුල සිට ඇරඹි පෘතුගීසි හා ලන්දේසි පාලන සමයන් තුළදී ද ලාංකිකයෝ අධිරාජ්‍යවාදී යුද්ධ හමුදාවේ හා පරිපාලනයේ තනතුරු දැරූහ. යටත්විජිත ශ්‍රී ලංකාව තුළ ස්වදේශිකයන් තම දේශපාලනික හා ආර්ථික තත්ත්වය වර්ධනය කරගත් ප්‍රධානතම ආකාරය මෙය වූවද අධිරාජ්‍යවාදී යුගයේ විවිධ අවස්ථාවලදී, විශේෂයෙන් ම අධිරාජ්‍යවාදී සමය ආරම්භයේ දී හා නිදහස ලබාගැනීමට ආසන්නයේ දී, දේශීයකරණ ක්‍රියාවලියේ රැඩිකල් වෙනසක් පෙනෙන්නට තිබිණි. මෙම අධ්‍යයනය නාභිගත වන්නේ ඉහත ක්‍රියාවලියේ ගමන් පථයෙහි පරිවර්තක අවස්ථාව (turning point) මතය. එනම්, 19 වන සියවස . අගභාගයේදී අධිරාජ්‍යවාදී කේන්ද්‍රස්ථානය වූ කොළඹ නගරයට ලාංකිකයන් දැක්වූ ප්‍රතිචාරය 'විරුද්ධවීමේ' සිට 'දේශීයකරණය" දක්වා වෙනස් වූ අවධියයි.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය එහි හිණිපෙත්තටම නැගි 1860 හා 1880 ගණන්වලදී කොළඹ අධිරාජ්‍යවාදී සමාජය හා යටත්විජිත අධිකාරිය ඉතා සුවපහසු පැවැත්මක් හිමිකරගන්නා ලදී. 1860 ගණන් වන විට බ්‍රිතාන්‍යයන්

මෙහි වැවිලි ආර්ථිකයක් නිර්මාණය කර ලංකාව පුළුල් ලෝක ආර්ථික තලයට ඇතුළු කර තිබුණා පමණක් නොව, ලංකාව තුළ ඔවුන්ගේ ලෝක දෘෂ්ටියට පුළුල් ආධිපත්‍යයක් ද ගොඩනගාගෙන තිබුණි (පෙරේරා 1998). දශක හතක් තිස්සේ ස්වදේශිකයන්ව තම අවකාශවලින් ඉවත් කොට තැබූ ඔවුහු මේ යුගයේදී තම ප්‍රදේශය පුළුල් කිරීමටත් පටන් ගත්හ. 1889දී කොටු පවුරු බිඳ දැමීමෙන් හා කොළඹ කොටුවේ සිට කි.මී. 2ක් පමණ දුරින් පිහිටි කුරුඳුවත්තේ තම නේවාසික නගරෝපාන්තය (residential suburb) පිහිටුවා ගැනීමෙන් මේ බැව් මනාව ප්‍රකට වේ. මීට සමාන්තරව ඔවුහු කොළඹ නගර සීමාව නිල වශයෙන් පුළුල් කළ අතර එහි පරිපාලන කටයුතු සඳහා නගර සභාවක් ද පිහිටවූහ. කේ. එම්. ද සිල්වා (1997) දක්වන පරිදි, 1870 පමණ වන විට මහනුවර කේන්ද්‍ර කොටගත් රදල නායකත්වයක් තිබුණු "සාම්ප්‍රදායික ජාතිකවාදයට" (traditional nationalism) තවදුරටත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ස්ථාවරත්වයට තර්ජනයක් එල්ල කිරීමට සමත් නොවීය.

ඒ වන විට දේශීයකරණය වඩාත් ස්වේච්ඡා ස්වරූපයක් ගත් අතර සමස්ත ක්‍රියාවලිය සමාජයේ විවිධ අංශයන්හි පහසුවෙන් දිස්වන්නට වූ අතර සමාජයේ පරිධියේ සිට ප්‍රධාන ධාරාවට සංක්‍රමණය විය. ලාංකිකයෝ අධිරාජ්‍යවාදී ක්‍රමයට හුරුවෙමින්, දේශපාලන හා ආර්ථික ව්‍යුහයන් තුළ තම බලය තහවුරු කර ගන්නට ඉගෙන ගත්හ. රට මැද පිහිටි මහනුවර 1815 දී බ්‍රිතාන්‍යයන් අතට පත්වූ අවසන් රාජධානිය වූ අතර, 1880 පමණ වන විට කොළඹ අධිකාරියට එරෙහි වූ මහනුවර දැක්වූ විරෝධය මගින් නියෝජනය වූ කොළඹ - මහනුවර බල අර්බුදය කොළඹ නගරය තුළටම සංකේන්ද්‍රණය වීම හා එමගින් කොළඹ නගරය බලය පිළිබඳ හෙට්ටු කිරීමේ හා තරග කිරීමේ ප්‍රධාන අවකාශය බවට පත්වීම දැකිය හැකිය. 1850 පමණ වනතෙක් ලාංකිකයෝ අධිරාජ්‍යවාදයට විරුද්ධ වී එයින් මිදීමට උත්සාහ දැරුවද, 1860 දශකයේ සිට අධිරාජ්‍යවාදී ව්‍යුහ, අවකාශ හා සංකේත

එඩ වඩාත් තමන්ට අනුචිතව සකසා ගනිමින් තමන්ට හිතකර හා ශක්තිමත් වටපිටාවක් තමා වටා ගොඩනගා ගනිමින් අධිරාජ්‍යවාදී ක්‍රමය තුළ සිට සමාජ තත්ත්වය වර්ධනයෙහිලා උත්සුක වූහ.

අධිරාජ්‍යවාදී නාගරීකරණය හා වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් කෙරෙන අධ්‍යයනයන්හි මූලික අවධානය යොමුවන්නේ යටත් වැසියන් හා ඔවුන්ගේ වටපිටාව කෙරෙහි අධිරාජ්‍යවාදයේ බලපෑම ගවේෂණය කිරීමටය. නිදහස ලැබීමෙන් පසුව වුවද ක්‍රියාත්මක වූ අධිරාජ්‍යවාදයේ බලපෑම සම්බන්ධයෙන් බොහෝ උගතුන් සාකච්ඡා කොට ඇති අතර, ඔවුන් බොහෝ දෙනෙකුට අධිරාජ්‍යවාදයේ උච්චතම අවස්ථාව වූයේ 20 වන සියවස මුල් භාගයයි (ක්‍රිස්ටෝෆර් 1988). මෙම අධ්‍යයනය එම මතය හා එකඟ නොවෙමින් කියා සිටින්නේ, මතු දක්වනු ලබන පරිදි, අධිරාජ්‍යවාදයේ බලපෑම නිදහසින් පසුවත් පැවතුණු නමුත්, 19 වන සියවස අගභාගයේ ඇරඹි අධිරාජ්‍යවාදී සමාජය හා අවකාශය දේශීයකරණ ක්‍රියාවලිය මගින් සමස්ත අධිරාජ්‍යවාදයේ ගමන් පථය වෙනස් වූ බවයි.

කෙසේ වුවද, අධිරාජ්‍යවාදී නාගරිකත්වය (colonial urbanism) හා වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් ලියැවී ඇති සාහිත්‍යයෙහි සමාජ අවකාශය සම්බන්ධයෙන් පවතින විවාදකාරී (contested) බව මගහැරී ගොස් ඇති අතර, දේශීයකරණ ක්‍රියාවලීන්ගේ බලපෑම හිතාමතාම අමතක කර ඇති බව ප්‍රකටව පෙනෙයි.[6] සමාජ හා සංස්කෘතික විශ්ලේෂණ ලෙස සිදුකෙරුණු මූලික අධ්‍යයන (උදාහරණයක් ලෙස රෙම්ෆීල්ඩ් සහ සිංගර් 1954, මැක්ගී 1971) ඉදිරියට ගෙනයමින් හා යටත්විජිත නගර අධ්‍යයනය විවිධ න්‍යායාත්මක දෘෂ්ටිකෝණ හරහා අධ්‍යයනය කරමින්, අද්‍යතන විද්වතුන් නිරාවරණය කිරීම අරඹා ඇත්තේ සමාජ අවකාශ ගොඩනැංවීමේ ඓතිහාසික ක්‍රියාවලියට දේශපාලන ප්‍රතිපත්ති හා අවකාශීය යටත්වැසි භාවයන් අතර ඇති සම්බන්ධතාවයි (කිං 1976 සහ 1990, රොස් සහ

වෙල්කම්ප් 1985, සවුවර්රෙසිග්-ෂ්‍රොයිඩර් 1986, මෙට්කාෆ් 1989, රැබිනෝ 1989, මිචෙල් 1991, රයිට් 1991, අල්-සයියඩ් 1992, ක්‍රිස්සන් 1996, හෝම් 1997).

යටත් විජිත හා පශ්චාත් විජිත නාගරිකත්වය පිළිබඳව ගොඩනැගුණු අධ්‍යයන බොහොමයක් පැවතිය ද, ඒවා දේශපාලනය හා ආර්ථික විද්‍යාව පසුබිම් කොට ගත් අධ්‍යයන වේ. මේ නිසා විෂය සම්බන්ධයෙන් තවමත් පවතින්නේ, ස්වදේශික ජනතාවන්ට ලැබෙන නියෝජනය ඉතා අවම වන ආකාරයේ පුළුල් නමුත් යූරෝ-ඇමරිකානු දෘෂ්ටිය මූලිකත්වයෙහිලා සැලකෙන තත්ත්වයකි. යෙඕ (1996) පෙන්වා දෙන්නේ මෙම ප්‍රවේශයෙන් විශාල ලෙසම අවධානය යොමුකරන්නේ අභියෝගයට ලක් නොවූ යුරෝපීය අධිරාජ්‍යවාදීන්ගේ ආධිපත්‍ය පිළිබඳව වන අතර ස්පිවාක් (1999) අධිරාජ්‍යවාදය යුරෝපයේ ඇරඹුණේ යැයි උපකල්පනය කිරීමේ යුරෝ කේන්ද්‍රීයත්වය පෙන්වා දෙයි.

ඇන්තනී කිං (1992) විසින් සියුම් ලෙස තර්ක කරමින් පෙන්වා දෙන්නේ, ස්වදේශීය ජනතාවගේ හා ස්ථානවල ඓතිහාසික අවකාශය අත්පත් කරගන්නා යුරෝපීය අධිරාජ්‍යවාදය පිළිබඳව ලියැවී ඇති සාහිත්‍යය මගින් අධිරාජ්‍යවාදයට එරෙහි ස්වදේශීය හඬවල් කොන්කොට නිශ්ශබ්ද කොට ඇති බවයි. මෙම අධ්‍යයනයන්ගේ අවධානයට යොමුනොවන්නේ, අර්ජුන් අප්පදොරෙයි වෙනත් සන්දර්භයක පවසා ඇති පරිදි පහත සඳහන් කාරණය වෙත වේ:

> "අවම වශයෙන් විවිධ විශාල නගරවලින් පිරිස් නව සමාජයන්ට ගෙන එන තරමටම වේගයෙන්, ඔවුන් කිසියම් හෝ ආකාරයකින් දේශීයකරණයට ලක් වේ" (අප්පදොරෙයි 1998: 32).

ස්වදේශීය ආයතනයන්ගේ භෞතික අවකාශීය ප්‍රකාශන අධ්‍යයනය කිරීමේ වැදගත්කම හුවා දක්වන කිං (1976) එවැනි විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සඳහා ස්වදේශීය භාෂාව හා සංස්කෘතිය දැන හඳුනා ගැනීමේ වැදගත්කම අවධාරණය කරයි.

අධිරාජ්‍යවාදයට ස්වදේශිකයන් ප්‍රතිචාර දක්වන ආකාරය හා ස්වකීය යටත් විජිත අතීතයෙන් ඈත් වෙමින් තිබෙන පශ්චාත් යටත්විජිත වර්ධන සාර්ථකව හඳුනා ගැනීමට හා එම තත්ත්වයන්ට ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීමට නම් භෞතික හා බුද්ධිමය ප්‍රතිපත්ති මුල්කරගත් (physical and intellectual standpoints) තලයක දිවෙන කතිකාව ස්වදේශිකයන්ට නියෝජනය සපයන නව තලයකට මාරු විය යුතුය. යෙඕ හා කොං (1994) අවධාරණය කරන්නේ බල අරගලයක් පවතින අවකාශයක් වන යටත් විජිත නගරයක භූමි දර්ශනය මගින් ප්‍රකාශයට පත්වන්නේ, එය තමන්ට රිසි පරිදි සැලසුම් කිරීමට හා වෙනස් කිරීමට බලය ඇත්තන්ගේ (අධිරාජ්‍යවාදීන්ගේ) අදහස් හා දෘෂ්ටිය පමණක් නොවන බවයි.

එවැනි භූමි දර්ශනයක සාමාන්‍ය ජනයාගේ දෛනික කටයුතු මගින් ඇති කරනු ලබන සරල සත්‍යයෝ ද විද්‍යමාන වෙති. ඇන්තනි ගිඩන්ස් දක්වන්නේ, "සමාජයේ වඩාත්ම දුර්වල යැපෙන්නන් සතුව ද ස්වකීය ආධිපත්‍යයට නතු අවකාශ තනාගැනීමට හැකියාව ඇති" (1987: 11) බවයි. විද්වතුන්ට අධිරාජ්‍යවාදී බලය හැදෑරීමට ඉඩ සලසන යටත් විජිත නගර අධ්‍යයන ඉතිහාස අභිමුඛයෙහි නව දෘෂ්ටිකෝණ වර්ධනය කරගැනීම හරහා නව සමාජ අවකාශ හා භෞමික අවකාශ දේශීයකරණය කරගන්නා සංස්කෘතික අවකාශ හඳුනාගත හැකිය.

පශ්චාත් යටත්විජිතවාදී විද්වතුන් විසින් අධිරාජ්‍යවාදී කතිකාව ව්‍යූහ විභාගනයට හා විකේන්ද්‍රණයට (deconstruction and decentering) ලක් කරමින් සාර්ථකව අධ්‍යයනය කර තිබේ. එහෙත් මෙම අධ්‍යයන තවමත් සමාජ

අවකාශය හා නගර අධ්‍යයනය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකර ඇති බවක් නොපෙනේ. ප්‍රත්‍යයන්ත අධ්‍යයනයන්හි දෘෂ්ටිකෝණ ආශ්‍රයෙන් පශ්චාත් යටත්විජිත නගර අධ්‍යයනය සඳහා පදනම් හැඳෑරීම් (යෙඕ හා කොං 1994, යෙඕ 1996, නල්බන්ටොග්ලු සහ වොං 1997, කුන්සො 2000, පෙරේරා 1998) කිහිපයක් කෙරී ඇති අතර, ඒවා තුළින් දෘෂ්ටිකෝණය වෙනස් කරමින් 'පශ්චාත් යටත්විජිත' හා 'ජාතිකවාදී' නිර්මිත විවිධ මට්ටම්වලින් ප්‍රශ්න කිරීමට භාජනය කරයි. දේශීයකරණය, අධිරාජ්‍යවාදී සමාජය හා අවකාශය අභියෝගයට ලක්කරන විශේෂ ක්‍රියාවලියක් ලෙස සළකමින් හා ස්වදේශිකයන්ට නියෝජනයක් ලබාදෙමින් වර්තමාන අධ්‍යයනය මගින්ද බලාපොරොත්තු වන්නේ ඉහතින් දැක්වූ දෘෂ්ටිකෝණයන්ට දායක වීමටයි.

කොළඹ නගරයේ සමාජ අවකාශය තුළ වෙනස්කම් ඇතිකිරීමට එහි විසූ අප්‍රධාන ජනතාවට තිබූ බලය මෙන්ම ස්වදේශික විඥානය ඔවුන්ගේ අභිප්‍රායන්, දෛනික කටයුතු හා සාමූහික ක්‍රියාකාරකම් මගින් අධිරාජ්‍යවාදී නගර අවකාශය මෙන්ම එහි සැලැස්ම මත කළ බලපෑම (ස්මිත් සහ ටාර්ඩැනිකෝ 1989) සම්බන්ධයෙන් ද මෙම අධ්‍යයනය අවධානය යොමු කරයි. 'දුර්වලයන්ගේ අවි' (weapons of the weak) සම්බන්ධයෙන් අදහස් පළකරන ජේම්ස් ස්කොට් (1985) සඳහන් කරන්නේ සාපේක්ෂ වශයෙන් දුර්වලයන් බල අධිකාරිය සමඟ සෘජු සංකේතිය අරගලයකට ඇතුළුවීම පුරුද්දක් ලෙස මග හරිනු ලබන අතර ඒ වෙනුවට වඩාත් සාමාන්‍ය ස්වයං සාධක උපක්‍රම වන විශේෂ සංවිධාන ශක්තියක් හෝ සැලසුම්කරණයක් අවශ්‍ය නොවන, වැඩ කටයුතු ප්‍රමාද කිරීම හා ව්‍යාජ යටහත් පහත් බව පෙන්වීම වැනි දෑ දැකිය හැකි බවයි. ඒ අර්ථයෙන් ගත් කල, දේශීයකරණය යනු 'ජාතික නිදහස' වැනි කිසියම් අරගලයක අපේක්ෂිත ඉලක්කයක් නොව, අධිරාජ්‍යවාදයට ස්වදේශිකයන් දැක්වූ විවිධ ප්‍රතිචාරයන්ගේ සාමූහික ඵලයකි.

වර්තමාන අධ්‍යයනයේ දී බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නිර්මිත දැනුම වෙනුවට දේශීයකරණය හැඳෑරෙන්නේ ප්‍රති ප්‍රාචීනවාදී නැතහොත් reverse Orientalist දෘෂ්ටිකෝණයකිනි (සයිඩ් 1978). මෙහිදී අවධානය යොමු කරනුයේ ප්‍රධාන වශයෙන් ම අධිරාජ්‍යවාදී සමාජය පිළිබඳව ලාංකිකයන් ගොඩනැගූ දැනුමත් ඔවුන් තමන් වෙනුවෙන් හැඩගස්වාගත් අවකාශයත්, කොළඹ නගරය තුළට ලාංකිකයන් ඇතුළුවීම නිසා නගරයේ භූමි දර්ශනය පරිවර්තනය වූ ආකාරයත් යන කරුණු වෙතය. කොළඹ නගරය දේශීයකරණය වීම සිතියම් ගත කිරීමේ දී වර්තමාන අධ්‍යයනය මගින්, 1860 සහ 1880 අතර කාල පරාසය තුළදී දේශීයකරණය සමාජයේ පරිධියේ සිට ප්‍රධාන ධාරාව බවට පරිවර්තනය කිරීමට ඉවහල් වූ අධිරාජ්‍යවාදී සමාජීය හා අවකාශීය ව්‍යුහයන්ට ස්වදේශිකයන් දැක්වූ ප්‍රධාන වශයෙන් තුන් ආකාරයක ප්‍රතිචාර සැලකිල්ලට ගනු ලැබේ. මේ ප්‍රතිචාර, බ්‍රිතාන්‍ය ආකෘති ඒ අයුරින් ම සමාරෝපණය කර ගන්නට උත්සහ දැරූවන්, විරෝධතා ව්‍යාපාර හා සමාජයේ කොන් කරන ලද කණ්ඩායම් විසින් විවිධ ආකාරයෙන් ප්‍රකාශ කරන ලද ඒවාය. මෙහිදී විශේෂ අවධානය යොමුකරනු ලබන්නේ දේශීය ධනපති පන්තියක නැගීම, බෞද්ධ පුනරුදය හා නගරයේ පදිංචිකරුවන් හා නව සංක්‍රමණිකයන් විසින් එහි ජන සංකේන්ද්‍රණය වෙනස් කිරීම සම්බන්ධයෙනි.

## ලාංකේය ප්‍රභූ පන්තියක නැගීම

19 වන සියවස මුලදීත් උඩරට රදලවරුන් අධිරාජ්‍යවාදයට විරුද්ධ වෙමින් සිය ඓතිහාසික, සමාජ, දේශපාලන ක්‍රමය ආරක්ෂා කරගැනීමට උත්සහ දරමින් සිටිය ද, සියවස් තුනහමාරක් තිස්සේ යටත් විජිත ක්‍රමය තුළ ජීවත්වුණු පහත රටියන් අතරින්, වඩා යහපත් (පශ්චාත්) යටත්විජිත

අනාගතයක් ගැන බලාපොරොත්තුවෙන් අධිරාජ්‍යවාදී ක්‍රමයේ බාධක අතරින් ඉදිරියට ගිය දේශීය ප්‍රභූ (ධනපති) පන්තිය ඉස්මතු වීම සිදු විය. බ්‍රිතාන්‍යයන් විසින් උඩරට රාජධානිය ග්‍රහණය කරගැනීම පහත රැටියන්ට වාසිදායක වූ අතර, එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් ඇතැමුන් විසින් දේශීය උසස් පන්තිය තුළ තමන් සඳහා තැනක් හිමිකර ගන්නා ලදී. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් 'උසස්' යැයි සම්මත ගොවිගම කුලයට අයත් නොවූ කරාව, දුරාව හෝ සලාගම කුලවලට අයත් වූහ. පහතරට සිංහල හා කොළඹ ආශ්‍රිත දෙමළ ප්‍රජාවන්ට අයත් වූ ලාංකේය ධනපති පන්තිය, 1860 දශකය වන විට වැවිලි කරුවන්, දේශපාලන නායකයන් හා පරිපාලන නිලධාරීන් බවට පත්වූ අතර, ඔවුන්ට අධිරාජ්‍යවාදී ක්‍රමය තුළ සැලකිය යුතු නියෝජනයක් තිබිණි.

මීළඟ දශක දෙකක කාලය තුළදී, අධිරාජ්‍යවාදී ආර්ථික, දේශපාලනික හා පරිපාලනමය ව්‍යූහ දේශීයකරණයට ලක්වීම වඩාත් පැහැදිලිව පෙනෙන්නට විය. 1848 කැරැල්ල මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් පරිවර්තනීය අවස්ථාවකි. එනම් එය මහනුවර ඇතිවූ අවසන් අධිරාජ්‍ය විරෝධී සන්නද්ධ පිබිදීම වූ අතරම කොළඹ කේන්ද්‍රකොටගෙන ඇරඹි යුරෝපීය රැඩිකල්වාදී අදහස් පරීක්ෂණයට භාජනය කළ පළමු සැලකිය යුතු නාගරික ව්‍යාපාරය සලකුණු කරන්නට ද විය (ද සිල්වා 1997). දේශීය පහතරට ධනපති පන්තියේ නැගීම මයිකල් රොබර්ට්ස් (1982), පැට්‍රික් පිබ්ල්ස් (1995) සහ කුමාරි ජයවර්ධන (1982) විසින් පුළුල්ව අධ්‍යයනය කෙරී ඇති අතර, එය කොළඹ නගරය හා එහි භූමි දර්ශනය දේශීයකරණය වටා කේන්ද්‍රගත වන වර්තමාන අධ්‍යයනයේදී පුළුල්ව සාකච්ඡාවට බඳුන් කෙරේ.

1880 ගණන් වන විට මෙම දේශීය ධනපතීන් ප්‍රධාන වශයෙන් ම බ්‍රිතාන්‍යයන් අත පැවති වැවිලි ආර්ථිකයට ඇතුළු වී සිටියා පමණක් නොව එහි සැලකිය යුතු කොටසක හිමිකාරීත්වය ද දැරිය. රොබර්ට්ස් පෙන්වා

දෙන පරිදි (1982, 1997) කරාව කුලයට අයත් දේශීය ධනපතීන්ගේ නැගීමට පදනම වැටුණේ පෘතුගීසි හා ලන්දේසි යුගවලදීය. එනම්, ඒ යුගයන්හිදී රැස්කරගත් මූලික ප්‍රාග්ධනය 19 වන සියවස මුල දී ආයෝජනය කෙරිණි. සියවස් තුනහමාරක් තිස්සේ යුරෝපීයන්ට යටත්ව සිටීම නිසා වාණිජකරණය, මූල්‍යකරණය, බටහිරකරණය හා ක්‍රිස්තියානිකරණය හරහා පහතරැටියන්ට හිමි වූ වාසි සහගත තත්ත්වයට අමතරව, බ්‍රිතාන්‍ය පාලකයන් උඩරට රදල පවුල් කෙරෙහි පැවති සැකය ද පහතරට ධනපති පන්තියක නැගීමට හේතුකාරක විය (රොබර්ට්ස් 1982). 1880 ගණන් වන විට සමාජ තත්ත්වය සම්බන්ධයෙන්, පහතරට ධනපති පැළැන්තිය උඩරට රදලයන්ව අභිභවා සිටියහ. පහත රැටියෝ වෙළෙඳුන්, කම්කරුවන්, හා ගුරුවරුන් ලෙස කඳුරට පළාත් සිසාරා ගමන් කරන්නට වූහ (රොබර්ට්ස් 1982). තවදුරටත්, එවක අත්‍යවශ්‍ය වූ බටහිර අධ්‍යාපනය හා බටහිරකරණය ලබාගැනීමට අවශ්‍ය හැකියාව පහතරැටියන්ට තිබුණු අතර, කරාව කුලය විසින් කාන්තා අධ්‍යාපනය අතින් දෙමළ ප්‍රජාව අභිභවන ලදී (රොබර්ට්ස් 1982).

ලංකාව ප්‍රත්‍යන්ත යුද්ධ බලකොටුවක සිට 19 වන සියවස මැදදී වැවිලි ආර්ථිකයක් දක්වා පරිවර්තනය වීමේ ක්‍රියාවලියේ දී (පෙරේරා 1998, බණ්ඩාරගේ 1983) පරිපාලන සේවයේ පහළම ස්තරයන්හි සේවය කළ ලාංකේය පරිපාලන නිලධාරීන්ට නව දේශීය ධනපති පන්තියට සංක්‍රමණය වීමට අවස්ථාව ලැබුණි. මෙය සිදුවූයේ අධ්‍යාපනය, ඉංග්‍රීසි දැනුම, ජීවනරටාව, රැකියාව හා ඉඩම් හිමිකම වැනි සාධක සාම්ප්‍රදායික පරිපාලන නිලධාරීන්ගේ තත්ත්වයට වඩා උසස් බවට පත් වෙමින් තිබුණු සන්දර්භයක් තුළය (පීබල්ස් 1995). 19 වන සියවස තුළදී, මෙම පරිපාලන නිලධාරී ප්‍රභූ පන්තියේ ඇඳුම 17 වන සියවසේ පෘතුගීසි මෝස්තරයට නිමකළ "ගම්දෙටු" කබාවල සිට ඔක්ස්ෆර්ඩ් හා කේම්බ්‍රිජ් උපාධි සහිත වික්ටෝරියානු නීතිඥවරුන්ගේ ජේත්තුකාර කබා සහ කලිසම් බවට පරිවර්තනය විය. නිලබල ක්‍රමයේ

ඉහළින් ම සිටි තෝල්ක මුදලිවරු සපත්තු හා මේස් අඳින්නට පටන් ගත් නමුත් දිගටම කබා ඇන්දහ (පීබල්ස් 1995). ඉංග්‍රීසි අධ්‍යාපනය යන සාධකය මේ දේශීය ප්‍රභූ පන්තිය සමාජයේ අනෙක් කොටස්වලින් වෙන්කරන සාධකයක් විය. උසස් අධ්‍යාපනය විශේෂ ජයග්‍රහණයක් වූවා සේම, උරුමය වෙනුවට දක්ෂතා මත අවස්ථා හිමිවන ක්‍රමයක් තුළ එය විශේෂයෙන් ප්‍රයෝජනවත් වූ අතර, සමාජයේ අනෙකුත් කොටස්වලටත් උසස් අධ්‍යාපනය සඳහා අනුබලයක් සපයන ලදී (පීබල්ස් 1995).

මීට සමගාමීව, නීත්‍යානුකූල ආණ්ඩු ක්‍රමයට පක්ෂපාතී වූවන් ලෙස හැඳින්වූ මේ දේශීය ප්‍රභූ පන්තිය අතින් අධිරාජ්‍යවාදී දේශපාලන ක්‍රමය දේශීයකරණයට ලක්කෙරෙමින් තිබිණි. ඔවුන්ගේ බලාපොරොත්තුව වූයේ තම දියුණුව, පැවති දේශපාලන ක්‍රමය තුළම සාක්ෂාත් කරගැනීම විනා එය රැඩිකල් වෙනසකට භාජනය කිරීම නොවේ. යටත් විජිත ක්‍රමය තුළ හැදී වැඩුණු ඔවුන්ට තම අනන්‍යතාව සඳහා ඒ මත යැපෙන්නට සිදුවිය. එහෙයින් දේශීය ප්‍රභූ පන්තිය සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකාවට සාපේක්ෂව නගරයේ මධ්‍යගත බව කොතරම් යෝග්‍ය ද යන්න හෝ එහි අධිරාජ්‍යවාදී භූමි දර්ශනය හෝ ප්‍රශ්න කළේ නැත. එහෙත් අධිරාජ්‍යවාදී ක්‍රමය තුළ දේශීය ධනපති පන්තිය ඊට හුරුවීම උභතෝකෝටික ස්වරූපයක් ගන්නා ලදී. ඔවුන් බොහෝ සෙයින් බ්‍රිතාන්‍යයන් මෙන් වූ නමුත් පූර්ණ බ්‍රිතාන්‍යයන් නොවූ අතරම ඔවුන්ගේ හැඩගැස්ම අසම්පූර්ණ හා තථ්‍යාසන්න (virtual) බවක් ඉසිලීය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ආකෘති අනුකරණය කිරීම හරහා මොවුහු අධිරාජ්‍යවාදී ව්‍යුහ, අවකාශ හා සංකේත තම ග්‍රහණයට ගනිමින් සිටි අතරම, තමන් යටත් වැසියන් වූ සමස්ත අධිරාජ්‍යවාදී ක්‍රමයට ද අභියෝග කරමින් සිටියහ.

දේශීය ධනපතීන් විසින් තමන්ට හුරුවූ යටත්විජිත පරිසරය පරිවර්තනය කිරීමට උත්සාහ නොකළද, එම පරිසරය තමන්ට හිතකර ආකාරයෙන්

හැඩගස්වා ගැනීම නිසා එහි සැලකිය යුතු වෙනස්කම් ඇති විය. සම්පූර්ණයෙන් ම යුරෝපීය ප්‍රදේශ වූ කොටුව හා පිටකොටුව ප්‍රදේශවලට මොවුහු ඇතුළුවෙමින් සිටියහ. එච්. ඒ. ජේ. හුලුගල්ලේ දක්වන පරිදි (1965) රන් ආභරණ වෙළඳුන් හැරුණු විට, නැව්වලට භාණ්ඩ සැපයූ හා වරාය කම්කරුවන් සැපයූ සී. මැතිව් සහ සමාගම වැනි වෙනත් වාණිජ ආයතන ද කොටුව තුළ ස්ථානගත වී තිබිණි. පිටකොටුවේ තිබුණු ලාංකේය වාණිජ ව්‍යාපාර ලෙස එච්. දොන් කරෝලිස් සහ පුත්‍රයෝ (ආරම්භය 1860), එන්. එස්. ප්‍රනාන්දු (1875), එස්. එල්. නයිනා මරික්කාර් (1888) සහ ආතර් ජේ. ප්‍රනාන්දු සහ සමාගම (1891) දැක්විය හැකිය. 19 වන සියවස අග භාගයේ දී ආයෝජන සඳහා වඩාත් ම ආකර්ෂණීය නගරය වූයේ, මහනුවර හෝ ගාල්ල නොව කොළඹයි. නව ව්‍යාපාර ඇරඹෙනවාට අමතරව, වෙනත් නගරවල සාර්ථකව පවත්වාගෙන ගිය වෙළඳාම් ද කොළඹට ආකර්ෂණය විය. උදාහරණයක් ලෙස නගරයේ සිටි පැරණිතම රන් භාණ්ඩ වෙළෙන්දා වන ඕතාවන් ලෙබ්බෙ මකාන් මකාර්, 1860 දී ගාල්ලේ දී සිය වෙළෙඳ ව්‍යාපාරය අරඹා වසර කිහිපයකින් කොළඹට සංක්‍රමණය විය (හුලුගල්ලේ 1965). මෙවැනි වෙළඳ ව්‍යාපාර ස්ථානගත කරමින්, මේ වෙළඳුන් විසින් ක්‍රමයෙන් ලාංකේය වෙළඳ කටයුතු සඳහා හිතකර පරිසරයක් බවට කොළඹ පරිවර්තනය කරන ලදී.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී සංස්කෘතිය ලංකාවේදී පත්වූයේ, වැවිලි කර්මාන්තයේ හා පතල්වල හිමිකාරීත්වය දරූ, දේශපාලන නායකයන් හා පරිපාලකයන්ගෙන් සැදුම් ලත්, විශේෂයෙන් ම සිය දරුවන් එංගලන්තයේ ඉගෙනගත්, ආගමික භක්තියෙන් ක්‍රිස්තියානි වූ පවුල් කිහිපයක අධිකාරී බලයට නතු අණසකක් (hegemony) බවටයි. ලාංකිකයන් අතර ස්වකීය වරප්‍රසාද ලත් සමාජ තත්ත්වය සංකේතවත් කිරීම සඳහා මේ ධනපති ප්‍රභූ පන්තිය විසින් සිය නාගරික සංස්කෘතිකාංග ඇතැම් විට අනවශ්‍ය සේ උලුප්පවා දක්වමින් හා ඒවා තම සමාජ හා සංස්කෘතික අනන්‍යතාව හුවා දැක්වීමට

රැකුල් කර ගනිමින් සිය සංස්කෘතිය විසරණයවීම ඉතා ඊර්ෂ්‍යා සහගත ලෙස වළක්වාලනු ලැබිය (ඩන්කන් 1989). තුන්වෙනි යටත්විජිත සංස්කෘතිය[7] වූ මෙම දේශීය ධනපති සංස්කෘතිය කිසිවිටෙකත් පූර්ණ ලෙස බ්‍රිතාන්‍ය හෝ දේශීය හෝ නොවීය. ඔවුන්ගේ අනන්‍යතාව ගොඩනැගුණේ, ස්වකීය ස්වදේශික සංස්කෘතිය, අධිරාජ්‍යවාදී සමාජයට අනුගතවීමේ ප්‍රතිඵලයක් ලෙස පරිවර්තනය වීම නිසාය. එනම් ඔවුන්ගේ සංස්කෘතිය, සාමාන්‍ය ලාංකේය ජනයාට ස්වකීය බලය හා යටත් විජිත සමාජයට ස්වකීය වටිනාකම නිරූපණය කර දක්වන ආකාරයෙන් ගොඩනැගුණු අධිරාජ්‍යවාදී සංස්කෘතියෙන් තෝරාගත් අංගවල විශාල බලපෑමට ලක් වූ ඉහළ පන්තියක සුපිරි ලාංකේය තුන්වන සංස්කෘතියකි.

බ්‍රිතාන්‍ය සංස්කෘතික ආකෘතිය අනුගමනය කිරීමට සමගාමීව, පහතරට සුපිරි පන්තිය සාම්ප්‍රදායික රදල බලයට හා උසස් යැයි සම්මත ගොවිගම කුලයට එරෙහිව තරග කරමින් සිටියහ. අධිරාජ්‍යවාදී ක්‍රමය තුළ තිබූ ගතිකත්වය වැඩි වශයෙන් ම ප්‍රයෝජනයට ගනු ලැබුවේ, සාම්ප්‍රදායික සමාජයේ ඉහළ ස්තරයන්ට අයත් නොවූ, බර්ගර්, දෙමළ, මුස්ලිම් හා පහතරට සිංහල ජනයා විසිනි (රොබර්ට්ස් 1982). ගොවිගම කුලයේ ආධිපත්‍යයට අභියෝග කිරීමේ ක්‍රියාවලියේ කොටසක් වශයෙන්, පහතරට සුපිරි පන්තිය, ගොවිගම රදලයන් විසින් ගොඩනගා තිබූ 'වලව්වේ හාමු' මුල් කොටගත් ජීවන රටාවක් අනුගමනය කරමින් 'නම්බුව' ලබා ගැනීමට උත්සාහ දැරූහ (රොබර්ට්ස් 1982). එහෙයින් පැරණි සිංහල ආචාර ධර්ම නවදුරටත් අදාළ හා ගැළපෙන දේ වූ අතර, නව සුපිරි පන්තිය ඒවා සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කිරීමට සූදානම්ව සිටියේ නැත (රොබර්ට්ස් 1982). මීට අමතරව ඔවුහු නව සම්ප්‍රදායන් නිර්මාණය කළහ. උදාහරණයක් ලෙස පොන්නම්බලම් අරුණාචලම් ඉන්දියානු රදලවරුන් මෙන් සාම්ප්‍රදායික දිග කබාය ඇඳීමට හා ජටාව බැඳීම ආරම්භ කෙළේය (ජයවර්ධන 2000).

කෙසේ නමුත් වෙනත් අවස්ථාවන්හිදී, ලාංකිකයෝ තම හැසිරීම් රටා බ්‍රිතාන්‍ය උසස් පන්තිය දෙස බලා හැඩගස්වා ගත්හ (රොබර්ට්ස් 1982). ගෞරවය හා වේතනය කෙරෙහි ආකර්ෂණය වී ලන්දේසීන්ගේ මුරකරුවන් හා ආරක්ෂකයන් ලෙස සේවයට පැමිණි ලාංකිකයන්ගෙන් පැවත එන්නෝ බොහෝ දෙනෙක් ඔවුන් රට හැර ගිය පසු බොහෝ නම්බුකාර ධනවතුන් ලෙස පිටත පිටකොටුව ආශ්‍රිත වොල්ෆන්ඩාල් ප්‍රදේශයේ ඒකරාශි වී සිටියහ. ඔවුහු සිය ළමාතැනීන් ද සමඟ ග්‍රීන් පාරේ, කුරුව පාරේ හා සිල්වර්ස්මිත් පාරේ, විශාල වලව්වල ජීවත් වූහ (බ්‍රෝහියර් 2000). ලන්දේසි යුගයේදී ද සිය බල ප්‍රදේශ වූ ග්‍රාමීය ප්‍රදේශවල විසූ මුදලිවරු ද, කොළඹ තම නිවාස තනා ගත්හ. මහ මුදලිවරු හතරදෙනා වොල්ෆන්ඩාල් ප්‍රදේශය තුළ හා ඒ ආශ්‍රිතව විශාල උද්‍යානවලින් සමන්විතවූ තම වලව් තනා ගත්හ.

නව සුපිරි ධනපති පන්තිය, බ්‍රිතාන්‍යයන් අනුගමනය කරමින් කොළඹ නගරයට පිවිසියා පමණක් නොව අධිරාජ්‍යවාදී ජීවන රටාව හා වාසස්ථාන ද අනුකරණය කළහ. හෝමි බබාට අනුව "අනුකරණය මතුවන්නේ වෙනසක් නියෝජනය කිරීමෙන් වන නිසාම, එය ප්‍රතික්ෂේප කිරීමේ ක්‍රියාවලියකි. පුනරුක්තියක් වන මෙම අනුකරණය, සරදම් සහගත උභතෝකෝටික තත්ත්වයකට මග පාදයි" (බබා 1994: 86). මෙම සුපිරි පන්තිය විසින් නිර්මාණය කරනු ලැබුවේ, පූර්ණ වශයෙන් අධිරාජ්‍යවාදී වන යමක් හෝ පූර්ණ වශයෙන් රදල වන යමක් හෝ නොවේ. එහි ප්‍රතිඵලය සෑම විටම සම්මිශ්‍රිත විය. ඔවුන් තැනූ විශාල මන්දිරවල සැලසුම් හා නම්වල පැවති මෙම සම්මිශ්‍රිත ලක්ෂණය හැරුණු විට, ඒ නිවාස පිහිටියේ ද අධිරාජ්‍යවාදී සමූහය හා ස්වදේශික නගරය අතර පිහිටි සීමාසහිත අවකාශයෙහිය.

19 වන සියවස මුල් භාගයේ දී කොළඹ නගරය පුළුල් වීම නිසා වොල්ෆන්ඩාල් අවට ප්‍රදේශයේ අඩු ආදායම් ලාභී ජාවා සහ මැලේ ජාතිකයන්ගේ පැල්පත් හා මුඩුක්කු ඇති විය. වහලුන් ලෙස සේවය කළ

ජනයා නිදහස ලැබුවායින් පසුව, කොටුවෙහි දකුණු දිගින් පිහිටි බේරේ වැවෙන් ඔබ්බෙහි වූ කොම්පඤ්ඤ වීදිය ආශ්‍රිත ප්‍රදේශයෙහි පදිංචි වූහ (බ්‍රෝහියර් 2000). අධිරාජ්‍යවාදී සමයේ මුල් අවධියේ දී කොළඹ කොටුවට උතුරින් පිහිටි මුට්වාල් හා ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශවල ස්ථානගත වී තිබූ යටත් විජිත වාසස්ථාන 1860 හා 1870 ගණන් වන විට කොටුවට දකුණු දෙසින් පිහිටි ප්‍රදේශයන්ට, විශේෂයෙන් ම කොල්ලුපිටිය හා කුරුඳුවත්ත ප්‍රදේශයට මාරු විය (හුලුගල්ලේ 1965). බ්‍රිතාන්‍ය ජාතිකයන්ට වෙන්වූ සමාජ ශාලාවල සාමාජිකත්වය නොලැබුණු දේශීය සුපිරි පන්තිය, කුරුඳුවත්ත ආසන්නයේ ම තමන් සඳහාම "ඔරියන්ටල් ක්ලබ්" නම් සමාජ ශාලාව පිහිටු වූහ (රොබර්ට්ස් 1974).

මෙම දේශීය සුපිරි පන්තියේ වාසස්ථාන සැලසුම් කෙරුණේ අධිරාජ්‍යවාදී ආකෘතීන්ට අනුවය (බලන්න රූපසටහන් අංක 2 හා 3). නවීනතම යුරෝපීය ඇඳුම් මෝස්තර අනුකරණය හැරුණු විට, ඔවුහු සිය ධනස්කන්ධය හා තරගකාරී ස්වභාවය තුළට නවීනතම වාස්තු විද්‍යාත්මක ශිල්ප ද උකහා ගත්හ. 1860න් පසු දශකවලදී, ධනයෙන් වැඩි කොටසක් වැය කෙරුණේ විශාල මන්දිර තැනීමටයි. ධනපතීන් විසින් කොළඹ නගරය තුළ උද්‍යානවලින් යුත් ව්‍යාජ ඉතාලි සැරසිලි සහිත දර්ශනීය මන්දිර තනනු ලැබිණි (ජයවර්ධන 2000: 258).

මෙම වාසස්ථාන අතරින් බොහොමයකට යොදා තිබුණේ ගාම්භීර රාජකීය බවක් ආරූඪ කර ගත් නම්ය. උදාහරණ ලෙස ඔලිවර් කාසල් (එච්. ජේ. පීරිස්), ඩෙයින් කෝට් (බැස්ටියන් ප්‍රනාන්දු), හිල් කාසල් (එස්. සී. ඔබේසේකර), එල්ස් කෝට් (ජෙරොනිස් පීරිස්) සහ වික්ටෝරියා කාසල් (ආර්.ඊ. එස් ද සොයිසා) යන නිවෙස් නාම දැක්විය හැකිය. තවත් අය බටහිර මෝස්තරයට ගැළපෙන පරිදි ප්‍රාචීනවාදී නම් තෝරාගෙන තිබිණි. පී. රාමනාදන්ගේ සුබස්ථාන් (සුබය ගෙන දෙන නිවස), පී. අරුනාචලම්ගේ





රූප අංක 2: කොළඹ ප්‍රභූ ප්‍රදේශවල පිහිටි යටත්විජිත පන්නයට අයත් නිවාස.
මූලාශ්‍රය: කේව්, 1908.





රූප අංක 3: කොළඹ ප්‍රභූ ප්‍රදේශවල පිහිටි යටත්විජිත පන්නයට අයත් නිවාස.
මූලාශ්‍රය: කේව්, 1908.

පොන්ක්ලාර් (රන් උද්‍යානය), එන්. ත්‍යාගරාජාගේ ත්‍යාග නිවාස හා ඒ.ඒ. ද සිල්වාගේ (කනිෂ්ඨ) සිරිමතිපාය මේවාට උදාහරණ ලෙස දැක්විය හැකිය. මෙම සුපිරි වෙළෙඳ පන්තියේ දරු පරපුර, බ්‍රිතාන්‍ය රදල පැවතුම් අනුකරණය කරමින්, රාජකීය ක්‍රීඩා ලෙස සැලකුණු බල්ලන් ඇතිකිරීම හා තුරඟ තරග කෙරෙහි දැඩි රුචියක් දක්වනු පෙනෙන්නට තිබිණි (ජයවර්ධන 2000). නගරයෙන් ඔවුන් වඩාත් ප්‍රියකළ ප්‍රදේශ වූයේ නඩත්තුව සඳහා අතිවිශාල සම්පත් ප්‍රමාණයක් අවශ්‍යවන, සේවා අංශය ඉතා උසස් මට්ටමක පැවැති ඒවාය. කොළඹ නගරය තුළ තම පැවැත්ම තවදුරටත් තහවුරු කර ගනිමින් මේ සුපිරි පන්තිය මගින් 1898 වර්ෂයේ දී *සිලෝන් ස්ටෑන්ඩර්ඩ්* නමින් ස්වකීය ප්‍රවෘත්ති පත්‍රයක් ද ආරම්භ කරනු ලැබීය (රොබර්ට්ස් 1984).

මේ අයුරින් බලන කළ දේශීය සුපිරි ධනපති පන්තිය, කොළඹ නගරයේ අධිරාජ්‍යවාදී භූමි දර්ශනය පුළුල් කිරීමේ ක්‍රියාවලියේ මෙන්ම එහි අර්ථය දේශීයකරණය කිරීමේ ක්‍රියාවලියේ ද එකම අවස්ථාවේ දී කොටස් කරුවෝ වූහ. සාම්ප්‍රදායික ධනපතීන් විසින් වොල්ෆෙන්ඩාල් ආශ්‍රිතව, කොළඹ නගර සීමාව අවට ඉදිකර තිබුණු විශාල මන්දිර වෙනුවට, නව සුපිරි පන්තිය විසින් අධිරාජ්‍යවාදී වාසස්ථාන අවට සිය සුවිසල් මන්දිර ඉදිකරවනු ලැබීය. අධිරාජ්‍යවාදී විදේශිකයන්ගේ වාසස්ථානයන්ට යාබද පෙදෙස තම වාසයට තෝරාගැනීමෙන් හා ඔවුන්ගේ වාස්තු විද්‍යාත්මක ආකෘති අනුකරණය කරමින්, නව සුපිරි පන්තිය නගරයේ අධිරාජ්‍යවාදී වාසස්ථාන පැතිර තිබූ ප්‍රදේශය පුළුල් කිරීමට ආධාර විය. මේ අතර කොළඹ කොටුව හා පිටකොටුව තුළට ඇතුළුවෙමින්, දේශීය සුපිරි ධනපතීන් විසින් නගරයේ ආර්ථික ප්‍රදේශය ද දේශීයකරණය කරන්නට යෙදිණි. කොටුව සහ පිටකොටුව ප්‍රදේශයන්හි අර්ථය අදේශපාලනික බවට පත් වූ අතර, එම ප්‍රදේශ හැඳින්වීමට දේශපාලනික වශයෙන් උදාසීන 'කොටුව' හා 'පිටකොටුව' යන පද භාවිතයට ගැනිණි. දේශීය සුපිරි පන්තිය නගරය

බෙදී තිබීම හා යටත් විජිත ක්‍රමය තුළ පැවති ආචාර ධර්ම පද්ධතිය ප්‍රිය කළ නමුත්, සෑම විටම ඔවුනට වරප්‍රසාද ලත් සමාජයේ කොටස් කරුවන් වීමට සටන් කරන්නට සිදුවීය. එසේ කිරීම මගින් ස්වදේශික සුපිරි පන්තිය, කොළඹ නගරය යටත්විජිත ආණ්ඩුවේ ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස පැවැත්මට නිත්‍යානුකූල භාවයක් ලබා දුන් අතර, කොළඹ නගරය දේශපාලන බලය පිළිබඳව හෙට්ටු කිරීමේ ප්‍රධාන අවකාශය බවට පරිවර්තනය කරන ලදී. එවැනි පිළිගැනීමක් කොළඹ නගරයට ඊට පෙර මෙතරම් පැහැදිලිව ලැබී නොතිබිණි (පෙරේරා 1999).

කොළඹ නගරය තුළ මේ ලාංකේය සුපිරි පන්තියෙහි පැවැත්ම ඉතා ප්‍රකටව පෙනෙන්නට තිබිණි. උසස් මාදිලියේ ගොඩනැගිලි තැනුණු අතර ඒවාහි නම් ආගන්තුක විය. නගරයෙහි භූමි දර්ශනය සාමාන්‍ය ලාංකිකයනට නුහුරු වූ අතරම එය උභයාර්ථීත එකක් ද විය. එහි පරිසරය පූර්ණ වශයෙන් අධිරාජ්‍යවාදී නොවුණා මෙන්ම එහි වැසියෝ ද පූර්ණ වශයෙන් ලාංකිකායෝ ද නොවූහ. දේශීය සුපිරි පන්තිය විසින් තනනු ලැබූ වටපිටාව සාමාන්‍ය ලාංකේය සමාජය හා යටත් විජිත සමාජය අතර මැද ස්ථාන ගත වූ සම්මිශ්‍රිත අවස්ථාවකි.

## බෞද්ධ ආගමික ප්‍රබෝධය

19 වන සියවස අග භාගය ලංකාවේ සංස්කෘතික හා ආගමික පුනර්ජීවයක් ඇති වූ කාල පරිච්ඡේදයකි (බැස්ටින් 1997, සමරවීර 1997). හින්දු පුනරුදය ඇතිවූයේ ඊට පෙර පරම්පරාවට අයත් කාලයේ වූ අතර, 19 වන සියවසෙහි අග භාගයේදී සිදුවූ කොළඹ නගර පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියට එහි සම්බන්ධයක් නැත. සිය පැවැත්ම සඳහා බොහෝ කාලයක් (පහතරට ප්‍රදේශවල සියවස් තුනහමාරක්) අරගල කරමින් සිටි බුදු දහම මේ යුගයේදී

ඉතා ප්‍රබලව නැගී සිටින්නට විය. 19 වන සියවස අගභාගයේ දී බුදු දහම මුහුණ දුන් මෙම පුළුල් පරිවර්තනය ගොම්බ්‍රිච් සහ ඔබේසේකර (1988), ඔබේසේකර (1970) සහ මලල්ගොඩ (1976) වැනි විද්වතුන් විසින් සාකච්ඡාවට භාජනය කෙරී ඇති අතර එය මෙහි නැවත සලකා බැලීම අවශ්‍ය නොවේ. වර්තමාන අධ්‍යයනයේ අවධානය යොමුවන්නේ බෞද්ධ පුනරුද ව්‍යාපාරය, කොළඹ භූමි දර්ශනය වෙනස් කිරීමට බලපෑ ආකාරය වෙතටය.

1860 හා 1880 ගණන්වලදී බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය යටත් විජිත කොළඹ නගරය මත විශාල බලපෑමක් කළ නමුදු, එය නගරයේ භූමි දර්ශනය තුළ ඒ අයුරින් ම නියෝජනය වී ඇත. බෞද්ධ ප්‍රබෝධය මගින් ලාංකිකයන් යටත් විජිත ක්‍රමයට අනුගතවීමේ දීර්ඝකාලීන ක්‍රියාවලියේ උච්චතම අවස්ථාව මෙන් ම යටත්විජිත ක්‍රමය වෙත එල්ල කළ දැඩි විරෝධය ද සංකේතවත් වෙයි. මෙම ව්‍යාපාරයේ කොටසක් ලෙස, ඉතා වැදගත් නව ආයතන බිහිවීම හා පැරණි ආයතන යටත් විජිත ක්‍රමයට හා ඊට එරෙහිව තමනට අවශ්‍ය සේ හැඩගස්වාගෙන කොළඹට ගෙන ඒමද දැකිය හැකිය. එමගින් නුවර-කොළඹ (ලාංකික-බ්‍රිතාන්‍ය) වශයෙන් පැවති අරගලය බල රහිත කොට ඒ වෙනුවට කොළඹ නගරය, එතුළ සිට දේශීයකරණය කිරීමේ ව්‍යාපාරයක් බවට පරිවර්තනය වූ අතර කොටුව තුළ ස්ථානගතව තිබූ බලසම්පන්න දේශපාලන හා සංස්කෘතික ආයතනවල ආධිපත්‍යයට අභියෝග කළ හැකි ශක්තිමත් සංස්කෘතික ආයතන ස්වදේශිකයන්ගේ නගරයට ලැබිණි. මීට අමතරව බෞද්ධ ප්‍රබෝධ ව්‍යාපාර මගින් ස්වදේශික සුපිරි පන්තිය තනමින් සිටි වඩාත් කැපී පෙනෙන භූමි දර්ශන බොඳකර දමන ලද අතර ව්‍යාජෝක්ති දනවමින් හා උභයාර්ථිතව (irony and ambiva-lence) පුනරුද ව්‍යාපාරය විසින් ඇති කළ රහස්‍ය ආකාරයේ වටපිටාවන්හි (clandestine type of landscape) සැඟව ගිය බලය පිළිබඳව නව මානයක් ද නගරයට එකතු කරනු ලැබිය.

යටත්විජිත සමයේ දී, වසර දහස් ගණනක් ක්‍රියාත්මක වෙමින් තිබුණු ව්‍යුහ විනාශකර දැම්ම නිසා ලංකාවේ බෞද්ධ ආයතන පද්ධතිය දුර්වල වී ගියේය.[8] 16 වන සියවස මුලදී පෘතුගීසින් විසින් ලංකාවේ පහතරට ප්‍රදේශ යටත් කර ගැනීමත් සමග උඩරට ප්‍රදේශවලට පැනගිය භික්ෂූන් ව උණුසුම්ව පිළිගත් උඩරට රජු, ඔවුන්ට විහාර හා නින්ද ගම් ලබා දී බෞද්ධාගම පෝෂණය කෙළේය. 1815 දී බ්‍රිතාන්‍යයන් විසින් උඩරට යටත් කරගැනීමෙන් පසු සංඝයාට කිසිදු රාජ්‍ය අනුග්‍රහයක් නොලැබුණි. ඊට අමතරව අධිරාජ්‍යවාදී රාජ්‍යයේ අනුග්‍රහය ලත් ක්‍රිස්තියානි ධර්මයේ විවිධ ස්වරූප හා තරග කරන්නට බුදු දහමට සිදුවිය (මලල්ගොඩ 1978, බොක්සර් 1965, වින්කර් 1989). මෙම නොපිට පෙරළුණු පරිසරය තුළ, කිසිදු රාජ්‍ය අනුග්‍රහයක් නොලද බුදු දහම යළි පුබුදුවීමේ ව්‍යාපාරයේ ඉතා වැදගත් කාර්යභාරයක් භාර ගත්තේ ගිහි ජනතාවය.

බෞද්ධ ප්‍රබෝධය, පහතරට සුපිරි පන්තියේ නැගීමට උරදුන්, එමෙන් ම එම පන්තියේ නැගීම මගින් පෝෂණය වූ පහතරට ජනතා ව්‍යාපාරයකි (සිල්වා 1981). මෙම ප්‍රබෝධය මහනුවර රාජධානිය බිඳවැටීමටත් පෙර, 19 වන සියවස ආරම්භයේදීම දැකගත හැකි වූයේ මහනුවර රජු විසින් උපසම්පදාව ගොවිගම කුලයට පමණක් සීමා කිරීමට එරෙහි වූ කරාව, දුරාව හා සලාගම කුලවලට අයත් ජනතාවගේ සංවිධානයෙන් නව නිකාය බිහිවීමත් සමඟය (සිල්වා 1981). යටත්විජිත රාජ්‍ය ප්‍රතිපත්තියේ ඇති වූ වෙනස්කම් හා ක්‍රිස්තියානි ධර්මයට අයත් ලබ්ධීන් අතර ඇති වූ ආරවුල් නිසා 19 වන සියවස අග භාගයේ දී බෞද්ධයන්ට සිය ආගමික කටයුතු ප්‍රතිසංවිධානය කිරීම හා යළි ප්‍රාණවත් කිරීම පහසු විය. එම ව්‍යාපාරයට නායකත්වය සපයනු ලැබුවේ ප්‍රධාන වශයෙන් ම පහතරට සුපිරි පන්තිය විසිනි (සිල්වා 1981). පසුකලෙක බෞද්ධ පුනරුද ව්‍යාපාරය සඳහා හෙන්රි ඕල්කට් හා බ්ලවට්ස්කි ආර්යාව වැනි පරමවිඥානාර්ථවාදී අන්තර්ජාතික

ක්‍රියාකාරීන්ගේ ද, ඇතැම් උසස් නිලතල දරූ අධිරාජ්‍ය බලධාරීන්ගේ ද ආධාරය ලැබිණි (සිල්වා 1981).

ආගමික ජීවිතය සම්බන්ධයෙන් ගොවිගම කුලය සතුව තිබූ ආධිපත්‍ය බිඳ වැටීම නිසා ගොවිගම නොවන කුලවලට අයත් වූවන් ආගමික කටයුතුවලට එළඹීම මගින් ආගමික පරිසරය පුළුල් වූ අතර නව ආගමික නිකාය කිහිපයක් බිහිවීමත් භික්ෂූන් හා පන්සල් සංඛ්‍යාව වැඩිවීමත් මේ යුගයේදී සිදු විය. මේ නව වර්ධනය නිසා සමස්ත බෞද්ධ ආගමික පද්ධතිය නව සමාජානුයෝජනයකට හා ප්‍රතිසංවිධානයකට ලක් වූ අතර, එමගින් එය වඩාත් ශක්තිමත් විය. මේ වකවානුවේ දී ගිහි ජනයා විශාල වශයෙන් ආගමික කටයුතුවල නිරත වූවා පමණක් නොව, 1880 පමණ සිට, භික්ෂූන් වහන්සේ දරූ ඇතැම් සාම්ප්‍රදායික ආගමික නිලතලවලින් ඔවුන්ව අවතැන් කෙරිණි (ගොම්බ්‍රිච් හා ඔබේසේකර 1988, මලල්ගොඩ 1976, සිල්වා 1981). මේ හේතුවෙන් බුදු දහම ග්‍රාමීය ප්‍රදේශයන්හි වේගයෙන් ව්‍යාප්ත වී ගියේය. බෞද්ධ ප්‍රබෝධය නාගරික ප්‍රදේශ හා කොළඹ නගරයට ද විශාල බලපෑමක් ඇති කෙළේය. එම සියවසේ වැඩි කාලයක් මුළුල්లේ ප්‍රොතෙස්තන්ත බුදු දහම කොළඹ හා 18 වන සියවසේ දී පහතරට ප්‍රධාන බෞද්ධ මධ්‍යස්ථානය වූ ගාල්ල (මලල්ගොඩ 1976) වැනි කුඩා නගරවල මතුවෙමින් පැවති මධ්‍යම පන්තියට පමණක් සීමා වී පැවතිණි (ගොම්බ්‍රිච් හා ඔබේසේකර 1988).

ගොම්බ්‍රිච් හා ඔබේසේකර (1988) තර්ක කරන්නේ බුදු දහම පොදුවේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට හා විශේෂයෙන් ප්‍රොතෙස්තන්ත මිෂනාරි ව්‍යාපාරයට එරෙහි වීම හරහා, 19 වන සියවස අග භාගයේ දී (1860-85), ඔවුන් එය හඳුන්වන ආකාරයට 'ප්‍රොතෙස්තන්ත බුදු දහමක්' බවට පරිවර්තනය වූ බවයි. අධිරාජ්‍යවාදයට හා ක්‍රිස්තියානි ධර්මයට විරුද්ධ වීමේ ක්‍රියාවලියේ දී හා ඒ ක්‍රියාවලිය සඳහා බුදු දහම බොහෝ ප්‍රොතෙස්තන්ත

අංග ලක්ෂණ උකහා ගන්නා ලදී. යටත් විජිත ක්‍රමය තුළ බෞද්ධ ආගමික සංවිධාන සකසා ගැනීම හා පිහිටුවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රකට වූ ප්‍රධාන ලක්ෂණ නම් 'විරුද්ධවාදී දේශපාලනයයි' (oppositional politics). එය ටෙරී ඊගල්ටන් දක්වන ආකාරයට "විරුද්ධවාදියා මගින් සිතියම් ගත කළ භූමි භාගයක් හඹායාමක්" (1990: 26) වන නිසා ව්‍යාජෝක්ති සංකේතයක් සේද සැලකිය හැකිය.

බෞද්ධ පරම විඥානාර්ථ සංගමය පිහිටුවීම, බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම, කැරොල් ගී අනුකරණය කරමින් තැනූ බොදු බැති ගී තම ආයතනික ක්‍රියාකාරකම්වලට ඇතුළත් කර ගැනීම, ඉංග්‍රීසි භාෂාව භාවිතයට ගැනීම, වැනි දෑ බුදු දහම ඉහත කී ආකාරයේ වෙනස් වීමකට ලක්වීම දක්වන ලක්ෂණයන්ගෙන් සමහරක්ය. බෞද්ධ පරම විඥානාර්ථ සංගමය හා මහාබෝධි සංගමය මගින් අනුග්‍රහය ලද බෞද්ධ මිෂනාරි පාසල්, ඒවාහි විෂය මාලාව සම්බන්ධයෙන් හා ක්‍රිකට් ක්‍රීඩා කිරීම සම්බන්ධයෙන් වුවද, තෝරාගත්තේ ක්‍රිස්තියානි මිෂනාරි පාසල්වල ක්‍රියාත්මක වෙමින් තිබූ ආකෘතින්ය (ගොම්බ්‍රිච් හා ඔබේසේකර 1988, ඔබේසේකර 1970). ප්‍රොතෙස්තන්ත බුදුදහම මගින් ඇති කෙරුණේ බහු උභයාර්ථ දනවන ආකාරයේ සම්මිශ්‍රිත ආයතනයි (මලල්ගොඩ 1976). මේවා මූලිකවම බෞද්ධ ආයතන වූවත් ඒවා පරිපූර්ණ ආයතන නොවිණි. මිශ්‍ර වූ බව හා උභයාර්ථ ජනනීත්වය මෙම ආගමික පරිවර්තනය අවකාශීය වශයෙන් නියෝජනය වීමේදී ද දැකිය හැකිය. ආගමික පුනරුද ව්‍යාපාරයේ නායකයන් උත්සහ දැරුවේ කොළඹ කේන්ද්‍රීය වූ යටත්විජිත අවකාශීය සංවිධානය අනුගමනය කරමින් බුදු දහම ප්‍රතිෂ්ඨාපනය කිරීමටය.

කොළඹ නගරය, මහනුවර හැරුණු විට බෞද්ධ පූජ්‍යස්ථාන කේන්ද්‍රගත වූ ප්‍රධානතම නගරය බවට පත්වූ අතර ආගමික පාසල් හරහා නගරය තුළ බෞද්ධාගමෙහි පැවැත්ම දැනෙන්නට විය. පළමුව,

කොළඹ ආශ්‍රිත ලාංකේය බලය තහවුරු වූ ප්‍රදේශ වන කැලණිය හා කෝට්ටේ පිහිටි පන්සල් යළි පණ ගැන්විණි. දෙවනුව, එම ඓතිහාසික පන්සල්වලට පරිවාර ආගමික ස්ථාන ගොඩනැගුණු අතර ඒවා කොළඹ නගරයට තවත් නුදුරින් හෝ නගරය තුලට සංකේන්ද්‍රණය විය (රූප අංක 4 බලන්න). මේ අතරින් ප්‍රධානතම ආගමික ස්ථාන වන්නේ අමරපුර නිකායේ නිර්මාතෘ ලංකාගොඩ ධීරානන්ද හිමි වැඩ විසූ දෙමටගොඩ ජයසේකරාරාමය සහ 1860 සහ 1870 ගණන්වල සිටි ප්‍රධාන ක්‍රිස්තියානි විරෝධී කථිකයා වූ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි වැඩ සිටි කොටහේන දිපදුත්තාරාමයයි (මලල්ගොඩ 1976). තෙවනුව, රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙන (1845), මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන (1873) හා පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන (1875) පිහිටුවීම හරහා ආගමික අධ්‍යාපන ආයතන සම්බන්ධයෙන් ප්‍රමුඛ මධ්‍යස්ථානය බවට කොළඹ පත් කෙරිණි (මලල්ගොඩ 1976).

මීට අමතරව, ගිහි ජනයාගේ සහභාගීත්වය වැඩි වශයෙන් ලැබුණු මිෂනාරි උරුවෙන් යුතු ආයතන හා පාසල් ඉදිවීම ද කොළඹ නගරය තුළ දක්නට ලැබුණි. කොළඹ නගරය කේන්ද්‍ර කොට ගෙන පිහිටවනු ලැබූ මේ සංවිධාන ක්‍රිස්තියානි ආගම් විරෝධී සටනට දායක විය. උදාහරණ ලෙස බෞද්ධ පරමවිඥානාර්ථ සංගමය, බුදුදහම ප්‍රචලිත කිරීමේ සංගමය සහ මහාබෝධි සංගමය දක්විය හැකිය. මේ සංගම් වටා සම්පූර්ණයෙන් ම ගිහි ආයතන වූ තරුණ බෞද්ධ සංගමය හා ආනන්ද විද්‍යාලය (1889) වැනි ආයතන ද පිහිටුවනු ලැබිණි. බෞද්ධයන් විසින් ස්වකීය ප්‍රධාන මුද්‍රණාලය මෙන්ම පොත් ප්‍රකාශන ආයතන පිහිටවනු ලැබුවේ ද කොළඹ නගරය තුළය (මලල්ගොඩ 1976).

කොළඹ නගරය සිය මධ්‍යස්ථානය ලෙස තෝරාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස බිහිවූ මෙම ආයතන, ගොඩනැගිලි හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සමූහය

මගින් නගරය සහ එහි භූමි දර්ශනය මත විශාල බලපෑමක් ඇති කරනු ලැබිය. ප්‍රධාන දේශපාලන හා ආගමික ආයතන එකිනෙක සමග ඒකීභූත වීම සිංහල රාජධානිවල පොදු ලක්‍ෂණයක් විය. නමුත් කොළඹ දී බෞද්ධාගමට දේශපාලන අධිකාරියේ අනුග්‍රහය ලැබුණේ නැත. එහෙයින් මෙ ආයතන හා සංවිධානයන්ගේ භෞතික භූමි දර්ශනය සම්බන්ධයෙන් සලකා බැලීමේදී, පැරණි ලාංකේය අගනුවරවල මෙන් උත්තුංග ලෙස පෙනී නොසිටි බව පැහැදිලිව පෙනේ. බොහෝ විට සිදුවූයේ එතෙක් පැවති ගොඩනැගිලි නව කටයුතු සඳහා යොදාගැනීමයි. උදාහරණයක් ලෙස බෞද්ධ පරමවිඥානාර්ථ සංගමය පිහිටා තිබුණේ කොම්පඤ්ඤ වීදිය ආශ්‍රිත නිවසකය. බොහෝ බෞද්ධ ආගමික කටයුතු සිදුකෙරුණේ, අධිරාජ්‍යවාදීන්ගේ භූමියෙන් පිටත පිහිටි දෙමටගොඩ, මරදාන හා කොම්පඤ්ඤ වීදිය වැනි ප්‍රදේශවලය. බෞද්ධ ක්‍රියාකාරීන් විසින් සිය කටයුතු පිටකොටුව දක්වාම පුළුල් කරනු ලැබූ අතර, ඔවුන් ඇතුළු නොවූයේ කොටුව තුළට හා අභිනවයෙන් ඉදිකෙරුණු අධිරාජ්‍යවාදීන්ගේ වාසස්ථාන පිහිටා තිබුණු යටත් විජිත සංස්කෘතික වටපිටාවක් සහිත වූ කුරුඳුවත්තට පමණි. උදාහරණයක් ලෙස බෞද්ධ අධ්‍යාපන ව්‍යාපාරයට අයත් ඉරිදා දහම් පාසලක් මැලිබන් වීදියේ පිහිටා තිබිණි (අමරසූරිය 1981). අනෙක් අතට, නගරය අවට ප්‍රදේශයේ ස්ථානගතව තිබූ බෞද්ධ ක්‍රියාකාරකම් හා ආයතන වඩා හොඳින් පෙනෙන්නට තිබිණි. නමුත් නගරය තුළ ක්‍රියාත්මක වූ බෞද්ධ කටයුතු වඩාත් විසිරී ගොස් තිබුණු අතර ප්‍රකටව පෙනෙන ලෙස භෞතිකව නියෝජනය වී තිබුණේ නැත.

මෙ අර්ථයෙන් සලකා බලන විට, බෞද්ධ ප්‍රබෝධය මගින් කොළඹ නගරය තුළ බිහි කළ භූමි දර්ශනය වඩාත් රහස්‍ය (clandestine) එකකි. බෞද්ධාගම ලාංකිකයන්ව ශක්තිමත් කළ අතර, කාලයත් සමඟ බෞද්ධ





රූප අංක 04: බෞද්ධ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත ගොඩනැගිලි යටත්විජිත භූමි දර්ශනය පරිවර්තනය කිරීමට සමත් විය. දීපදුත්තාරාමය (ඉහළ) සහ කැළණි විහාරය (පහළ). ඡායාරූප: නිහාල් පෙරේරා.

සංවිධාන කොළඹ නගරය පුරා ජාලයක් මෙන් විසිර ගියේය. ඒවා එකිනෙකින් වෙනස් වූයේ ඉටුකළ කාර්යය හා ක්‍රියාකාරී වූ මට්ටම අනුව මිස භෞතික පිහිටීමෙන් හෝ ස්වරූපය අනුව නොවේ. කෙසේ නමුත්, මේ ව්‍යාපාරය නිසා ස්වදේශීය නගරය තවත් පුළුල් වූ අතර, එය ප්‍රථම වරට ප්‍රධාන ලාංකේය ආයතනයක් මගින් අධිරාජ්‍යවාදී බල අධිකාරිය ප්‍රශ්න කරන්නට හැකි තත්ත්වයකට පදනමක්ද සැපයීය.

මෙම තත්ත්වය ජාතික තලයක සිට බලන්නේ නම්, මේ යුගයේ ඇති වූ සංස්කෘතික පුබුදුව මගින්, අවකාශය සම්බන්ධයෙන් පැවති තරගය උග්‍ර අතට හරවමින්, කොළඹ නගරය දේශපාලන හා සංස්කෘතික බලය සම්බන්ධව හෙට්ටු කිරීමේ ප්‍රධාන අවකාශය බවට පරිවර්තනය කරන ලදී. එනම් දෙපාර්ශවයේ ම හඬට ඉඩ ලබා දෙමින්, අරගලය නගරය තුළට ගෙන එනු ලැබුවේ, කොළඹ නගරයට ද්විත්ව ස්වරූපයක් (dual form) ලබා දෙමිනි. එමගින් කොළඹ නගරය තුළ ඇතිවූයේ, සිය ප්‍රධාන ලක්‍ෂණය බහු අර්ථ ජනනය කරගත් මිශ්‍ර වූ නගරයකි. නගරයේ භූමි දර්ශනය තුළ වඩාත් කැපී පෙනුණේ, අලංකාර අධිරාජ්‍යවාදී වාස්තු විද්‍යාවට අනුව අධිරාජ්‍යවාදීන්ගේ බලප්‍රදේශ වූ කොළඹ කොටුව ඇතුළත තනා තිබූ ගොඩනැගිලි හා කුරුඳුවත්තේ ඔවුන් ඉදිකර තිබූ සිය සංස්කෘතික මධ්‍යස්ථානය. එහෙත් සුපිරි ප්‍රාන්තික වාසස්ථානවලට ඔබ්බෙන් වූයේ, උභයාර්ථ ජනනය කරන සම්මිශ්‍රිත නගරයයි. විශේෂයෙන් ම නගරයේ සීමාවන්ට ආසන්නව හා තදාසන්න ප්‍රදේශවල බෞද්ධ ආයතන හා එම අවකාශයන්ගේ පැවැත්ම ප්‍රකටව පෙනිණි. නගරයට පැමිණෙත්ම, බෞද්ධ භූමි දර්ශනය නාගරික පරිසරය හා මිශ්‍ර වී ගිය නමුත්, සිය භූමි දර්ශනයට සම්පූර්ණ ප්‍රතිවිරුද්ධ ලක්‍ෂණ පෙන්වමින්, බෞද්ධ ක්‍රියාකාරකම් යටත්විජිත පාලන අධිකාරියේ බලයට එරෙහිව තරග කරන්නට විය.

## ජනවිකාශිය වෙනස්කම් හා ප්‍රසාරණය

ඉහළ පන්තින් විසින් නගරයේ භූමි දර්ශනය වෙනස් කරමින් ද බෞද්ධ ආගමික ප්‍රබෝධය මගින් යටත්විජිත නගරය අලුතින් අර්ථගන්වමින් ද සිටි අතර, එහි වැසියෝ හා සංක්‍රමණිකයෝ තමන්ගේ භූමි ප්‍රදේශ දේශීයකරණයට ලක්කරමින් හා ඒ හරහා මුළු නගරයේම භූමි දර්ශනය වෙනස් කළහ. 1800 දී කොළඹ නගරයේ ජනගහනය 28, 000ක් පමණ තරම් කුඩා වූ අතර, එම සියවසේ අගභාගයේ ඇති වූ විශාල නාගරික ජනගහන වර්ධනයත් සමඟ 1900 වන විට නාගරික ජනගහනය 150, 000 දක්වා වැඩි විය. 1870 පමණ වන විට කොළඹ නගර සීමාව ඇතුළත රටෙහි අනෙකුත් විශාල නගර වූ මහනුවර හෝ ගාල්ලට වඩා දෙගුණයක් පමණ ජනතාව පදිංචිව සිටියහ (ෆර්ගියුසන් 1903, ටර්නර් 1927). මේ ජනගහන ප්‍රසාරණයට සංක්‍රමණ ප්‍රධාන හේතුවක් ලෙස බලපෑවේය. ජන සංක්‍රමණයන්ට අමතරව දකුණු ඉන්දියාවෙන් හා වෙනත් බ්‍රිතාන්‍ය යටත්විජිතයන්ගෙන් කොළඹට ආගමනය වූවන් නිසා ද ජනගහනය ප්‍රසාරණය විය. මේ විදේශිකයෝ මෙහි රටවැසියන් වීමේදී (naturalization), සිය සංස්කෘති හා අවකාශ දේශීයකරණය කර ගත්හ. මීට අමතරව, නගර සීමා පුළුල් කිරීම ද නගරයේ ජනගහනය වැඩිවීමට හා නගරය දේශීයකරණයට ලක්වීමට බලපෑනු ලැබූව ද එසේ නගර සීමාව පුළුල් කිරීම, සංක්‍රමණික ජනතාවගෙන් සැලකිය යුතු කොටසක් 19 වන සියවස ආරම්භයේ පැවැති නගර සීමාවෙන් පිටත තම වාසස්ථාන තනාගැනීම හා සම්බන්ධය. මේ විවිධ ක්‍රියාවලීන් හරහා 1860 හා 1880 දශක අතර කාලයේදී කොළඹ නගරයේ ස්වරූපය මෙන්ම අර්ථය ද සැලකිය යුතු ලෙස පරිවර්තනය විය. මෙම අධ්‍යයනයේ මීළඟ පිටු කිහිපයේ දී අවධානය යොමුවන්නේ මේ යුගයේ ඇති වූ ජන

සංක්‍රමණ, විදේශිකයන් රටවැසියන් වීමේ ක්‍රියාවලිය හා අනෙකුත් ප්‍රසාරණ හේතුවෙන් කොළඹ නගරයේ භූමි දර්ශනය කෙරෙහි ඇතිකළ බලපෑම හඳුනාගැනීමටය.

19 වන සියවස අවසන් වන විට කොළඹ සිටි බොහෝ ආගමනික විදේශිකයින් රටවැසියන් වී සිටි අතර සමස්ත නගර වැසියෝ බොහෝ දුරට දේශීයකරණය වී සිටියහ. මෙම විශාල යටත්විජිත අවකාශය එහි යටත් වැසියන් සිය දෛනික කටයුතු මගින් ඇතිකරන ලද පරිවර්තනයකි. මුස්ලිම්වරුන් සිය දෛනික කටයුතු සඳහා දෙමළ භාෂාව (ඔවුන් යාඥා කළේ අරාබි බසිනි) භාවිතයට ගත් අතර ඔවුහු කුල වශයෙන් ද ස්තරායනය වී සිටියහ (අසීස් 1986). කොළඹ නගරය තුළ වෙළෙඳ කටයුතු සඳහා තාවකාලිකව පදිංචි වූ මුස්ලිම්වරු පසුව එහි රටවැසියෝ වූහ. යටත්විජිත යුගයට පෙර හා එහි මුල් අවධියේදී ලංකාවට ආගමනය වූ විදේශීය කණ්ඩායම් දේශීයකරණයට ලක්වීම සම්බන්ධයෙන් ද දැකිය හැක්කේ මේ හා සමාන රටාවලියකි.

19 වන සියවස තුළ ප්‍රධාන ලාංකේය ජන වාර්ගික සහ ආගමික කණ්ඩායම් කෙරෙන් දිස්වූ සංස්කෘතික පුබුදුව කොළඹ ජීවත් වූ යුරේශියානු හා යුරෝපීය කණ්ඩායම්වලට 'බර්ගර්' ජන සමූහය ලෙස ඒකාබද්ධ වන්නට උනන්දු කෙරිණි. 'බර්ගර්' සමාජය නිර්මාණය වූයේ ඔවුන් පරම්පරා ගණනක් තිස්සේ දේශීය සංස්කෘතියට, පරිසරයට අනුගත වීමේ හා මිශ්‍ර විවාහයන්ගේ ප්‍රතිඵලයක් ලෙසිනි. බ්‍රිතාන්‍ය පාලන සමය මුලදී පෘතුගීසි, ලන්දේසි, සහ ඉංග්‍රීසි සම්භවයක් සහිත වූවන්ට විශේෂ වරප්‍රසාද හිමි වූවත්, 1871 වන විට කොළඹ බර්ගර් ජනගහනයෙන් තුනෙන් එකක් පමණ නිත්‍ය ශ්‍රම හමුදාවේ කොටස් කරුවෝ වූහ (රොබර්ට්ස් හා අන් අය 1989).

බ්‍රිතාන්‍යයන්ගේ හා ලන්දේසීන්ගේ පොදු උරුමය හා සිය රට දේට දක්වන කැමැත්ත නිසා ද බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයට එරෙහිව

එල්ල වූ දේශානුරාගී ප්‍රතිවිරෝධය නිසා ද, සිංහල හා දෙමළ මධ්‍යම පන්තිකයන් අතරත්, යුරෝපීය හා යුරේෂියානු ජනයා අතරත් 'මිත්‍රත්වයක්' වර්ධනය වූ අතර, එමගින් සුවිශේෂී ලාංකේය සමාජයක් ගොඩනැගුණි (රොබර්ට්ස් හා අන් අය 1989). මෙ පරිවර්තනයේ කොටසක් ලෙස, ඔවුන්ගේ ප්‍රධානතම බලප්‍රදේශය වූ පිටකොටුව ද ඇතුළු සිය සියලුම භූමි භාග දේශීයකරණයට ලක් විය.

ලාංකිකයන් යටත්විජිත ක්‍රමයට අනුගත වීමට උත්සාහ කළ ද, ලංකාවට ආගමනය වූ විදේශිකයන් විසින් සිය සංස්කෘතිය හා අවකාශ වෙනස් කරගනු ලැබුවේ ලාංකේය පරිසරයට හා සංස්කෘතික සන්දර්භයට අනුගත වීම පහසු කර ගැනීමේ අරමුණිනි. ඔවුන් දේශීයකරණයට ලක්වූයේ දිගු කලක් මුළුල්ලේ වීම නිසා සහ එසේ දේශීයකරණය වීම ඔවුන්ගේ ම ආකෘති තුළ සිදු වූ නිසා ඒ ක්‍රියාවලිය මගින් භෞතික භූමි දර්ශනයේ අතිවිශාල වෙනස්කම් ඇතිකරනු ලැබුවේ නැත. ඔවුන්ගේ ප්‍රශ්නය වූයේ තම වාසස්ථාන තුළ සහ ඉන් පිටත ලාංකේය භාවිතයන්ට වඩාත් සමීප භාවිතයන් වර්ධනය කරගන්නේ කෙසේ ද යන්නය. මීට සමගාමීව ඔවුන් විසින් බ්‍රිතාන්‍ය ජාතිකයන් සමඟ පොදුවේ භාවිත කළ 'අවකාශ' සම්බන්ධයෙන් අරගල ද කෙරිණි. උදාහරණයක් ලෙස ක්‍රිකට් පිටියේ දී බ්‍රිතාන්‍යයන්ට එරෙහිව පළමුවෙන් ම ලංකාව නියෝජනය කළෝ බර්ගර්වරු වෙති. එනම් දේශීයකරණ ක්‍රියාවලියට බහු දිශානති ඇති අතර එය අධිරාජ්‍යවාදියා, යටත් වැසියා යන බෙදීම අස්ථාවර බවට පත්කරමින්, එකට ගැටෙන සංස්කෘති එකිනෙකා සමඟ මිශ්‍ර කරයි.

එහෙත් භෞතික භූමි දර්ශනය තුළ විදේශිකයන් රටවැසියන් වීම සම්බන්ධ සාධක විරලය. ලංකාවේ රටවැසියන් වූ ලාංකිකයන් සිය දෛනික භාවිත හරහා නිමවනු ලැබුවේ සම්මිශ්‍රිත අවකාශය. මේවා එකට ගැටුණු සංස්කෘති සියල්ලන්ගෙන්ම උකහාගත් ලක්ෂණවලින් සමන්විත වූව ද පරිසරය

මත පදනම්ව තිබිණි. එහෙයින් ජන සම්මිශ්‍රණය අතින් මෙන්ම ඔවුන් විසින් කොළඹ නගරයේ නිර්මාණය කරනු ලැබූ අවකාශ ද නගරාසන්න ප්‍රදේශවල හා දිවයිනේ අනෙකුත් නගරවල තිබූ අවකාශයන්ගෙන් දැඩි ලෙස වෙනස් විය. ආරම්භයේ දී විවිධ අධිරාජ්‍යවාදී කණ්ඩායම් විසින් කොළඹ නගරයේ ගොඩනැගූ භූමි දර්ශන විදේශීය බවක් දැරුව ද විදේශීය ජන සමූහ දේශීයකරණයට ලක්වීම නිසා කොළඹ ඉතා විශේෂ අනන්‍යතාවක් ඇති නගරයක් බවට පරිවර්තනය විය. 20වන සියවස මුලදී ඇති වූ සංක්‍රමණයන්ට පෙර සිටම කොළඹ නගරය විවිධත්වයෙන් පිරි තැනක් විය. එහි සිංහලයන් සිටියේ මුළු ජනගහනයෙන් සියයට 35-45ත් අතර ප්‍රමාණයක් පමණි (රොබර්ට්ස් හා අන් අය 1989).

සංක්‍රමණිකයන් විසින් නගරයේ භූමි දර්ශනය මත පුළුල් බලපෑමක් ඇතිකරන ලදී. කෙසේ වුව ද, මේ බලපෑම සමාජයේ ඇතැම් සුවිශේෂී පන්ති හා ජනවාර්ගික කොටස් මෙන්ම විශාල වශයෙන් එහි වැසියන් ද නගරයේ පරිධිය ආශ්‍රිත ප්‍රදේශවල සිය වාසස්ථාන තනාගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමස්තයක් ලෙස නගරය පුළුල් වීම හා සම්බන්ධය. සංක්‍රමණිකයෝ අවශ්‍යයෙන් ම දේශීයකරණය වූ නගරය පුළුල් කළහ. 1860 ගණන් වන තුරුම කොළඹ නගරයට අයත් වූයේ කොටුව, පිටකොටුව හා පිටකොටුවට පිටත ප්‍රදේශය (Outer Pettah) යන ප්‍රධාන කොටස් තුන පමණි.

1865 දී කොළඹ නගරසභාව පිහිටුවීම, 1869 දී කොටුපවුරු බිඳදැමීම හා 1870 ගණන්වලදී කුරුඳුවත්ත ඉදිකිරීම යන සිදුවීම්වලට සමගාමීව, කොළඹ නගරය සහ එහි නිල සීමා දැඩි වෙනසකට භාජනය විය (පෙරේරා 1998). 1880 ගණන්වලදී කොළඹ නගරය, කොටුව ප්‍රදේශය මෙන් 13 ගුණයක් පමණ විශාල වූ අතර ඊට මරදාන, මහ වීදිය, කොටහේන සහ කොම්පඤ්ඤ වීදිය වැනි අඩු ආදායම්ලාභී ප්‍රදේශ කිහිපයක් ද අයත් විය. 1881 දී කොළඹ නගරයේ ජනගහනය, කොටුව සහ පිටකොටුව තුළ ජීවත් වූවන්ගේ

එකතුව මෙන් විසි ගුණයක් විය (හුලුගල්ලේ 1965). ඒ අනුව, 1860 සහ 1870 ගණන් වල සිදුවූ නගරය ප්‍රසාරණය වීමේ ක්‍රියාවලිය මගින් අධිරාජ්‍යවාදී කොළඹ නගරය ඊට වඩා පුළුල් ස්වදේශික නගරය ඇතුළත 'දේශියකරණයට' ලක්කර ඇති බව පෙනී යයි.

1860 ගණන්වල විශාල ලෙස ඉහළ ගිය සංක්‍රමණ නිසා නගරයේ ජනගහනය 1824 සහ 1891 අතරතුර කාලයේදී සියයට 300කින් පමණ ඉහළ ගියේය. ඒද විශේෂයෙන් ම සියවස අග භාගයේ දී ඇති වූ සංක්‍රමණ නිසාය. කොළඹ නගරයේ ජනගහනය බොහෝ ලෙස ඉහළ ගියා පමණක් නොව, එහි ජනවාර්ගික, ආගමික හා පන්ති සංයුතිය ද විශාල ලෙස වෙනස් විය. 1860 ගණන්වලදී දුම්රිය සේවාව ආරම්භ කිරීමත් සමගම, සන්නිවේදන ජාලය හඳුන්වාදීම සහ පුළුල් කිරීම නිසා ග්‍රාමීය ප්‍රදේශවල සිටි ජනයාට නගරයට සංක්‍රමණය වීම පහසු කෙරිණි. අධිරාජ්‍යවාදීන් විසින් සන්නිවේදන යටිතල පහසුකම් වර්ධනය කරනු ලැබුවේ, කොළඹ කේන්ද්‍ර කොටගෙන සිය දේශපාලන, ආර්ථික හා පරිපාලන කටයුතු සංවිධානයට හා හැසිරවීමටය. මේ දිශානුගත කිරීම කණපිට හරවමින් සංක්‍රමණිකයෝ ප්‍රවාහන පහසුකම් ප්‍රයෝජනයට ගෙන කොළඹ නගරයට සංක්‍රමණය වූහ. 1921 වන විටත්, කොළඹ නගරයේ ජනගහනයෙන් සියයට 47ක් සිංහලයන් වූ අතර ඔවුන්ගෙන් බහුතරය පහතරට සිංහලයෝ වූහ. නගරයේ මුළු ජනගහනයෙන් සියයට 63 ක් සිංහල, ලාංකේය ද්‍රවිඩ හා රටවැසිභාවය ලබාගත් මුවර් හා බර්ගර් ජනගහනයෙන් සමන්විත විය (හුලුගල්ලේ 1965).

නගරයට ගලා ආ සංක්‍රමණිකයන් නිසා එහි ජනවාර්ගික හා පන්තිමය අවකාශීය ව්‍යුහ ද පරිවර්තනය විය. මෙහිදී වඩාත් ම වැදගත් සිදුවීම නම් සියවස් හතරකට පසු, පහතරට සිංහලයන් එහි ප්‍රධාන ජන කොටස වූ යුරෝපීන්ව අභිභවනය කිරීමයි. යුරෝපීයන් කොළඹ නගරය අත්පත් කර

ගත්තේ මුස්ලිම්වරුන්ගෙනි. ඔරලෝසු කණු හා ජෝර්ජියානු ගොඩනැගිලිවලින් සලකුණු වූ මධ්‍යයක් සහිත නගරයට බෞද්ධ හා ග්‍රාමීය ඌරුවෙන් යුතු ගොඩනැගිලි ද, අධිරාජ්‍යවාදීන් සැමවිටම නගරයෙන් පිටතින් තැබීමට උත්සාහ ගත් දුප්පතුන්ගේ පැල්පත් ද නගරය ඇතුළතට ගලා ආවේය. 1880 පමණ වන විට එවකට කොළඹ නගර සීමාවෙන් ඔබ්බෙහි වූ වැල්ලවත්ත ප්‍රදේශයේ දෙමළ වාසස්ථාන සංකේන්ද්‍රණය වී තිබිණි (රොබර්ට්ස් 1984). මේ අනුව බලන විට පෙනීයන්නේ, 19 වන සියවස මුලදී තිබුණු කොළඹ නගරය හා සසඳන විට 1880 දශකයේ කොළඹ නගරය බොහෝ සෙයින් ලාංකේය ස්වරූපයක් ගත් බවයි.

අඩු ආදායම් ලාභීන්ගේ නිවාස ඒවාහි ස්වරූප අතින් බලන කල ලාංකේය හෝ යුරෝපීය නොවුණු අතර, ඒවා මගින් දිස්වූයේ ධනවාදී නගරයක වේගයෙන් වර්ධනය වන කම්කරු පන්තියයි. මේ බොහෝ අඩු ආදායම් නිවාස තැනුණේ 'කාර්මීකරණයේ,' විශේෂයෙන්ම වරාය පුළුල් කිරීමේ, දුම්රිය වැඩපොළවල් හා ගබඩා බිහිවීමේ හා මුද්‍රණාල පිහිටුවීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මරදාන, කොටහේන හා කොම්පඤ්ඤ වීදිය ආදී ප්‍රදේශවල පැතිරගොස් තිබූ මේ අඩු ආදායම්ලාභීන්ගේ වාසස්ථාන කම්කරුවන් බොහෝ දෙනෙකුට සෙවණ සැපයීය. 1883දී වරාය පුළුල් කිරීම හා ඒ ආශ්‍රිතව බිහිවූ කර්මාන්ත හේතුවෙන් කොච්චිකඩේ හා ජින්තුපිටිය වැනි විශාල ප්‍රදේශ වරාය කටයුතු සඳහා සේවා සපයන ප්‍රදේශ බවට පරිවර්තනය වූ අතර, ඒවාහි කම්කරු ජනයා සමූහ වශයෙන් ජීවත් වන සමූහ-වාසස්ථාන හා කුඩා පරිමාණයේ වෙළඳ කටයුතු ද බිහිවිය (රොබර්ට්ස් 1984).

නගර සභා බලධාරීන් හඳුනාගෙන තිබූ ආකාරයට 'මුඩුක්කු' හා පැල්පත්' (slums & shanties) නමින්, අඩු ආදායම් ලාභීන්ගේ වාසස්ථාන වර්ග දෙකක් කොළඹ නගරයේ පිහිටා තිබිණි. ඉන් පළමුවැන්න කොටුවට

උතුරින් හා පිටකොටුව ආශ්‍රිතව පිහිටා තිබුණු මධ්‍යම පාන්තිකයන් හා ඉහළ පාන්තිකයන් විසින් හැරදමා ගොස් තිබුණු විශාල නිවාස විය. අඩු ආදායම් ලාභීන් මේවායෙහි සමූහ වශයෙන් ජීවත් වූ අතර විශාල පවුල් එක් කාමරයක් හෝ කාමර දෙකක් තුළ අධික තදබදයෙන් යුතුව ජීවත් වූහ. රොබර්ට්ස් සහ අන් අය විසින් 1860 ගණන් සහ 1910 අතර කාලපරාසය තුළ පිටකොටුවේ සහ උතුරු කොළඹ ඇති වූ 'බැසීම' (decline) ලෙස හඳුන්වන්නේ මෙයයි (රොබර්ට්ස් සහ අන් අය 1989). කොම්පඤ්ඤ වීදියේ පිහිටා තිබුණු එක් එවන් මුඩුක්කුවක කාමර 32ක් තිබිණි. 1890 ගණන්වලදී කොළඹ ජීවත් වූ ලිස්බෝආ පින්තු නම් වෛද්‍යවරයෙක් ඒ පිළිබඳව මෙසේ ලියා ඇත:

> "පිරිසිදුකම හා සෞඛ්‍ය මෙහි වැසියන් හඳුනන්නේ නැති අතර, ඒවා ඇතිකිරීම ද කළ හැකි යැයි නොපෙනේ. ඇතැම් විට ස්තාලයක් තරම්වත් විශාල නැති, අඩි 15 ක් පමණ දිග හා අඩි 8ක් පමණ පළල මේ කුඩා කාමර තුළ අපගේ මුද්‍රණ ශිල්පීහු දුසිම් ගණනින් ජීවත් වෙති. මා නිතර දුක ඇති පරිදි පවුලේ මුදල් උපයන්නා වන පිරිමියා සිය බිරිඳ හා දරුවන් ද සමගින් එක් දොරක් ඇතත් කිසිම ජනේලයක් නැති මේ කාමරයක් තුළ ජීවත් වෙයි. ඔවුන්ගේ ළිපෙන් පිටවන දුමාරයෙන් මුළු කාමරයම පිරෙයි (පින්තු 1893, උපුටාගැනීම ජයවර්ධනගෙනි 1972: 11).

මේ වාසස්ථාන මගින් නගරයේ භෞතික භූමි දර්ශනය පරිවර්තනය කිරීමක් සිදු නොකළ නමුත් එහි අර්ථය සහ කාර්යය වෙනස් කෙරිණි. මේ භූමි දර්ශනය, එක් අතකින් නගරයේ පැවති පුරුෂාධිපත්‍ය සංකේතවත්

කරයි. 20 වන සියවස වන තෙක්ම නගරයට සංක්‍රමණය වූවන් සහ ආගමනය වූවන්ගෙන් බහුතරය පිරිමිහු වූහ. 1921 වන විට ද නගරයේ ජනගහනයෙන් සියයට 61 ක් පිරිමිහු වූහ (රොබර්ට්ස් 1984).

අවිවාහක පිරිමින් බොහෝ විට ජීවත් වූයේ, ඉන්දියානු සංක්‍රමණිකයන් විසින් 'කිද්දන්ගි' ලෙස හැඳින් වූ නවාතැන් පොළවල්වලය. මේවා ආශ්‍රිතව දුප්පතුන්ගේ අසංවිධිත ආර්ථිකයේ කොටසක් ලෙස හඳුනා ගැනෙන, කුඩා වෙළෙඳ සැල් තිබූ අතර වෙනත් අවශේෂ සේවාවන් සැපයීම ද සිදු විය. සංක්‍රමණිකයන් ක්‍රමිකව ස්ථාවර වාසස්ථානවල පදිංචියට යනු ලැබීමත් සමගම ඔවුන්ගේ පවුල් ද නගරයට සංක්‍රමණය වීම නිසා, 1960 පමණ වන විට නගරය තුළ ස්ත්‍රී පුරුෂ තුලනයක් ඇතිවිය (පෙරේරා 2002).

අනෙක් ආකාරයේ වාසස්ථාන වූයේ, නගරයේ භූ දර්ශනයට නව මානයක් එක් කළ කම්කරුවන් විසින්ම තනාගත් පැල්පත්ය. දැරිය හැකි මිලෙන් යුතු වාසස්ථාන හිඟයට, අඩු ආදායම් ලාභීන් විසින් පොදුවේ යොදාගත් විසඳුමක් වූයේ, නාගරික පරිසරයේ නිතර හමුවන තාවකාලික අමුද්‍රව්‍ය භාවිත කොට තනාගත් එකිනෙකින් වෙන් වූ තනි තට්ටුවේ වාසස්ථාන ඉදිකර ගැනීමයි. තම වටපිටාවෙන් සොයාගත හැකි අමුද්‍රව්‍ය උපයෝගී කොටගෙන තම නිවස තමන් විසින්ම ඉදිකිරීම, ග්‍රාමීය නිවාස ඉදිකිරීමේ ක්‍රම නගරයට සංක්‍රමණය වීමකි. තුන්වන ලෝකයේ නගර සම්බන්ධයෙන් අදහස් දක්වන ටෙරන්ස් මැක්ගී (1971) ප්‍රකාශ කරන්නේ, 'විස්තෘත පවුලක පැවැත්ම' හා අධි සාඵල්‍යතාව නැතහොත් අධික දරුඵල ලැබීම (high fertility) වැනි ලක්ෂණ ඔවුන්ගේ 'ග්‍රාමීයත්වය' (ruralness) පිළිබිඹු කරන බවයි.

"බ්‍රිතාන්‍ය බලධාරීන් විසින් කොටුව තුළ පැල්පත් (huts) ඉදි කිරීම තහනම් කරන ලදී" (පර්සිවල් 1990) යන කියමන මගින් කියැවෙන්නේ කොටුවෙන් බැහැරව කොළඹ නගරය තුළ ඒවා පැවති බවයි. තමන් විසින්ම වාසස්ථාන තනාගැනීම මගින් ඔවුන් නගරය තුළ තමන්ට හිතකර

හුරු පුරුදු පරිසරයක් ගොඩනැගූ අතරම, එසේ කරමින් ඔවුහු නාගරික භූමි දර්ශනයේ කොටස් ග්‍රාමීයකරණය (ruralize) කළහ. මෙසේ නාගරික ජීවිතය හා අමුද්‍රව්‍ය භාවිතය ග්‍රාමීය ජීවන ක්‍රම හා නිවාස ඉදි කිරීමේ ක්‍රම සමග මිශ්‍ර වීමෙන් සැදෙන සම්මිශ්‍රිත ස්වභාවය, සම්පූර්ණයෙන්ම නාගරික හෝ ග්‍රාමීය නොවන, එහෙත් ඒ අතරමැද අවස්ථාවක් වන මේ පැල්පත්වලින් ප්‍රකාශයට පත්වෙයි.

මේ අයුරින් බැලීමේදී පෙනී යන්නේ, අඩු ආදායම් ලාභීන්ගේ වාසස්ථාන මගින් නගරයේ සමස්ත භූමි දර්ශනය සහ එහි අර්ථය පරිවර්තනය කරනු ලැබූ බවයි. සාමාන්‍ය ලාංකිකයන්ගේ නිවාස තැනුණේ උසස් වාස්තු විද්‍යාත්මක මෝස්තර අනුගමනය කරමින් නොවුණු අතර, ඒවා ප්‍රමාණයෙන් එතරම් විශාල නොවීය. එහෙත් 1880 ගණන් වන විට ලාංකිකයන් නගරයෙන් අතිවිශාල කොටසක් තමන්ට නතු කරගෙන තිබිණි. ඔවුහු නගරය තුළ පැවති භූමි දර්ශනය අභිභවනය කරන්නට උත්සාහ දැරුවේ නැති නමුත්, විශාල ස්වදේශික කොටසක්, විදේශීය නගරයට සම්බන්ධ කළහ. මේ වන විට කොළඹ නගරය කොටුවට හා පිටුකොටුවට පමණක් සීමා වී නොතිබුණු අතර, ඒ ප්‍රදේශ අධිරාජ්‍යවාදීන්ට නගර මධ්‍යය වූවා මෙන්ම, ස්වදේශිකයන්ට උභයාර්ථ ජනනීය ප්‍රදේශයක් බවට පත්ව තිබිණි. එය ඔවුන්ගේ නගරයේම කොටසක් වුවත්, ඔවුන් පූර්ණ ලෙස ඊට නතු නොවීය. ස්වදේශිකයන්ට නුහුරු වූ ඒ ප්‍රදේශයේ බොහෝ ස්ථානයන්හි ඔවුන්ව පිළිගැනුණේද නැත. බ්‍රිතාන්‍යයන්ව නගරයේ අනෙක් කොටස්වලින් වෙන් කළ පවුරු සහ දිය අගල් යම් යුගවල පැවතිය ද, ඒ සීමා වඩා ලිහිල්ව ගොස් තිබිණි. නගරය තුළ තවදුරටත් බලය තිබුණේ බ්‍රිතාන්‍යයන් අත වුවද, එය අභියෝගයට ලක් කෙරිණි. 1880 ගණන් වන විට කොළඹ නගරයෙන් විශාල ප්‍රදේශයක් ලාංකිකයන්ට හුරු පුරුදු වටපිටාවන් බවට පරිවර්තනය වී තිබිණි. ඉන්පසු කාලවලදී, ලාංකිකයන් අධිරාජ්‍යවාදී ක්‍රමයෙන්

බැහැර නොවී, සියතට ගත් පරිපාලන කටයුතු, දේශපාලන කටයුතු හා වෙළෙඳ ව්‍යාපාර ද හරහා ඔවුන් දායක වූ බෞද්ධ ප්‍රබෝධය හා කම්කරු ව්‍යාපාරය වැනි සමාජ ව්‍යාපාර හරහා ද, සිය නගරය දේශීයකරණය කළ බව පෙනී යයි.

## නිගමනය හා සාරාංශය

දේශීයකරණය යුරෝපීය අධිරාජ්‍යවාදයේම අනිවාර්ය අංගයක්ය යන්න මෙම අධ්‍යයනයේ ප්‍රධානතම නිගමනයකි. අති සාර්ථක ලෙස යුරෝපීය සංස්කෘතික ආධිපත්‍ය පිහිටුවා ගැනීම, ස්වදේශිකයන්ට අධිරාජ්‍යවාදී සමාජයේ සංස්කෘතිකාංග අනුකරණය සඳහා මූලික පෙළඹවීමක් සපයන ලදි. යුරෝපීය ජාතීන් යටත්විජිතවල තම සංස්කෘතික ආධිපත්‍ය තහවුරු කරගත්තේ, ස්වදේශිකයන්ට දේශීය වූ අතීත හෝ අනාගත සංස්කෘතියක් සාක්ෂාත් කර ගැනීමට ඇති ඉඩ, සිය ආයුධ හා ආර්ථික බලය යොදමින් අහුරන අතරතුරදීය. මීට සමගාමීව අධිරාජ්‍යවාදීන් විසින් පරිපාලනය හා ආර්ථික ක්ෂේත්‍රවල ඔවුන් ලබා තිබූ දියුණුවට විශාල ප්‍රසිද්ධියක් ලබාදුන් අතර, ලාංකිකයන්ටද යටත්විජිත ක්‍රමය තුළ එම ක්ෂේත්‍රයන්ට සහභාගිවීමට අවකාශය සලසන ලදි. කෙසේ වෙතත්, දේශීයකරණය දෙදිසාවටම ගමන් කරන ක්‍රියාවලියකි. එමගින් යටත් වැසියන් බටහිරකරණයට (westernization) ලක් කරනු ලැබූ අතර, ඊට සමගාමීව යටත්විජිත සමාජ - අවකාශීය ව්‍යුහ දේශීයකරණයට ද ලක් කෙරිණි.

සැකෙවින් දක්වතොත්, කොළඹ නගරය, සමාජ බලය සඳහා තරග කෙරෙන හා ඊට විරුද්ධ වීමේ අවකාශයක් බවට පරිවර්තනය විය. දේශීයකරණ ක්‍රියාවලිය පැවතීමට හා ඉදිරියට ගෙනයාමට හැකි වූයේ මේ සන්දර්භය තුළ පමණි. අධිරාජ්‍යවාදයට ස්වදේශිකයන් දක් වූ ප්‍රතිචාරය,

අධිරාජ්‍යවාදී සමාජීය හා අවකාශීය ව්‍යුහයන්ට සෘජු විරෝධය පෑමේ සිට ඒවා තමන්ට ගැළපෙන පරිදි වෙනස්කර ගැනීමේ ක්‍රියාවලිය දක්වා ඇති වූ පරිවර්තනය සිදුවූයේ පුළුල් යටත්විජිත ව්‍යුහ හා ලාංකේය සංස්කෘතික භාවිතයන් අතර ඇති වූ හෙට්ටු කිරීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. දේශීයකරණය සම්බන්ධයෙන් පරිකල්පනය ඉතා වැදගත් වෙයි. ස්වදේශිකයන්ට සිය සිරිත් හැඩ ගස්වා ගත හැකි වූයේ යටත්විජිත සමාජ ක්‍රමය තුළ හා ඔවුන්ගේම පරිකල්පනීය අවකාශ තුළ පමණි. ස්වදේශිකයන් විසින් අධිරාජ්‍යවාදී සමාජීය හා අවකාශීය ව්‍යුහයන්ට හුරුවීම හෝ ඒවාට නව අර්ථ සැපයීම හේතුවෙන්, යටත්විජිත ක්‍රමය සම්පූර්ණයෙන්ම පෙරළී ගියේ නැති වුවද, එමගින් ස්වදේශිකයන්ට එම ව්‍යුහයන් තමන්ට ගැළපෙන සේ සකස් කර ගැනීම සහ වෙනස් කර යළි පිහිටුවීම (reinscription) පහසු විය. ඒ අනුව දේශීයකරණ ක්‍රියාවලිය හේතුවෙන් බිහිවන සමාජය සහ භූමි දර්ශනය, බලවත් යටත්විජිත ව්‍යුහ සහ ඒවාට අනුගත වෙමින් පැවති ලාංකේය භාවිතයන් අතර සිදු වූ අන්තර් ක්‍රියාවේ ප්‍රතිඵලයකි.

1860 සහ 1880 ගණන්වලදී, දේශීය සුපිරි පන්තියක නැගීම, බෞද්ධ ප්‍රබෝධය ඇතිවීම, දේශීය හා විදේශීය සංක්‍රමණිකයන් කොළඹ නගරයෙහි වාසස්ථාන තනාගැනීම ආදී සාධකයන්ගේ බලපෑමෙන්, දේශීයකරණය කොළඹ නගරයෙහි සිදු වූ ප්‍රධානතම ක්‍රියාවලිය බවට පත් විය. දේශීයකරණයට ලක්වීම නිසා, කොළඹ නගරයෙහි ඇති වූ භූමි දර්ශනය අධිරාජ්‍යවාදී ක්‍රමයට සම්පූර්ණයෙන්ම විරුද්ධ එකක් වනවා වෙනුවට, ව්‍යාජෝක්තිය, උපාන්තික බව, අනුකරණය, උභයාර්ථ ජනනය හා සම්මිශ්‍රිත බව සිය අංග ලක්ෂණ කරගත් ස්තර කිහිපයකින් යුත් භූමි දර්ශනයක් බවට පත්විය. ලාංකිකයන් විසින් අධිරාජ්‍යවාදී සමාජීය සහ අවකාශීය ආකෘති අනුගමනය කරන්නට යාම නිසා ඇති වූයේ, ව්‍යාජෝක්ති සංකේතවත් කරන විරුද්ධවාදී දේශපාලනයයි. එය සිය විරුද්ධවාදීන් විසින් සිතියම්ගත

කොට තිබූ භූමි ප්‍රදේශයක් හඹා යාමකි. මෙය වඩාත් හොඳින් පෙනුණේ අධිරාජ්‍යවාදයත් සමග තරග කළ කොළඹ නගරයේ බෞද්ධ ආයතනවල ස්ථානගත වීම තුළිනි (නමුත් මහනුවර හෝ ගාල්ලෙහි එසේ නැත). දේශීය සුපිරි පන්තිය අධිරාජ්‍යවාදීන් පසුපසින් විත් කොළඹට ඇතුළු වූවා පමණක් නොව, ඔවුන්ගේ වාසස්ථාන සහ නිවාස ක්‍රමය ද අනුකරණය කළහ. මෙම අනුකරණය සිදු වූයේ පුනරුක්තියක ආකාරයෙන් මිස නිරූපණයක ආකාරයෙන් (repeat than represent) නොවුණු නිසා එය උභයාර්ථ ජනනය කරන පරිහාසීය (mockery) ස්වභාවයක් බවට පත්විය. දේශීය සුපිරි පන්තිය තම බලය සාමාන්‍ය ලාංකිකයන්ට පෙන්වීමට හැකිවන ආකාරයේ හා අධිරාජ්‍යවාදී බලධාරීන්ට තම වටිනාකම පෙන්විය හැකි ආකාරයේ අවකාශ ගොඩනැගිය.

සංක්‍රමණිකයන් විසින් ගොඩනැගූ විශාල භූමි දර්ශන විචලිත (varied) වුවත් උපාන්තික (liminal) බවක් ද ඉසිලීය. නගරය තුළ කම්කරු පන්තිය වැඩිවීම මෙන්ම නගරය ග්‍රාමීයකරණය වීම සංකේතවත් කරමින්, 'කාර්මික' ප්‍රදේශයන්ට ආසන්නව නව සංක්‍රමණිකයන් විසින් බොහෝ විට තමන්ගේම ශ්‍රමයෙන් තනාගත් නිවාස තුළ අධික ජනඝනත්වයක් පැවතිණි. කොළඹ නගරයේ භූමි දර්ශනය තුළ දේශීය සුපිරි පන්තිය හා කම්කරු පන්තිය නියෝජනය වූ අතර, බෞද්ධ ප්‍රබෝධය මගින් ඇති කළ භූමි දර්ශනය රහස්‍ය ස්වභාවයක් ගත්තේය. එමගින් සිදු කළ ක්‍රියාකාරකම් භූමි දර්ශනයේ භෞතික ස්වරූපය හරහා ප්‍රකාශයට පත් වූයේ නැත. නගරයේ සමස්ත භූමි දර්ශනය සමග මිශ්‍ර වෙමින් මේ ක්‍රියාකාරකම් මගින් බල අධිකාරිය ප්‍රශ්න කිරීමකට ලක් කරනු ලැබීය. 1860 සහ 1880 ගණන්වලදී සිදු වූ දේශීයකරණ ක්‍රියාවලිය මගින්, අධිරාජ්‍යවාදී ක්‍රමය ඉවත් කරනු ලැබුවේ නැති වුවද, ඊට සපයනු ලැබූ වඩාත්ම ශක්තිමත් දේශීය ප්‍රතිචාරය එය විය.

එමගින් නගරයේ බලය අල්ලාගනු ලැබුවේ නැති වුවද, එය සෘජු හා වක්‍රව සෑම දිශාවකින්ම දේශීයකරණය කරන ලදි. ජෝර්ජියානු ගොඩනැගිලිවලින් හා උත්තුංග හෝරා ස්ථම්භවලින් හෙබි කොළඹ කොටුව හා පිටකොටුවත්, අධිරාජ්‍යවාදී වාසික ප්‍රදේශය වූ කුරුඳුවත්ත හා ඒ දශකයේම එහි ඉදිකෙරුණු විවිධ සංස්කෘතික මධ්‍යස්ථාන ද, කොළඹ නගර ශාලාව ද, ස්වදේශිකයන්ට නුහුරු වූ මුත් ඒවා ඔවුන්ට ඉතා දර්ශනීය විය. බ්‍රිතාන්‍යයන්ගේ සමාජය තුළ, දේශීය සුපිරි පන්තියවත් පිළිගැනුණේ නැත. එබැවින් භූමි දර්ශනය හරහා නගරයේ පැවති සමාජ සංස්කෘතික ධූරාවලි ක්‍රමය ප්‍රදර්ශනය විය. ඒ, අධිරාජ්‍යවාදීන්, දේශීය සුපිරි පන්තිය, සාමාන්‍ය ලාංකිකයන් හා කම්කරු පන්තිය වශයෙනි. එහෙත් බෞද්ධ හා ස්වදේශීය බලය වැඩි වූ නගරාන්තයේ සිට, එහි බලය සඳහා තරග කිරීම ඇරඹුණි. නගර මධ්‍යය හා නගර සීමාව අතර මැද බෞද්ධ බලය සැඟවී ගත්, දේශීය සුපිරි පන්තියේ වාසස්ථාන පිහිටා තිබුණි. ඒවා අධිරාජ්‍යවාදීන්ගේ වාස්තු විද්‍යාව හා නිවාස ක්‍රමය අනුකරණය කරමින් තනා තිබිණි. එනම් එවක කොළඹ නගරය බලය සඳහා තරග කෙරුණු සම්මිශ්‍රිත අවකාශයක්ව තිබුණි.

## පසු සටහන්

1. මේ ලිපිය ප්‍රථමයෙන්ම පළ වූයේ *Urban Studies* (39 වන වෙළුම, අංක 9, 2002) නම් වූ නාගරික අධ්‍යයනය සඳහා වූ ශාස්ත්‍රීය ලිපි සංග්‍රහයේය. මෙය සිංහලයෙන් පළ කිරීම සඳහා අවසරදීම පිළිබඳව පයීන සංස්කාරක මණ්ඩලයේ ස්තූතිය නිහාල් පෙරේරා වෙත පුදකර සිටී.

2. මෙම සන්දර්භය හා මෙම අධ්‍යයනයේදී ගෙනහැර පානු ලබන අනෙකුත් තර්ක ගැන වැඩිදුර විස්තර සඳහා කියවන්න, පෙරේරා (1999).

[3]. ගෙරිට් ක්නප්ට (1981) අනුව, ලන්දේසි වී. ඕ. සී. සමාගම ද, කොළඹ නගරය තුළ සුදු ජන අවකාශයක් ස්ථාපනය කිරීමට, විශේෂයෙන්ම බලකොටුව තුළ, රූකුල් දෙනු ලැබීය. කොළඹ නගරයේ සමාජ ලිංගික සම්බන්ධතා සම්බන්ධ වැඩිදුර තොරතුරු සඳහා කියවන්න, පෙරේරා (2002).

[4]. හොල්ස්ටන් (1989), යෙම් (1996), පෙරේරා (1998) සහ කුන්සෝ (2000), එකිනෙකට වෙනස් සන්දර්භ තුළ පෙන්වා දී ඇති ආකාරයට, යටත් වැසියන්ට පරිවර්තනය කිරීම සඳහා නිමවූ නූතන හා අධිරාජ්‍යවාදී සංකේත යටත් වැසියන් විසින් තමන්ට ගැළපෙන ලෙස වෙනස් කරනු ලබයි.

[5]. මෙම තර්කය පදනම් වන්නේ සමාජය හා අවකාශය සම්බන්ධව මීට කලින් පළ කළ මාගේ අධ්‍යයනයක දක් වූ අදහස් (බලන්න, පෙරේරා 1998) හා සමාජ ව්‍යුහ සහ එහි වැසියන් පරිවර්තනය වීම සම්බන්ධයෙන් ගයත්‍රි ස්පිවාක් (2001) දක්වන අදහස් මතය.

[6]. 'දේශීයකරණය සම්බන්ධයෙන් මා දුටු වැදගත් අධ්‍යයන දෙක වන්නේ යමමොටෝ (2000) සහ අප්පදුරෙයි (1998) ගේ අධ්‍යයන වේ.

[7]. මෙයින් අදහස් කරනුයේ නාගරික සංස්කෘතික සංස්ථා (metropoli tan cultural institutions) ස්වදේශීය සංස්කෘතිය සමග ගැටීම තුළින් ඇතිවන පරිවර්තනය තුළින් බිහිවන යටත් විජිත යුරෝපීය සංස්කෘතියයි (කිං 1976: 58).

[8]. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් වර්තමාන අධ්‍යයනයේ විශ්ලේෂණ පරයට පරිබාහිරය.

## ආශ්‍රිත පඨිත


AL- Sayyad, N. (Ed.,)

1992. *Forms of Dominance: On the Architecture and Urbanism of the Colonial Enterprise*. Aldershot: Avebury

Amarasuriya, M.P.

1981. 'Colonel Olcott and the Buddhist Revival in Sri Lanka.' In, B.P. Kirthisinghe and M.P. Amarasuriya, *Colonel Olcott and his Services to Buddhism*. Kandy: Buddhist Publication Society

Appadurai, A.

1998. *Modernity at Large: Cultural Dimensions of Globalization*. Minneapolis: University of Minnesota Press.

Azeez, M.

1986. 'The Muslims of Sri Lanka.' In M.M.M. Maharoof, M. Azeez, M.M. Uwise et al. (Eds.,) An *Ethnographical Survey of Muslims of Sri Lanka: From the Earliest Times to Independence*. Colombo: Sir Razik Fareed Foundation.

Bandarage, A.

1983. *Colonialism in Sri Lanka: The Political Economy of the Kandyan Highlands 1833-1886*. Berlin : Walter de Gruyter.

Bastin , R.

1997. 'The Authentic Inner Life: Complicity and Resistance of the Tamil Hindu Revival,' In, M. Roberts (Ed.,) Sri Lanka: Collective Identities Revisited. Colombo: Marga Institute.

Bhaba, H.K.

1994. *The Location of Culture*. London: Rutledge.

Boxer, C.R.

1990. *The Dutch Seaborne Empire 1600-1800*. London: Penguin Books

Brohier, R.L.

2000. *Changing Face of Colombo (1505-1972): Covering the Portuguese, Dutch and the British Periods*. Colombo: Lake House Investments Ltd.

Castelles, M.

1989. *The Informational City: Information, Technology, Economic Restructuring and the Urban Regional Process*. Oxford: Basil Blackwell.

Cave, H.W.

1908. *The Book of Ceylon Being a Guide to its Railway System and an Account of its Various Attractions for the Visitor and Tourist*. London: Cassell.

Christopher, A.J.

1988. *The British Empire at its Zenith*. London: Croom Helm

Crinson, M.

1996. *Empire Building: Orientals and Victorian Architecture*. London: Rutledge

Duncan, J.S.

1986. 'The Power of Place in Kandy: 1780-1980.' In, J. A. Agnew and J.S. Duncan (Eds.,) *The Power of Places: Bringing together Geographical and Sociological Imaginations*. Winchester: Unwin Haymen.

1990. *The City as Text: The Politics of Landscape Interpretation in the Kandyan Kingdom*. Cambridge: Cambridge University

Eagleton, T.

1990. 'Nationalism, Irony and Commitment' In, T. Eagleton, F. Jameson and E. Said (Eds.,) *Nationalism, Colonialism and Literature*. Minneapolis: University of Minneapolis Press.

Fanon, J.

1903. *Ceylon in 1903: Describing the Process of the Island since 1803, its Present Agricultural and Commercial Enterprises, and its Unequalled Attractions to Visitors, With Useful Statistical Information; A Map of the Island, and Upwards of one Hundred Illustrations*. Colombo: A.M. and Ferguson..

Giddens, A.

1987. *The Nation State and Violence, Volume Two: A Contemporary Critique of Historical Materialism*. Cambridge: Polity Press.

Gombrich, R. and Obeyesekere, G.

1988. *Buddhism Transformed: Religious Change in Sri Lanka*. Princeton: Princeton University Press.

Harvey, D.

1990a. *The Conditions of Postmodernity: An Enquiry into the Origins of Cultural Change*. Oxford: Basil Blackwell

1990b. 'Between Space and Time: Reflections on the Geographical Imagination.' In, *Annals of the Association of American Geography*, 80, pp.418-434.

Holston J.

1989. *The Modernist City: An Anthropological Critique of a Basilica*. Chicago: University of Chicago Press.

Home, R.

1997. *Of Planting and Planning: The Making of British Colonial Cities*. London: Belhaven Press.

Hullugalle, H.A.J

1965. *Centenary Volume of the Colombo Municipal Council 1865-1965.* Colombo: Municipal Council.

Jayawardana, K.

1972. *The Rise of the Labor Movement in Ceylon.* Dunham: Duke University Press.

2000. *Nobodies to Somebodies: The Rise of the Colonial Bourgeoisie in Sri Lanka.* Colombo: Social Scientist Association and Sanjeeva Books.

King. A.D.

1976. *Colonial Urban Development: Culture, Social Power and Environment* London: Routledge.

1990. Urbanism, *Colonialism and the World –economy: Cultural and Spatial Foundations of the World Urban System.* London: Routledge.

1992. 'Rethinking Colonialism: An Epilogue.' In, N. Al-Sayyad (Ed,) *Forms of Dominance: On the Architecture and Urbanism of Colonial Enterprise.* Aldershort: Avebury.

Knapp. G.

1981. Europeans, Mestizos and Slaves: The Population of Colombo at the End of the Seventeenth Century. In, *Itinerario*,5. pp. 84-101.

Kong, L

1993. 'Negotiating Concepts of Sacred Spaces: A Case Study of Religious Building in Singapore.' In, *Transactions, Institute of British Geographers* NS. 18, pp. 342-258.

Kusang, A

2000. *Behind the Postcolonial: Architecture, Urban Space and Political Culture in Indonesia.* London: Routledge.

Malalgoda, K.

1976. *Buddhism in Singhalese Society 1750 –1900: A Study of Religious Revival and Change.* Berkeley: University of California Press.

McGee, T.G.

1971. *The Urbanization Process in The Third World: Explorations In Search of a Theory.* London: Bell

Metcalf, T.R.

1989. *An Imperial Vision: Indian Architecture and Britain's Raj.* Berkeley: University of California Press.

Mitchell, T.

1991. *Colonizing Egypt.* Berkeley: University of California Press.

Natbantoglu, G.B. and Wong, C.T. (eds.)
1997. *Postcolonial Space(s).* New York: Princeton Architectural Press.

Obeyesekere, G.
1970. 'Religious Symbolism and Political Change in Ceylon.' In, *Modern Ceylon Studies*, 1. pp. 43-63.

Peebles, P
1995. *Social Change in Nineteenth Centaury Ceylon.* New Delhi: Navrang.

Percival, R.
1990. *An account of the Island of Ceylon Containing its History, Geography, Natural History, with the Manners and Customs of its Various Inhabitants to which is Added the Journal of an Embassy to the court of Candy.* New Delhi: Asian Education Service.

Perera, N.
1998. *Society and Space: Colonialism Nationalism, and Postcolonial Identity in Sri Lanka.* Boulder: Westview Press.
1999. Decolonizing Ceylon: Colonialism, Nationalism and Politics of Space in Sri Lanka. New Delhi: Oxford University Press.
2002. 'Feminizing the City: Gender and Space in Colonial Colombo.' In, E.N. De and S Sarkar (Eds.,) *Trans-status Subjects: Gender in the Globalization of South and Southeast Asia.* Durham: Duke University Press.

Pinto, L.
1893. 'Ceylon Workmen's Unions.' In, *Ceylon Review.*

Rabinow, P.
1989. *French Modern: Norms and Forms of the Social Environment.* Cambridge: MIT Press.

Redfield, R. and Singer , M.
1954. 'The Cultural Role of Cities.' *Economic Development and Cultural Change*, 3, pp. 53-73.

Roberts, M.
1974. 'Problems of Social Stratification and the Demarcation of Natural and Local Elites in British Ceylon' In, *Journal of Asian Studies*, 33, pp. 549-577.
1982. *Caste Conflict and Elite Formation: The Rise of Karave Elite in Sri Lanka, 1500-1931.* Cambridge: Cambridge University Press.
1984. 'Colombo in the Round: Outlines of its Growth in Modern Times.' Paper presented at the *Second International Conference on Indian Ocean Studies.* Perth, December.
1997. 'Elite Formation and Elites, 1832-1931.' In, M. Roberts (Ed.,.) *Sri Lanka: Collective Identities Revisited.* Colombo: Marga Institute.

Roberts, M, I. Rahim, and P. Colin– home.
1989. *People in Between: The Burgers and the Middle Class in the Transition within Sri Lanka 1790s –1960s, Vol.1.* Colombo: Sarvodya.
Ross, R. amd Telekamp, G.J. (Eds.,)
1985. *Colonial Cities: Essays in Urbanism in a Colonial Context.* Dordecht: Martinus Nijhoff Publishers.
Said, E.
1978. *Orientalism.* New York. Pantheon.
Samaraweera , V.
1997. 'The Muslim Revivalist Movement, 1880-1915.' In, M. Roberts (Ed.,) *Sri Lanka: Collective Identities Revisited.* Colombo: Marga Institute.
Sauerssig-Schjreuder, Y.
1986. 'The Impact of British Colonial Rule on the Urban Hierarchy of Burma.' In, *Review: A Journal of the Fernand Brandel Center*, 10, pp. 245-277.
Scott, J.C.
1985. *Weapons of the Weak: Everyday Forms of Peasant Resistance.* New Haven: Yale University Press.
Silva, K.M. de
1981. *A History of Sri Lanka.* London: C. Hurst and Co.
1989. *A History of Sri Lanka.* London: C. Hurst and Co.
1997. 'Resistance Movements in Nineteenth Century Sri Lanka.' In, M. Roberts Ed., Sri Lanka. *Collective Identities Revisited.* Colombo: Marga Institute.
Singer, M.
1964. *The Emerging Elite: A Study of Political Leadership in Ceylon.* Cambridge: The MIT Press.
Smith, M. P. and Tardanico, R.
1988. 'Urban Theory Reconsidered: Production, Reproduction and Collective Action.' In, M. P. Smith and J.R. Feagin (Eds.,) *The Capitalist City.* Cambridge: Basil Blackwell.
Spivak, G. C.
1999. *A Critique of Postcolonial Reason: Toward a History of the Vanishing Present.* Cambridge: Harvard University Press.
2001. 'Foucault and Najibullah.' Keynote address to *Globalicities: A Conference on Issues Related to Globalization.* Modern Literature Conference, Michigan State University, October.

Sumiko, Y

2000. *History of Protestantism in China: The Indigenization of Christianity.* Tokyo: The Toho Gakkai.

Tunker, H,.

1989. *South Asia: A short History*, 2nd Edition. London: Macmillan.

Turner, L.J.B.

1927. *Handbook of Commercial and General Information for Ceylon.* Colombo: Government Printer.

Wright, G.

1991. *The Politics of Design in French Colonial Urbanism.* Chicago: University of Chicago Press.

Yammamotto, S.

2000. *History of Protestantism in China: The Indigenization of Christianity.* Tokyo: The Toho Gakkai.

Yeoh, B.S.A

1996. *Contesting Spaces: Power Relations and the Urban Built Environment in Colonial Singapore.* Kuala Lampur: Oxford University Press.

Yeoh, B.S.A and Kong, L.

1994. 'Reading Landscape Meanings: State Constrictions and Lived Experiences in Singapore's Chinatown.' In, *Habitat International*, 18, pp. 17-35.

# ආශ්චර්යාත්මක යථාර්ථවාදය පශ්චාත් යථාර්ථවාදයක් ලෙස

ලියනගේ අමරකීර්ති

## ප්‍රවේශය

මායා යථාර්ථවාදය, ඉන්ද්‍රජාලික යථාර්ථවාදය යන පද මේ වන විට සිංහල පාඨකයා අතර ප්‍රචලිතව පවතී. ඒ පද භාවිත වන්නේ සාහිත්‍යික යථාර්ථවාදයේ සීමා පිළිබඳ සිංහල සාහිත්‍ය කලා ලෝකය තුළ කෙරෙන සම්භාෂණයක කොටසක් හැටියටය. එම සම්භාෂණයේ අරමුණ සාධනීයය; පොහොසත්ය. එහෙත් එහි අන්තර්ගතය දුප්පත්ය; එනිසා හානිකරය. මායා යථාර්ථවාදය නිර්වචනය කිරීමට සිංහල ලේඛකයෙකු දරන ලද ප්‍රථම උත්සාහයද අතිශය දුර්වලය. එම ලේඛකයා, කේ. කේ. සමන් කුමාර, 'විශ්ව කෝෂමය සාර සංග්‍රහයක්' යැයි එහි ප්‍රකාශයන් විසින් හඳුන්වා දෙනු ලබන කෘතියක 'මායා යථාර්ථවාදය' යටතේ ලියන පිටු දෙක ඒ විෂය අරභයා මා කියවා ඇති අවුල් සහගතම පිටු දෙකයි. එය කියවන කිසිවෙකුට ඉන් විස්තර කරන විෂය තේරුම් ගත හැකියැයි මම නොසිතමි (සමන් කුමාර 1999: 45-46). එහෙත් එම කෘතිය මගින් පෙන්නුම් කරන්නේ සාහිත්‍ය සම්බන්ධයෙන් නව න්‍යායික ක්ෂේත්‍ර ගවේෂණය කරන්නට අප රට තරුණ ජනයාට කලෙක සිට පවතින උනන්දුවය; ලාලසාවය. එහෙයින් සමන් කුමාරගේ එම උත්සාහයට ගෞරවයද පුද කරමින් එළඹෙන මේ ලිපිය මායා යථාර්ථවාදය හෝ ඉන්ද්‍රජාලික යථාර්ථවාදය පිළිබඳ දීර්ඝ නිර්වචනාත්මක සම්භාෂණයක යෙදෙයි. දෙවනුව, මෙම ලිපිය යට කී පද

දෙක වෙනුවට 'ආශ්චර්යාත්මක යථාර්ථවාදය' යන පාරිභාෂික පදය යෝජනා කරයි. තෙවැනිව, මෙම ලිපියේ ප්‍රධාන තිසීසය ලෙස ආශ්චර්යාත්මක යථාර්ථවාදය යථාර්ථවාදී සම්ප්‍රදාය මුළුමනින්ම අතහැරයාමක් නොවන බව තර්ක කරයි. එම තර්කයේ අරමුණ වන්නේ ආශ්චර්යාත්මක යථාර්ථවාදය හුදු සෞන්දර්යාත්මක ආකෘතික හරඹයක් නොවන බව පෙන්වා දීමයි. දේශපාලනික සහ සමාජමය යථාර්ථ ප්‍රබන්ධ කථාවට විෂය කර ගැනුණු පමණින් ඒවා 'ජනතාවාදී'' කෘති ලෙස හඳුන්වා පහරදීමේ ප්‍රවණතාවක් සිංහල සාහිත්‍ය කතිකාව තුළ ඇති බැවින්, ආශ්චර්යාත්මක යථාර්ථවාදය හෙවත් magic realism හි ඇති යථාර්ථවාදී ලක්ෂණ මතු කර පෙන්වීම අවශ්‍ය වෙයි. එහෙත් එසේ පෙන්වීමේ අරමුණ යථාර්ථවාදය එකම ප්‍රබන්ධ නිර්මාණ මාදිලිය ලෙස තබා ගත යුතුය යන්න යෝජනා කිරීම නොවේ. මෙම ලිපිය එළඹෙන්නේම යථාර්ථවාදය ව්‍යුහමය වශයෙන් සීමාසහිතය; සරලරේඛීයය; ජීවිතය පිළිබඳ සියුම් බහුවිධ, බහුමානීය, බහු ශාබ්දික අර්ථ ජනනයට යථාර්ථවාදයේ ඇති ව්‍යුහාත්මක ඉඩ අඩුය, යන පූර්ව විශ්වාසයන්හි පිහිටා ගෙනය.

## ප්‍රබන්ධ රචනාව සහ ආශ්චර්ය

*One Hundred Years of Solitude* (හුදකලාවේ වසර සියයක්, 1971) නවකතාවේ 'ලස්සණ රෙමිඩියෝස්' හිටි හැටියේ මහා දවාලේ අහසට ඉගිල්ලී යයි. ඒ උදෙසා ඇයට දෙවියන්ගේ හෝ වෙනත් අධි මානුෂික බලවේගයක සහායද නොලැබෙයි. ගේබ්‍රියල් ගාර්සියා මාර්කේස්ගේ නවකතාවක ඕනෑම දෙයක් සිදු විය හැකිය. ගුන්තර් ග්‍රාස්ගේ *The Tin Drum* (තහඩු බෙරය, 1964) නවකතාවේ වීරයා වන ඔස්කාට සිය දෑසින් බලා, යටිගිරියෙන් කෑ ගසා වීදුරු, විදුලි බුබුළු ආදිය පුපුරුවා හැරීමට පුළුවන.

"මම මින් එහාට ලොකු නොවෙමියි" (ග්‍රාස් 1964) සිතා සිරුරින් නොවැඩී සිටීමට ද ඔහුට පුළුවන. සමහර විට නූතන නවකතාවේ වඩාත් 'ඉන්ද්‍රජාලික' හෝ 'ආශ්චර්ය සහගත' චරිතය ඇත්තේ ඔස්කාට වන්නට පුළුවන.

පෘතුගීසි ජාතික නොබෙල් ත්‍යාගලාභී ලේඛක හොසේ සරමාගෝ ගේ *Blindness* (අන්ධභාවය, 1997) නවකතාවේ එක් චරිතයක් එක්තරා නගර වීදියක (මෙම නගරයට නමක් සපයා නැත) මෝටර් රථයක් ධාවනය කරමින් සිටිද්දී හිටිවනම අන්ධභාවයට පත්වෙයි. මුළු නගරයටම අන්ධභාවය බෝවෙයි. එක් ගැහැනියක් පමණක් මේ වසංගතයෙන් බේරී සිටියි. අන්ධභාවය යනු බෝවෙන රෝගයක් නෙවෙයි. එය බෝවෙන ආකාරයද 'මැජික්' ලක්ෂණ සහිතය. එනම් එක් අන්ධයෙකු දෙස බැලූ විට දෙවැන්නාටත් අන්ධභාවය බෝ වෙයි. නවකතාව අවසන් වන්නේ බෝවෙන ලෙඩක් සුවවෙන ලෙසට අන්ධභාවය සුව වීමෙනි. සරමාගෝ සිය කෘතිය තුළ අන්ධභාවය ඉදිරිපත් කරන, හසුරුවන, එය නවකතාවෙහි කේන්ද්‍රීය සංඥාව ලෙස භාවිත කරන ආකාරය තුළ ආශ්චර්යාත්මක යථාර්ථවාදී ලක්ෂණ ඇත. එහෙත් ගාර්සියා මාර්කේස්ගේ කෘතියට වැඩි උපමා කතා ස්වරූපයක් ද සරමාගෝගේ කෘතියේ ඇත.

සල්මාන් රුෂ්ඩිගේ *Midnight's Children* (රෑ මැදියමේ දරුවෝ, 1987) නවකතාවේදී 'මැජික්මය' අවස්ථා නිතර හමුවේ. නවකතාවේ වීරයා (හෝ පුංචි ප්‍රතිවීරයා) වන සලීම සිනායිගේ කිරි අම්මාට ඇගේ දියණියන්ගේ සිහිනවලට හොරෙන් එබී බලන්නට පුළුවන. මෙවැනි කුඩා 'මැජික්' අවස්ථා ගණනාවක් රුෂ්ඩිගේ නවකතාවේ ඇත.

ඉසබෙල් අයියන්දේගේ *House of Spirits* (භූත ගෙදර, 1985) නවකතාවේ මව වන ක්ලේරාට අනාගත සිද්ධි පෙර දකින්නට පුළුවන. ගෙදර ඇති ගෘහ භාණ්ඩ 'චිත්ත ශක්තියෙන්' සෙලවීමටත් මළවුන් හා කතා කිරීමටත් ඇයට හැකියාව ඇත. ප්‍රධාන වශයෙන් මෙයත්, තවත් 'මායාමය' සිද්ධි

කිහිපයකුත් අය්යන්දේගේ නවකතාවේ ඇත. මා මේ පෙළ ගැස්වූයේ මා කියවා ඇති, මා කැමති සහ මේ ලිපියට ප්‍රමාණවත් 'මායා යථාර්ථවාදී' ලක්ෂණ රැගත් කෘති පමණි. එම කෘති සියල්ල සවිස්තරව සාකච්ඡා කිරීමට මෙහිලා අවසර නැත. එහෙයින් මා විසින් සාරාංශ ගත කෙරුණු ඒ 'මායා' සිද්ධි දෙස පමණක් සමීපව බලමු.




බෞද්ධ මිථ්‍යා විශ්වාස ද ආශ්චර්යාත්මක යථාර්ථවාදයේ ස්වරූප ද?
1930 ගණන්වල බෝතලේ රජමහා විහාරයේ අඳින ලද ප්‍රේත ලෝකය
පෙන්නුම් කරන බිතුසිතුවම් වලින් කොටසක්.
ඡායාරූප මූලාශ්‍රය: බණ්ඩාරනායක සහ ජයසිංහ, 1986.

ඒ සිද්ධි සියල්ල යථාර්ථය පිළිබඳ අපගේ සම්මත අදහස අභියෝගයකට ලක් කරයි. යථාර්ථවාදී නවකතාවකදී නම් එහි සිදුවන සියලු සිද්ධීන්ට හේතු යුක්තීන් කතාවේ වපසරිය තුළම ඇත. *The Tin Drum* නවකතාවේ ඔස්කා කෑගසා වීදුරු බිඳීම, දෑසින් බලා වීදුරු බුබුළු, ඔරලෝසු මුහුණ ආදිය පුපුරවා හැරීම සිංහල යථාර්ථවාදී නවකතාවක නිරූපණය වී යැයි සිතමු. එම සිද්ධි කතාව තුළ ඉදිරිපත් කරන විට ඔස්කාගේ එම ශක්තිය ග්‍රහ බලපෑමක්, භූත දෝෂයක් වැනි දෙයක් ලෙසවත් යථාර්ථවාදය තුළ

හේතුඵල ධර්මානුකූලව හීලෑ කරන්නට සිංහල ලේඛකයා තැත් දරන්නට ඉඩ ඇත. නොඑසේ නම්, යථාර්ථවාදී ලේඛකයා කරන්නේ එවැනි සිද්ධි මුළුමනින් බැහැර කිරීමය.

යථාර්ථවාදී නවකතාවක සිදුවන සෑම දෙයක්ම (සමහරවිට චරිත දකින සිහින වැනි දේ හැර) යථාර්ථය පිළිබඳ අපගේ දෛනික, ලෞකික හා සම්මත අවබෝධය ඉක්මවා නොයයි. ඒ සීමා ඉක්මවන දෙයක් යථාර්ථවාදී නවකතාවකදී සිදු වේ නම්, එය සිහිනයක් හෝ මනෝ විකාරයක් පමණක් බව කතුවරයා විසින් ඍජුව හෝ වක්‍රව අඟවනු ලැබේ. හේතුඵල තර්කනය මඟින් කතාවේ සිද්ධි හා චරිත තාර්කිකව එකට ඈඳීමට අවශ්‍යවීම යථාර්ථවාදී ප්‍රබන්ධ කථාවේ ඇති එක් සන්දර්භමය සීමාවකි. ඒ සන්දර්භමය සීමාවට කාටිසියානු දාර්ශනික පදනමක් ද ඇති බව විචාරකයෝ පෙන්වා දෙති.[2] යථාර්ථය බාහිර සත්තාවක් සේ මිනිස් මනසේ ඇති ඥාන ශක්තියෙන් දත හැකිය යන විශ්වාසය යථාර්ථවාදයේ පදනම යැයි ඉයන් වොට් වැන්නවුන් පෙන්වා දෙති (වොට් 1983).[3] යථාර්ථවාදය යනු යථාර්ථය මිනිස් දැනුමෙහි විෂයක් බවත්, එම විෂයෙහි ආභ්‍යන්තරික සැකැස්ම, ගතික ආදිය තර්කානුකූලව වටහාගත හැකිය යන දෘඪතර විශ්වාසයෙහි පිහිටි සම්භාෂණයක් යැයි ඉයෝන් විලියම්ස් කියයි (විලියම්ස් 1974).[4] නිරීක්ෂකයාගෙන් බැහැර යථාර්ථය යැයි කියා දෙයක් පවතින බවත් ඒ බාහිරව පවතින යථාර්ථය භාෂාව මඟින් ප්‍රතිනිර්මාණය කළ හැකි බවත් සාහිත්‍යික යථාර්ථවාදය විශ්වාස කරයි. අපි, අතිශය සංකෝචිත ඒ කරුණු පමණක් සිතෙහි තබාගෙන මේ දාර්ශනික ගැටලුවෙන් එළියට යන්නට උත්සාහ ගනිමු.

අප මුලින් දුටු නවකතාවල නිදර්ශන පෙන්නුම් කරන්නේ ආශ්චර්යාත්මක යථාර්ථවාදී නවකතාකරුවා යථාර්ථවාදයේ ඇති මේ ඥාන මීමංසාත්මක සීමාව ඉක්මවා යන බවයි. ගාර්සියා මාර්කේස්, ග්‍රාස්, සරමාගෝ, අය්යන්දේ සහ රුෂ්ඩිගේ නවකතාවල යට කී සිද්ධි යථාර්ථවාදයේ දෛනික

හා ලෞකික හේතුඵල තර්කනය ඉක්මවා යනු පමණක් නොව, යථාර්ථය යන සංකල්පය ගැනම පවා නව මානයක් හෙළි කරයි. එම සිදුවීම් යථාර්ථය පිළිබඳ සම්මත සහ 'ඇදහිය හැකි' අදහස තාර්කිකත්වයේ උපරිම සීමාව දක්වා විශාලනය කරයි. එමතු නොව, යථාර්ථයේ තාර්කික සීමාවෙන් පිට පැන අතාර්කිකත්වය දෙසට ගලා යයි; දිගු වෙයි; ලියලයි. තාර්කිකත්වය සහ අතාර්කිකත්වය අතර මායිම් කෙමෙන් බොඳවෙයි. තාර්කිකත්වයේ අධිපතිවාදයෙන්, පීඩකාරිත්වයෙන් සහ හිංසනයෙන් මිදුණු, තාමත් වැට කඩුලු බැඳ නැති ඥාන මීමංසාත්මක විශ්වයකට අත්හරිනු ලැබුවාක් මෙන් අපරිමිත නිදහසක් අපට දැනෙයි. 'මායා' යථාර්ථවාදී නවකතාව අපට මෙවනි දාර්ශනික සෞන්දර්යයක් අත්කර දෙයි.

නව ප්‍රබන්ධ කතාව මගින් අපිට විඳින්නට සලස්වන යථාර්ථය පිළිබඳ මේ නව අදහස, පශ්චාත් - කාටිසියානු අත්දැකීම, න්‍යායගත කරන්නට තැත් කළ සාහිත්‍ය කලා විද්‍යාර්ථියෝ සහ ලේඛකයෝ magic realism යන පාරිභාෂික පදය නිපදවූහ (සමෝරා සහ ෆරිස් 1995: 1-7).

Magic realism යන පදය 'මායා' හෝ 'ඉන්ද්‍රජාලික' යථාර්ථවාදය ලෙස සිංහලයට ගෙන ආ කල එය, නොමග යවන සුලු ධ්වනිතාර්ථ දෙයි. හුදෙක් ප්‍රබන්ධමය සිහින ලොවක්, මායා ලෝකයක් නිර්මාණය කිරීම 'මැජික් රියලිස්ම්' යන්නෙන් අදහස් නොවේ. ඊට 'ආශ්චාර්යාත්මක යථාර්ථවාදය' යන යෙදුම අප යෝජනා කරන්නේ එහෙයිනි. ඉතා සාමාන්‍ය, එදිනෙදා සංසිද්ධීන්හි පවා ආශ්චර්ය දැකීමට ආශ්චර්යාත්මක යථාර්ථවාදී නවකතාකරුවා සමත්වන අතර, එය ආශ්චර්යවත් ලෙස ප්‍රතිනිර්මාණය ද කරයි.

මායා යථාර්ථවාදීන් යැයි අප රට ප්‍රචලිත නවකතාකරුවන්ගේ කෘති මිනිස් ලෝකය හා සමීප ලෙස සම්බන්ධය. නූතන මිනිස් සමාජයෙහි ඇති ආර්ථික හා සමාජීය ගැටලු, දේශපාලන අරගල ආදී සියලු දේ ගාර්සියා මාර්කේස්, ග්‍රාස්, සරමාගෝ, අය්යන්දේ සහ එවැනි තවත් අයගේ

ප්‍රබන්ධවල නිරූපණය වේ. එම ලේඛකයන්ගෙන් බොහෝ දෙනෙකු ඉතා දැඩි වාමාංශික දේශපාලන නැඹුරුවක් සහිත අය වීමෙන්ම පෙනී යන්නේ 'සමාජ යථාර්ථය' හා ඔවුන් අතර ඇති සමීප සබඳතාවයි. ගාර්සියා මාකේස් සමාජවාදී ලෝකය හා දැඩි සබඳතා ඇති, ෆිදෙල් කැස්ත්‍රෝගේ සමීප මිතුරෙකි; දැඩි ඇමෙරිකානු විරෝධියෙකි. සමාජවාදී-ත්‍රස්තවාදයටද එඩිතරව විරෝධය පාන්නෙකි. ගුන්තර් ග්‍රාස් යනු ජර්මානු වමේ ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකයෙකි. සරමාගෝගේ නවකතා ඉතා බලසම්පන්න ලෙස ඓතිහාසික - දේශපාලන සන්දර්භයක පිහිටයි. *Blindness* නවකතාව දේශපාලන හිංසනයට, අධිපතිවාදයට, පීඩනයට එරෙහි ප්‍රබල දෘෂ්ටාන්තයක් වැන්න. ඉසබෙල් අය්යන්දේ බාල කල සිටම වාමාංශික දේශපාලනයට සම්බන්ධය. ඡන්ද බලයෙන් ජනාධිපති ධුරයට පත් වූ චිලි රටේ සමාජවාදී ජනාධිපති සැල්වදෝර් අය්යන්දේ ඇයගේ ඇවැස්ස මාමාය. *House of Spirits* නවකතාවේ සැල්වදෝර් අයියන්දේ, සී. අයි. ඒ. ව්‍යාපාරයේද සහාය ඇතුව ජනාධිපති මන්දිරය තුළම ඝාතනය කෙරෙන සැටි නිරූපණය කෙරී තිබේ. එම නවකතාව පවුලක කතාවක් වන තරමටම තියුණු දේශපාලන කතාවක්ද වේ. සල්මන් රුෂ්ඩි මෑතකදී ඉතා ඛේදනීය ලෙස ඇමෙරිකානුවාදී වෙමින් සිටියද මූලධර්මවාදයට සහ ජාතිවාදයට එරෙහිව අභීතව හඬ නඟා තිබේ.[5] රුෂ්ඩිගේ *Midnight's Children* එක් අතකින්, පශ්චාත් යටත්විජිත, විශේෂයෙන්ම දේශපාලනයට එල්ල කරන කර්කශ උපහාසයක් වැන්න. ඉන්දිරා ගාන්ධි එම නවතාවට එරෙහිව නඩු මඟට බැසීමෙන් එය එළිවෙයි. මූලධර්මවාදයේ දරුණුතම ප්‍රහාරයට ලක් වූ අපේ කාලයේ ප්‍රබන්ධ රචකයාද ඔහුය.

ඒ ඒ රචකයන්ගේ ප්‍රබන්ධ සහ ඔවුන්ගේ ජීවන තතුවලින් පෙනෙන්නේ ඔවුන්ගේ ප්‍රබන්ධ කතා යථාර්ථය සමඟ -- විශේෂයෙන්ම යථාර්ථයේ සමාජීය අංශය සමඟ දැඩි සේ සම්බන්ධ බවය. ඒ සම්බන්ධය සවිඥානිකය. එම

ලේඛකයන්ගේ සුවිශේෂ යථාර්ථවාදය 'මායා' හෝ 'ඉන්ද්‍රජාලික' යැයි හැඳින්වීම නොමග යවන සුලුවන්නේ එහෙයිනි. ආශ්චර්යාත්මක යථාර්ථවාදියා පොළොවෙන් ඉහළට එසවුණු එක් ටැමක් නිර්මාණය නොකරයි. ඔහු හුදු මනස් පුතුන් වදන්නෙක් ද නොවේ.

ගේබ්‍රියෙල් ගාර්සියා මාර්කේස්ම වරක් මේ ප්‍රශ්නයට ආකර්ෂණීය හා උපහාසාත්මක පිළිතුරක් දුන්නේය. ඒ පහත සඳහන් සන්දර්භය තුළය. ගාර්සියා මාර්කේස්ගේ නවකතා බටහිර රටවල කියවනු ලබන්නේ 'මායා යථාර්ථවාදී' කෘති හැටියටය. 'යථාර්ථවාදී' කෘති හැටියට නොවේ. එනම් ඇතැම් බටහිර පාඨකයන් රචකයා මවන ලෝකය දකින්නේ කාල්පනික මා ායා ලොවක් ලෙස මිස යථාර්ථවත්, තථ්‍ය ලොවක් ලෙස නොවේ. මෙම සා ාද්‍ය කියවීමට වඩාත්ම ලක්වූයේ *One Hundred Years of Solitude* කෘතියය. සිංහල පාඨකයා දනට දන්නා *Love in the Time of Cholera* (කොලරා කාලේ ආලෝ) වැනි කෘති නොවේ. මෙම ගැටලුව පිළිබඳව එක් ලේඛකයෙක් වරක් ගාර්සියා මාර්කේස්ගෙන් ප්‍රශ්න කෙළේය. "ඔබේ නවකතාවලදී ඔබ යථාර්ථය නැමති දෙය හසුරුවන විශේෂ ආකාරය සමහරු හඳුන්වන්නේ මැජික් රියලිස්ම් කියලයි. මට හිතෙනවා, යුරෝපයේ පාඨකයෝ සාමාන්‍යයෙන් ඔබගේ කෘතිවල මැජික් (මායා) ස්වභාවය දකිනවා. ඒ ඒ අය අසමත් වෙනවා ඒ මායා ස්වභාවය පිටුපස ඇති යථාර්ථය දකින්න" (ගාසියා මාකේස් සහ මෙන්ඩෝසා 1982). ඊට පිළිතුරු වශයෙන් ගාර්සියා මාකේස් මෙසේ කීයඃ

> "සත්‍ය වශයෙන්ම ඒකට හේතුව මේකයි. යුරෝපීය පාඨකයාගේ තර්කවාදය[6] ඔවුන්ට ඉඩ දෙන්නේ නැහැ යථාර්ථය කියන දේ තක්කාලිවලයි, බිත්තරවලයි මිලට වඩා සීමා නොවන බව දකින්න. හැබැයි ලතින් ඇමෙරිකානු එදිනෙදා

ජීවිතයේ යථාර්ථය අසාමාන්‍ය සිදුවීම්වලින් පිරිලා. ඔය ප්‍රශ්නෙට උත්තර දෙන කොට මං නිතරම පාවිච්චි කරන උදාහරණයක් තියෙනවා. ඔන්න එක සැරයක් ඇමෙරිකන් ගවේෂකයෙක් ලතින් ඇමෙරිකාවේ ඇමසන් වනාන්තරේ දිගේ ඇවිද්දා. ඒ මිනිහට හම්බු වුණා උණු වතුර ගලන ගඟක්. ඒ විතරක්යැ? එක ගමකුත් හම්බ වුණා. ඒ ගමේ මිනිස්සු හයියෙන් කෑ ගහන කොට වහින්න පටන් ගන්නවා. තව එනකොට ඔන්න එක සැරයක්, ආර්ජන්ටිනාවේ සර්කස් එකක් පැවැත්වෙන කොට ලොකු හුළඟක් හැමුවා. පහුවදා මුහුදු ගිය ධීවරයන්ගේ දැල්වලට සිංහයන්ගේ, ජිරාෆ්ලගේ මළ සිරුරු හමු උණා" (ගාසියා මාකේස් සහ මෙන්ඩෝසා 1982).

ගාර්සියා මාකේස්ගේ නවකතා කියවූවෙකුට ඔහුගේ නවකතාවල මෙවැනි සිද්ධි හමුවෙන බව සිහිපත්වෙනු ඇති. ඔහු එවැනි සිද්ධි ඒවායෙහි අද්භූතභාවය, නොඇදහිය හැකි බව නොමරා ඉදිරිපත් කරන සැටිද සිහිවනු ඇත. එම සිද්ධිවල ස්වභාවික ආශ්චර්ය සාහිත්‍ය රචනය තුළ සෞන්දර්යාත්මක ආශ්චර්යයක් ලෙස යළි ගොඩනගන කලාව ගාර්සියා මාකේස් කාලයක් තිස්සේ ප්‍රගුණ කර ඇත.

ගාර්සියා මාකේස්ගේ ඉහත පිළිතුර බටහිර තර්කවාදයට එරෙහිව සිටියි. එසේම එම පිළිතුර මගින් ඇඟවෙන්නේ ලතින් ඇමෙරිකාව නැමති සුවිශේෂ මහාද්වීපයට අදාළ යථාර්ථයක් ඇතැයි ගාර්සියා මාකේස් විශ්වාස කරන බවයි. එහිදී ඔහු එක්තරා වැදගත් දාර්ශනික අස්ථානයකද පිහිටයි. එනම් යථාර්ථවාදය යනු මුළු විශ්වයටම පොදු එක් සජාතීය ප්‍රපංචයක් නොවන බව ඔහු අඟවයි. එසේම යථාර්ථය පිළිබඳ යුරෝ-කේන්ද්‍රීය සංකල්පය ඔහුගේ ප්‍රහාරයට ලක්වෙයි. කේ. කේ. සමන් කුමාර ද 'මායා

යථාර්ථවාදය' යුරෝපා-කේන්ද්‍රියතාවෙන් මිදෙන්නට තැත් කරන බව නිවැරදිව හඳුනා ගනියි (සමන් කුමාර 1999).

ගාර්සියා මාකේස් දුන් ඒ පිළිතුර මෙම ලිපිය සම්බන්ධයෙන් වැදගත් වන තවත් කාරණයක් නම් 'මැජික් රියලිස්ම්' යන පදයේ සම්භවය පිළිබඳ තවදුරටත් සාකච්ඡා කරනු ලැබිය යුතු ඉඟියක් එහි අඩංගු වී තිබීමයි. එම පිළිතුරෙන් ඔහු අඟවන්නේ ස්වභාවධර්මානුකූලව හා භූගෝලීය වශයෙන් පවා ලතින් ඇමෙරිකාවට අදාළ යථාර්ථයක්, ස්වාභාවිකත්වයක් ඇති බවයි. සුවිශාල ගංගා, වනාන්තර, ඊටම ආවේණික වන සතුන්, ගහවැල ආදිය තුළින් මුළු ලතින් ඇමෙරිකානු මහාද්වීපයම ප්‍රාග් ඓතිහාසික සාරවත් පෘථිවි පෘෂ්ඨය සිහි කරයි. තවමත් බටහිර විද්‍යාත්මක තර්කනයේ සැක ස්වදේශීය දිසි අදිසි ජීවින් ඝාතනය කර නොමැති භූමියකි, එය. යථාර්ථය, ස්වභාවධර්මය පිළිබඳ ස්වදේශීය ඇමෙරිකානු[7] හා යුරෝපීය අදහස් අතර බල පොරය තවමත් එහි අවසන්ව නැත.[8] ලතින් ඇමෙරිකාවේ මේ සුවිශේෂත්වය මෙහිදී අපට ඉතා වැදගත්ය.

'මැජික් රියලිස්ම්' යන යෙදුම නිපදවීම සහ භාවිතයට ගැනීම පිළිබඳ ගෞරවය පිරිනැමෙන්නවුන් අතර, කියුබානු ජාතික ලේඛක අලේහෝ කාර්පෙන්ටියර් ප්‍රධානය.[9] 'මැජික් රියලිස්ම්' යන්න න්‍යාය ගත කිරීම පිළිබඳ ලතින් ඇමෙරිකානු පිතෘත්වය නිසැක වශයෙන්ම කාර්පෙන්ටියර්ට හිමි වේ.

කාර්පෙන්ටියර් යනු යථාර්ථවාදයේ සීමා අවබෝධ කර ගත් මුල් පරම්පරාවේ ලතින් ඇමෙරිකානු ලේඛකයන්ගෙන් කෙනෙකි. ඔහු මුලින් යුරෝපීය අධිතාත්විකවාදී ව්‍යාපාරය සමග සබඳතා පැවැත්වීය. එහෙත් අතිශය යුරෝ කේන්ද්‍රීය අධිතාත්විකවාදයට හසුනොවන සුවිශේෂී යථාර්ථයක් ලතින් ඇමෙරිකාවට ඇති බව කාර්පෙන්ටියර් වටහා ගත්තේය. ඔහු දුටු හැටියට ඊට හේතුව වූයේ ඓතිහාසික, භූගෝලීය සහ දේශපාලනික වශයෙන් ලතින් ඇමෙරිකාව යුරෝපයට වඩා වෙනස්වීමයි. ඔහු එය හැඳින්වූයේ

'ඇමෙරිකාවේ ආශ්චර්යවත් යථාර්ථය' (marvelous real in America) යනුවෙනි (කාර්පෙන්ටියර් 1995). 1949 දී කාර්පෙන්ටියර් එම මාතෘකාව යටතේම ලියූ ලිපියකින් 'මැජික් රියලිස්ම්' සංකල්පය යුරෝපීය අධිතාත්විකවාදයට එරෙහිව නිර්වචනය කෙළේය (1995: 97-98). ඔහුට අනුව, යුරෝපීය අධිතාත්විකවාදියා කරන්නේ යථාර්ථය පිළිබඳ දෘශ්‍යමාන යථාර්ථයට වැඩි යමක්, සවිඥානිකව නිර්මාණය කිරීමය. උදාහරණයක් ලෙස සිය කැන්වසය ඉදිරිපිට සිටගන්නා සැල්වඩෝර් ඩාලි රෙදි වැලක වැනූ රෙද්දක් සේ නැමී එල්ලෙන බිත්ති ඔරලෝසුවක් අඳියි. එම අධිතාත්විකවාදි චිත්‍රය ඩාලිගේ සවිඥානික නිර්මාණයකි. කාර්පෙන්ටියර්ගේ තර්කය අනුව ලතින් ඇමෙරිකාවේ එදිනෙදා ජීවිතය තුළ ආශ්චර්යවත් සිදුවීම් ස්වාභාවිකව හමුවේ. දැන් අපි මීට ඉහතදී ගාර්සියා මාකේස් කළ ප්‍රකාශය නැවත සිහිපත් කර ගනිමු. ඔහු උණු වතුර ගලන ගඟක්, මිනිස් කටකඩ ඇසෙන විට වැසි වසින ගමක් ආදිය ගැන කතා කෙළේය. කාර්පෙන්ටියර් විස්තර කරන ලතින් ඇමෙරිකාවේද 'නාමත් හඳුනා ගෙන නැති' සත්තු වසති. මකරු ගංගාවල පිහිනති. කිසිවෙකු රස බලා නැති ආහාර තිබේ. ඒ ලතින් ඇමෙරිකානු ස්වාභාවිකත්වයේ ඇති ආශ්චර්යයි. කාර්පෙන්ටියර් එම මහාද්වීපයේ ඇති යම් ඓතිහාසික ආශ්චර්යයන් ද විස්තර කරයි. උදාහරණයක් ලෙස, මධ්‍යම ඇමෙරිකාවේ අකුරු හැකියාව පවා නැති ජනගහනයක් තුළින් මුළුමහත් ස්පාඤ්ඤ භාෂා කාව්‍ය කලාවම විප්ලවයකට හසු කළ රූබෙන් දාරියෝ නමැති කවියා මතු විය. කාර්පෙන්ටියර් මෙවැනි ආශ්චර්යවත් සිද්ධි ගණනාවක් වාර්තා කරයි.[11]

ගාර්සියා මාකේස් සහ කාර්පෙන්ටියර් යන දෙදෙනාම මෙහිදී ඉදිරිපත් වන්නේ ලතින් ඇමෙරිකාවට අදාළ ස්වාභාවික සහ ඓතිහාසික යථාර්ථයක් වෙනුවෙන් මිනා මායා හෝ ඉන්ද්‍රජාලික ලෝකයක් වෙනුවෙන් නොවේ. එදිනෙදා ජීවිතයෙහිම පවත්නා ආශ්චර්යයන්ද මැකී නොයන සේ සාහිත්‍ය

කලාවන්ට හසුකර ගැනීම 'මැජික් රියලිස්ම් ' යන්නට කාර්පෙන්ටියර් දෙන අර්ථ කථනයයි (කාර්පෙන්ටියර් 1995). එනිසාගේ ඔහුගේ 'ඇමෙරිකාවේ ආශ්චර්යවත් යථාර්ථය' සංකල්පය ද සැළකිල්ලට ගෙන 'මැජික් රියලිස්ම්' යන්නේ ඓතිහාසික, දාර්ශනික සහ ඥාන මීමංසාත්මක අර්ථ සහ ඇඟවුම් හසුකර ගනු පිණිස 'ආශ්චර්යාත්මක යථාර්ථවාදය' යන පදය 'ඉන්ද්‍රජාලික' හෝ 'මායා' යථාර්ථවාදය යන පදවලට වඩා සුදුසු යැයි මම යෝජනා කරමි. එම පදය යථාර්ථවාදය සහ 'මැජික් රියලිස්ම්' අතර සබඳතාව ද වඩා හොඳින් විශද කරයි.

## ආශ්චර්යාත්මක යථාර්ථවාදය: සවිස්තරාත්මක නිර්වචනයක්

ආශ්චර්යාත්මක යථාර්ථවාදය පිළිබඳ කෙටි සරල නිර්වචනයක් දීම පහසු නැත. මා දැනට දන්නා නිර්වචන ඇසුරින් වඩාත් සවිස්තර නිර්වචනය මට හමුවූයේ වෙන්ඩි බී. ෆාරිස්ගේ ලිපියකය (ෆාරිස් 1995). ආරම්භක පියවරක් ලෙස අපි ඇගේ අදහස් සාරාංශ කරමු. ඇය සඳහන් කරන ආකාරයට ආශ්චර්යාත්මක සිද්ධි සහ එදිනෙදා යථාර්ථය සම්මිශ්‍රණය කරන සුවිශේෂී ආකාරය නිසා ඒ ආශ්චර්ය ස්වභාවිකවම, යථාර්ථය තුළින්ම මතුව එන්නක් ලෙස හැඟී යයි (ෆාරිස් 1995). ඉන් ඇය අදහස් කරන්නේ ආශ්චර්ය සහ යථාර්ථය මිශ්‍රවන ආකාරය තුල කෘත්‍රිම භාවයක් නැති බවයි. ඇය ආශ්චර්යාත්මක යථාර්ථවාදී ප්‍රබන්ධ කතාවේ අංග ලක්ෂණ පහක් ගෙන හැර පායි. අපි ඒවා ව්‍යාඛ්‍යානය කර සහ විශාලනය කර වටහා ගනිමු.

(i) ආශ්චර්යාත්මක ප්‍රබන්ධ කතාව අප දන්නා විශ්වයේ නීතිරීති ඇසුරින් පැහැදිලි කරගත නොහැකි ආශ්චර්යාත්මක අංග අඩංගු කරගනී. ප්‍රබන්ධ කතාව තුළ දී ඒ ආශ්චර්යාත්මක, අද්භූත සිද්ධි ඇත්තටම සිදු වේ. *One Hundred Years of Solitude* නවකතාවේ ලස්සන රෙමිඩියෝස් ඇත්තටම දිව්‍ය

ලෝකය දෙසට ඉගිල්ලී යයි. සරමාගෝගේ *Blindness* නවකතාවේ චරිතයෝ හිටිවනම, තවත් අන්ධයන්ගේ ඇස් පහර වැද අන්ධ වෙති. ඒ අන්ධයෝ තවත් මිනිසුන්ට ඇස් පහරදී අන්ධභාවය බෝ කරති. එනම් අපගේ එදිනෙදා ජීවිතයේ හෝ එදිනෙදා ලෝකයේ ධර්මතාවලින් විස්තර කළ නොහැකි දෙයක් එදිනෙදා තථ්‍ය ලෝකය තුළම සිදු වේ. ආශ්චර්යාත්මක යථාර්ථවාදී ප්‍රබන්ධ කතාව ආශ්චර්ය සහ යථාර්ථය ඒවායෙහි මූට්ටු නොපෙනෙනසේ එකට පුරුද්දන්නේ යැයි ෆාරිස් ප්‍රකාශ කරයි (ෆාරිස් 1995: 163).

(ii) ආශ්චර්යාත්මක යථාර්ථවාදී නවකතාවේ විස්තර වර්ණනා අප වසන එදිනෙදා ජීවිතයට ඉතා සමීපය (ෆාරිස් 1995: 169). ඒවා අතිශයින්ම යථාර්ථවාදීය. ඒ අතින් මාර්ටින් වික්‍රමසිංහ *ගම්පෙරළියේ* මහගෙදර විස්තර කරන ආකාරයත් ගාර්සියා මාර්කේස් *One Hundred Years of Solitude* හි හොසේ ආර්කාදියෝ බුවෙන්දියාගේ නිවස විස්තර කරන ආකාරයත් අතර වැඩි වෙනසක් නැත. වෙනසකට ඇත්තේ ගාර්සියා මාර්කේස්ගේ අතිශය කාව්‍යාත්මක, රූපකාර්ථවත් බස් වහරයි. ඔහුගේ ඉතා යථාර්ථවත් විස්තර වර්ණනාව අතරින් ආශ්චර්ය මතුව එයි. *One Hundred Years of Solitude* වෙතින් අප ගත් පහත සඳහන් ඡේදය බලන්න:

> "ළමයින්ගේ වැඩිමලා, හොසේ ආර්කාදියෝ දාහතර වැනි වියෙහි වූයේය. හතරැස් හිසත්, ඝන හිසකෙස් සහ සිය පියාගේ චරිත ස්වභාවයත් ඔහු සතු විය. හැදී වැඩීම සහ කාය ශක්තිය පිළිබඳ සිය පියාගේම පෙලඹීම ඔහු සතු වුවද ඔහු පරිකල්පනයෙන් හීන බව කල් තියාම පැහැදිලි විය. ඔහු පිළිසිඳ ගැනීම සහ ඉපදී තිබුණේ ඔවුන් මකොන්දෝ නගරය ගොඩනැගීමට පෙර කඳුකරය හරහා ආ දුෂ්කර කාලයේදීය. ඔහුගේ දෙමව්පියෝ, ඔහු වෙත සත්ව අංග ලක්ෂණ නැති බව දුනගත් මොහොතේ දිව්‍ය ලෝකය

> වෙත තුති පුද කළහ. මකොන්දෝහිදී උපන් ප්‍රථම මනුෂ්‍ය ප්‍රාණියා වන ඖරලියානෝට එන මාර්තු මාසයට අවුරුදු හයක් වයස වනු ඇත. *ඔහු සිය මවගේ ගර්භාෂයේ දී හඬා වැලපී සිටියෙන් ඔහු උපන්නේ ඇස් ඇරගෙනය....ඖරලියානෝ වයස තුනේදී, ඔහුගේ මව උණු සුප් මුට්ටියක් ළිපෙන් බා මේසයක් මත තියන මොහොතේදීම කුස්සියට ගියේය. ව්‍යාකූලව සිටි ළමයා, දොරකඩ සිට 'ඒක වැටෙන්ඩයි යන්නේ' යි කීවේය. සුප් මුට්ටිය මේසය මැද නොසෙල්වෙන ලෙස තබා තිබුණි. එහෙත් ළමයා අර විදිහට කී විගසම, සුප් මුට්ටිය එහි වූ ආභ්‍යන්තරික බලයකින් බලය ලැබුවාක් මෙන් මේසයේ අයින දෙසට යන්නට පටන් ගෙන බිම වැටී බිඳී ගියේය"* (ගාර්සියා මාකේස් 1991: 15-16)

මෙහි විස්තර වන්නේ හොසේ ආර්කාදියෝ බුවෙන්දියා ඔහු අතින් සිදුවූ මිනීමැරුමක පාපයෙන් සහ ඒ ගැන මතකයෙන් පලා යාමට සිය බිරිඳ ද තවත් අය ද සමග කඳුකරය හරහා ගොස්, මකොන්දෝ නම් කාලයත් සමග විශාල නරගයක් බවට පෙරළෙන ගම ගොඩනගා එහි පදිංචි වූ පසු ඔවුන්ගේ ජීවිතයයි. ඉහත උපුටනයෙහි, ඖරලියානෝ ගැන විස්තරය එන තුරුම, එහි විස්තර වර්ණනය ස්වභාවිකය; යථාර්ථවාදීය. ඉක්බිතිව කථිකයා ස්වාභාවික යථාර්ථයේ සිට අස්වභාවිකත්වය කරා ක්‍රමයෙන් මාරුවෙයි. 'ඔහු සිය මවගේ ගර්භාෂයේදී හඬා වැලපී සිටියෙන් උපන්නේ ඇස් ඇරගෙනය' යන වැකියෙන් ගාර්සියා මාකේස් යථාර්ථවාදී ආඛ්‍යාන ශෛලියේ උපරිම සීමාව පසු කරයි. ඉන්පසු ඖරලියානෝගේ අනාවැකි කීමේ ශක්තිය පළමු වරට හෙළිවෙයි. සුප් මුට්ටිය පෙරළෙන්නට යන බව තුන් හැවිරිදි ඖරලියානෝ කියන්නේ එය මේසය මත

නොසෙල්වෙන ලෙස තබා තිබියදීය. එහෙත් එය 'අනාගතයේදී' පෙරළෙනු ඔහු කලින්ම දකියි. නැති නම් ඔහුට සුප් මුට්ටිය සෙලවීමට බලයක් ඇත. ඔහුට ඇත්තේ අනාගත සිද්ධි පෙර දැකීමේ බලයක් බව නවකතාව තවදුරටත් කියවන විට පෙනී යයි. අප වටහාගත යුත්තේ යථාර්ථවාදී ආඛ්‍යාන ශෛලියක් තුළම සිට ලියන රචකයා, ඉතා අරපරිස්සමින් ලියූ වැකියක් මගින් ආශ්චර්ය වෙත ගොස් නැවත එවැනිම සුපරීක්ෂාවකින් ආපසු යථාර්ථය වෙත එන බවයි. ගාර්සියා මාකේස් වූ කලී එවැනි සූක්ෂ්ම රචනාකරණයෙහි විශ්මකර්මයෙකි. ලුයි බෝර්හේස්, ෆ්‍රාන්ස් කෆ්කා සහ විලියම් ෆෝක්නර්ගේ රචනා කුසලතා ගාර්සියා මාකේස් එසේ ස්වීකරණය කර ගනියි.[11] මෙතෙක් කළ මෙම නිර්වචනාත්මක ව්‍යාඛ්‍යානය මගින් අප වටහාගත යුතු එක් සුවිශේෂ කරුණක් නම් ස්වාභාවික යථාර්ථය හා අස්වාභාවික ආශ්චර්ය මිශ්‍රණයෙහිලා ගද්‍ය රචනා කුසලතාවද තීරණාත්මක ලෙස බලපාන බවයි.

(iii) ආශ්චර්යාත්මක යථාර්ථවාදය යම් සිදුවීම් පිළිබඳ අර්ථකථන හෝ තේරුම් ගැනීම් දෙකක් අතර දෙගිඩියාවකට පාඨකයා යොමු කරයි. වෙන්ඩි ෆාරිස්ගේ නිර්වචනයේ වඩාම දුෂ්කර ප්‍රදේශය මෙයයි (ෆාරිස් 1995: 171). එහෙයින් එය සනිදර්ශනාත්මකව ව්‍යාඛ්‍යානය කරමු. ගුන්තර් ග්‍රාස්ගේ *The Tin Drum* නවකතාවේ නායක සහ කථක ඔස්කාර් සිය තුන්වැනි උපන් දිනය දවසේ පඩි පෙළෙන් වැටෙයි. ඔහු එතැන් සිට ලොකු වීම සහ උසයාම නවතයි. ඔහු හිතාමතාම හැදී වැඩීම නවතනවාද යන්න පැහැදිලි නැත. කතුවරයා ඊට කිසිදු හේතුවක් විස්තර නොකරයි. අපි *The Tin Drum* කෘතියෙන් එක් තීරණාත්මක මොහොතක් කියවමු:

> "…. කිසිම කෙනෙක් තමන්ගේ කන් බෙර පුපුරවන මගේ තහඩු බෙරය උදුරලා පැත්තකින් තියන්ඩ තරම් නිර්භීත උණේ නෑ. මං යටිගිරියෙන් කෑ ගැහුවා. මං කෑගහන කොට වටිනා

> කියන වීදුරු බඩු කැලි කැලිවලට කුඩු වුණා. මට කුසලතාවක් තිබුණා සිංදු කීමෙන් වීදුරු කුඩු කරන්න. මගෙ කැගැහිලි මල් වාස් බින්දා. මගේ සින්දු කියවිලි ජනෙල් වීදුරු පොඩි පට්ටම් කෙරුවා. පවිත්‍ර, ඒ පවිත්‍රතාවය නිසාම බලසම්පන්න, දියමන්තියක් වැනි මගේ කටහඬ වීදුරු කැබිනට් එකේ වීදුරු කපාගෙන ගිහින්, ඒත් එහි අහිසංකත්වයක් නැති කර නොගෙන, කැබිනට් එක ඇතුළට ගිහින්, අලංකාරෙට හිටිය, ආදරබර දෑතකින් තැන්පත් කරලා තිබුණ, තුනී දූවිලි පටලයකින් වැහිලා තිබුණ, මත්පැන් වීදුරු තු තු කරලා දැම්මා...." (ග්‍රාස් 1964: 64).

කුඩා ඔස්කාර් සිය කඩහඬින් වීදුරු බිඳින්නේ කෙසේද යන ප්‍රශ්නය ඕනෑම පාඨකයෙකු දෙගිඩියාවකට යොමු ක්රයි. ඊට කිසිදු හේතුවක් රචකයා විසින් සපයනු නොලැබේ. ඇමෙරිකානු 'ත්‍රාස කතා රචක ස්ටිවන් කිංග් හෝ විද්‍යා ප්‍රබන්ධ රචකයෙකු නම් ඔස්කාර්ගේ කට හඬේ දියමන්ති ශක්තියට තාර්කික අර්ථකථනයක් දෙනු ඇත. ගුන්තර් ග්‍රාස් එසේ නොකරන බැවින් ඒ සිදුවීමට අර්ථකථන නිර්මාණය කිරීම පාඨකයාට බාර වෙයි. වෙන්ඩි ෆාරිස්ගේ නිර්වචනයට අනුව මේ අවස්ථාවේදී පාඨකයා අර්ථකථන දෙකකට මැදිව දෙගිඩියාවකට හසුවෙයි.

ෆාරිස්ගේ නිර්වචනයම තවත් පුළුල් කරමින්, පාඨකයා ආශ්චර්යාත්මක සිද්ධිය පිළිබඳ දෙගිඩියා ගණනාවකටම මුහුණ දෙතියි අපට කිව හැකිය. මෙහිදී ආශ්චර්ය මතුවන්නේ අර්ථකථන ගණනාවකට පාඨකයා මැදිහත්වීමටත් වඩා පාඨකයාගේ එදිනෙදා තර්කය අසමත්වීම නියා යැයි මම යොජනා කරමි. තර්කයේ මුවහත ඒ සංසිද්ධිය හරහා යා නොහැකිව මොට වෙයි. එහෙයින් තාර්කික නිර්වචනයක් තනා සංසිද්ධිය නිර්වචනය කරන විජයග්‍රාහී පාඨකයෙකු වෙනුවට සංසිද්ධියේ දාර්ශනික අවුල මැද

මොහොතකට තනිවෙන පාඨකයෙක් අපට හමුවේ. තර්කය අසමත්වන තැනින් අස්වභාවිකත්වය මතුවෙයි. එම අස්වභාවිකත්වය රචකයාගේ රචනා කුසලතාව මගින් සැකසී ඉදිරිපත් කෙරෙන විට, ආශ්චර්ය උපදයි.

*The Tin Drum* වෙතින් ගත් නිදර්ශනය සමග තව මොහොතක් ගත කරමු. ඔස්කාර්ගේ කටහඬේ තරංග පිහිටීම අනුව ඊට භෞතිකවම වීදුරු බිඳීමට ශක්තියක් ඇත. මේ තාර්කික පාඨකයෙකුට එළඹිය හැකි නිගමනයකි. ඔස්කාර් කෑගසන විටම ඇතිවන තවත් සංසිද්ධියක් නිසා වීදුරු බිඳෙයි යැයි වෙනකෙකු සිතන්නට ඉඩ ඇත. එසේ නම් ඔහු කෑගසන හැම විටෙකම ඉහත සංසිද්ධිය පණ ගැන්වෙනු විය යුතුය. ඒ ඔහු යටිගිරියෙන් කෑගසන හැමවිටම වීදුරු බිඳවැටෙන බැවිනි. ඔස්කාර් යනු කිසියම් භූත බලයක් ඇත්තෙකු විය හැකි යැයි තවත් අර්ථකථනයක් ඉදිරිපත් කෙරෙනු ඇත. එහෙත් පිටු හයසීයක් පමණ වන *The Tin Drum* හි කොතැනකවත් ඔස්කාර් අවතාරයක් යැයි අඟවන කිසිදු සාධකයක් නැත. අනෙක් අතට, ඔස්කාර් අවතාරයක් ලෙස ගතහොත් නවකතාව ආශ්චර්යාත්මක යථාර්ථවාදයෙන් පිට පැන අවතාර කතා නැමති ශානරය (genre) හෝ රීතිය වෙත යයි. ආශ්චර්යාත්මක යථාර්ථවාදී කතා කරුවා සිය රීතියට පිටින් පැනීමට ඉඩ නොදෙයි. එය කරන්නේ ආශ්චර්ය හා ස්වාභාවිකත්වය මිශ්‍ර කිරීමෙනි. එනම් ඔස්කාර්ගේ කටහඬ වීදුරු කපාගෙන යාම 'ඇත්තටම' සිදුවෙයි. එය ඇත්තටම සිදුවූ බව ඇඟවීම උදෙසා රචකයා සිය ප්‍රබන්ධය භූත කතා, විද්‍යා ප්‍රබන්ධ කතා, වැනි වෙනත් ශානරයක් වෙත මාරුවෙන්නට ඉඩ නොතබයි. ශානර න්‍යාය වැන්නකින් අපට වඩාත් ප්‍රයෝජන ලැබිය හැක්කේ මෙහිදීය.

කතාවක අස්වාභාවික සිද්ධිය පිළිබඳ නිර්වචන ගණනාවක අබිමුව කුමන නිර්වචනය නිවැරදිදැයි තමා සමගම වාද කරන පාඨකයාට සියලුම අර්ථකථන එකවර නිවැරදි සහ වැරදි බව පෙනී යයි. ඒ නිසා ඔහු හෝ ඇය

එළඹෙන්නේ, නිවැරදි - වැරදි නිගමනයකටය. මෙය අපගේ එදිනෙදා ජීවිතයේ ප්‍රායෝගික තර්කනය හා නොගැළපෙයි. තාර්කිකත්වය සහ අතාර්කිකත්වය අතර අතරමංවීම ප්‍රබන්ධ පාඨකයෙකු ලබන නැවුම් කියවීම් අත්දැකීමකි. මෙම අලුත් වර්ගයේ කියැවීම් අත්දැකීම ද ආශ්චර්යවත්ය. එය ජීවිතය පිළිබඳ අපගේ ඉතා ලෞකික, ඉතා භෞතික, ඉතා තාර්කික එදිනෙදා දෘෂ්ටිය විනිවිද යයි. මා මෙහි ජීවිතය යැයි කීවේ පන්ති සමාජීය ජීවිතයටයි. මෙම අලුත් කියැවීම් අත්දැකීම, යථාර්ථවාදී නවකතාවෙන් නොලැබෙන කියැවීම් අත්දැකීම, ආශ්චර්යාත්මක කියවීම් අත්දැකීමක් ලෙස හඳුන්වයි.

එහෙත් මෙහිලා එක කරුණක් මතක තබා ගත යුතුය. එනම් ආශ්චර්යාත්මක සිදුවීම් පිළිබඳ අර්ථකථන කිහිපයකට මැදිවන සෑම පාඨකයාගේම කුමකින් කුමක් තෝරා ගන්නේද යන දෙගිඩියාව එකක්ම නොවේ. ඒ දෙගිඩියාව පාඨකයාගෙන් පාඨකයාට, සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වෙයි. නැවතත් අපි *The Tin Drum* කෘතියේ ඔස්කාර්ගේ අරුම පුදුම කටහඬ වෙත යමු.

සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ ඔහුගේ කටහඬ එසේවීම පිළිබඳ කර්මඵලවාදී අර්ථකථනයක් මතුවන්නට පුළුවන. ඔස්කාර් පෙර ආත්මයකදී කළ පිනක් හෝ පවක් නිසා ඔහුගේ කඩහඬ විදුරු බිඳීමේ ශක්තිය ලබා ඇතැයි සිතන බෞද්ධ පාඨකයෙකු මෙම සිද්ධිය කියැවීමෙන් මුහුණ දෙන දෙගිඩියාව ප්‍රබල නොවන්නට පුළුවන. එසේ නම්, මෙහිදී තව අමතර ප්‍රශ්නයක් පැන නගී. එනම් 'මැජික් රියලිස්ම්' යන විශේෂ යථාර්ථවාදය ඉදිරිපත් කරන නිර්මාණශීලී ලේඛකයා තමන්ගේ සංස්කෘතික සම්ප්‍රදාය තුළම සිට යථාර්ථවාදී කතා කලාවේ ඇති දෘෂ්ටිවාදාත්මක, කලාත්මක, සංජානාත්මක සහ ඥාන මීමංසාත්මක සීමා අතික්‍රමණය කරන ක්‍රමවේද ගවේෂණය කරයි. ආශ්චර්යාත්මක යථාර්ථවාදයේ විවිධ ස්වරූප තිබිය හැකිය. සල්මාන් රුෂ්ඩිගේ ආශ්චර්යාත්මක යථාර්ථවාදය *Midnight's Chil-*

dren නවකතාවේ දී හින්දු මිථ්‍යා කතා හා මිශ්‍ර වෙයි. *Satanic Verses* (සාතන්ගේ ශ්ලෝක, 1995) නවකතාවේදී ඉස්ලාමීය කතා සම්ප්‍රදායේ අංග සමගත් මිශ්‍ර වෙයි. සයිමන් නවගත්තේගම සහ අජිත් තිලකසේන (*චන්දනාව* නවකතා සංග්‍රහයේදී) යථාර්ථවාදය අතික්‍රමණය කරන්නේ බෞද්ධ කතා සම්ප්‍රදායේ ඇති ව්‍යුහීය අංග, සංකල්ප රූප, රූපක ආදිය යොදා ගෙනය. එහෙයින් 'මැජික් රියලිස්ම්' යන්න 'ආශ්චර්යාත්මක යථාර්ථවාදය' ලෙස සිංහලයට ගත් කල අපටම ආවේණික ප්‍රබන්ධාත්මක ආශ්චර්යන් විස්තර කරන යෙදුමක් ලෙස එය යොදාගත හැකි යැයි මම යෝජනා කරමි.

(iv) ආශ්චර්යාත්මක යථාර්ථවාදය එකිනෙට සපුරා වෙනස් ලෝක දෙකක් එකට ඈඳයි. මේ ලෝක දෙක මළවුන්ගේ සහ ජීවත්වන්නවුන්ගේ ලෝකය ද, සැබෑ ලෝකය සහ ප්‍රබන්ධ ලෝකය ද ලෙස වෙන්ඩි බී. ෆාරිස් විස්තර කරයි (ෆාරිස් 1995: 172-73). අපි එම නිර්වචනාංග ද විස්තාරණය කර පැහැදිලි කරමු. ගාර්සියා මාකේස්ගේ *One Hundred Years of Solitude* හි මළවුන්ගේ ලෝකය සහ නොමළවුන්ගේ ලෝකය අතර සීමා වැට පැහැදිලිව ඇඳ නැත. ඇඳ ඇතත්, එය විටින් විට දිය වෙයි. මිය ගිය තැනැත්තෝ පණ පිටින් සිටින්නාසේම ජීවත්වන්නවුන්ගේ ලෝකය වෙත ඇවිද එති. ඒ මියගියවුන්ගේ අවතාර යැයි කතුවරයා නොඅඟවයි. සෙසු චරිතයෝ ද ආපසු එන මියගියවුන් පණ පිටින් සිටින කලෙක මෙන් බ ාර ගනිති.

*One Hundred Years of Solitude* නවකතාවේ පිතෘ මූලිකයා වන හොසේ ආර්කාදියෝ බුවෙන්දියා හෙල්ලකින් ඇන පෘඩෙන්ෂියෝ අගිලාර් නම් සිය සගයා මරා දමයි. ගාර්සියා මාකේස්ගේ විස්මය ජනක ගද්‍ය රචනා ශක්තියෙන් තවත් ප්‍රබන්ධ රචකයෙකුගේ සිතෙහි ආදරණීය ඊර්ෂ්‍යාවක් ඇති කරන තරම් ආකර්ෂණීය ලෙස විස්තර කරන ඒ මිනිමැරුම ආශ්‍රිත සිද්ධි මෙහිලා යළි පවසන්නට අවකාශ නැත. අගිලාර් මිය ගියද නවකතාවේ ලෝකය තුළ ඔහු තවම ජීවත්වෙයි. මේ වූ කලී ඔහුගේ මරණයෙන් පසුව සිදුවන්නකි:

"එක රැයක උර්සුලා වතුර ටිකක් ගැනීම සඳහා මිදුලට ගිය විට පෘඩෙන්සියෝ අගිලාර් වතුර කළය ළඟ සිටිනු දුක්කාය. ඔහු සුදුමැලිවී සිටියේය. ශෝකී මුහුණින් යුක්ත විය. ඔහු තණකොළවලින් සාදන ලද ඇබයකින් ඔහුගේ ගෙලෙහි සිදුර වසන්නට තැත් කරමින් සිටියේය. ඒ දර්ශනය උර්සුලා වෙත ගෙනාවේ භීතිය නොව අනුකම්පාවයි. ඇය කාමරය වෙත ගොස් දුටුදේ සැමියාට කීවාය. එහෙත් ඔහු ඒ ගැන වැඩිදුර නොසිතුවේය. 'මෙකෙන් පේන්නේ අපිට අපේ අපේ හෘද සාක්ෂ්‍යයේ බර දරා ගන්න බැරි බවයි.' දෙරැයකට පසු අගිලාර් ඔවුන්ගේ නාන කාමරයට වී අර තණ ඇබයෙන් ඔහුගේ උගුරේ කැටි ගැසුණ ලේ පිස දමමින් සිටිනු උර්සුලා දුටුවාය. තවත් රාත්‍රියකදී අගිලාර් වැස්සේ ඇවිදිනු ඈ දුක්කාය. සිය බිරිඳ දකින මායා දාර්ශනයන්ගෙන් කරදයට පත් හොසේ ආර්කාදියෝ බුවෙන්දියා සිය හෙල්ලෙන් ද සන්නද්ධව මිදුලට ගියේය. ඒ මළ මිනිසා ශෝකී පෙනුමෙන් යුතුව එහි සිටියේය" (ගාර්සියා මාකේස් 1991: 22-23).

"'උඹ පලයං යන්ඩ මක බැව්ලා. උඹ ආපහු එන එන සැරේට මං උඹව මරනවා.' පෘඩෙන්සියෝ අගිලාර් යන්නට නොගියේය. හොසේ ආර්කාදියෝ බුවෙන්දියාද හෙල්ල විසි කිරීමට තරම් නිර්භීත නොවිය. එතැන් පටන් ඔහුට සුව නින්දක් නම් නොලැබිණි. මළ මිනිසා වැස්ස අතරින් තමන් දෙස බැලූ ආකාරයේ වූ දැඩිතර ශෝකී ස්වභාවය, ජීවමාන මිනිසුන් හා එක්වීම පිණිස ඔහු දක් වූ ගැඹුරු කාන්සාව, තණකොළ ඇබය පොඟවා ගැනීම සඳහා ගෙය පුරා වතුර සෙවූ උනන්දුව

බුවෙන්දියාගේ හිතට වධ දුන්නේය. 'මිනිහා හරිම ලොකු දුකක් විඳිනවා වෙන්නෝනැ' ඔහු උර්සුලාට කීවේය. ඉන් ඇගේ සිත කොතෙක් උණුවීද යත්, ඊළඟ වතාවේ ඔහු කුස්සියේ හට්ටි මුට්ටි අරිමින් සිටිනු දුක ඔහුට අවශ්‍ය කුමක්දැයි වටහා ගත් ඇය සෑම දිනෙකම, ගෙයි සෑම තැනෙකම වතුර මුට්ටි තැබුවාය. එක් රැයෙක හොසේ අර්කාදියෝ බුවෙන්දියා තමාගේ කාමරයටම පැමිණ තුවාලය සෝදන පෘඩෙන්සියෝ දුටුවේය" (ගාර්සියා මාකේස් 1991: 22-23).

මළ මිනිසාගේ නැවත පැමිණීම ගාර්සියා මාර්කේස් සිය ප්‍රබන්ධයේදී හසුරුවන්නේ මළවුන්ගේ ලෝකය හා ජීවත්වන්නවුන්ගේ ලෝකය අතර තාර්කික සහ සම්මත සීමා මැකී යන අන්දමින් බව ඉහත උද්ධෘත හෙළි කරයි. කතුවරයා මළ මිනිසා විස්තර කරන්නේ උර්සුලා හෝ බුවෙන්දියා යන චරිතවල දෘෂ්ටි කෝණයෙන් නොවේ. කථකයාගේ දෘෂ්ටිකෝණයෙනි. මෙ කථකයාට බුවෙන්දියාත්, උර්සුලාත් මිය ගොස් නැවත පැමිණි පෘඩෙන්සියෝත් යන තිදෙනාම පැහැදිලිව පෙනේ. මළ මිනිසාගේ යළි පැමිණීම කථකයා ද පිළිගනියි. උගත්, බුද්ධිමත්, තාර්කික තුන්වැන්නෙකු ලෙස බුවෙන්දියා සහ උර්සුලාගේ ලෝකයෙන් දුරස්ථ වී වාස්තවික (objective) හෝ 'විද්‍යාත්මක' ඇසකින් බලා සිද්ධි විස්තර නොකරයි. කථකයා වාස්තවිකත්වය හිසින් ගත් තාර්කික සහ දුරස්ථ නිරීක්ෂකයෙකුව සිය වාස්තවික සහ විද්‍යාත්මක විග්‍රහය මගින් තමා විස්තර කරන සංසිද්ධිය විග්‍රහාත්මකව සංවිධානය නොකරයි. ඔහු එය විස්තර කරන ආකාරයෙන් විශද වන්නේ නිරීක්ෂකයාගේ නිරීක්ෂණ ක්‍රියාවලියේ නීති රීති නොව නිරීක්ෂිතයේ නීති රීතිය. ඒ නීති රීති අපගේ එදිනෙදා තර්කනයේ නීති රීතිවලට වෙනස්ය. වෙනත් ආකාරයකට මෙය විස්තර කරන්නේ නම්, කථකයා ඔහු විස්තර

කරන චරිතයන්ගේ ලෝක දැක්ම සමග ඥාන මීමංසාත්මකව සහභාගි වෙයි. කථකයා නිරීක්ෂකයෙකු ද ඔහු විස්තර කරන ලෝකය හෝ ඔහු ගොඩනගන ලෝකය නිරීක්ෂිතය ද යන සරල සමීකරණමය ද්විධාකරණය මෙහි නැත. ඒ දෙක වෙන් කරන මිනිස් තර්ක ඥානයේ බිත්තිය දිය වී දෙපසට බොඳ වී යයි. නිරීක්ෂකයාගේ බැල්ම සහ නිරීක්ෂිතයේ පැවැත්ම එකිනෙක වෙතට යා වෙයි. බැඳී යයි. මේ බිඳ වැටෙන්නේ කාටීසියානු වාස්තවිකත්වයේ බිත්තියයි. දැනටමත් අපි සාහිත්‍යයේ සීමාවෙන් දර්ශනය වෙත පැන සිටිමු. එහෙයින් අපි මඳකට මෙතැනින් නතර වෙමු. එහෙත් අප වටහා ගත යුතු දෙය නම්, මළවුන්ගේ අතාර්කික ලෝකය හා නොමළවුන්ගේ තාර්කික ලෝකය අසිරිමත්ව සමීපකරණය ආශ්චර්යාත්මක යථාර්ථවාදයේ එක් ප්‍රධාන ලක්ෂණයක් බවයි. එසේම, සාමාන්‍යයෙන් එකිනෙකට දුරස්ථ යැයි සළකන සත්‍ය සහ ප්‍රබන්ධය, අතීතය සහ වර්තමානය ආදිය එකිනෙක වෙත බැඳී යයි.

(v) වෙන්ඩි ෆාරිස්ගේ නිර්වචනයේ ඊළඟ කොටසින් කියැවෙන්නේ ආශ්චර්යාත්මක යථාර්ථවාදය, කාලය, අවකාශය සහ අනන්‍යතාව පිළිබඳ අපගේ සම්මත අදහස් ප්‍රශ්න කිරීමට ලක් කරන බවයි (ෆාරිස් 1995: 173). අපි මේ අදහස ද සනිදර්ශනාත්මකව විශාලනය කරමු. කාලය, අවකාශය, අනන්‍යතාව පිළිබඳ සම්මත අදහස යන්නෙහි තේරුම් දෙකක් තිබේ. පළමු වැන්න නම් අපි එදිනෙදා ඒ සංකල්ප සලකන ආකාරයයි. උදාහරණයක් ලෙස අපි එදිනෙදා ජීවිතයේදී 'කාලය' සලකන්නේ එක් තැනෙක සිට ඉදිරියට විකාශනය වන සරල රේඛීය ගමන් මාර්ගයක් ඇත්තක් ලෙසිනි.

කාලය, අවකාශය සහ අනන්‍යතාව පිළිබඳ දෙවැනි සම්මත අදහස නම් ඒ සංකල්ප යථාර්ථවාදී නවකතාවේ භාවිත වන ආකාරයයි. යථාර්ථවාදී නවකතාව ද බොහෝ විට කාල මානය හසුරුවන්නේ ඒකමානීය සහ සජාතීයත්වයෙන් යුත් ප්‍රපංචයක් ලෙසිනි. ඒ අතින් කාලය සහ අවකාශය පිළිබඳ එදිනෙදා සම්මත අදහස ඒ සංකල්ප පිළිබඳ යථාර්ථවාදී ප්‍රබන්ධ කතාවේ

සම්මත අදහසට සමගාමීය. ආශ්චර්යාත්මක යථාර්ථවාදය මෙම සංකල්ප අභියෝගයට ලක් කරයි. එම ශිල්පීය ප්‍රයෝගය නිසාද ආශ්චර්ය උපදයි.

*One Hundred Years of Solitude* නවකතාව තුළ කාලය පිළිබඳ මාන දෙකක් ඇතැයි අපට තර්ක කළ හැකිය. එකක් සරල රේඛීයය. අනෙක චක්‍රාකාරය. කතුවරයා මෙම කාල සංකල්ප දෙක ශූර ලෙස සහපැවැත්මෙහි යොදවයි. රුෂ්ඩිගේ *Midnight's Children* හිත් ග්‍රාස්ගේ *The Tin Drum* කෘතියේත් කාලය පිළිබඳ රේඛීය සහ චක්‍රීය යන කාල මාන දෙකම භාවිත කරයි. එහෙයින් ආශ්චර්යාත්මක යථාර්ථවාදය කාලය පිළිබඳ සම්මත අදහස උඩියටිකුරු කරයි යන ෆාරිස්ගේ නිර්වචනය නිර්වචනාර්ථයෙන්ම ගැනීම වැරදිය. *One Hundred Years of Solitude* ඇසුරින් මෙය පැහැදිලි කර ගනිමු.

එම නවකතාවේ කතාව දිග හැරෙන්නේ මුල සිට අගට විස්තරවන, ඉතිහාස කතාවක් බඳු රේඛීය මානයකිනි. කතාව ආරම්භයේදී කෘත්‍රිම අයිස්, දුරදක්නයක් යනාදිය දකින මකොන්දෝ වැසියෝ විස්මයට පත්වෙති. එනම් විද්‍යාත්මක දියුණුවට සාපේක්ෂව මකොන්දෝ වැසියෝ තවම 'නොදියුණුය:' 'නූගත්ය.' නවකතාව අවසන් වන විට මකොන්දෝව නූතන නගරයක් බවට පෙරළෙන අතර, එහි ජනතාව ද මුළුමනින්ම දියුණු ජනතාවක් බවට පත්වෙති. මකොන්දෝවට නැව් ද අහස්යානාද එයි. කාලය 'නොදියුණු' වේ සිය 'දියුණුව' කරා රේඛීයව චලනය වෙයි. එහෙයින් එහි ඉතිහාසවාදී කාල මානයක් ඇත.

නවකතාවේ මූලික පවුල වන අර්කාදියෝ බුවෙන්දියා පවුල පරම්පරා තුනක් දක්වා වර්ධනය වෙයි. ඒ නිසා මුල මැද සහ අගින් යුතු, මනා ලෙස නිමා කරන ලද කතාව හෝ කතන්දරය ඕනෑම නුපුහුණු පාඨකයෙකුට වටහා ගත හැකි ලෙස දිග හැරෙයි. එය වූ කලී කාලය පිළිබඳ රේඛීය මානයක් සරලව ගොඩනැගීමේ ප්‍රතිඵලයකි. "ආශ්චර්යාත්මක යථාර්ථවාදී නවකතාව, එහි නූතනවාදී පුරෝගාමී නවකතාවන්ට වෙනස්ව, පාඨකයා

වෙත රේඛීය විකාශනයකින් යුතු කතාවක් බොහෝ විට ඉදිරිපත් කරමින් 'ඊළඟට වෙන්නේ මොකද්ද?' යන අපගේ කුතුහලය ආමන්ත්‍රණය කරයි" යනුවෙන් ෆාරිස් කරන ප්‍රකාශයම මගේ තර්කය සනාථ කරයි (ෆාරිස් 1995ඃ 163). මෙහිදී ඇය ආශ්චර්යාත්මක යථාර්ථවාදයේ නූතනවාදී පුරෝගාමී ප්‍රවණතාව යනුවෙන් හඳුන්වන්නේ අධිනාත්විකවාදය, විකාරරූපවාදය ආදියයි.

*One Hundred Years of Solitude* හි එම රේඛීය කාලය සමග සහපැවැත්මෙහි යෙදෙන චක්‍රීය කාලයක්ද ඇත. මෙම චක්‍රීය කාලය නියෝජනය කරන ප්‍රධානම චරිතය මෙල්කියාදෙස්ය. ඔහු සැරින් සැරේ මකොන්දෝවට එන යන 'අභිකුණ්ඨික' නායකයෙකි.[12] මෙම චරිතය විටින් විට නවකතාවේ කතාන්දරය වෙත පිවිසෙන ආකාරයට කාලය පිළිබඳ චක්‍රීය හැඟීමක් ඇති කරයි. ඔහුගේ චරිතය විස්තර කෙරෙන විලාසයෙන්ම පවා එය පැහැදිලි වෙයි. ඔහු රස විද්‍යාඥයෙකුගේ විද්‍යාගාරයක් ද රැගෙන වරක් මකොන්දෝ වෙත එන විට වේගයෙන් මහලුවෙමින් සිටි බවක් පෙනී යයි. එහෙත් ඊළඟ වතාවේ ඔහු එන විට තාරුණ්‍යයෙන් පිරී සිටියි. පළමු වර එන විට ඔහුට ශිතාදරෝගය වැළඳී දත් හැලී තිබුණ නමුත්, දිදුලන දත්වලින් සිනාසෙයි. ඔහුගේ කෘත්‍රිම දත් කුට්ටම පරීක්ෂා කරන්නට ලැබෙන්නේ හොසේ ආර්කාදියෝ බුවෙන්දියාට පමණි. අනෙක් මකොන්දෝ වැසියන් කෘත්‍රිම දත් කුට්ටම ගැන නොදන්නා නිසා ඔවුන්ට මෙල්කියාදේසි පෙනෙන්නේ මහලු වියේ සිට තාරුණ්‍යය වෙත කාලයට විරුද්ධව ගමන් කරන්නෙකු ලෙසය. මෙහිදී ගාර්සියා මාර්කේස් මෙල්කියාදේස් විස්තර කරන්නේ මකොන්දෝ වැසි ගැමියන්ගේ දෘෂ්ටි කෝණයට අනුවයි. ඔවුන්ගේ ඥාන මීමංසාත්මක අඩවියේ සිටය.

මෙල්කියාදේස් මකොන්දෝ වාසීන් අතර සදාකාලිකව සිටින නිසාද, ඔහු කාලය පිළිබඳ චක්‍රීය සංකල්පයක් නියෝජනය කරයි. ලෝකය පුරා ඇවිදින ඔහු ජාවා රටේදී මිය යයි. ඔහුගේ ගෝත්‍රය පෘථිවිය මතින් සඳහටම

වඳවී යයි. එහෙත් ඔහු මකොන්දෝ වාසීන් අතර තවමත්, ජීවත්වෙයි. ඒ අතින් ඔහු අයත් කාලයට නොව සාදාකාලයටයි. නැතිනම් ඔහු කාලයට සහ සදාකාලයට එකවර අයිති වෙයි. උදාහරණයක් සලකා බලමු.

වරක් මකොන්දෝ වැසියන්ට අමතකවීමේ වසංගත රෝගයක් බෝවෙයි. සියලු දෙනාට සියලු දේ අමතක වෙයි. සෑහෙන කාලයකට පසුව, මකොන්දෝ වැසියන් තම මතකය යළි ලබා ගනිමින් සිටින අතර, මෙල්කියාදේස් මහලු පෙනුමකින් යුතුව යළි මතුවෙයි. එහෙත් කිසිවෙක් ඔහු හඳුනා නොගනිති. මෙල්කියාදේස් අමතකව වසංගතයට ගොදුරු වූ හොසේ ආර්කාදියෝ බුවෙන්දියා මුණ ගැසෙන අවස්ථාව ගාර්සියා මාකේස් මෙසේ විස්තර කරයි:

> "මෙල්කියාදේස් ඉතා පෘථුල ස්නේහයක් පෙන්නමින් බුවෙන්දියාට ආචාර කළේය. කලෙක තමා දැන සිටි බුවෙන්දියාට දැන් තමා අමතකව ඇතැයි යන බිය ඔහු වෙත විය. එහෙත් ඒ බිය වැරදි බව ඔහුම දැන සිටියේය. ඔහුට ද තමාවම අමතක වී ඇති බව ඔහුට හැඟුණේය. යළි ලබාගත නොහැකි, හදවතේ අමතකයෙන් නොව, ඊට වඩා කුරිරු, යළි යළි වෙනස්කළ නොහැකි, ඔහු හොඳින් දන්නා හඳුනන මරණයේ අමතකයෙන්, ඔහුව හොඳටම අමතක වී සිටියේය. එවිට ඔහුට සිදුවී ඇති දේ තේරුණේය. ඔහු සිය සූට් කේසය විවෘත කර එහි වූ කිරි කිරියේ අසුරා තිබූ පුංචි පුංචි ප්ලාස්කුවලින් යුතු පෙට්ටියක් එළියට ගත්තේය. ඔහු මුදු මොළොක් මද වර්ණයකින් යුතු යම් බීමක් හොසේ අර්කාදියෝ බුවෙන්දියාට බොන්නට දුන්නෙන් ඔහුගේ මතකය ආලෝකවත් විය" (ගාර්සියා මාකේස් 1991: 50).

මෙසේ යළි මතකය ලබන අර්කාදියෝ බුවෙන්දියා මේ පැමිණ සිටින මිනිසා මෙල්කියාදේස් බව හඳුනාගනියි. අමතකවීමේ වසංගතයත්, මෙල්කියාදේස් පැමිණ ඔවුන්ට නැවත මතකය ලබාදීමත් යන සිදුවීම් දෙකම නවකතාව තුළ භාවිත වන්නේ චක්‍රීය කාලයක් පිළිබඳ හැඟීමක් දෙන පරිද්දෙනි. නොඑසේ නම්, රේඛීය කාලය මත චක්‍රීය කාලය හසුරුවන උපක්‍රමයක් ලෙසය.

ඉහත උද්ධෘතයේදී ගාර්සියා මාර්කේස් මෙල්කියාදේස් මරණයේ සිට ආපසු එන බව සංකීර්ණ වැකියක ලා කියයි. මෙල්කියාදේස් මරණයේ සිට ආපසු එන බව මාකොන්දෝ වැසියන්ට හැඟීයාමත්, ඔවුන්ගේ මතකය නැති වී ගොස් යළි හමුවීමත්, රූපකාර්ථයෙන් ගත් කල එක සමානය. අමතකවීම හා මරණය සංකේතමය වශයෙන් සමානාර්ථවත්ය. ඒ දෙකම එදිනෙදා පැවැත්මේ රේඛීයත්වය විසන්ධි කරයි.

තවද මෙල්කියාදේස් 'මියයන' විට මකොන්දෝ වැසියන්ට ජීවිතය අමතකවීම එකම කාසියේ දෙපැත්තක් ලෙස නවකතාව තුළින් අර්ථකථනය කළ හැකිය. ඊට හේතුව ඇත්තේ *One Hundred Years of Solitude* නවකතාවේ ඉතා සංකීර්ණම අංගයක් තුළය. ඒ මෙසේය, නවකතාවට අනුව හොසේ ආර්කාදියෝ බුවෙන්දියාගේ පවුලේ පරම්පරා තුනක ජීවිතය මෙල්කියාදේස් කලින්ම පොතක ලියා ඇත. ඔහු එය ලියා ඇත්තේ ඔහුගේ 'මව් බස' වන සංස්කෘතයෙනි (ගාර්සියා මාකේස් 1997: 42). එම ලේඛනය තුළ මෙලකියාදේස් ආර්කාදියෝ බුවෙන්දියා පවුලේ වසර සියයක කතාව පෙර දැක, වාර්තා කර තිබේ. මෙම අත්පිටපත මෙල්කියාදේස් එම කතාවෙහි 'මහගෙදර' දමා යයි. අර්කාදියෝ බුවෙන්දියා පවුලේ පිරිමින්ට එය ලියැවී ඇති සංස්කෘත භාෂාව නොතේරේ. නවකතාව අවසන් වන විට එම පවුලේ තුන්වැනි පරම්පරාවේ කෙනෙක් එම අත්පිටපත ස්පාඤ්ඤ බසින් ලියා ඇතුවාක් මෙන් පහසුවෙන් කියවයි. එහි ලියැවී ඇත්තේ ඒ දක්වා

ගත වී ගිය ඔවුන්ගේම ජීවිතයයි. එනම් ඔවුන් එතෙක් කල් කර ඇත්තේ මෙල්කියාදේස් ලියූ පොත රඟ දක්වීමයි. එහෙත් මකොන්දෝ වැසියන් එය තේරුම් ගන්නේ ඒ පොතේ අවසන් පිටුව දක්වාම ඔහුගේ ජීවිතය ද ගත වූවාට පසුවයි. එවිට මෙල්කියාදේස්ගේ අත් පිටපතත්, ගාර්සියා මාර්කේස්ගේ නවකතාවත් එකක්ම බවට පත්වෙයි. මෙලෙසින් නවකතාව ඉතා සංකීර්ණ කාල මානයක් හිමිකර ගනියි.[13] මෙම කාල මානය ඉතිහාසවාදිත්වයෙන් තොරය. ඉතිහාසය සිදුවූ දෙය වාර්තා කරන්නක් නම් මේ වූ කලී සිදුවන දෙය වාර්තා කිරීමකි.[14] නැතිනම්, ඒ දෙකේම ආශ්චර්යාත්මක මිශ්‍රණයකි.

මෙල්කියාදේස් විසින් නියෝජනය කරනු ලබන කාලය පිළිබඳ මානය තව දුරටත් සංකීර්ණ කරන කරුණක් අවධානයට ලක් කළ මනාය. ඔහු මෙවර මකොන්දෝව වෙත එන්නේ ඩෙගරොටයිප් නමැති ප්‍රාථමික කැමරාවකුත් රැගෙනය. රසායනික ද්‍රව්‍යයක් ආලේපයෙන් රිදී හෝ තඹ තහඩුවක් මතට ඉන් ඡායාරූප ගත හැකිය. මෙය නූතන කැමරාවේ ළමා වියට අයත්, දහ නම වැනි සියවසේ නිපදවූ උපකරණයකි. මේ වූ කලී මෙල්කියාදේස් මකොන්දෝ වෙත රැගෙන එන අලුත්ම උපකරණයයි. මකොන්දෝව වෙත විද්‍යාත්මක නූතනත්වය රැගෙන එන්නේත්, ආදි කල්පිකත්වය නියෝජනය කරන්නේත් මෙල්කියාදේස්ය. එහෙයින් ඔහු තුළ නූතනත්වය සහ ආදිකල්පිකත්වය සහපැවැත්මක යෙදේ. ඒ අතිනුත් ඔහු කාලය පිළිබඳ රේඛීය නොවූ අදහසක් නියෝජනය කරයි. සංස්කෘතය මව් බස වූ, නූතන තාක්ෂණය පිටිසර දකුණු ඇමෙරිකානු රටකට ගෙනයන, මෙල්කියාදේස් යන ස්පාඤ්ඤ නමකින් යුතු ඔහු රේඛීය කාලය, සහ සම්මත ඉතිහාසය පිළිබඳ සියලු සංකල්ප අභියෝගයට ලක් කරයි.

තවද, මෙල්කියාදේස් සිය ඩෙගරොටයිප් කැමරාවෙන් ආර්කාදියෝ බුවෙන්දියා පවුලේ ඡායාරූපයක් ගනියි. මෙම ඡායාරූපය ද නවකතාවේ

රචිතය තුළ කාලය පිළිබඳ සංකේතාත්මක අර්ථයකට ජීවය දෙයි. ඡායාරූප යනු කාලය රාමුකර අවකාශය තුළට කැටි ගසන ක්‍රමයකි. ආර්කාදියෝ බුවෙන්දියා පවුලේ ඡායාරූප යනු ඔවුන්ගේ අතීතය වර්තමානය තුළට ඊ ගෙන එන ක්‍රමයකි. අනාගතය වෙත රැගෙන යන ක්‍රමයකි. ඒ ඡායාරූප දකින, ඡායාරූප ශිල්පය ගැන එතෙක් නොදුන සිටි ආර්කාදියෝ බුවෙන්දියාගේ ස්වභාවය වෙනස් කරන ගාර්සියා මාර්කේස් මෙසේ ලියයිඃ "..... තමා සහ තම පවුලේ අය ඒ දිලිසෙන තහඩුව මත සදාකාලයට අමුණා ඇති සැටි දුටු ඔහු විස්මයෙන් ගොළු විය (ගාර්සියා මාකේස් 1991)." පරිවර්තනය පරදවන එම වැකියෙන් ඒ ඡායාරූපය ආර්කාදියෝ බුවෙන්දියා පවුල කාලයේ සිට සදාකාලිකත්වයට ගෙන ගොස් ඇති බව කියයි. ඒ ඡායාරූපය යනු අතීතය වර්තමානය වෙත ගෙන යන සහ කාලය අවකාශය තුළට පාස්සන උපක්‍රමයක්ය යන මගේ තර්කයට ඒ නිසා කෘතියෙන් ද සහයක් ලැබේ.

අප මෙතෙක් සාකච්ඡා කළේ ආශ්චර්යාත්මක යථාර්ථවාදය කාලය පිළිබඳ අපගේ සම්මත අදහසට අභියෝග කරයි: එය විප්ලවයකට හසු කරයි යන තිසීසයයි. ගාර්සියා මාකේස්ගේ රචනා ශෛලිය ද කෘතිය මගින් ප්‍රකාශ කරන කාලය පිළිබඳ (සහ අවකාශය පිළිබඳ) චක්‍රීය සංකල්පය තියුණු කරයි. නිදසුනක් වෙත යමු. පහත සඳහන් වන්නේ *One Hundred Years of Solitude* නවකතාවේ පළමු වැකියයිඃ

> "වසර ගණනාවකට පසු, කර්නල් ඖරෙලියානෝ බුවෙන්දියා, මරණ දණ්ඩක භටයන්ගේ තුවක්කුවට මුහුණ දෙන විට ඔහුට ඉතා ඈත දවසක හවසක සිය පියා කෘත්‍රිම අයිස් බලන්නට ඔහු රැගෙන ගිය සැටි සිහියට නැගුණි."[15]

මෙම වැකිය, අතීතයත්, වර්තමානයත්, අනාගතයත් එකට ඈඳයි. එය ලියන මොහොතේ කථකයා සිටින්නේ වර්තමානයේය. මෙම වැකියෙන් පසු කථකයා හොසේ අර්කාදියෝ බුවෙන්දියා පවුලේ අතීතය විස්තර කිරීම අරඹයි. නවකතාව ඇරඹෙන්නේ ලෝකයේ අටවැනි පුදුමය ලෙස හඳුන්වමින් මෙල්කියාදේස් ගැමියන්ට පෙන්වූ අයිස් බලන්නට සිය පුතුන් ද සමග ආර්කාදියෝ බුවෙන්දියා යන සැටි විස්තර කරමිනි. කර්නල් ඖරෙලියානෝ බුවෙන්දියාගේ දෙවන පුතාය. ඔහු සිවිල් යුද්ධ ගණනාවක් මෙහෙයවන්නේත්, ඒ සියල්ල පරදින්නේත්, අවසන වෙඩි තබා දමනු ලබන්නේත් නවකතාවේ අවසන් භාගයේය. එනම්, නවකතාව ආරම්භයේ සිට බලන කල මේ සිද්ධිය සිදුවන්නේ අනාගතයේදීය. එහෙත් කථකයා ඒ තීරණාත්මක අනාගත සිදුවීම පළමු වැකියෙහිම අඩංගු කරයි. මෙම රචනා උපක්‍රමය 'පෙර ඉඟිදීම' යැයි සිංහලයෙන් හැඳින්විය හැකිය. කෙසේ හැඳින්වුවත් එම උපක්‍රමය මගින් කෙරෙන්නේ කාලයේ රේඛීය ස්වභාවය බිඳීමයි. එම වැකිය තුළ වර්තමානයත්, අනාගතයත්, එකට මුණ ගැසෙයි. එකිනෙකා වෙත සුහදව සිටියි. මෙවැනි අවස්ථා ගණනාවක් නවකතාව පුරාම හමුවෙයි. අරුන්දතී රෝයි *God of Small Things* (සිල්ලර දෙවියෝ, 2000) නවකතාවේදී මෙම උපක්‍රමය ආකර්ෂණීය ලෙස භාවිත කරන බවද අප මතක තබා ගත යුතුය.

මෙල්කියාදේස් කාලය ගැන පමණක් නොව අවකාශය සම්බන්ධයෙන් ද සම්මතය ඉක්මවන අදහසක් නියෝජනය කරයි. මකොන්දෝව යනු එහි මුල්කාලයේදී ලෝකයෙන් මුළුමනින්ම වෙන් වූ කුඩා ජනාවාසයකි. ගෙවල් කිහිපයකින් යුතු ගමකි. මෙල්කියාදේස් මේ කුඩා ගම සහ සෙසු ලෝකය තුළ එකවර වසන බවක් පෙනී යයි. ආසියාවේ ගිනිකොන දිග කොටසේ ජාවා දූපතේදී මිය යන ඔහු ඇමෙරිකා මහද්වීපයේ වයඹ දිග කොනේ කොලොම්බියාවේ තවමත් ජීවත් වෙයි. ජාවා රටට කෙසේ

වෙතත්,[16] කොලොම්බියාවට අමුතු බසක් වන සංස්කෘතයෙන් ඔහු ආර්කාදියෝ බුවෙන්දියා පවුලේ ශත වර්ෂයක ජීවිතය ලියා තබයි. කොලොම්බියාවට සංස්කෘත භාෂාව යනු අපගේ සම්මත අවකාශය පිළිබඳ අවබෝධය හා එකඟ නොවන්නකි. අනුරාධපුරයට පාලි බසත්, කොලොම්බියාවේ සංස්කෘත බසත් එකක් නොව දෙකකි. පළමු වැන්න අවකාශය ගැන අපගේ ඓතිහාසික අවබෝධයට එකඟය. දෙවැන්න ඊට පටහැණිය. දෙවැන්න ප්‍රබන්ධගත කරන ලද අවකාශය පිළිබඳ හැඟීමකි.

කාලය, අවකාශය මෙන්ම අනන්‍යතාව පිළිබඳ සම්මත අදහසක් ආශ්චර්යාත්මක යථාර්ථවාදය විසින් අභියෝගයට ලක් කෙරෙන බව අපි ඉහතින් සඳහන් කෙළෙමු. මෙතෙක් විස්තර කළ නිදර්ශන තුළම ඒ අදහස ද ප්‍රකාශ වී ඇතත්, එය යළි අවධාරණය කළ හැකිය. ඉන් අදහස් වන්නේ 'කවුරු' සහ 'කවුද' යන ප්‍රශ්නවලට සෘජු පිළිතුරු නැති බවයි. *ගම්පෙරළියේ* පියල් නවකතාවේ මුල සිට අග දක්වාම පියල්ය. එහෙත් මෙල්කියාදේස් එසේ නොවේ. ඔහු විටෙක නූතන විද්‍යා තාක්ෂණයේ දූතයාය. විටෙක පැරණි භාෂාවලින් පොත් ලියන ශාස්ත්‍රධරයාය. සදාතනික සංචාරකයාය. විටෙක අනාවැකි කියන්නෙකු වන ඔහු තවත් විටෙක ජනයා විනෝද කරන මැජික් කාරයෙකි. ඔහු කවුද යන ප්‍රශ්නයට පෙරළා පිළිතුරු නැත. ඔහු විටෙක මේ සෑම දෙනාමය. සයිමන් නවගත්තේගමගේ නවකතා කිහිපයකම දැකිය හැකි දඩයක්කාරයාගේ චරිතය තුළ ද මීට සමාන ලක්ෂණ ඇත. ඔහු විටෙක සමස්ත මිනිසාගේ පිතෘවරයාය. තවත් විටෙක හාමුදුරුවන්ගේ ඇබිත්තයාය. තවත් විටෙක භාවනානුයෝගීව වානප්‍රස්ථව වසන ශ්‍රමණයෙකි. ඔහු එකවිටෙක මේ සියලු දෙනාමය. *සංසාර ආරණ්‍ය අසබඩ* නවකතාවේ ආගන්තුකයාද මෙවැනි ලක්ෂණ සහිත වන අතර, ඔහු උගතෙකි. ශිෂ්‍යයෙකු හා ශාස්ත්‍රවන්තයෙකු ලෙස ද ඔහු ඉස්මතු වේ (නවගත්තේගම 1998). *One Hundered Years of Solitude* හා සළකා බලන කල

*සංසාර ආරණ්‍ය අසබඩ ඉතා සරල ප්‍රබන්ධයක් බව පෙනෙනත්,* 'අනන්‍යතාව' පිළිබඳ ප්‍රශ්නය වටහා ගැනීමට එය ඉතා ප්‍රයෝජනවත්ය. සමහර විට ආශ්චර්යාත්මක යථාර්ථවාදී නවකතාවේ චරිතවල අසම්මත අනන්‍යතාව පිළිබඳ හොඳම නිදර්ශනය රුෂ්ඩිගේ *Midnight's Children* හි සලීම් සිනායි විය හැකිය. ඉන්දියාවට නිදහස ලැබුණ දින මධ්‍යම රාත්‍රියෙහි දරුවෝ දාහක් උපදිති. සලීම් සිනායි ඉන් එක් අයෙකි. එහෙත් අර දරුවන්ගෙන් බොහෝ දෙනෙක් විටින් විට සලීම් සිනායි තුළින් කතා කරති. සලීම් සිනායිගේ සිරුර වාහනය කරගෙන පෙනී සිටිති. එවිට සැබෑ සලීම් සිනායි කවුද යන අනන්‍යතාව පිළිබඳ ප්‍රශ්නය පැන නගියි.

## සමාප්ති සටහන්: ආශ්චර්ය, යථාර්ථය හා යුරෝ-කේන්ද්‍රීය දේශපාලනයේ සීමා

මෙතෙක් කරන ලද නිර්වචනාත්මක සාකච්ඡාවේ අරමුණ වූයේ සාහිත්‍යික යථාර්ථවාදය වෙත වූ මූලික ගුණාංග මුළුමනින්ම අත්හැරයාමක් ආශ්චර්යාත්මක යථාර්ථවාදයෙන් අදහස් නොවන බව පෙන්වාදීමය. එහෙත් magic realism හෙවත් ආශ්චර්යාත්මක යථාර්ථවාදය යනුවෙන් අදහස් කරන දෙය සහ එය ඉදිරිපත් කරන ව්‍යූහමය සහ ශෛලිය පිළිබඳ අංග බෙහෙවින් වෙනස්ය.

අපි නැවතත් ආශ්චර්යාත්මක යථාර්ථවාදයේ මහර්ඝ කෘතිය හැටියට ඇතැම් විචාරකයන් හඳුන්වන (මෙලන් 2000) *One Hundred Years of Solitude* හි යථාර්ථවාදී ලක්ෂණ වෙත ආපසු යමු. මෙම ලිපියෙහි මුලින්ම උපුටා දක්වන ලද ගාර්සියා මාර්කේස්ගේ ප්‍රකාශයෙන් ඔහු කීයේ ඔහු මායාවී කතා ලියන්නෙකුගේ ගොඩට නොදමන ලෙසයි. 1987 දී පමණ කළ ඒ ප්‍රකාශයෙන් ලේඛකයෙකු ලෙස ඔහු සතුව ඇති වගකීම් සහගත බව ගම්‍ය

වේ. එක් අතකින් ඔහු අනතුරු අඟවන්නේ ලතින් ඇමෙරිකාව වැනි දේශපාලන-ආර්ථික පරිපීඩනයන්ගෙන් ගහන, යුරෝපීය යටත්විජිතවාදය විසින්ම ඛේදජනක යථාර්ථයක් වෙත ඇද දමන ලද දේශයක් වෙතින් මතුවන සාහිත්‍ය දවල් සිහිනමය මායා කතා ලෙස නොකියවන ලෙසය. *හැරි පොටර්* කතා මාලාව වැන්නක් ලෝකය පුරා නොගැඹුරු හා මෝස්තරකාර උමතුවක් ජනිත කර ඇති අද දින ගාර්සියා මාර්කේස් විසි වසරකට පෙර කළ එකී අනතුරු ඇඟවීමේ දේශපාලනික ඇඟවුම සහ දුරදක්නා ස්වභාවය වඩාත් හොඳින් පැහැදිලි වෙයි. සිය තර්කය තවත් පැහැදිලි කරමින් ඔහු මෙසේද කීවේය: "ගැටලුව මේකයි, හුඟක් මිනිස්සු හිතනවා මම මායාවී කතා ලියන ලේඛකයෙක් කියලා. මම ඇත්තටම යථාර්ථවාදියෙක්. මම ලියන්නේ සැබෑ සමාජවාදී යථාර්ථවාදය යැයි මං විශ්වාස කරන දේ" (උපුටා ගන්නා ලද්දේ ලෙවිට්ගෙනි 1989). මෙම ප්‍රකාශයෙහි දේශපාලනික සහ දාර්ශනික ඇඟවුම් නිවැරදිව හඳුනාගැනීමේ වගකීම අප වෙත තිබේ. නැතිනම්, එය අප වැනි රටක ඊනියා ජනතාවාදීන්ගේ බැනරයක් බවට පත්වන්නට පුළුවන. ඔහු ඉන් අදහස් කරන්නේ ඔහුගේ කෘති, විශේෂයෙන්ම *One Hundred Years of Solitude* කොලොම්බියාවේ දේශපාලන ඉතිහාසය හා සම්බන්ධ බවත්, නවකතාවේ මකොන්දෝවේ නැගීම හා බැසීම කොලොම්බියාවේ නැගීම හා බැසීමට සමාන්තර බවත් මෝර්ටන් පී. ලෙවිට් සහ ප්‍රකට පෙරුවියානු ලේඛක මරියෝ වර්ගාස් යෝසා පෙන්වා දෙයි (ලෙවිට් 1989). කොලොම්බියානු සිවිල් යුද්ධය, උතුරු ඇමෙරිකානු කෙසෙල් වතු කොම්පැනි කොලොම්බියාවේ කළ මහා සූරාකෑම, ඊට එරෙහිව නැගුණු ජනතා විරෝධය ආදිය *One Hundred Years of Solitude* හි අඩංගු වේ. මේ අංග වූ කලී සාහිත්‍යික යථාර්ථවාදයෙහි අංගය. එහෙත් යථාර්ථවාදයට අදාළ මේ ඓතිහාසිකත්වය[17] ගාර්සියා මාකේස් ඉදිරිපත් කරන්නේ ලතින් ඇමෙරිකානු සාමාන්‍ය ජනයාගේ

දෘෂ්ටි කෝණය යැයි කිවහැකි ඥාන මීමංසාත්මක ප්‍රවේශයකිනි. ඔහු සැබෑ සමාජවාදී යථාර්ථවාදියෙකියි තමා හඳුන්වාගැනීමේ දාර්ශනික අර්ථය නම්, එයයි. එම දාර්ශනික ආස්ථානය යුරෝපීය යථාර්ථවාදයේත්, යුරෝපයේ යටත්විජිතවාදයේත් දෘෂ්ටිවාදය වන සමස්ත විශ්වයටම අදාළ තනි, සජාතිය යථාර්ථයක් ඇතැයි යන අතිශය පටු දේශපාලනික දෘෂ්ටිවාදයට එරෙහිව සිටියි. එහෙයින් ගාර්සියා මාකේස්ගේ දාර්ශනික ආස්ථානය දේශපාලනික ආස්ථානයක් බවට පත්වෙයි. ඔහු තමා 'සැබෑ' සමාජවාදී යථාර්ථවාදියෙකියි කියන්නේ 'බොරු' සමාජවාදී යථාර්ථවාදයක් ද ඇතැයි ඔහු විශ්වාස කරන නිසාය. ඔහු අඟවන ඒ 'බොරු' සමාජවාදී යථාර්ථවාදය නම් සමස්ත විශ්වයටම අදාළ යථාර්ථයක් ඇතැයි යන සම්භාව්‍ය සමාජවාදයේ/ මාක්ස්වාදයේ යුරෝ කේන්ද්‍රිය මහා ආඛ්‍යානයයි. ලංකාවේ ප්‍රචලිත ජනතාවාදය, සමාජ සත්තා යථාර්ථවාදය ආදිය යටකී යුරෝ කේන්ද්‍රිය මහා ආඛ්‍යානයේම දරිද්‍ර පිටපත් මිස අන් යමක් නොවේ. යුරෝ කේන්ද්‍රිය විශ්විය ඉතිහාසයක් පිළිබඳ දෘෂ්ටිවාද සිදුරු කර කපා බස්නා මුවහත සහිත සම්භාෂණයක් නිපදවීමට අප රටේ චමේ ව්‍යාපාරය හෝ අන් සමාජ දේශපාලන ව්‍යාපාර අසමත් වී ඇත. එලෙසම විජාතික දෘෂ්ටිවාද පරදවන චින්තනයක් තමන්ට ඇතැයි කියන ජාතික චින්තන ව්‍යාපාරයේ සාහිත්‍යධරයා වන ගුණදාස අමරසේකර ප්‍රබන්ධ රචකයෙකු ලෙස තවදුරටත් යථාර්ථවාදයේම රැඳී සිටිනු පමණක් නොව, විවිධ පශ්චාත් යථාර්ථවාදී ප්‍රවණතා උපහාසයට ලක් කරන ආකාරය ද දැකිය හැකිය.

මායා යථාර්ථවාදය ලෙස ලංකාවේ ප්‍රචලිත ආශ්චර්යාත්මක යථාර්ථවාදය පිළිබඳ සැබෑ ගැඹුරු කතිකාවක් යථාර්වාදයෙන්ම පටන් ගැනීම නම් අවශ්‍යයෙන්ම කළ යුත්තකි. යථාර්ථවාදය යනු 19 වැනි සියවසේ යුරෝපයේ පහළ වූ යුරෝපය වෙතින් සෙසු ලෝකයා වෙත පිදෙන මහඟු දායාදයක් ලෙසත්, සාහිත්‍යික යථාර්ථවාදය යනු තනි, සජාතිය

සංකල්පයක් ලෙසත් සිංහල සාහිත්‍ය ලෝකය තුළ පතළ වූයේ යථාර්ථවාදය පිළිබඳවම පවා පොහොසත් සම්භාෂණයක් අප සතු නොවූ බැවිනි. ඒ නිසා සම්භාව්‍ය මාක්ස්වාදයේ යථාර්ථවාදය පිළිබඳ න්‍යායධරයා වන ජෝර්ජ් ලුකාශ්ගේ අදහස් පමණක් ප්‍රචලිත විය. අශිෂ් නන්දි වැන්නන් ඉන්දියාවේදී කළාක් මෙන් (නන්දි 1998) ලුකාශ් වැන්නන්ගේ මතවල යුරෝ කේන්ද්‍රීයත්වය ප්‍රශ්න කොට යථාර්ථය වූ කලී සජාතිය, කේවල ප්‍රපංචයක් නොවන බව පෙන්වාදීමට අපට කිසිවෙක් නොවීය.[18] එහෙත් යුරෝපීය යථාර්ථවාදයම පවා කේවල, සජාතිය හෝ සාර්වත්‍රික එකක් නොවුණ බව ඇමෙරිකානු විචාරක ජෝර්ජ් ලෙවින් බරපතළ ශාස්ත්‍රීයතාවයකින් යුතුව පෙන්වා දෙයි. ඔහුගේ තර්කයට අනුව 19 වන සියවසේ බ්‍රිතාන්‍ය නවකතාවේ යථාර්ථවාදය ප්‍රංශ යථාර්ථවාදයට වෙනස්ය (ලෙවින් 1980). එම සියවසේ ඉංග්‍රීසි නවකතාකරුවන් යථාර්ථවාදයේ ව්‍යුහයීය සීමා ගැන සවිඥානිකව, ඒවා මග හැර යන මං යථාර්වාදය තුළම සිට අන්හදා බැලූ බව ලෙවින් තර්ක කරයි (ලෙවින් 1989). එසේ නම් යථාර්ථවාදය යැයි තනි, කේවල, සජාතීය මහා ආඛ්‍යානයක් ඇතැයි අප විශ්වාස කළ යුත්තේ ඇයි? ප්‍රශ්නයට එලෙස එළඹුණ කල අස්වභාවික සිද්ධීන්ගෙන් ගහන නවකතා ලියන ගාර්සියා මාර්කේස් තමා යථාර්ථවාදියෙකියි කියන කියුම තේරුම් ගැනීම අසීරු නැත. ඔහු යථාර්ථවාදියෙකි. නමුත් ඔහු යුරෝපීය-යථාර්ථවාදියෙක් නොවේ. යථාර්ථවාදය ගැන සිතීමේදී යුරෝපය ආදර්ශ රූපය කොට ගැනීම, නිර්ණායක ලෙස සැලකීම, වහා අත්හැර දැමීම යථාර්ථවාදය සම්බන්ධයෙන් පවා ප්‍රතිඵලදායකය. ඒ වූ කලී 'යුරෝපය ප්‍රාදේශීයකරණය' කිරීමේ ව්‍යාපෘතිය සාහිත්‍ය න්‍යාය තුළට ගෙන ඒමකි.[19] එවන් සම්භාෂණයක් මගින් 'මැජික් රියලිස්ම්' පශ්චාත් යථාර්ථවාදයක් ලෙස තේරුම් ගැනීමට ආලෝකයක් ලැබෙනු ඇත. පශ්චාත්-යථාර්ථවාදය වූ කලී යථාර්ථවාදයට පසුව එන්නකි, ඊට එරෙහි වන්නක, එහිම දිගුවකි. යථාර්ථවාදය මිනිස්

සමාජය වෙත වූ පොරොන්දුවලින් සමහරක් නවදුරටත් ආරක්ෂා කරන්නනි. එකවර මේ සියලු අංග ඒකගන්නා පශ්චාත් යථාර්ථවාදයක් ලෙස 'මැජික් රියලිස්ම්' ඉදිරියෙන්ම සිටියි. එහෙයින් එය ආශ්චර්යාත්මක යථාර්ථවාදය ලෙසම මිස අන් ලෙසකින් හැඳින්විය නොහැකි යැයි මම සිනමි.

## පසු සටහන්

[1] ජනතාවාදී යන යෙදුම එතරම් නිරවුල්ව භාවිත වන බවක් නොපෙනේ. ඉන් මා අදහස් කරන්නේ ජනතා ප්‍රශ්න තේරුම්ගත් ජනතා වීරයෙකු තමා ජීවත්වන පරිසරය වෙනස් කිරීම උදෙසා සටන් කරන සැටි පෙන්වන කාල්පනික 'සමාජවාදී' ප්‍රබන්ධයන්ය. එනම් සාහිත්‍ය මගින් ජනතා සමාජ ප්‍රශ්නවලට විසඳුම් සෙවිය හැකිය යන දෘෂ්ටි විද්‍යාත්මක එළඹුම සහිත ප්‍රබන්ධයන්ය. පොදු ජනයාගේ ජීවිතය විවරණය කෙරෙන, දේශපාලනික අර්ථවලින් යුතු සෑම ප්‍රබන්ධ කතාවක්ම ජනතාවාදී ලෙස සැලකීම ඇතැම් සිංහල පුවත්පත් විචාරකයන් අතින් සිදුකෙරෙන වරදකි.

[2] 18 වැනි සියවසේදී යථාර්ථවාදී මාදිලියේ නවකතාවේ නැග්මට දාර්ශනික පසුතලය සැපයුවේ රෙනෙ ඩෙස්කාටෙස් (1596-1650) සහ ජෝන් ලොක් (1632-1700) ආදීන්ගේ අනුභූතිකවාදී (empiricist) දර්ශන පද්ධතීන් බව ඉයන් වොට් සිය *The Rise of the Novel* (නවකතාවේ නැගීම) කෘතිය තුළ සවිස්තරව පෙන්වා දී ඇත (වොට් 1957: 12).

[3] ඉයන් වොට් *The Rise of the Novel* කෘතිය තුළ ප්‍රධාන වශයෙන් මෙම තර්කය මතු කරයි. සිංහල නූතන සාහිත්‍ය කතිකාවට හුරු පුරුදු මෙම කෘතිය, විය යුතු තරම් සමීපව සහ අර්ථවත්ව සාකච්ඡාවට ලක් කෙරී නැත.

[4] ඉයෝන් විලියම්ස්ගේ *The Realist Novel in England* (එංගලන්තයේ යථාර්ථවාදී නවකථාව) නමැති 1974 දී පළවූ කෘතියෙහි මූලික තර්කය වන මෙය ඇමෙරිකානු

විචාරක ජෝර්ජ් ලෙවින් සිය *The Realistic Imagination* (යථාර්ථවාදී පරිකල්පනය, 1981) කෘතියෙන් අභියෝගයට ලක් කරයි.

[5.] සල්මාන් රුෂ්ඩි ඉස්ලාමීය මූලධර්මවාදයට විරුද්ධව ලියූ ඇතැම් පුවත්පත් ලිපි ඔහුගේ ලිපි එකතුවක් වන *Step Across this Line* (මේ ඉරෙන් ඔබ්බට පියනගන්න, 2002) හි අඩංගු වේ.

[6.] තර්කවාදය = rationalism.

[7.] ස්වදේශීය ඇමෙරිකානු (Native American) යනු යුරෝපීය ජනයා ඇමෙරිකානු මහාද්වීපයට එන විට එහි සිටි ජන පිරිසයි.

[8.] යුරෝපීය විද්‍යාත්මක තර්කනයට ලෝකයේ කිසිම ප්‍රදේශයක, එමෙන්ම යුරෝපයේම පවා, අතාර්කිකත්වය සහ අස්වාභාවිකත්වය ලෙස සලකන දේ සම්පූර්ණයෙන් පලවා හරින්නට හැකි වී ඇත් ද යන්න සමාජ විද්‍යාත්මකව වැදගත් ප්‍රශ්නයකි.

[9.] මෙම යෙදුම මුලින්ම චිත්‍ර කලාව සම්බන්ධයෙන් ෆ්‍රාන්ස් රෝ විසින් 1925 දී නිපදවන ලදී. එහෙත් එම අදහස ප්‍රබන්ධ කතාව විෂයෙහි භාවිත කළේ කාර්පෙන්ටියර් බව විද්‍යාර්ථීන්ගේ අදහසයි.

[10.] කාර්පෙන්ටියර්ගේ ඇතැම් අදහස් සිංහල පාඨකයා වෙත ගෙන එනු පිණිස මා විසින් නිදර්ශන ගත්වා ප්‍රතිරචනය කැරිණි. වැඩි විස්තර සඳහා කියවන්න වෙන්ඩි බී. ෆාරිස් හා ලුවිස් සමෝරා සංස්කරණය කළ *Magical Realism: Theory, History and Community* (ආශ්චර්යාත්මක යථාර්ථවාදය: න්‍යාය, ඉතිහාසය සහ ප්‍රජාව, 1995).

[11.] ගාර්සියා මාකේස් තමා ඒ තිදෙනාගෙන් ලබාගත් ආභාසය පිළිබඳව විවිධ අවස්ථාවල සඳහන් කර ඇත. අමතර තොරතුරු සඳහා කියවන්න, ගාර්සියා මාකේස් හා මෙන්ඩෝසාගේ *Fragrance of Guava* (පේර ගෙඩියේ සුවඳ, 1982) සහ පී. බෝල්ඩ්වින්

ස්ටැන්ලිගේ *Gabriel Garcia-Marquesz: Life and His Work* (ගේබ්‍රියෙල් ගාසියා මාකේස්: මිනිසා සහ ඔහුගේ කෘති, 1988).

[12] සයිමන් නවගත්තේගමගේ *සංසාර ආරණ්‍ය අසබඩ* (1998) නවකතාවේ ආගන්තුකයා එක් අතකින් මෙල්කියාදේස්ට සමානය. එහෙත් සාහිත්‍යික චරිතයක් ලෙස මෙල්කියාදේස් බෙහෙවින් සංකීර්ණය.

[13] මෙම උපක්‍රමය විස්තර කිරීම පවා අභියෝගාත්මක කාර්යයකි. එය නවකතාවට එක් කරන ගැඹුර සහ අවබෝධය වටහාගත හැක්කේ එය කියවීමෙන් පමණි.

[14] ඉතිහාසවාදීත්වය සහ යථාර්ථවාදී නවකතාව පිළිබඳ සාකච්ඡාවක් සඳහා බලය සඟරාවේ 2003 වසරේ මාර්තු, මැයි සහ ජූනි මාසවල පළවූ මගේ ලිපිය බලන්න.

[15] මගේ පරිවර්තනයේ අඩුපාඩු මගහැරවීම සඳහා ඉංග්‍රීසි වැකිය දක්වමි: "Many years later, as he faced the firing squad, Colonel Aureliano Buendia was to remember that distant afternoon when his father took him to discover ice" (ගාර්සියා මාකේස් 1991: 1).

[16]. ජාවා දූපත ඉන්දුනීසියාවේ කොටසකි. ඉස්ලාම් ධර්මයේ ව්‍යාප්තියට පෙර බෞද්ධ සහ හින්දු සංස්කෘතිය ව්‍යාප්තව තිබූ මලයාසියා, ඉන්දුනීසියා ප්‍රදේශය සංස්කෘත භාෂාවේ ආනුභාවයට යටත්ව තිබුණේය. තවමත් ඒ රටවල භාෂා තුළ බොහෝ දුරට සංස්කෘත තත්සම දකිය හැකිය.

[17]. හේඩන් වයිට් සිය *Metahistory* කෘතියේදී 19 වන සියවසේ යුරෝපීය යථාර්ථවාදය සහ ඉතිහාස අතර තිබූ සමීප සම්බන්ධය අතිමහත් ශාස්ත්‍රීය ගැඹුරකින් යුතුව පෙන්වා දෙයි.

[18]. රවින්ද්‍රනාත් තාගෝර්ගේ නවකතා පිළිබඳව වන අශිශ් නන්දිගේ *Illegitimacy of Nationalism* (ජාතිකවාදයේ අවජාතකත්වය, 1998) නම් කෘතිය යටත්විජිත ඉන්දියානු නවකතාවට අදාළ ඉන්දියානු යථාර්ථවාදයක් ගැන තර්ක කරයි.

[19] දීපේෂ් චක්‍රවර්ති සිය *Provincializing Europe* (යුරෝපය ප්‍රාදේශීයකරණය කිරීම, 2000) කෘතිය මගින් අපගේ සිතීමේ ක්‍රියාවලියේ කේන්ද්‍රය ලෙස යුරෝපය පැවතීමට එරෙහිව සිත් කාවදින සේ තර්ක කරයි. යුරෝපය පෘථිවියේ කේන්ද්‍රය නොව, එක් කුඩා ප්‍රදේශයක් පමණක් ලෙස චින්තනමය වශයෙන් අයිනකට කළ විට, අපගේ පරිකල්පනයට අපරිමිත නිදහසක් ලැබේ.

## ආශ්‍රිත පඨිත


Allende, Isabel.
1985. *The House of the Spirits.* Translated by Magda Bogin. New York: Alfred Knoff.

Bandaranayake, Senake & Gamini Jayasinghe
1986. *The Rock and Wall Paintings of Sri Lanka.* Colombo: Lake House Bookshop.

Baldwin-Stanley, P.
1988. Gabriel Garcia Marquez: Life and His Work. New York: Spark Publishing Company.

Carpentier, Ajelo.
1995. 'On the Marvelous Real in America.' In, Wendy B. Faris & Lois Zamora eds., *Magical Realism: Theory, History, Community.* Durham: Duke University Press.

Chakrabarthy, Dipesh.
2000. *Provincializing Europe.* Princeton. Princeton University Press.

Faris, Wendy B.
1995. 'Schererazade's Children: Magical Realism and Postmodern Fiction.' In, Wendy B. Faris & Lois Zamora eds., *Magical Realism: Theory, History, Community.* Durham: Duke University Press.

Faris, Wendy B. and Lois Samora (Eds.,)
1995. *Magical Realism: Theory, History, Community.* Durham: Duke University Press.

Garcia Marquez, Gabriel.
1991. *One Hundred Years of Solitude.* Translated by Gregory Rabassa. New York: Harper Perennial.

Garcia Marquez, Gabriel and Plino Mendoza.
1982. *The Fragrance of Guava*. Translated by Anne Wright. London: Verso.

Grass, Gunther.
1964. *The Tin Drum.* Translated by Ralph Manheim. New York: Vintage.

Levine, George.
1980. *The Realistic Imagination.* Chicago: University of Chicago Press.

Levitt, Morton P.
1989. 'Meticulous Modernist Fiction of Garcia Marquez.' In, Harold Bloom ed., *Modern Critical Views on Gabriel Garcia Marquez.* New York: Chelsea House.

Mellen, Joan.
2000. *Literary Topics: Magic Realism.* Farmington: Gale Group.

Roh, Franz.
1995. 'Magical Realism: Post-Expressionism.' In, Wendy B. Faris & Lois Zamora eds., *Magical Realism: Theory, History, Community*. Durham: Duke University Press.

Nandy, Ashis.
1998. *Illegitimacy of Nationalism.* Delhi: Oxford University Press.

නවගත්තේගම, සයිමන්
1998. *සංසාර අරණ්‍ය අසබඩ.* අතුරුගිරිය: සාර ප්‍රකාශන.

Roy, Arundathi
1998. *God of Small Things.* New York: Harper Perennial.

Rushdie, Salman.
1991. *Midnight's Children.* New York: Penguin.
2002. *Step Across this Line*. New York: Random House.

සමන් කුමාර, කේ කේ
1999. *නූතනවාදය වෙතට සහ ඉන් ඔබ්බට.* නුගේගොඩ: විදර්ශන.

Saramago, Jose.
1997. *Blindness.* Translated by Giovanni Pontiero. San Diago: Hartcourt Brace & Company.

Watt, Ian.
1983. *The Rise of the Novel.* Berkeley: University of California Press.

White, Hayden.
1987. *Metahistory.* Baltimore: John Hopkins University Press.

Williams, Ioan.
1974. *The Realist Novel in England: A Study in Development.* Basingstoke: Macmillan.

වීනා දාස්, ආතර් ක්ලයින්මන්, මාගරට් ලොක්, මම්ෆෙලේ රම්ෆෙලේ සහ පාමිලා රෙනෝල්ඩ්ස් (සංස්කාරකවරු)

***Remaking a World: Violence, Social Suffering and Recovery***

(ලොවක් නැවත ගොඩනැගීම, ප්‍රචණ්ඩත්වය, සමාජයානුගත දුක සහ ප්‍රතිප්‍රාප්තිය)

2001. කැලිෆෝනියා විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය, බර්ක්ලි.

ISBN 0-520-22330-6/ ISBN 0-520-22329-2, පිටු VIII, 294. මිල: ඇමරිකානු ඩොලර් 19.95 (මෘදු කවරය සහිතව) / ඇමරිකානු ඩොලර් 50.00 (ඝන කවරය සහිතව)

විමර්ශනය: ටොඩ් මෙයර්ස්




*Remaking a World* යනු සමාජ ක්ෂතිය (social trauma) සහ දෛනික ජීවිතය නැවත ගොඩනැගීමේ අද්විතීය කාර්ය ගවේෂණය කරන ලද ලිපි එකතුවකි.[1] දුක විඳින ආකාර, ප්‍රචණ්ඩත්වය හා අන්ත දුක (despair) යන කාරණා ගවේෂණය කළ කෘති තුනකින් තුන්වන හා අවසාන වෙළුම වන්නේ මේ කෘතියයි.. මෙහි සංස්කාරකවරු නිව්යෝර්ක්හි සමාජ විද්‍යා පර්යේෂණ මණ්ඩලයේ (Social Science Research Council)

සංස්කෘතිය, සෞඛ්‍ය හා මානව සංවර්ධනය සඳහා වූ කමිටුවේ (Committe for Culture, Health & Human Development) සාමාජිකයෝ වෙති. මේ කෘති ත්‍රිත්වයටම පදනම් වූ පර්යේෂණ ඇරඹුණේ මේ කමිටුවේ මැදිහත්වීමෙනි. *Social Suffering* (සමාජයානුගත දුක, 1997) නම් වූ පළමු වෙළුමෙන් සිදු වූයේ බහුවිධ වූ සමාජ ආපදා හා දේශපාලනිකව ව්‍යුහනය වූ අවදානම් තත්ත්ව (vulnarabilities) හඳුනා ගැනීමය. *Violence & Subjectivity* (ප්‍රචණ්ඩත්වය හා අසමද්භාවය, 2000) නම් වූ දෙවන වෙළුම අවධානය යොමු කෙළේ ප්‍රචණ්ඩත්වය මගින් පෞද්ගලික අස්මද්භාවය (individual subjectivity) සකස් කරන යාන්ත්‍රණ ගවේෂණය කිරීමටය. *Remaking a World* නම් වූ මේ තෙවන වෙළුමෙන් උත්සාහ කරනුයේ පුද්ගලයන් හා ප්‍රජාවන් ප්‍රචණ්ඩත්වය අත්විඳින ආකාරයේ මෙන්ම එහි ප්‍රතිවිපාකවලින් මිදී ඉන් ඔබ්බට යාමට ගන්නා උත්සාහ දෙස විචේචනාත්මකව බැලීමටය. මේ කෘතියෙන් සපයන ගැඹුරු දැනුම සම්පාදනය වී ඇත්තේ දීර්ඝ කාලීන ක්ෂේත්‍ර අධ්‍යයන මත පදනම් වූ සංසන්දනාත්මක මානව වංශ ලේඛන (comparative ethnographies) මතය. එමෙන්ම මේ වෙළුමේ අඩංගු සෑම ලිපියකම එක් එක් දේශීය සන්දර්භයට (local context) අදාළව සුවිශේෂ න්‍යායික වාද විෂයන් ගණනාවක් ඉදිරිපත් කරයි. කෘතියේ අඩංගු ලිපි හය එකිනෙකට වෙනස් භූගෝලීය හා සංස්කෘතික අවකාශ (කැනඩාව, තායිලන්තය, ශ්‍රී ලංකාව, ජපානය, දකුණු අප්‍රිකාව හා ඉන්දියාව) විස්තර කළද, ඒ සෑම ලිපියක් තුළින්ම ආමන්ත්‍රණය කරන කරුණක් වන්නේ ප්‍රජාවන් ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඉතිහාසවලින් ආන්තික කරනු ලබන ක්‍රියාවලිය හෝ සාමූහික ප්‍රචණ්ඩත්වයේ ක්ෂතිය (trauma of collective violence) අත්විඳිනු ලැබූ ක්‍රියාවලියයි (viii).

*Remaking a World* කෘතියේ අඩංගු ලිපි පුළුල් වශයෙන් නිර්වචනය කළ හැකි සහ අතිච්ඡාදනය වන ප්‍රවර්ග දෙකකට අයත් වේ. ඒවා නම්, ප්‍රජාවන් පිළිබඳ විස්තර හා ප්‍රචණ්ඩත්වය පිළිබඳ මානව වංශ ලේඛන

(ethnographies of violence) යන ප්‍රවර්ග දෙක වේ (8). මුල් ප්‍රවර්ගය තුළ අඩංගු ලිපි මගින් නිල ඉතිහාස දේශීය (local, නැතිනම් යම් ප්‍රදේශයටකට ආවේණික) අනුභූති සමග සසඳන අතර, එතුලින් පුරවැසිකම හා අනන්‍යතාව වැනි ප්‍රශ්න මත රාජ්‍ය ප්‍රතිපත්ති සහ යටත් විජිත භාවිතයන් බලපෑම් කරන ආකාරය ගවේෂණය කරයි. කොමාත්‍රා චුළුන්ග්සතියන්සුප් විසින් රචනා කර ඇති ප්‍රථම ලිපිය තායිලන්තයේ කුයි ප්‍රජාව පිළිබඳ මානව වංශ ලේඛනයක් වන අතර, එතුලින් ගවේෂණය කරනුයේ නිල තායි රාජ්‍ය ඉතිහාසය තුළින් කුයි ප්‍රජාව බහිෂ්කරණය කර ඇති ආකාරයයි. කුයි ප්‍රජාව සම්බන්ධයෙන් සියම් ඉතිහාසකරණය තුළ සිදුවන 'ආන්තිකත්වය සමාජීය වශයෙන් නිෂ්පාදනය කිරීම' (social production of marginality) තත්කාලීන දේශපාලනය තුළදී ද සිදු වේ. මේ නිසා සිදුවන්නේ ප්‍රජාවක් වශයෙන් කුයිවරු ප්‍රධාන පෙළේ දේශපාලන කතිකාවෙන් අතුරුදහන් වීමය. මීට ප්‍රතිචාර වශයෙන් කුයිවරු කර ඇත්තේ විසම්මුතික 'පරිකල්පිත ප්‍රජාවක්' ගොඩනැගීමය (constructed an immagined community of dissenters). මෙතුළින් පෙන්නුම් කරනුයේ දුක යන කාරණය තුළින් ගොඩනැගෙන අන්තර් පුද්ගල (inter-subjective) අත්දැකීම සහ සාමූහික බහිෂ්කරණය තුළින් බලගැන්වීමට ඊට ඇති හැකියාවයි.

දෙවන ලිපිය තුළින් නයෝමි ඇඩල්සන් කැනඩාවේ ක්‍රී ප්‍රජාව පිළිබඳව පාඨකයා ග්‍රහණය කරගන්නා විස්තරයක් ඉදිරිපත් කරයි. මේ ප්‍රජාව සම්බන්ධයෙන් ඇය පෙන්නුම් කරනුයේ දරිද්‍රතාව, දුක සහ සංස්ථාගත කරන ලද ජාතිවාදය මගින් සලකුණු වූ ඉතිහාසයක් ගොඩනැගී ඇති ආකාරයයි. ඇයට අනුව ප්‍රසිද්ධ අවකාශය තුළ ක්‍රීවරුන්ට දුක් විඳින්නවුන් (sufferers) හා ගොදුරු (victims) වශයෙන් ගොඩනැගී ඇති නියෝජනත්වයෙන් ඔබ්බට යාමට ඇති අසීරුකම නිසා ඔවුන් මත පැටවී ඇති අවදානම නැතාහොත් යටහපත් පහත් (subordinate) තත්ත්වය වඩාත් තීව්‍ර වේ.

ඓතිහාසික දෛවයෙන් (historical fatality) ඔබ්බට යාම සඳහා සම්පූර්ණයෙන්ම විකල්පීය සංස්කෘතික, දේශපාලනික හා ප්‍රජා අවකාශ සකසා ගැනීමට ක්‍රිවරු උත්සාහ ගනිති. ඒ අවකාශවල ස්වභාවය භෞතික වූත් මානසික වූත් ජාතික රාජ්‍යයකි.

කෘතියේ අඩංගු දෙවන ප්‍රවර්ගයට අයත් ලිපි වඩාත් පැහැදිලිව ප්‍රචණ්ඩත්වය පිළිබඳ මානව වංශ ලේඛන වේ. මායා ටොඩේශිනි විසින් ජපානයේ හිබකුෂාවරියන්[2] වෙත හෙළන සමීප හා සංවේදී බැල්මෙන් අනාවරණය කරනුයේ ක්ෂතික අවස්ථා (traumatic events) අර්ථකථනය කිරීමේදී සමාජ ලිංගිකත්වය (gender) කුමන භූමිකාවක් ඉටු කරන්නේද යන්නය. මෙහිදී පෙනෙනුයේ හිරෝෂිමා හා නාගසාකි යන නගරවලට දෙවන ලෝක සංග්‍රාමයේදී පරමාණු බෝම්බ හෙළීම පිළිබඳ ස්ථිතික (static), නැතහොත් වෙනස් නොවන ස්මාරක වශයෙන් ස්ත්‍රී ශරීර ගොඩනැගෙන බවය. එතුළින් ස්ත්‍රියගේ ලිංගිකත්වය හා අස්මද්භාවය පිළිබඳ හැඟීමද සකස් වේ. මෙතරම්ම ක්ෂතිය ගෙන දෙන තවත් කරුණක් වන්නේ පරමාණු බෝම්බවලින් නිකුත් වූ විකිරණ නිසා දරුවන් ප්‍රසූත කරන්නියන් සහ මව්වරුන් වශයෙන් ස්ත්‍රීන් මත ඇති කළ බලපෑම තුළින් මතු වූ සාංකාව (anxiety) හා නැතිවීම පිළිබඳ හැඟීම (loss) සමාජය විසින් බලයෙන් අත්පත් කර ගැනීමය (appropriation).

හොල්මන් කතාවල අස්වාභාවික තත්ත්වය සහ භූතාවේෂයේ (spirit posession) ආඛ්‍යාන පිළිබඳව ලියැවුණු තම ලිපිය තුළින් සංසක පෙරේරා ශ්‍රී ලංකාවේ මනෝ විද්‍යාත්මක භීෂණයේ අධිතාත්වික භූමි දර්ශනය ඔස්සේ සංචාරයේ යෙදෙයි. 1988 සිට 1991 දක්වා ක්‍රියාත්මක වුණු බිහිසුණු දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් පසුව ඉන් මතු වූ බොහෝ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමක් සිදු වූයේ නැත. මේ තත්ත්වය තුළ සාම්ප්‍රදායික විශ්වාස සහ විඥානය වෙනත් තත්ත්වවලට වෙනස් කිරීමෙන් (altered states of consciousness) ගොඩනැගුණු අතීතය මතකයට නගාගැනීමේ

යාන්ත්‍රණ තුළින් පළිගැනීම හා යුක්තිය අතර ඇති අපැහැදිලි අවකාශය තරණය කරන්නට යම් දුරකට උපකාර විය.

පාඨකයා බෙහෙවින් ග්‍රහණය කරගන්නා ලිපියක් තුළින් දීපාක් මේතා සහ රෝමා චැටර්ජි බොම්බාය නගරයේ කලකෝලාහලවල (riots) වාර්ගික ප්‍රචණ්ඩත්වය (communal violence) හා ඒ තුළින් ගොඩනැගෙන ස්මෘතිය පිළිබඳ අවකාශ ගවේෂණය කරනු ලබයි. කතුවරුන්ට අනුව දෛනික ජීවිතයේ ප්‍රතිප්‍රාප්තිය (recovering the everyday) යනු සාමාන්‍ය තත්ත්වයේ පවතින බිඳෙනසුලු ස්වභාවය (fragility of the normal) පිළිගැනීමට සිදුවීමය (202). හින්දූන් හා මුස්ලිම්වරුන් අතර ඇතිවෙන ගැටුම් තුළින් පවතින කෘත්‍යාත්මක සදාචාර ප්‍රජාවන් (functional moral communities) දූෂමාන ආරංචි සහ අවිශ්වාසය තුළින් ඛණ්ඩනය වී ප්‍රතිසංවිධානය වේ. යම් අවස්ථාවක තමාගේ අසල්වාසීන් ප්‍රචණ්ඩත්වයේ කර්තෘවරුන් විය හැකි වුවද, නැවත සකසන ලද අවකාශීය සීමාවන්ගෙන් (spatial boundaries) පෙන්නුම් කරනුයේ යමෙකුගේ සමාජීය භාවය (sociality) සහ පිළිගත් ස්මෘතිය කුමක්ද යන්නය. එනම් යමෙකු ආශ්‍රය කරනුයේ කව්රුන්ද, මතක තබාගත යුත්තේ කුමක්ද යන්නය.

ෆියෝනා රොස්ගේ අනුවේදනීය ලිපිය පදනම් වී තිබෙනුයේ දකුණු අප්‍රිකාවේ සත්‍යය හා ප්‍රතිසන්ධානය සඳහා වූ කොමිසම (Truth & Reconcilliation Commission) තුළදී ඉදිරිපත් කළ ස්ත්‍රීන්ගේ සාක්ෂ්‍ය ප්‍රකාශන මතය. එතුළින් මැනවින් පෙන්නුම් කරනුයේ ආඛ්‍යානගත විෂය සමග ඇති අනුභූතික ඛණ්ඩනයයි (experiential disconnect of the narrated subject). ප්‍රචණ්ඩත්වය විස්තර කරන ස්ත්‍රීන් කතා කරනුයේ තාවකාලික නිරීක්ෂකයන් (ephemeral observers) වශයෙන් පමණක් මිස ක්ෂනික සිදුවීම් තුළ සිටින පුද්ගලයන් වශයෙන් නොවේ (not as subjects within traumatic events). මෙහිදී යුක්තිය ළඟා කරගැනීමට බලාපොරොත්තුවන්නේ කටහඬ තුළිනි. ඒ රොස් ප්‍රකාශ කරන ආකාරයට කතා කිරීමට ඇති අපහසුකම (suffocation of speech) ජයගැනීම තුළිනි.

මෙ කෘතියේ අන්තර්ගත බුද්ධිමත්ව සකසන ලද ලිපිවලට අමතරව, එය සංස්කරණය කර ඇති ආකාරය පිළිබඳව යමක් ප්‍රකාශ කිරීම ද අතිශයින් වැදගත් වේ. වඩාත් පුළුල් වූ පාදක රාමුවක් තුළ ලිපිවලින් මතුවෙන අදහස් කල්පනාකාරීව එකිනෙක සමග විවීම තුළින් සමස්තයක් වශයෙන් සංස්කාරකවරුන් වෙළුම වඩාත් ශක්තිමත් කරන අතර, එසේ කරනුයේ පරිස්සම් සහිතව සරල මතුපිට සම්බන්ධතාවලට අවධානය යොමු කිරීම මග හරිමින්ය. නිරතුරුවම පුළුල්වන ප්‍රචණ්ඩත්වය පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක සාහිත්‍යය තුළ මෙතරම් සුපැහැදිලිව කැපී පෙනෙන නවත් කෘති ඇත්නම්, ඒ අතළොස්සකි. *Remaking a World* කෘතියෙන් පෙන්නුම් කරනුයේ සංසන්දනාත්මක සහ සැබවින්ම සහයෝගීතා පදනමක් මත කරනු ලබන පර්යේෂණ (collaborative work) තුළින් ළඟා කරගත හැකි සාරවත් බව හා න්‍යායික ගැඹුර යන කාරණාය.

## පසු සටහන්

[1] මෙ විමර්ශනය ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රථමයෙන්ම පළ වූයේ *Medical Anthropology Quarterly* (15 වන වෙළුම, අංක 4, 2001) නම් වූ වෛද්‍ය මානව විද්‍යාත්මක ශාස්ත්‍රීය ලිපි සංග්‍රහයේය. මෙ විමර්ශනය සිංහලයට පරිවර්තනය කිරීම සඳහා ලබාදීමෙන් සහ ඊට අවශ්‍ය අවසර ලබාගැනීමේදී නිව්යෝර්ක්හි සමාජ විද්‍යා පර්යේෂණ මණ්ඩලයේ ෆ්‍රැන්ක් කෙසෙල්ගෙන් සහ ජෝන් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ වොඩ් මෙයර්ස්ගෙන් ලත් උපකාර පයින සංස්කාරක මණ්ඩලය අගය කරයි. මෙය සිංහලට පරිවර්තනය කරනු ලැබුවේ සමාජ සංස්කෘතික ගවේෂණය සඳහා වූ එකතුවේ පරිවර්තන කම්ටුව විසිනි.

[2]. හිබකුෂා යන ජපන් පදයේ පරිසමාප්ත සිංහල අර්ථය නම් පරමාණු බෝම්බ පතිත වූ පුද්ගලයා (atom-bombed person) යන්නය.

## ආශ්‍රිත පඨිත

Das, Veena, Arthur Kleinman, Mamphele Ramphele and Pamela Reynolds (Eds.,)
2000. *Violence & Subjectivity*. Bekeley: University of California Press.

Kleinman, Aruthur, Veena Das and Margaret Lock (Eds.,)
1997. *Social Suffering*. Berkeley: Unversity of California Press.

එස්. ටී. හෙට්ටිගේ

***වර්තමාන සමාජ අර්බුදය***

2004. එස්. ගොඩගේ සහ සහෝදරයෝ
ISBN 955-20-7041-4, පිටු 176, මිල: රු. 250.00

විමර්ශනය: අජිත් සේරසුන්දර




**ප්‍රවේශය**

ලාංකේය ජනතාව සමාජීය වශයෙන් අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දී සිටින අතර, එය පුළුල් ඓතිහාසික සමාජ, ආර්ථික හා දේශපාලන සංසිද්ධිවල ප්‍රතිඵලයක් බව එස්. ටී. හෙට්ටිගේ තම *වර්තමාන සමාජ අර්බුදය* නම් කෘතියේ හැඳින්වීමෙන් ප්‍රකාශ කරයි. එසේම, එම අර්බුදයේ විවිධ පැතිකඩ එකිනෙකට සම්බන්ධ වූ ප්‍රශ්න රැසක ප්‍රතිඵල බැවින් එම ප්‍රශ්න හුදකලා ප්‍රශ්න ලෙස හඳුනා නොගත යුතු බවත් ඔහු නිවැරදිව අවධාරණය කරයි. එබැවින්, වර්තමාන සමාජ අර්බුද(ය) තේරුම් ගැනීම සඳහා සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක අවශ්‍යතාව මූලික කොන්දේසියක් යැයි කතුවරයා ප්‍රකාශ කරයි.

වර්තමාන සමාජ අර්බුදය කෘතියේ බොහෝ ලිපි විවිධ අවස්ථාවන්හිදී සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පුවත්පත් මගින් ප්‍රකාශ වූ ඒවා වෙයි. එලෙස නොයෙකුත් තැන්වල විසිර තිබූ ලිපි එකතුවක් දුන් කෘතියක් ලෙස ප්‍රකාශයට පත්ව ඇත. එමගින් ප්‍රකාශ වන්නේ එම ලිපිවල අඩංගු විෂය කරුණු සහ ඒ පිළිබඳ කර්තෘගේ දෘෂ්ටිවාදය සිංහල භාෂාවෙන් කියවන පාඨකයන් අතරට ගෙනයාමට කර්තෘට ඇති අවශ්‍යතාවයි. එම බුද්ධිමය උත්සාහය මගින් ප්‍රකාශ වන දේශපාලන මතවාදය තේරුම් ගැනීම මෙම කෙටි විශ්ලේෂණයේ ප්‍රධාන අරමුණයි.

## කෘතියේ අන්තර්ගතය හා එහි දේශපාලන මතවාදය

බලයට පත් ආණ්ඩු විසින් පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ අනුගමනය කළ දේශපාලන හා ආර්ථික ප්‍රතිපත්ති සමාජයට හා එහි රටවැසියන්ගේ ජීවිත කෙරෙහි කරන ලද බලපෑම විවිධ සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රශ්නවලට පදනම සපයා ඇත. ග්‍රාමීය-නාගරික සමාජ අසමානතාව, ආර්ථික ප්‍රතිපත්ති සැලසුම්කරණයේ සහ රාජ්‍ය පරිපාලනයේ අකාර්යක්ෂමතාව, ලාංකේය දේශපාලන සංස්කෘතියේ ස්වභාවය හා ඒ මගින් ප්‍රකාශිත ගැටලු මෙම කෘතියේ ලිපිවල අවධානයට ලක් වී ඇති ප්‍රධාන ක්ෂේත්‍රය. ඊට අමතර වශයෙන් නව ලිබරල්වාදී දේශපාලන හා ආර්ථික යථාර්ථ හමුවේ ශ්‍රී ලංකාවේ ඉරණමත්, යුරෝපයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ වර්තමාන ගමන් මගත්, සාකච්ඡාවට ලක් කරයි. වර්තමාන සමාජ අර්බුද(ය) පිළිබඳ කර්තෘගේ දේශපාලන මතවාදය සහ ඔහු විසින් යෝජනා කරන දේශපාලන ප්‍රතිසංස්කරණයන්ගේ දිශානතිය ප්‍රකාශ වන්නේ මෙම ලිපිවලිනි. කෙටියෙන් ප්‍රකාශ කරතොත්, සමාජ

සාධාරණත්වය මත පදනම් වූ දේශපාලන ආර්ථික ප්‍රතිසංස්කරණ වර්තමාන සමාජ අර්බුදයට ඇති විකල්ප ගමන් මාර්ගය බව කර්තෘගේ මූලික නිගමනයයි.

1977 වර්ෂයේ පටන් ක්‍රියාත්මක වූ නව ලිබරල්වාදී ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්ති හා උපාය මාර්ග හේතුවෙන් ලාංකේය රාජ්‍යයේ කාර්යභාර සංකෝචනය විය. ඒ මගින් සමාජ සාධාරණත්වය මත පදනම් වූ ශුභසාධනවාදී රාජ්‍ය ප්‍රතිපත්ති බිඳවැටුණි. මීට සමගාමීව පෞද්ගලික අංශයේ සාපේක්ෂ ශක්තිමත් වීමත්, එහි ප්‍රසාරණයත් විසින් ග්‍රාමීය-නාගරික ප්‍රදේශ අතර තිබූ අසමාන සංවර්ධනය වඩාත් තීව්‍ර කෙළේය. මෙනිසාම, සමාජ පංති අතර ආදායම් බෙදීයාමේ පරතරයද තීව්‍ර විය. මෙම සන්දර්භය තුළ පරිභෝජනවාදී සංස්කෘතියක ප්‍රසාරණයත් එතුළින් සමාජය තුළ ඒකපුද්ගලත්වය (individuality) තාර්කික අන්තයකට ගමන් කිරීමත් සිදු විය. මෙම සමස්ත ක්‍රියාවලියේ තාර්කික ප්‍රතිඵලය වන්නේ ලාංකේය සමාජයේ සමාජ සහයෝගිභාවය, සමාජ සාධාරණත්වය සහ සාම්ප්‍රදායික සමාජ පර්යාය බිඳවැටීමයි.

එබැවින් වර්තමාන සමාජ අර්බුද(ය) නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිවල සෘජු ප්‍රතිඵලයක් බව හෙට්ටිගේ විසින් රචිත කෘතියේ මූලික මතවාදී හරයයි. නමුත් කර්තෘගේ විශ්ලේෂණය මෙම මූලික අදහසට පමණක් සීමා වන්නේ නැත. ශුභසාධනවාදී රාජ්‍ය ප්‍රතිපත්ති හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් සහ සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්වීම, ග්‍රාමීය හා නාගරික සමාජ ස්තර තුළ සමාජ චලනතාව සම්බන්ධයෙන් ඇති කළ වෙනස්කම් ආදිය ද අවධානයට ලක් කරයි. නමුත් මෙම සමාජ ස්තර තම සමාජ වගකීම් අතපසු කර ඇති බවත් ඒ තත්ත්වය ලාංකේය සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ක්‍රමය හා සමස්තයක් වශයෙන් සමාජය දුර්වල කිරීමට ද හේතු වී ඇති බවත් කතුවරයා පෙන්වා දෙයි.

මෙම සංකීර්ණ සමාජ ආර්ථික හා දේශපාලනික ක්‍රියාවලිය හේතුකොට ගෙන 1956 න් පසු ආරම්භ වී තිබූ සමාජ-ප්‍රගතිගාමී ක්‍රියාමාර්ග පසුපසට තල්ලු කිරීමක් ද, එනිසාම නීතිය, පරිපාලන හා දේශපාලන සංස්කෘතිය තුළ ඇති වූ තත්ත්ව හේතුකොට ලාංකේය සමාජයේ ශිෂ්ටත්වයේ බරපතළ බිඳවැටීමක් දකින්නට ලැබෙන බැව් ද කර්තෘ ප්‍රකාශ කරයි. මෙ තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා තීරණාත්මක සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වේ. රාජ්‍යයේ කාර්යභාරයන් නැවත ශක්තිමත් කිරීම, රාජ්‍ය ව්‍යවසාය නැතිනම් රාජ්‍ය ධනවාදය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ නව ලිබරල්වාදී ආර්ථික ක්‍රියාමාර්ගයන්ට විකල්ප සමාජ සාධාරණත්වය අවධාරණය කරන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීම විකල්පය යැයි කර්තෘ යෝජනා කරයි.

## විවෘත ආර්ථිකය පිළිබඳ සංස්කෘතික විරෝධය පන්ති ප්‍රතිවිරෝධයන්ගේ ප්‍රකාශනයක්ද?

නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරණ (විවෘත ආර්ථිකය) පිළිබඳව අවසානයක් නොමැති විවාද අසන්නට ලැබී ඇති නමුත්, ක්‍රියාවලියක් වශයෙන් එමගින් ලාංකේය සමාජ ස්තරායනයට සහ සමාජ චලනතාවට සිදු කරන ලද බරපතළ වෙනස්කම් පිළිබඳ මේ වනතුරු ගැඹුරින් සලකා බලා නැත. ඒ අඩුව සමාජ විද්‍යා පර්යේෂණ හා න්‍යායික යන එකිනෙකට සම්බන්ධිත ඥාන සම්පාදන අඩවි දෙක තුළම එක සේ දැකගත හැකිය. මේ නිසා ලාංකේය සමාජය තුළ විවෘත ආර්ථිකය හේතුකොට ගෙන ඇති වූ සමාජ-ආර්ථික පරිවර්තනය හා එමගින් රටේ දේශපාලන සංස්කෘතියේ ඇති වූ වෙනස්කම් පිළිබඳව විග්‍රහ කර ගැනීමේ බුද්ධිමය අර්බුදයක් තවමත් පවතී. එම අර්බුදය මූලික වශයෙන්ම මතවාදී හේතු නිසා ඇති වූවකි. එම මතවාදී

හේතු ප්‍රකාශ වන්නේ සංස්කෘතික විරෝධයක් වශයෙනි. එබැවින් වඩාත් නිවැරදි ලෙස කියන්නේ නම් නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරණයන්ට විරුද්ධව ඇති වූ මතවාදය මූලික වශයෙන් චිත්තවේගීය වූ පාරිශුද්ධවාදී සංස්කෘතික විවේචනයක් මිස ගැඹුරු සමාජ-ආර්ථික විවේචනයක් නොවේ.

මෙම සංස්කෘතික විවේචකයන් පැමිණෙන්නේ නාගරික හා ග්‍රාමීය මධ්‍යම පංතික ස්තර තුළින් නිසාත්, ලාංකේය සමාජයේ පහළ ස්තර තුළ මේ ආර්ථිකය මගින් ඇති කරන ලද සාධනීය බලපෑම නම පාරිශුද්ධවාදී ස්ථාවරය තුළ අමතක කර ඇති නිසාත් මෙම සංස්කෘතික විවේචනය ප්‍රභුවාදී විවේචනයක් ද වෙයි. එමෙන්ම අප මතක තබා ගත යුතු අන් කරුණ වන්නේ මේ බොහෝ විවේචකයන් තමන් විවේචනය කරන නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරණවල අනේක ප්‍රතිඵල භුක්ති විඳින අතර ඒ පිළිබඳ ස්වයං විවේචනයක නිරත නොවන අයද වන බවයි.

නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරණ ලාංකේය සමාජයේ විවිධ සමාජ ස්තරයන්ට හා කණ්ඩායම්වලට බලපෑවේ සමාන ආකාරයකින් නොවේ. ඒ මගින් නාගරික හා ග්‍රාමීය පහළ සමාජ ස්තරයන්හි, විශේෂයෙන්ම කාන්තාවන්ගේ ශ්‍රම සම්බන්ධතාවල විප්ලවකාරී වෙනසක් ඇති කොට ඇත. ඒ හේතුකොට ගෙන ග්‍රාමීය දේශපාලන-ආර්ථිකයේ අර්ධ වැඩවසම් නිෂ්පාදන ක්‍රියාවලිය බිඳවැටුණ අතර, එය පහළ සමාජ ස්තරවල සමාජ චිචලාත්‍යතාව වේගවත් කෙළේය.

නමුත් සංස්කෘතික උද්ඝෝෂකයන් මෙම පරිවර්තනය නිරීක්ෂණය කෙළේ හුදෙක් සාම්ප්‍රදායික සංස්කෘතියේ හා සදාචාරයේ බිඳවැටීමක් ලෙසය. එසේ නැතිව, එහි ප්‍රතිසැකසීමක් ලෙස නොවේ. *වර්තමාන සමාජ අර්බුදය* කෘතියේ හැඳින්වීම තුළින් හෙට්ටිගේ උත්සාහ කරන්නේ මෙම සමාජ පරිවර්තන පිළිබඳව සමස්ත විශ්ලේෂණයක් සඳහා අවශ්‍ය රාමුව ගොඩනැගීමටයි.

එහිදී ඉතාම නිවැරදි ලෙස සිංහල භාෂාවෙන් කියවන පාඨකයා හුදු 'සංස්කෘතික විවේචනයෙන්' ඔබ්බට රැගෙන යාමට කතුවරයා උත්සාහ කරයි. සමාජ අර්බුද(ය) ලෙස ඔහු හඳුනාගන්නා ක්‍රියාවලිය තේරුම් ගැනීම සඳහා අවශ්‍ය සමාජ-දේශපාලන හා ආර්ථික විචල්‍යයන් පැහැදිලි කිරීමට ද කර්තෘ උත්සාහ කරයි. එමෙන්ම, මෙම සමාජ අර්බුද(ය) නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරණ හේතුකොට ගෙන ඇති වූ එකක් බවත්, ඒ නිසා වූ සංස්කෘතික පරිවර්තන හා රාජ්‍යයේ කාර්ය භාරයන්හි වෙනස්වීම ද අර්බුදය වඩාත් තීව්‍ර කළ බවත් ප්‍රකාශ කරයි.

කෘතියේ අභ්‍යන්තර ලිපි මගින් නව-ලිබරල්වාදය විසින් ඇති කරන ලද සියලු ප්‍රතිසංස්කරණයන්ට කතුවරයා සමස්තයක් වශයෙන් විරුද්ධ වන අතර, මතවාදී වශයෙන් ඔහු පාරිශුද්ධවාදී සංස්කෘතික උද්ඝෝෂකයන් නව-ලිබරල්වාදය පිළිබඳ දරන සීමිත අදහස්වලට සමීප වෙයි. මේ නිසා සිදුවන්නේ කර්තෘ හඳුන්වාදීමට උත්සාහ දරන පුළුල් සමාජ විද්‍යාත්මක විශ්ලේෂණය අනවශ්‍ය ලෙස ලඝු නැතිනම් ඌනිත වීමයි. නැතහොත් මතවාදීමය හිර අඩස්සියකට පත්වීමය. නමුත් ඒ සමගම, ලාංකේය සමාජ අර්බුදයට විසඳුම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික හා දේශපාලන ආකෘතියක් බැව් ප්‍රකාශ කිරීමෙන් නැවතත් සංස්කෘතික උද්ඝෝෂකයන්ගේ කේන්ද්‍රීය මතවාදයට එරෙහිව යයි.

මේ සන්දර්භය තුළ වර්තමාන සමාජ අර්බුද(ය) පිළිබඳව කර්තෘගේ ප්‍රධාන විග්‍රහය කුමක්ද යන්න පිළිබඳ ව්‍යාකූලත්වයක් පාඨකයන්ට මතු වෙයි. කෘතිය ඉතා පරිස්සම් සහගතව කියවීමෙන් හා දැඩි වෙහෙසක් දැරීමෙන් ගැටලුව විසඳාගත හැකි බව මගේ නිරීක්ෂණයයි. මේ තත්ත්වය ඇතිවන්නේ එකිනෙක සම්බන්ධ ප්‍රධාන හේතු දෙකක් නිසාය. ඒවා නම්,

1. 1956 යේ දේශපාලන ජයග්‍රහණය අත්පත් කරගත් සමාජ බලවේග හා ඔවුන්ගේ ක්‍රියාමාර්ග ප්‍රගතිශීලී බවත්, ලාංකේය සමාජය තුළ සමාජ

සාධාරණත්වය සඳහා පෙනී සිටින්නේ ඔවුන් බවත්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් සඳහා නායකත්වය දිය හැක්කේ ඔවුන්ට පමණක් බවත් කර්තෘ විශ්වාස කිරීම.

2. ලාංකේය සමාජයට නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරණ විකල්ප මාර්ගය ලෙස තෝරා ගැනීම දක්වා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඇති වූ ආර්ථික හා දේශපාලන යථාර්ථ පිළිබඳ පුළුල් ඓතිහාසික විශ්ලේෂණයකට නොයාම.

ඒ හේතුකොට ගෙන සියලු ප්‍රශ්න විවෘත ආර්ථිකයේ ප්‍රතිඵලයැයි අතිශය ඌනිත (reductionist) නිගමනයකට පැමිණීමේ දැඩි අවධානම කෘතියෙන් සම්පාදනය කිරීමට බලාපොරොත්තු වන සමස්ත සමාජ විද්‍යාත්මක විශ්ලේෂණය අවප්‍රමාණ කිරීමට ද හේතුවනු ඇත.

## විවෘත ආර්ථික ප්‍රතිපත්ති හා රාජ්‍යයේ කාර්යභාරයන්ගේ ඇති වූ වෙනස්කම්

මෙම කෘතියේ තවත් වැදගත් සමාජ විද්‍යාත්මක දායකත්වයක් වන්නේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති හේතුකොට ගෙන රාජ්‍යයේ කාර්යභාරයේ ඇති වූ පරිවර්තන සාකච්ඡා කිරීමය. කර්තෘට අනුව පෞද්ගලීකරණය ව්‍යාප්තවීම නිසාත්, අධ්‍යාපනය, සෞඛ්‍ය හා ප්‍රවාහන කටයුතුවලට මැදිහත්වීමට පෞද්ගලික අංශයට ඉඩදීම නිසාත් රාජ්‍යය ශුභසාධන කටයුතුවලින් ඈත් විය. මෙම සන්දර්භය තුළ පුරවැසියෝ සෞඛ්‍යය, අධ්‍යාපනය හා ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වැඩි වැඩියෙන් මුදල් සෙවීමේ කටයුතුවල නිරත වූහ. සමාජය දැඩි පරිභෝජනවාදයකට යොමු වන්නේත්, අල්ලස් හා දූෂණ සඳහා බොහෝ අය යොමුවන්නේත් මේ පසුබිම තුළය. දීර්ඝකාලීන වශයෙන් සමාජයේ ඇති නැති පරතරය

පුළුල් වීමටත් මෙම තත්ත්ව බලපා තිබේ. රාජ්‍ය ආයතන හා පරිපාලනය දේශපාලනීකරණය වීමත්, දේශපාලන සංස්කෘතියේ ඇති වී තිබෙන විකෘති තත්ත්ව පිළිබඳවත් 'ජනතාවාදී' දෘෂ්ටියකින් විග්‍රහ කිරීමට කර්තෘ උත්සාහ කරයි. ඒ අනුවː

1. 1956 න් පසු කාලයේ රටේ දේශපාලන ප්‍රභූත්වය තුළ වැදගත් වෙනස්කම ඇති විය. ස්වභාෂා අධ්‍යාපනයෙන් විශ්වවිද්‍යාල දක්වා ඉගෙනගත් කොටස් රාජ්‍ය සේවයට ඇතුළු විය. මේ අයගෙන් බහුතරය ඉංග්‍රිසි උගත්, දේපළ හිමි නාගරික සමාජ පසුබිමක් සහිත වූවෝ නොවෙති.

2. 1977 න් පසු ක්‍රියාත්මක වූ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්ති හා රාජ්‍ය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය විසින්, 1956 දී ක්‍රියාවට නැංවූ ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග ආපස්සට හරවනු ලැබීය.

3. 1980 දශකයේ මුල සිටම ව්‍යාප්ත වූ දේශපාලන ප්‍රචණ්ඩත්වයත් සමග මේ තත්ත්වය තීව්‍ර විය.

කෘතියේ සමස්ත රචනා එකතුව තුළින් කර්තෘ ප්‍රකාශ කිරීමට උත්සාහ කරන්නේ ග්‍රාමීය ජනතාව, ග්‍රාමීය තරුණ පරපුරේ අපේක්ෂා ප්‍රතික්ෂේප කොට නිදහස් ආර්ථිකය මත පමණක් විශ්වාසය තබා කටයුතු කරන්නේ නම්, ඒ මාර්ගය ඔස්සේ දිගු ගමනක් යා නොහැකි බවයි. මේ සියලු කාරණා සාකච්ඡා කරන්නේ නමුත් කුමන දේශපාලන ව්‍යාපාර හෝ සමාජ බලවේග සමස්ත අර්බුදයට දායකවීද යන්න සෘජුව ප්‍රකාශ නොකරන අතර, වර්ෂ සහ කාල වකවානු පමණක් උදාහරණ වශයෙන් ගනී. මේ නිසා කර්තෘගේ දේශපාලන ආස්ථානය පිළිබඳව අපැහැදිලිතාවක් මතුවෙයි. එවැනි ප්‍රශ්නයක් මතුවන්නේ කර්තෘ දේශපාලන වශයෙන් සංවේදී ප්‍රශ්න සහ කාරණා පිළිබඳව සාකච්ඡා කරන නිසාය. එබැවින් කෘතියෙන් ප්‍රකාශයට පත්වන සමාජ ඉතිහාසයට

සම්බන්ධ දේශපාලන බලවේගවල ඓතිහාසික හැසිරීම පිළිබඳව යම් කරුණු කිහිපයක් සාකච්ඡා කළ යුතුය.

1956 දී මහජන එක්සත් පෙරමුණ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායකගේ නායකත්වයෙන් පාර්ලිමේන්තු බලය ලබාගත්තේ මතුපිටින් ප්‍රගතිශීලී හා ජාතිකවාදී ලක්ෂණ පෙන්නුම් කළ ද අභ්‍යන්තර වශයෙන් අර්ධ-වැඩවසම්, නවීකරණ විරෝධී සමාජ බලවේග සමග ඇති කරගත් දේශපාලන සන්ධානයක් තුළින්ය. එම සමාජ බලවේගයන්ට සහ එහි දේශපාලන නායකත්වයට ලාංකේය දේශපාලන සංස්කෘතිය තුළ විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනයක් කරන්නට නොහැකිවන්නේද ඒ නිසාය. මැතිවරණ කේන්ද්‍රීය නොදියුණු පක්ෂ දේශපාලන ක්‍රමය ක්‍රියාත්මක වන සමාජවල අනුග්‍රාහක සේවාදායක දේශපාලන සම්බන්ධතා වර්ධනයවීම නොවැළැක්විය හැකි කාරණයකි. ලාංකේය සමාජයේ ග්‍රාමීය ප්‍රදේශවල අර්ධ-වැඩවසම් සංස්කෘතික හා දේශපාලන සම්බන්ධතා මේ තත්ත්වය තීව්‍ර කරයි. ඊට සමගාමීව එම ක්‍රියාවලිය විසින් දේශපාලන හා පරිපාලන ආයතනවල කාර්ය පටිපාටිය දුර්වල කරයි.

1970 දී සිරිමාවෝ බණ්ඩාරනායකගේ නායකත්වය යටතේ බලයට පැමිණි සමගි පෙරමුණ ආණ්ඩුව විසින් දිස්ත්‍රික්ක පරිපාලන කටයුතුවලට මැදිහත්වීම සඳහා 'දිස්ත්‍රික්ක දේශපාලන අධිකාරිය' සහ ග්‍රාම සේවක කොට්ඨාස මට්ටමේදී 'ජනතා කමිටු' පිහිටවනු ලැබීය. ඒ මගින් ජාතික දේශපාලන නායකත්වයේ හා ප්‍රාදේශීය දේශපාලන නායකත්වයේ පාලනයට සියලු රාජ්‍ය පරිපාලන ආයතන යටත් කරනු ලැබිය. 1977 දී බලයට පැමිණි එක්සත් ජාතික පක්ෂ රජය විසින් දිසා ඇමතිවරුන්, ග්‍රාමෝදය මණ්ඩල සහ විශේෂිත සේවා නිලධාරීන් මගින් මෙම අතිශය නිෂේධක දේශපාලනීකරණ ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කරනු ලැබිය. 1950 දශකයෙන් පටන් ගෙන 1970 අග භාගය වන විට මේ ක්‍රියාවලිය උපරිම මට්ටමකට වර්ධනය වී තිබුණේය.

1956 දී මහජන එක්සත් පෙරමුණු රජය විසින් ගත් ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග එම බලවේග විසින්ම ආභ්‍යන්තරික වශයෙන් බිඳදමනු ලැබීය. ඊට බලපෑවේ රාජ්‍ය ආයතන දේශපාලනීකරණය වීම පමණක් නොවේ. ඔවුන් විසින් අනුගමනය කළ රාජ්‍ය ධනවාදය මත පදනම් වූ ආර්ථික ප්‍රතිපත්ති ද ඊට බලපෑවේය. 1977 දී එක්සත් ජාතික පක්ෂයට නව-ලිබරල්වාදයේ පිහිට පැතීමට සිදුවන්නේ 1947 සිට 1970 දශකයේ අග භාගය දක්වා බලයට පත් සියලු රජයන් විසින් අනුගමනය කළ දේශපාලන ආර්ථික ප්‍රතිපත්ති බලාපොරොත්තු වූ ප්‍රතිඵල අත්පත් කරගනු නොලැබූ නිසාය. එබැවින් වර්තමාන සමාජ අර්බුද(ය) හුදු නව-ලිබරල්වාදයේ සෘජු ප්‍රතිඵලයක් නොව, ඉන් ඈතට දිවෙන දේශපාලන ආර්ථික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් බැව් පැවසීම සමාජ-විද්‍යාත්මක වශයෙන් වඩාත් නිවැරදිය. ඊට සම්බන්ධිත සමාජ බලවේගවල ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය විසින් අර්බුදයේ ගැඹුර තීව්‍ර කර ඇත. අප කැමති වුවත් අකමැති වුවත් නව ලිබරල්වාදය අද දවසේ ලෝක දේශපාලන ආර්ථික ක්‍රියාවලියේ යථාර්ථයයි.

ලාංකේය සමාජයට වඩා සමාජවාදී-ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දේශපාලන ආකෘතිය ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාවක් පවතින අසල්වැසි ඉන්දියාවත්, කොමියුනිස්ට් චීනයත් නව ලිබරල්වාදය තම ආර්ථික සංවර්ධනයේ විකල්පය වශයෙන් පිළිගෙන ඇත. ඊට ආසන්න හේතුව ධනේශ්වර සංවර්ධනයේ යම් මූලික කොන්දේසි අත්පත් කරගන්නේ නැතිව අවම සමාජ-ශුභසාධනයක්වත් සැපිරීමට ඇති නොහැකියාව මෙම රාජ්‍යවල පාලක ප්‍රභූන් තේරුම් ගෙන තිබීමය.

## සිංහල භාෂාවෙන් සමාජ විද්‍යා ලේඛනකරණයේ ඇති වැදගත්කම

ලාංකේය සමාජ හා මානව විද්‍යා පර්යේෂණ සම්ප්‍රදායට අඩ සියවසකට ආසන්න ඉතිහාසයක් ඇත. එසේ නමුත් සමාජ විද්‍යාත්මක විශ්ලේෂණ ක්‍රමවේද පිළිබඳ සිංහල පාඨකයා අතර ප්‍රචලිතව ඇත්තේ නිවැරදි අදහසක් නොවේ.

වර්තමානයේදී සිංහල භාෂාවෙන් සමාජ විද්‍යාව ලෙස හඳුන්වාදී ඇති බොහෝ කෘති හා පුවත්පත් රචනා අයත් වන්නේ 1980 දශකයේ මුල් භාගයේදී ප්‍රසිද්ධියට පත් වූ ඊනියා 'ජනප්‍රිය සමාජ විද්‍යාව' නම් ආන්තික බුද්ධිමය ගුරුකුලයටයි. මේ සන්දර්භය තුළ සමාජ හා සංස්කෘතික වැදගත්කමක් ඇති හෝ නැති සංසිද්ධි මතුපිටින් විමසා ජනප්‍රිය දේශපාලන මතවාදී කතිකාව තුළ ආවේගශීලී ලෙස දියකර හැරීම සමාජ විද්‍යාත්මක විග්‍රහය ලෙස ස්ථාපිත වෙමින් පවතී. මේ ක්‍රියාවලිය හේතුකොට ගෙන සිදුවෙමින් පවතින අනර්ථ රැසකිඃ තර්කානුකූල ලෙස සාකච්ඡා කිරීම, හේතුවාදී ලෙස විග්‍රහයේ යෙදීම, සහ ප්‍රතිවිරුද්ධ අදහස් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ඉවසීම යන කාරණා ලාංකේය සමාජයෙන් හා ශාස්ත්‍රාලයීය කතිකාවෙන් ඈත්වීම මෙහි ප්‍රතිඵලය වේ.

ජන වර්ග අතර අසමගිය හා අවිශ්වාසය තීව්‍ර වීමත් නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරණයන්හි ප්‍රතිඵලයක් ලෙස පරිභෝජනවාදී සංස්කෘතියක ප්‍රසාරණයත් සමග ලාංකේය සමාජීය දේශපාලනික හා සංස්කෘතික වශයෙන් වික්ෂිප්ත වූ තත්ත්වයකට පත්විය. මෙම වික්ෂිප්ත භාවය විසින් සමාජය තුළ ජනිත කළ බිය, සැක සංකා හා අරමුණු විරහිත බව විසින් හේතු සහගත සහ තර්කානුකූල ලෙස කල්පනා කිරීමේ සහ ක්‍රියාකිරීමේ සාධනීය චර්යාවලින් සමාජය තවදුරටත් ඈත් කරනු ලැබීය.

මෙම පසුබිම තුළ සිංහල භාෂාවෙන් කියවීමෙ යෙදෙන සමාජ කණ්ඩායම් අතර, සමාජ හා සංස්කෘතික සංසිද්ධි තේරුම් ගැනීමේදීත්, සමාජ විද්‍යාවේ හා සමාජ මානව විද්‍යාවේ ශාස්ත්‍රීය හා ව්‍යවහාරික පර්යේෂණ ක්ෂේත්‍ර දෙක පිළිබඳවත් වැරදි මතවාද සහ මිථ්‍යාවන් රාශියක් ගොඩනැගී ඇත. මෙම තත්ත්වය නිවැරදි දිශාවට යොමු කිරීමේ බුද්ධිමය හා දේශපාලන අවශ්‍යතාවක් පවතින අතර, ඒ සඳහා සිංහල භාෂාවෙන් සමාජ විද්‍යා ලේඛනකරණයේ යෙදීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව තිබේ.

ජනප්‍රිය හා පුළුල් පාඨක ප්‍රජාවක් සඳහා ලියනු ලැබුව ද *වර්තමාන සමාජ අර්බුදය* කෘතිය ප්‍රකාශයට පත්වීම වැදගත්කමක් හිමිකරගන්නේ ඒ නිසාය. විශේෂයෙන්ම හුදු 'ජාතික ප්‍රශ්නය' පිළිබඳ සාකච්ඡාවට පමණක් කොටුවී සිටින අධිපතිවාදී ලාංකේය සමාජීය විද්‍යා ලේඛනකරණ සම්ප්‍රදාය ඉන් බැහැර ක්ෂේත්‍ර ගණනාවක් කරා මේ කෘතිය ගෙනයයි. ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් සොයාගැනීමට අවශ්‍ය නම්, ඊට පෙර දකුණේ සමාජ හා දේශපාලන ව්‍යුහ ප්‍රතිසංස්කරණයට ලක්විය යුතු බවත්, ජනවර්ග අතර ගැටුම ලාංකේය සමාජය මුහුණ දෙන එකම ප්‍රශ්නය නොවන බවටත් කතුවරයා කරන අවධාරණය වැදගත් වන්නේ මේ සන්දර්භය තුළය.

## කෘතියේ ඇති තාක්ෂණික ඌනතා සහ සමාප්ත සටහන්

ඉතාම කෙටියෙන් මෙම ලිපි එකතුවෙහි දක්නට ලැබෙන තාක්ෂණික දුර්වලතා කිහිපයක් පෙන්වාදීම අවශ්‍ය වේ.,

1. මෙහි පළවෙන ලිපි පුවත්පත්වල පළවූ ලිපි බව ප්‍රකාශ වුවත්, ඒවා ප්‍රකාශයට පත් වූ පුවත්පත, මාසය හා දිනය පිළිබඳව කිසිම සඳහනක් කෘතිය තුළ නැත. මෙනිසා කෘතියේ අන්තර්ගත ලිපි සම්පාදනය වී

ඇත්තේ කුමන කාලාවකාශ අනුපිළිවෙළකට ද යන්න පැහැදිලි නැත. එබැවින් කර්තෘ කුමන සමාජ දේශපාලන සන්දර්භයක් තුළ මේ ලිපි රචනා කෙළේ ද යන්න පිළිබඳව පාඨකයාට අවබෝධයක් ලබාගත නොහැකිය. එය කෘතිය හා පාඨකයා අතර ඇති කරගත හැකිව තිබූ සමීප බුද්ධිමය ගනුදෙනුව අවම කිරීමට හේතු වේ.

2. හැඳින්වීමේ අන්තර්ගතයට අදාළ වන සේ රචනා වඩා පැහැදිලි අනුපිළිවෙළකට සංවිධානය කොට තිබුණේ නම් පාඨකයන්ට කර්තෘගේ පරමාර්ථ මීට වඩා පැහැදිලි ආකාරයකට සන්නිවේදනය කිරීමේ ප්‍රස්තාවක් තිබුණි. එසේ නොමැති වීම නිසා මගහැර ගත හැකිව තිබූ ව්‍යාකූලතා රැසක් කෘතිය තුළට පැමිණ ඇත.

3. නිසි පරිදි සෝදුපත් නොකියවීම සහ මනා සංයමයකින් යුතුව සංස්කරණය නොකිරීම හේතු කොට කෘතිය තුළ භාෂා සහ ශෛලීයමය දෝෂ අතිශයින් බහුල බැවින් එය පාඨකයා වෙහෙසකර තත්ත්වයකට පත් කරයි.

මේ ලිපි සකසා ඇත්තේ ජනප්‍රිය පරිභෝජනය සඳහා යැයි කතුවරයා පුන පුනා ප්‍රකාශ කර තිබේ. නමුත් ජනප්‍රිය අවකාශයකට මුදාහැරිය පමණකින් ඉහත සඳහන් කළ ආකාරයේ තාක්ෂණික හා විශ්ලේෂණීය ඌනතා අවම කර නොගැනීම හේතුවක් නොවේ. මෙහිදී අවසන් වශයෙන් මතක් කර දිය යුත්තේ ලොව පරසිදු මැදිහත්වාදී ශාස්ත්‍රාලයීය බුද්ධිමතුන් දෙදෙනෙකුගේ ක්‍රියාකලාප පිළිබඳවය. එනම් නෝම් චොම්ස්කි සහ එඩ්වර්ඩ් සයිඩ්ය. මේ දෙදෙනා ශාස්ත්‍රාලයීය බුද්ධිමතුන් වුව ද, ශාස්ත්‍රාලයීය අවකාශයට සම්බන්ධ නැති ජනප්‍රිය මුද්‍රිත මාධ්‍ය තුළින් හා අන් මාර්ග මඟින් සමාජීය මැදිහත්වීම් ගණනාවක් කර ඇත. ඔවුන් ජීවත් වූ ඇමරිකා එක්සත් ජනපද සමාජයේ සහ ගෝලීය වශයෙන් අර්බුදකාරී අවස්ථා බොහෝමයකදී පුවත්පත් හා සඟරා සඳහා ලිපි සම්පාදනය කළ ද, ඒවා

පසුව ලිපි එකතු වශයෙන් පළ කළ ද, ඒ කරනු ලැබුවේ ඉහත සඳහන් ආකාරයේ ඌනතා ඉතාමත් පැහැදිලි ලෙස මගහරවා ගනිමිනි. එවන් බුද්ධිමතුන්ගේ ශාස්ත්‍රාලයීය හා සමාජීය මැදිහත්වීමේ ශෛලිය හා මේ භූමිකා දෙක සමබරව තබාගත් ආකාරය ශ්‍රී ලංකාව තුළ බුද්ධිමය ගනුදෙනුවල යෙදෙන අපට මහත් ආලෝකයක් සපයනු ඇත.

## වී. නිත්‍යානන්දන්

*இலங்கையின் பொருளாதார வரலாறு வடக்கு - கிழக்குப் பரிமாணம்*

(ඉලංගෛයින් පෙරුලාදාර වරලාරු - වඩක්කුක් කිලක්කුප් පරිමාණම්

[ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසයඃ උතුරු නැගෙනහිර පැතිකඩ])

2003. උසස් අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය, යාපනය.

ISBN අංකයක් නොමැත. පිටු V+228. මිල රු. 280.00

විමර්ශනයඃ එන්. ජේරින්බනාදන්

පරිවර්තනයඃ සාමිනාදන් විමල්




වී. නිත්‍යානන්දන් විසින් ලියා 2003 වසරේ ජුනි මාසයේදී ප්‍රකාශනයට පත් කරන ලද *இலங்கையின் பொருளாதார வரலாறு வடக்கு- கிழக்குப் பரிமாணம்* (ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය උතුරු-නැගෙනහිර පැතිකඩ)' යන ග්‍රන්ථය දෙමළ භාෂාවෙන් රචිත සමාජීය විද්‍යා සාහිත්‍යයට අලුතින් එකතු වූ වැදගත් කෘතියකි.

මෙම කෘතිය පරිච්ඡේද අටකින් සමන්විතය. ආර්ථික ඉතිහාසය සහ නිර්-ඓතිහාසිකත්වය නම් වූ පෙරවදන, ආර්ථික ඉතිහාසය සඳහා වන පූර්ව කොන්දේසි, යාපනය රාජධානියේ දළ ආර්ථික ව්‍යුහය, යටත් විජිත ආර්ථික ප්‍රවණතාවන්ගේ

පිබිදීම: පෘතුගීසි හා ලන්දේසි පාලන කාල, යටත් විජිත ආර්ථික ප්‍රවණතාවන්ගේ වර්ධනය: බ්‍රිතාන්‍ය කාලය, ලාංකේය දෙමළ ජනතාවගේ අධ්‍යාපනය පිළිබඳ ආර්ථිකය, භෞතික සම්පත්වල භාවිතය, ආර්ථික ඉතිහාසය සහ නිර්-ඓතිහාසකත්වය, පසු සටහන යන්න එම පරිච්ඡේද වේ. කෘතියේ ආරම්භයේදීම රටක ඉතිහාසය, දේශපාලන ඉතිහාසය සහ ආර්ථික ඉතිහාසය අතර ඇති සම්බන්ධතා පැහැදිලි කරන කතුවරයා, යම් කිසි ප්‍රදේශයක ආර්ථික ඉතිහාසය වෙනම ලිවීමේ අවශ්‍යතාව අවධාරණය කරයි. ශ්‍රී ලංකාවේ උතුරු-නැගෙනහිර ප්‍රදේශයේ ආර්ථික ඉතිහාසය ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසයෙන් වෙන්ව ගෙන ලිවීම සාධාරණීකරණය කළ හැකි කොන්දේසි ඉතිහාසය තුළ අන්තර්ගතවන බව ඔහු පැහැදිලි කරයි. එමෙන්ම, මේ පිළිබඳ ඉතා අඩු පිරිසක් පමණක් අධ්‍යයනවල යෙදී ඇති බවත්, පූර්ණ අධ්‍යයනයකට ලක් නොවූ ක්ෂේත්‍රයක් ලෙස මෙම ප්‍රදේශයේ ආර්ථික ඉතිහාසය සැලකිය හැකි බවත් කතුවරයා පවසයි. යාපනය රාජ්‍යයේ බිඳ වැටීමත් සමග මෙම ප්‍රදේශ පාලනය කළ පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන විදේශිකයන් සහ නිදහසින් පසුව මෙම ප්‍රදේශ පාලනය කළ සිංහල කේන්ද්‍රීය ආණ්ඩු විසින් ද උතුරු-නැගෙනහිර ආර්ථික සම්පත් (භෞතික සහ මානව) යහපත් අයුරින් ප්‍රයෝජනයට ගෙන එම ප්‍රදේශ සංවර්ධනය කිරීමට කටයුතු නොකළේය යන අදහස ඔප්පු කර පෙන්වීමට උත්සාහ දැරීම මෙම කෘතිය පුරාම දක්නට ලැබෙන්නකි.

යාපනයේ රජවරු විසින් මෙම ප්‍රදේශ පාලනය කළ කාලයේදී බලපැවැත්වූ ආර්ථික තත්ත්ව පැහැදිලි කිරීමේදී කෘෂිකාර්මික ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වී, කුරක්කන්, අමු, මෙනේරි, දුම්කොළ වැනි බෝග පිළිබඳවත්, භූමි බදු පිළිබඳවත් බොහෝ තොරතුරු කෘතිය තුළ අඩංගුව පවතී. එමෙන්ම, එම කාලයේ ක්‍රියාත්මක වූ කර්මාන්ත, එම කාලයේ ක්‍රියාත්මක වූ කර්මාන්ත, ආභරණ, යකඩ සහ වඩු වැඩ ආදිය පිළිබඳවත්, අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය,

එයට අදාළ වර්ණ ද්‍රව්‍ය ආදිය නිෂ්පාදනය පිළිබඳවත් විස්තරාත්මකව කරුණු ඉදිරිපත් කරයි. යාපනය රාජ්‍ය දෙමළ රජවරුන් විසින් පාලනය කරන ලද කාලයේදී එහි වූ නාවික රැකියා සහ වෙළඳම පිළිබඳ පැහැදිලි කරුණු ද ගෙනහැර දක්වන අතර, ඇතුන්, ගම්මිරිස්, පුවක්, කහ, කරාබු නැටි, කුරුඳු, ඉඟුරු යනාදිය වාණිජ බෝග ලෙස පැවති බව ද එකල වෙළඳ නුවමාරු අනුපාතය යාපනය රාජ්‍යයට වාසිදායක ලෙස සකස්වී තිබුණ බව ද කතුවරයා සඳහන් කරයි. මෙම කරුණු පිළිබඳව සඳහන් කිරීමේදී ඉතිහාස ග්‍රන්ථයන්හි සඳහන්වන ආර්ථිකය සම්බන්ධ කරුණු ආර්ථික න්‍යායන් සමග බද්ධකර පැහැදිලි කිරීමේ විශේෂ ලක්ෂණය කෘතිය තුළ දැකිය හැකිය. ආර්ථික දර්ශන ඓතිහාසික කරුණු සමග සම්බන්ධකරගෙන පර්යේෂකයෙකුට යම් කිසි ප්‍රදේශයක ආර්ථික ඉතිහාසය සාර්ථකව ලිවීමේ හැකියාවට මනා නිදසුනක් ලෙස කතුවරයාගේ වෑයම හඳුන්වාදිය හැකිය.

ඉන්පසුව, විදේශීය පාලනය ආරම්භවීමත්, ජනතාව පාලනය කිරීමේදී යාපනයේ රජවරුන් සහ විදේශික පාලකයන් අතරෙහි වූ වෙනස්කම් පිළිබඳවත් පැහැදිලි කරයි. විදේශිකයන් විසින් උතුරු-නැගෙනහිර ප්‍රදේශ පාලනය කිරීමට පටන්ගත් මොහොතේ එවක දෙමළ ජනතාව තුළ දේශපාලන සවිඥානකත්වය හීනව පැවතීම නිසා, දෙමළ ජාතිකවාදය ඇතිවීම සඳහා වූ අවස්ථා දුර්ලභ වූ බව කතුවරයා සඳහන් කරයි: "ලාංකේය දමිළයෝ ලංකාව නම් දූපත තුළ තම ප්‍රදේශවල ඒකාග්‍රතාව ආරක්ෂා කර ගනිමින් සහ එය සීමාව කරගෙන තම දෙමළ ජාතිකවාදය කැප කර, ඒ වෙනුවට පැතිරුණු බිම් පෙදෙසක් වූ, ශ්‍රී ලංකාව නම් දූපත තුළ ලාංකේය ජාතිකවාදය තුළට තම ජාතිකවාදය ඇතුළු කර ගැනීමට තීරණය කරන ලදී. එනම්, ලාංකේය ජාතිකවාදය නම් වූ විශාල වෘක්ෂයේ සෙවණ යට වැඩෙන පඳුරක් ලෙස ලාංකේය දෙමළ ජාතිකවාදයේ වර්ධනය එතැන් සිට තීරණය විය. තමන් සඳහා ස්වීය ජාතිකත්වයක් ඇත්තේය යන කාරණය බොහෝ සෙයින්ම

ලාංකේය දෙමළ ජනයා විසින් අමතක කරන ප්‍රවණතාවක් ආරම්භ කර තිබුණි" (2003). උතුරු-නැගෙනහිර ආර්ථිකයේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් මෙම කාලයේදී ආරම්භ වූ බව පෙනේ. එමෙන්ම, මෙම කාලයේදී ලාංකේය දෙමළ ජනතාවගේ ස්වාධිපත්‍යය පියවරින් පියවර හීන වූ අතර, අද්‍යතන දේශපාලනික ප්‍රශ්නවල යම් මූලික ස්වභාව ආරම්භ වූ කාලයක් ලෙස මේ වකවානුව හැඳින්විය හැකිය.

බ්‍රිතාන්‍ය පාලන කාලයේදී උතුරු-නැගෙනහිර ප්‍රදේශවල වූ ආර්ථික තත්ත්වය පැහැදිලි කරන කතුවරයා මෙම ප්‍රදේශවල වතු වගාව ඇසුරෙන් බිහිවූ ආර්ථිකයක් ඇති කර, මෙම ප්‍රදේශ සංවර්ධනය කිරීමට බ්‍රිතාන්‍යයන් විසින් කටයුතු නොකළ බව ගෙනහැර දක්වයි. තල්, පොල්, උක්, දුම්කොළ, කෙසෙල්, අඹ, කොස් වැනි බෝග මහා පරිමාණ වගාවන් ලෙස කිරීමට අවශ්‍ය කොන්දේසි මෙම ප්‍රදේශ තුළ දක්නට ලැබුණ ද බ්‍රිතාන්‍යයන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වූයේ නැත. මහා පරිමාණ වතු වගාව ආශ්‍රිත ආර්ථික ව්‍යුහයක් ගොඩනැගීම සිදු නොකිරීම නිසා ලාංකේය දෙමළ ජනතාව ජීවත්වීම සඳහා අන් අය මත යැපෙමින් ආරක්ෂා වූ බව සත්‍යයකි. නමුත් මහා පරිමාණ වතු වගාව ඇති කරනු ලැබුවේ නම්, ගමනාගමන ක්‍රමය මෙම ප්‍රදේශවල වර්ධනය වීමට එය හේතුවන්නට තිබුණි. ගමනාගමනය වර්ධනය වී තිබුණේ නම්, උතුර සහ නැගෙනහිර අතර සම්බන්ධකම වඩාත් වර්ධනයවීමට එය හේතුවක් වන්නට තිබුණි. එතුළින් මානව සම්පත් සංසරණය වැඩි වී භෞතික සම්පත්වල භාවිතය ද වැඩි වී එම ප්‍රදේශ වඩාත් සංවර්ධනය කිරීමට අවස්ථාව ලබාගැනීමට හැකිව තිබුණි. නමුත් ආණ්ඩුවේ අනවධානය හේතුවෙන් එවැනි වර්ධන සිදු නොවූ බව කතුවරයා අවධාරණය කර සිටියි.

විදේශීය පාලනය යටතේ පමණක් නොව, උතුරෙහි විශේෂයෙන්ම දූපත් ප්‍රදේශවල වාසය කළ ලාංකේය දෙමළ ජනයා පවා (ජනාධික තත්ත්ව

යටතේ මෙම දූපත්වල දෙමළ ජනතාව වාසය කළහ) වෙනත් දෙමළ ප්‍රදේශයන්හි පැවති භෞතික සම්පත් ද නිසි ලෙස ප්‍රයෝජනයට නොගැනීම සිංහල කේන්ද්‍රී ආණ්ඩු විසින් දෙමළ ප්‍රදේශවල සිංහල ජනයා පදිංචි කරවීමට ප්‍රධාන හේතුවක් වූ බව ග්‍රන්ථයෙහි විස්තරාත්මකව දක්වා ඇත. වර්තමානයේ පවතින දේශපාලනික ප්‍රශ්නයේ මූල හේතුවලින් එකක් වන දෙමළ ප්‍රදේශවල සිංහල ජනපද ක්‍රියාත්මක කිරීමට දෙමළ ජනයාගේ පැරැන්නන්ගේ උදාසීන බව සහ අදූරදර්ශී බව හේතු වූවා ද යන සැකය පාඨකයා තුළ ඇතිවීම නොවැළැක්විය හැකිය. නමුත් හමුදා බලය සහිතව සැලසුම් සහගත සිංහල ජනපදකරණය ආණ්ඩුවේ මර්දනකාරී ක්‍රියාවලින්ගෙන් එකක්ය යන්න කතුවරයා උදාහරණ සහිතව පැහැදිලි කරයි.

ලාංකේය දෙමළ ජනතාවගේ අධ්‍යාපනය පිළිබඳ ආර්ථිකය ඉතාමත් විස්තරාත්මව කතුවරයා විසින් අධ්‍යයනයට ලක් කර ඇත. 19 වැනි සියවසේදී යාපන අර්ධද්වීපයේ ජනගහනය වර්ධනය වී භෞතික සම්පත්වල භාවිතයත් මානව සම්පත්වල භාවිතයත් අතර පැන නැගුණු අර්බුදකාරී තත්ත්වයක් තුළ ඉංග්‍රීසීන් විසින් හඳුන්වා දෙන ලද ඉංග්‍රීසි අධ්‍යාපන ක්‍රමය උතුරේ වාසය කළ ඇතැමුන්ට එම ප්‍රදේශයෙන් බැහැරට යෑම සඳහා දොරටුවක් ලෙස ක්‍රියාත්මකවීමෙන් මේ අර්බුදකාරී තත්ත්වය ක්ෂයවීමට හේතු වූ බව කතුවරයා පැහැදිලි කරයි. ලාංකේය දෙමළ ජනතාව අධ්‍යාපනය යන අංශයෙන් ඉදිරියට පැමිණ සිටියද, අධ්‍යාපනයේ මූලික අරමුණ වූ සමාජයේ පවතින අඩුපාඩු පුරවා ඉදිරිගාමී පෝෂිත සමාජයක් ඇති කිරීම වෙනුවට තරගකාරීත්වය මුල්කරගත් අධ්‍යාපනයක් ලාංකේය දෙමළ අධ්‍යාපන ව්‍යුහය තුළ දක්නට ලැබෙන බව කතුවරයා සඳහන් කරයි. අධ්‍යාපනය ලාංකේය දෙමළ ජනතාව විසින් පෞද්ගලික ආර්ථික වර්ධනය සඳහා උපයෝගී කරගත්ත ද, එමෙන්ම උපයෝගීකරගනිමින් සිටිය ද අධ්‍යාපනයෙන් ලබාගත් යහපත් ප්‍රතිඵල සමාජ දියුණුව සඳහා භාවිත

කිරීමට අපොහොසත් වී ඇති බව කතුවරයා සඳහන් කරයි. විශේෂයෙන්ම අධික ආදායමක් ලැබිය හැකි විද්‍යා අධ්‍යාපනයට සහ උසස් සමාජ තත්ත්ව ද හිමිකර ගත හැකි වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව වැනි අංශ කෙරෙහි වර්තමානයේ ද වැඩි අවධානයක් යොමු කිරීමේ ලක්ෂණ දක්නට ලැබෙන බවත්, සමාජීය විද්‍යාඥයන් බිහි කිරීම යන විෂයේදී ලාංකේය දෙමළ සමාජය පසුබා ඇති බව ද කතුවරයා කරුණු සහිතව පැහැදිලි කරයි. ළමයින්ගේ දක්ෂතා සහ කැමැත්ත පිළිබඳ සැලකිල්ලක් නොදක්වා දෙමාපියන් සහ පාසල් විසින් තම කැමැත්ත පරිදි දරුවන් අධ්‍යාපනය ලැබිය යුතු අංශ තීරණය කිරීම දක්නට ලැබේ. පුද්ගලයෙකුගේ අධ්‍යාපන වර්ධනයේදී සමාජ දායකත්වය වැදගත්වන බව නොපිළිගන්නා සමාජයක් ලෙස ලාංකේය දෙමළ සමාජය හඳුනාගත හැකි බව කතුවරයා සඳහන් කරයි. එතුළින් ඔහු ප්‍රකාශ කිරීමට උත්සාහ කරනුයේ ලාංකේය දෙමළ ජනතාවගේ අධ්‍යාපනික දියුණුව වනාහි පෞද්ගලික ජයග්‍රහණ ලෙස සලකනවා මිස, සමාජය සමග එක්ව ගමන් ගන්නා එකක් ලෙස සැලකිය නොහැකි බවය.

මෙම ග්‍රන්ථය තුළ බොහෝ කරුණු පැහැදිලි කරන නමුත්, කෘතියේ නමට ගැළපෙන ලෙස නැගෙනහිර සහ වන්නි ප්‍රදේශ පිළිබඳ බොහෝ අධ්‍යයන සැලකිල්ලට ගෙන නැති බව කිව යුතුය. ඓතිහාසික තත්ත්ව ආර්ථික දර්ශන සමග සම්බන්ධකර පැහැදිලි කිරීමට කතුවරයා සමත්වී ඇතත්, ඓතිහාසික සාධක - විශේෂයෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදන, කාර්මික නිෂ්පාදන, වෙළඳාමේදී භාවිත වූ භාණ්ඩ ප්‍රමාණය, භූමි බද්ධ, රේගු බද්ධ වැනි විෂයන්ට අදාළ සංඛ්‍යාලේඛන සමගින් ගෙන හැර නොදැක්වීම ද සඳහන් කළ යුතු ඌනතාවකි. එමෙන්ම, උතුරු-නැගෙනහිර ආර්ථික ඉතිහාසයට අයත්වන අන් කරුණු, විශේෂයෙන් ලාංකේය දෙමළ ඉහළ පංතියේ වර්ධනය, ගමනාගමනය, ලාංකේය දෙමළ ආර්ථික ඉතිහාසය තුළ කඳුරට දෙමළ ජනයාගේ දායකත්වය වැනි අංශ අධ්‍යයනට ලක් කිරීමේ

අවශ්‍යතාව කතුවරයා ද පිළිගෙන ඇත. මෙම කරුණු පිළිබඳව තරුණ සමාජීය විද්‍යාඥයන්ගේ අවධානය යොමු විය යුතු බව කතුවරයා පවසයි. අවසාන වශයෙන් කිව යුත්තේ, මෙම ග්‍රන්ථයෙහි නව දෙමළ පාරිභාෂික වචන යොදාගෙන තිබීම විශේෂ කරුණක් බවය. එය දෙමළ භාෂාවෙන් සමාජීය විද්‍යා රචනාකරණයේදී අත්‍යවශ්‍ය දායකත්වයක් සපයනු ඇත.

## පසු සටහන්

1. මෙම පරිවර්තනය 2004 ජූලි මාසයේදී පළවීමට නියමිතව තිබූ *[illegible]* (සමූක *අරිවු*, පළමු වෙළුම. ප්‍රකාශනය: කුමරන් පොත් නිවස, කොළඹ සහ චෙන්නායි) නම් ලිපි සංග්‍රහය සඳහා සම්පාදිත විමර්ශනයක පයීන අවශ්‍යතාවන්ට ගැළපෙන සේ සංස්කරණය කරන ලද්දකි.

# පඨිත පාරිභාෂික පද මාලාව

අවකාශීය සමස්තය - overal spatial ensemble
අධිඅනාවරණය - over expose
අධිපරාධීනත්වය - hyper dependency
අධිපැහැදිලි - hyper legible
අතුරු මුහුණත - interface
අසන්තතා - discontinuities
ආකාරිකය - routine
ආකාරිකයනය - routinization
ආවරණය - effect
අතිස්ථාපනය - transpose
අධි ජනඝනත්වය - hyper density
අවහරණය - smuggled
අන්තර්-දෘෂ්ටිය - insight
අවකාශීය අනන්‍යතාව - spatial identity
ආකෘති (ස්වරූප) - forms
අවකාශය සිනමාකරණය - cinematization of space
අස්ථායීකරණය - destabilize
අපිකේන්ද්‍රය - epicentre
අස්ථානීය - placeless
අධියථාර්ථය (අධිතත්‍ය) - hyper-real
අධිතාත්වික(වාදය) - surreal(ism)
අකාලික - atemporal
අඛණ්ඩතාව - continuity
අතිතක්සේරුව - over assessed
අධිපති - dominant
අණසක - hegemony
අනුපඨිතය - sub text
අනුභූති විරෝධී ස්ථාවරය - anti empirical position
අනුස්මරණය - commemorate
අභ්‍යන්තර ප්‍රතිවිරෝධය - internal contradiction
අර්ථ ක්ෂේත්‍රය - a field of meaning
අර්ථ පථය - path of meaning
අර්ථය - meaning
අර්ථයේ අවසාන විනිශ්චයකරුවා - aribiter of meaning
අර්ථ ව්‍යාපක ශෛලිය - expository style
අර්ථවිවරණාත්මක ව්‍යුහ - interpretational structure
අර්ථවිවරණාත්මක - interpretational / interpretive

අව්‍යාජත්වය - authenticity
අවකාශය - space
අවිදග්ධ - naive
අස්තිත්වය - existence
ආකර්ෂණය - attraction
ආකර්ෂණ අවකාශ - spaces of attraction
ආඛ්‍යාන - narratives
ආගමික රූපක - religious metaphors
ආත්මීයත්වය - subjectivity
ආන්තික අනන්‍යතාව - marginal identity
ආරක්ෂිත අවකාශය - protected space
ආවෘත - closed
ආශ්චර්යාත්මක යථාර්ථවාදය - magic realism
අතිඅස්ථානීයත්වය - hyper placelessness
අඥාත - anonymous

උපාන්තික - liminal
උපයෝගතානුරූපී - pragmatic
උභයාර්ථීන - ambivalent
උපග්‍රහණය - posit

ඒකපුද්ගල වාදය - individualism
ඒකපුද්ගලත්වය - individuality
ඒක සංස්කෘතික - mono-cultural
ඒකීය අර්ථය - absolute meaning
ඓතිහාසික වර්ධනය - historical development
ඓතිහාසික අනුක්‍රමිකතාව - historical sequentiality
ඓතිහාසිකවාදී - historicist
ඓතිහාසික මොහොත - historical moment
ඒකාකෘතික - stereo-typical

ඉදිකළ අවකාශය - built space

ඔස්ට්‍රලේෂියා - Australasia (Australia + Asia)

ගතික - dynamics
ග්‍රාහකතාව - receptivity
ග්‍රාමීයකරණය - ruralization
ගුවන් ඉම - skyline
ගැටලු විශ්වය (සංවාද ගැටලුව) - problematic
ගාමක බලය - impetus
ගෞරවාරෝපිත - gentrified

දෘශ්‍යය - visual (නාම පදය)
දිසිරුව - visual (නාම පදය)

දිසිරූ (දෘශ්‍යමය) - visual (නාම විශේෂණය)
දිසිරූ බව (දෘශ්‍ය බව) - visuality
දිසිරූ අවකාශය (දෘශ්‍ය අවකාශය) - visual space
දිසිරූ මතවාදය (දෘශ්‍යමය මතවාදය) - visual ideology
දෘශ්‍ය පරිභෝජනය - visual consumption
දර්ශ වේදය - typology
දෘශ්‍ය තන්ත්‍ර - scopic regimes
දෘශ්‍ය කලා - visual arts
දෘශ්‍යමානය / දෘශ්‍යමාන - appearance / appearances
දෘශ්‍ය ශෛලිය - visual style
දෘශ්‍ය හා අභිවාහ්‍ය කලා - visual & performing arts
දුටුවිරූ මායාව - déjà vu (දැනටමත් දැක ඇති බව)
දේශප්‍රත්‍යාවර්තනය - repatriate
දේපොළ සම්පේක්ෂණය - property speculation

න්‍යායාත්මක අනුමිතිය - theoretical implication
නගරෝපාන්තය - suburb
නාගරික භූමි (භූ) දර්ශනය - urban landscape
නියෝජනය (පෙනී සිටීම, නිරූපණය) - representation
න-විස්තර (විස්තර කළ නොහැකි) - nondescript
න-ඓතිහාසික - non historical
නිශ්පන්ද ලක්ෂය - nodal point
නිර්කාල - achronic
නාගරික දර්ශනාස්වාදය - urban voyeurism
නැවුම් නිර්මාණ - orginal creation
නිර්ධන පාන්තික වෙළෙඳ සවාරි - proletarian shopping
නිර්කාල ක්‍රමය - achronicity

වස්තු විෂය - subject
විද්‍යමාන අනන්‍යතාව - putative identity
විභවය - potential
විචිත්‍ර - exotic
විතංස - retinal
විරුද්ධවාදී දේශපාලනය - oppositional politics
විෂම ජාතීත්වය - heterogeneity
විකේන්ද්‍රණය - decentre
ව්‍යාපදේශිත - simulated
වාසික - residential
ව්‍යුහ විභාගය - deconstruction
ව්‍යුහ විභාගනය - to deconstruct
වාසික - residential
ව්‍යාවහාරික බුද්ධිය - common sense
ව්‍යාජ රූපය - simulcrum

ව්‍යාජෝක්තිය - irony
වියුක්ත න්‍යාය - abstract theory
වාග් විද්‍යාත්මක පද්ධති - linguistic systems
විච්ඡේදනය - dissection
විචාර පූර්වක කතිකා - critical discourses
විස්තීර්ණ - extentions
විස්මෘතිය - amnesia
විශ්ලේෂිය දර්ශනය - analytic philosophy

චලන රූප - moving images
චිත්‍ර ශිල්පීමය දෘෂ්ටිය - painterly mode of looking
චරිතාපදානය - biography
ඡායාකාන්ත - photogenic

යටත් වැසියා / යටත්විජිත වස්තු විෂය - colonial subject
යටත්විජිත පරිකල්පනය - colonial imagination
යටත්විජිතවාදී බැල්ම - colonial gaze
යථාර්ථය - reality
යථාර්ථ විරෝධී - anti realist
යෝග්‍යකරණය - qualify

පශ්චාත් යටත් විජිත - post colonial
පරිප්‍රාකාරිත (තාප්පවලින් වටවූ) - walled
පරිවර්තක අවස්ථාව - turning point
පරිහාසය - mockery
පර්යාවලෝකීය අවකාශය - perspectival space
පාර-බිම්කඩ - para-site
පූර්වාදර්ශිත - presidented
පූර්වාපේක්ෂණය - anticipation
ප්‍රත්‍යාවලෝකනය - reflexive
ප්‍රධාන (මහා) කතිකාව - master discourse
ප්‍රතිස්ථාය / ප්‍රතිස්ථාපනය (ප්‍රතිස්ථායීකරණය) - restablize
ප්‍රේක්ෂාව - spectacle
ප්‍රතිතුලනය - counter weight
ප්‍රතිමාන මූලික - clichéd
පඨිතය - text
පඨිතාගත අභිප්‍රාය - textual intention
පදනම් පදාර්ථ - foundational categories
ප්‍රතිමා විද්‍යාව - iconography
ප්‍රතිරෝධයේ ස්මාරක - monuments of protest
ප්‍රපංචවාදී - phenomenal
ප්‍රසිද්ධ පරිභෝජනය - popular consumption
ප්‍රාචීනවාදී - orientalist

ප්‍රාථමික වෘත්තාන්ත - primary narratives / stories
පරිකල්පිත ප්‍රජාව - immagined community
පරිපථය - circuit
පරිහාසය - mockery
පරිභෝජනය - consumption
පශ්චාත් නූතන - post modern
පාඨනය - reading
පාඨීය පඨිත - readerly text
පාඨීය මතුපිට - readerly surface
පාරිශුද්ධ - puritanical
පූර්ණ යථාව - complete reality
පූර්ණ ව්‍යාජත්වය - complete fake
ප්‍රභවය - origin
ප්‍රමුඛස්ථාන - landmarks

බහු පඨිත - plural text
බුද්ධි ගලනය - flow of knowledge
බජාර් කලා / දින දර්ශන කලා - bazzar art / calendar art
බහු කියවීම / බහු පාඨන - multiple reading
බහු අර්ථ - multiple meanings
බහු ප්‍රස්තුත අවකාශ - heterotopic spaces
බුද්ධි ශ්‍රේෂ්ඨයෙකුගේ නිර්මාණය - a product of genius

මනස්සෘෂ්ටි - fantasies
මාතෘකාව - subject

ලේඛ්‍ය - writable, writerly or scriptible

සංකේතීය භූමි දර්ශනය - symbolic landscape
සව්‍ය සංවාස - promiscuous
ස්මාරකීය - monumental
ස්වරූප - forms
සංකේතීය පිළිවෙළ - symbolic order
සංස්කෘතික හා නාගරික ආකෘති - cultural & urban forms
සමාග්‍රහණය - assimilation
සම්පර්කය - fusion
සහලක්ෂණය - syndrome
සීමා සංගය - aporias
ස්වචාරී - ideosyncratic
ස්ථිර අර්ථ - permanant meanings
ස්වයං ගවේෂණ - self - explorations
සත්තාව - reality
සමාජ ප්‍රාග්ධනය - social capital
සමාජ ශෝධනය - social reform

සමාජ ලිංගිකත්වය - gender
සමුද්දේශ ලක්ෂණ - reference features
සරුව පින්තල - kitsch
සංකේතාත්මක බලය - symbolic power
සංඥා - signs
සංදිග්ධ - ambiguous
සංදිග්ධතා - ambiguities
සංඥා මණ්ඩල - field of signs
සංඥාර්ථ විචාරකයා - semiotician
සංඥාර්ථවේදය - semiotics
සංඥාර්ථවේදී එළඹුම - semiotic approach
සංධ්වනි රචකයා - composer
සංයුක්ත - compact
සංස්කෘතකරණය - sanskritization
සංස්කෘතික අවශේෂ - cultural residues
සංස්කෘතික අධ්‍යයන - cultural studies
සංස්කෘතික පාඨනය - cultural reading
සත්තාව - reality
සිහිනයක පිටපත - copy of a dream
සුසාධ්‍යකරණය - facilitation
සූචක මණ්ඩලය - galaxy of signifieds
සූත්‍රගත කිරීම - formulation
සූචිත - signifieds
සෞන්දර්යය - aesthetics

හැබිටස් - habitus
හෘද සාක්ෂ්‍ය - conscience

ශාස්ත්‍රීය ගතික - academic dynamics
ශෛශ්නරූප - phallic
ශෛශ්නරූප කේන්ද්‍රීය - phallic centric

කාල ව්‍යති ක්‍රමය - anachronism
ක්ෂණික පරිභෝජනය - immediate consumption
කතිකාමය - discursive
කතිකාමය නිර්මාණ - discursive formation
කර්තෘ - author
කියවීම / පාඨනය - reading
කියවිය හැකි - readerly or readable
කේත - codes
ඛණ්ඩනය - rupture

තත්‍ය - real
තථ්‍ය පඨිතය - actual text

තථ්‍යාසන්න - virtual
තාක්ෂණය - technology
ත්වරණිත (වේගය වැඩිකරන ලද) - accelarated
තේමා උද්‍යාන - theme parks
තොරතුරු පද්ධති - information systems

රහස්‍ය - clandestine

ජනඝනත්වය - population density
ජනප්‍රිය කතිකාව - popular discourse
ජාතික අනන්‍යතාව - national identity
ජාතිකවාදය - nationalism

## ලේඛකයන් පිළිබඳ තොරතුරු

■ නිහාල් පෙරේරා විසින් 1975 දී මොරටුවේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයෙන් ඉදිකළ පරිසරය විෂය සඳහා විද්‍යාවේදී උපාධියද, 1987 දී ලන්ඩන්හි විශ්වවිද්‍යාල කොලීජියෙන් නාගරික සංවර්ධන සැලසුම්කරණය විෂය සඳහා විද්‍යාපති උපාධියද, 1995 දී නිව්යෝර්ක්හි බිංහැම්ටන් විශ්වවිද්‍යාලයෙන් වාස්තු විද්‍යාවේ න්‍යාය හා ඉතිහාසය සහ නාගරිකවාදය යන විෂය සඳහා දර්ශනසූරි උපාධියද ලබාගන්නා ලදී. දැනට ඔහු ඇමෙරිකාවේ ඉන්ඩියානා ප්‍රාන්තයේ බෝල් ස්ටේට් විශ්වවිද්‍යාලයේ නාගරික සැලසුම්කරණය පිළිබඳ සහාය මහාචාර්යවරයා සහ ආසියානු අධ්‍යයන වැඩසටහනේ අධ්‍යක්ෂවරයා වශයෙන් ද කටයුතු කරයි. ඔහුගේ ප්‍රධාන ප්‍රකාශන අතර, *Decolonizing Ceylon: Colonialism, Nationalism and Politics Space in Sri Lanka* (ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය, 1999) සහ *Feminizing the City: Gender & Space in Colonial Colombo* (ඩියුක් විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය, 2002) යන පඨිතද ඇතුළත් වේ.

■ ලියනගේ අමරකීර්ති 1994 දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් සිංහල භාෂාව හා සාහිත්‍ය සඳහා ශාස්ත්‍රවේදී උපාධියද, 2000 දී ඇමෙරිකාවේ මැඩිසන්හි විස්කොන්සින් විශ්වවිද්‍යාලයෙන් දකුණු ආසියානු සාහිත්‍ය සහ භාෂා සඳහා ශාස්ත්‍රපති උපාධියද ලබාගත් අතර, එම විශ්වවිද්‍යාලයෙන්ම 2004 අග භාගයේදී දර්ශනසූරි උපාධිය අපේක්ෂාවෙන් සිටී. ඔහු දැනට නිව්යෝර්ක් හි කෝනෙල් විශ්වවිද්‍යාලයේ සිංහල පිළිබඳ කථිකාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කරයි. ඔහුගේ ප්‍රධාන රචනා සහ පරිවර්තන අතර, *විල සහ මල* (ගොඩගේ, 2003), *මල්වර සමය* (විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය,

1998), *මහා පුරුෂයෙකුට බිරිඳක්ව* (විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 1996) යන පයින ද ඇතුළත් වේ.

■ **සාමිනාදන් විමල්** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිධාරියෙකු වන අතර, දැනට යාපනය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශයේ සිංහල පිළිබඳ කථිකාචාර්යවරයාය.

■ **එන්. පේරින්බනාදන්** 1974 දී ආර්ථික විද්‍යා විෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ද, 1981 දී එම විෂය සඳහාම යාපනය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියද ලබාගන්නා ලදී. දැනට ඔහු යාපනය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කරයි.

■ **අජිත් සේරසුන්දර** විසින් 1990 දී සමාජ විද්‍යාව සඳහා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ද, 2000 දී වර්ජිනියාවේ චාලට්ස්විල්හි වර්ජිනියා විශ්වවිද්‍යාලයෙන් සංස්කෘතික මානව විද්‍යාව සඳහා ශාස්ත්‍රපති උපාධිය ද ලබාගන්නා ලදී. ඔහු එම විශ්වවිද්‍යාලයේම දර්ශනසූරී උපාධි අපේක්ෂකයෙකු වන අතරම දැනට කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කරයි.

■ **අක්බාර් අබ්බාස්** හොංකොං විශ්වවිද්‍යාලයේ සන්සන්දනාත්මක සාහිත්‍ය පිළිබඳ අධ්‍යයනාංශයේ විෂය පිළිබඳ මහාචාර්යවරයා වන අතර එම විශ්වවිද්‍යාලයේම ගෝලීයකරණය සහ සංස්කෘති අධ්‍යයනය සඳහා වූ කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයා ද වේ. ඔහුගේ ප්‍රකාශන වාස්තු විද්‍යාව, සිනමාව,

දෘශ්‍ය සංස්කෘතිය, විලාසිතා යන තේමාවන්ට විශේෂයෙන් අවධානය යොමුකොට ඇත. ඔහුගේ ප්‍රසිද්ධතම කෘතිය *Hong Kong: Culture and the Politics of Disappearance* (මිනෙසෝටා විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය, 1997) යන කෘතිය වේ.

■ **ටොඩ් මෙයර්ස්** 1995දී චිකාගෝහි ස්කූල් ඔෆ් ද ආර්ට් ඉන්ස්ටිටියුට් ආයතනයෙන් කලා ඉතිහාසය, න්‍යාය සහ විචාරය සඳහා ලලිත කලාවේදී උපාධිය ලබාගත් අතර, දැනට ජෝන් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ මානව විද්‍යා අධ්‍යයනාංශයේ සහ එම විශ්වවිද්‍යාලයේම මහජන සෞඛ්‍යය සඳහා වූ බ්ලූම්බර්ග් පාසැලේ පවුල් සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශයේ දර්ශනසූරි උපාධි අපේක්ෂකයෙකි. ඔහුගේ මෑත කාලීන ප්‍රකාශන අතර *The Clinic and Elsewhere* (Culture, Medicine and Psychiatry, 2002) සහ Uncertainty Becomes a World (Parachute, 2003) යන පඨිත ද ඇතුළත් වේ.

■ **හරින්ද්‍ර දසනායක** 2002 දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් ජර්මන් භාෂාව, ප්‍රංශ භාෂාව හා පරිවර්තන ක්‍රම යන විෂයන් සඳහා ශාස්ත්‍රවේදී උපාධිය ලබාගත්තේය. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ නූතන භාෂා අංශයේ ජර්මන් භාෂාව පිළිබඳ කථිකාචාර්යවරයෙකු වශයෙන් සහ සබරගමුව විශ්වවිද්‍යාලයේ ප්‍රංශ භාෂාව පිළිබඳ කථිකාචාර්යවරයෙකු වශයෙන් ද කලක් සේවය කළේය. දැනට ඔහු ස්වාධීන පරිවර්තකයෙකු වශයෙන් කටයුතු කරයි.

## පඨිත අරමුණු

සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර වශයෙන් සාමාන්‍යයෙන් සැලකෙන ඕනෑම විෂය ක්ෂේත්‍රයක් තුළින් සංස්කෘතික අධ්‍යයනයන්ට වැඩි අවධානයක් යොමු කරමින් කරන ලද පර්යේෂණ හා න්‍යායික සංකල්පනාවන්ට ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන් පඨිත හැඳින්විය හැකිය. පඨිත සමාජ සංස්කෘතික ගවේෂණය සඳහා වූ එකතුව මගින් වාර්ෂිකව පළ කරන ලිපි සංග්‍රහයයි.

### පඨිත වෙත ලිපි සැපයිය හැකි ආකාරය

1. සමාජ සංස්කෘතික ගවේෂණය සඳහා වූ එකතුව විසින් කරන ලද ආරාධනය අනුව ලිපියක් සැපයිය හැකිය.
2. පඨිත අරමුණු හා අපේක්ෂාවන්ට අනුකූලව ඕනෑම අයෙකුට පඨිත වෙත ලිපියක් ඉදිරිපත් කළ හැකිය.

### ලේඛකයන් සඳහා උපදෙස්

1. පඨිත තුළ හුදෙක් විස්තර කථන ඇතුළත් නොකරනු ඇත. පඨිත ලිපි මගින් තොරතුරු, සමාජ න්‍යාය සමග ගනුදෙනුවක් ඇතිකර ගැනීම, විශ්ලේෂණය යන අංග විදහා දැක්වීම සාමාන්‍යයෙන් සිදුවිය යුතුය.
2. පඨිත සඳහා ඉදිරිපත් කරන ලිපි සිංහලයෙන් රචනා විය යුතු අතර, සාමාන්‍යයෙන් සමාජීය විද්‍යා ලේඛනකරණයේදී ජාත්‍යන්තරව අනුගමනය කරන රචනා ශෛලීන් හා තාක්ෂණික ප්‍රවණතා හා ප්‍රමිති අනුගමනය කළ යුතුය. මේවා උද්ධෘත සටහන්, සමුද්දේශ සටහන්, මූලාශ්‍රය තොරතුරු, පසු සටහන් ආදී සියලුම දේ සම්බන්ධව බල පැවැත්වේ. පඨිත වෙත ලිපියක් ඉදිරිපත්

කිරීමට පෙර ප්‍රධාන සංස්කාරකගෙන් ලිපියක් මගින් පඨිත රචනා උපදේශ ලේඛනය ගෙන්වා ගැනීම වඩාත් සුදුසුය. අවස්ථාව ඇති විට මේ පිළිබඳ වැඩි විස්තර සඳහා කියවන්න, *Chicago Manual of Style*, 14 වන සංස්කරණය). අක්ෂර සංයෝජනය පොයින්ට් 12 එෆ්. එම් අභය මගින් විය යුතුය.

## පඨිත සඳහා ලිපි තෝරා ගැනීමේ ක්‍රියාවලිය

පඨිත වාර්ෂික විමර්ශිත ලිපි සංග්‍රහයකි (refereed journal). පඨිත සඳහා එවනු ලබන සෑම ලිපියක්ම පඨිත සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයෙකු සහ ඔවුන් විසින් තෝරා ගත් අන් අයෙකුගේ උපදෙස් අනුව, සංස්කරණය කළ යුතු නම්, එසේ කිරීමට දී තිබෙන කාලය තුළ ඒ කටයුතු කිරීමට කතුවරුන් වග බලා ගත යුතුවේ. ලිපියක් පඨිත වෙත සැපයූ පසු ඒ ලිපිය පළ කරනවාද, නැතිද, සංස්කරණය කළයුතු නම් ඒ කෙසේද යන තොරතුරු ලිඛිතව පඨිත ප්‍රධාන සංස්කාරක විසින් අදාළ රචකයන් වෙත දන්වනු ඇත. මේ ක්‍රියාවලිය පිළිබඳ අවිධිමත් ආකාරයකින් විපරම් කිරීම අනවශ්‍ය වේ.

## පඨිත ලිපිනය

ප්‍රධාන සංස්කාරක, පඨිත
සමාජ සංස්කෘතික ගවේෂණය සඳහා වූ එකතුව,
19 A, කින්සි පාර,
කොළඹ 8.

## පඨිත විද්‍යුත් තැපැල් ලිපිනය

patitha@yahoo.com

පඨිත වෙත ඉදිරිපත් කරන සියලුම ප්‍රශ්න හා ලිපි ඉහත සඳහන් ලිපින වෙත පමණක් ඉදිරිපත් කරන්න.

**සැලසුම් සංකල්පය හා කවර නිර්මාණය**

අනෝලි පෙරේරා

**ග්‍රැෆික් සැලසුම්කරණය**

ටී.පී.ජී. අමරජීව

**අක්ෂර සංයෝජනය**

රෝමිණී ලියනගේ

**පිටකවරයේ සිතියම**

සිප්‍රියානෝ සාන්ශෙස් විසින් 1560ත් 1565ත් අතර සකසන ලද ශ්‍රී ලංකාවේ සිතියම. එය උපුටා ගන්නා ලද්දේ ආර්. එල්. බ්‍රෝහියර්ගේ *Changing Face of Colombo* (විසිදුනු ප්‍රකාශකයෝ, 2000) කෘතියෙනි. කවර සැලසුම්කරණයේදී මුල් සිතියම යම් දුරකට අවප්‍රමාණ කර ඇති බව සළකන්න.

## අර්ථකථනය පිළිබඳව ......

ලොව පිළිබඳ සෑම ප්‍රතිරූපයක්ම (එය විද්‍යාත්මක නීතියක් හෝ නවකතාවක් වුවද) ඒවායේ නියත භාවයේ සහ අනියත භාවයේ මට්ටම්වල සුපැහැදිලි වෙනස්කම් තිබුණ ද, ඒ සෑමෙකක්ම රටම ආවේණික පැවැත්මකින් යුක්ත කෘතියක්වන අතර, ඒ සෑමෙකක්ම වෙනත් අර්ථකථන සඳහා විවරව පවතී. එහෙත් ඇතැම් අර්ථ නිරූපණ අසාර්ථක යැයි පිළිගැනෙන්නේ ඒවා චඳ කොටළුවෙකු ලෙස හැසිරෙන නිසාය. එනම් ඒවාට නව අර්ථකථන සම්පාදනය කරන්නට හෝ රට පෙර පැවති අර්ථ නිරූපණ සම්ප්‍රදායන්ට මුහුණ දෙන්නට හෝ හැකියාවක් නොමැත. කොපර්නිකස්ගේ විප්ලවයේ බලය රඳා පවතිනුයේ, එමගින් ටොලමිගේ සම්ප්‍රදායට වඩා මැනවින් ඇතැම් තාරකා විද්‍යා ප්‍රපංච විස්තර කරන නිසාම පමණක් නොව, එතුළින් ටොලමි උන්මත්තක බින්න ඇද බාන්නෙකු ලෙස හංවඩු නොගසා, ඔහු තම අර්ථ නිරූපණය ඉදිරිපත් කරනු ලැබුවේ කුමන හේතුවක් නිසා ද, කුමන පදනමක් මත සිට ද යන කාරණා ද යුක්ති සහගත ආකාරයකින් පහදා දෙන නිසාවෙනි.

මා සිතන ආකාරයට අප සාහිත්‍යික හෝ දාර්ශනික පඨිත සමග ගනුදෙනු කිරීමේදී අනුගමනය කළ යුත්තේ ද ප්‍රස්තුත මාවත වන අතර, ඇතැම් අවස්ථාවල යම් අර්ථකථනවලට අභියෝග කිරීමට පුද්ගලයන්ට අයිතියක් තිබිය යුතුය .......

සියලු දෙනාම නිවැරදි වන විට සියලු දෙනාම වැරදි ද වන අතර, ඔවුන් සැමගේම මතය පිළිනොගෙන සිටින්නට මට අයිතියක් තිබේ.

- උම්බර්තෝ ඒකෝ
*Interpretation and Over-interpretation* (අර්ථකථනය හා අති-අර්ථකථනය) කෘතියේ.

පඨිත

සමාජ
සංස්කෘතික
සමීක්ෂා